79 වන කාණ්ඩය
4 වන කලාපය

සිකුරාදා
1968 ජූලි 19

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදනය : [තී. 425]**

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා

**අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව : [තී. 431]**

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [හතර වන දිනය]

විවාදය කල් තබන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 79
இல. 4

வெள்ளிக்கிழமை
19 ஜூலை 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

*அதிகார அறிக்கை*

*பிரதான உள்ளடக்கம்*

அறிவிப்பு [ப. 425] :

*சட்டவாக்க நிலையற் குழுக்கள்*

மகா தேசாதிபதியினது பேச்சு [ப. 431] :

*உரை மீதான விவாதம் [நான்காம் நாள்]*

*விவாதம் ஒத்திவைக்கப்பட்டது*

---

Volume 79
No. 4

Friday
19th July 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

**ANNOUNCEMENT [Col. 425] :**
**Legislative Standing Committees**

**GOVERNOR-GENERAL'S SPEECH [Col. 431] :**
**Debate on the Address [Fourth Day]**
**Debate adjourned**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

### 1968 ජූලි 19 වන සිකුරාදා

வெள்ளிக்கிழமை, 19 ஜூலை 1968

*Friday, 19th July 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායක තුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## නිවේදනය

அறிவிப்பு

ANNOUNCEMENT

### ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා

சட்டவாக்க நிலையற் குழுக்கள்

LEGISLATIVE STANDING COMMITTEES

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

122 වන ස්ථාවර නියෝගය අනුව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් වන මන්ත්‍රීන් "ඒ" සහ "බී" ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවල සේවය සඳහා නම් කර ඇත:

"ඒ" ස්ථාවර කාරක සභාව

එම්. ෆලීල් අබ්දුල් කපූර් මයා., එම්.බී.ඊ.
එම්. එස්. අමරසිරි මයා.
කා. පො. ඉරත්තිනම් මයා.
ටී. බී. ඉලංගරත්න මයා.
චන්ද්‍රා කරුණාරත්න මයා.
පී. ජී. බී. කෙනමන් මයා.
එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
ඩී. ඊ. තිලකරත්න මයා.
බී. වයි. තුඩාවේ මයා.
නිල් ද අල්විස් මයා.
රොනී ද මැල් මයා.
කේ. ඩබ්ලිව්. දේවනායගම් මයා.
වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන්
පෙස්ටස් පෙරේරා මයා.
ආචාර්ය එන්. එම්. පෙරේරා
ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
වෛද්‍යාචාර්ය ඒ. රත්නපාල
ආර්. පී. විජේසිරි මයා.
මෛත්‍රීපාල සේනානායක මයා.
එස්. බී. හේරත් මයා.

"බී" ස්ථාවර කාරක සභාව

එම්. අබ්දුල් බකීර් මාකර් මයා.
ජෝර්ජ් අබයගුණසේකර මයා.
සුගතදාස අරඹවල මයා.
පී. බී. ජී. කලුගල්ල මයා.
එච්. කුලරත්න මයා.
ලෙස්ලි ගුණවර්ධන මයා.
ප්‍රින්ස් ගුණසේකර මයා.
ලක්ෂ්මන් ජයකොඩි මයා.
වී. ධර්මලිංගම් මයා.
එස්. එම්. මානික්කරාජා මයා.
සී. එන්. මැතිව් මයා.
ඩී. බී. රණතුංග මයා.
එස්. බී. ලේනව මයා.
වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
ඩී. බී. විජේතුංග මයා.
පී. බී. ඒ. වීරකෝන් මයා.
ටී. සිවසිතම්පරම් මයා.
එස්. කේ. කේ. සූරියාරච්චි මයා.
බර්නාඩ් සොයිසා මයා.
ටී. බී. එම්. හේරත් මයා.

In terms of Standing Order No. 122, the following Members have been nominated by the Committee of Selection to serve on Legislative Standing Committees "A" and "B":

STANDING COMMITTEE "A"

Mr. M. Falil Abdul Caffoor, M.B.E.
Mr. M. S. Amarasiri
Mr. K. P. Ratnam
Mr. T. B. Ilangaratne
Mr. Chandra Karunaratne
Mr. P. G. B. Keuneman
Mr. F. R. Dias Bandaranaike
Mr. D. E. Tillekeratne
Mr. B. Y. Tudawe



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Mr. Neal de Alwis
Mr. Ronnie de Mel
Mr. K. W. Devanayagam
Dr. E. M. V. Naganathan
Mr. Festus Perera
Dr. N. M. Perera
Mr. Denzil Fernando
Dr. A. Ratnapala
Mr. R. P. Wijesiri
Mr. Maithripala Senanayeke
Mr. S. B. Herat

STANDING COMMITTEE "B"

Mr. M. Abdul Bakeer Markar
Mr. George Abeyagoonasekera
Mr. Sugathadasa Arambewala
Mr. P. B. G. Kalugalla
Mr. H. Kularatne
Mr. Leslie Goonewardene
Mr. Prins Gunasekera
Mr. Lakshman Jayakody
Mr. V. Dharmalingam
Mr. S. M. Manickarajah
Mr. C. N. Mathew
Mr. D. B. Ranatunga
Mr. S. B. Lenawa
Dr. S. A. Wickremasinghe
Mr. D. B. Wijetunga
Mr. P. B. A. Weerakoon
Mr. T. Sivasithamparam
Mr. S. K. K. Suriarachchi
Mr. Bernard Soysa
Mr. T. B. M. Herath.

## පෙත්සම

மனு

PETITION

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.** (මිහින්තලේ)

*(திரு. பி. எம். கே. தென்னகூன்—மிஹிந் தலை)*

(Mr. P. M. K. Tennekoon—Mihintale)

ගරු කථානායකතුමනි, කලාවැව යෝධ ඇළ ව්‍යාපාරය යටතේ දිය බදු ගෙවමින් ගොවිතැන් කරනු ලබන ගොවීන්ට මුහුණ දෙන්නට සිදු වී ඇති දුෂ්කරතාවයක් විදහා පාමින් හිපලෝගම ඒ. එම්. මොහොට්ටාල මහතා ඇතුළු 101 දෙනෙක් විසින් පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කිරීම සඳහා එවන ලද පෙත්සමක් මෙම ගරු සභාව ඉදිරියෙහි තබන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා.

ඒ උදවිය මෙම දුක්ගැනවිල්ලෙන් කියන්නේ කුමක්ද? කලාවැව යෝධ ඇළ ව්‍යාපාරය යටතේ ගොවිතැන් කරන ගොවීන්ට දිය බදු ගෙවන්නට නියම කර තිබෙනවා. 1965 අවුරුද්දේ සිට මේ වන තෙක් ඔවුන්ගෙන් බදු අය කිරීම සඳහා කිසිදු බදු මුළාදෑනියෙක් ඔවුන් ඉදිරියට ගොස් නැහැ. එසේ හෙයින් අවුරුදු තුන හතරක හිඟ බදු මුදල් තහනම් ගාස්තුවකුත් සමග ගෙවන්නට දැන් සිදු වී තිබෙනවා. මෙම කාරණය අවබෝධ කරවන්නට එක්තරා සාධකයකුත් මම ඉදිරිපත් කරන්නම්. පර්චස් 4 ක ඉඩමක් හිමි අයකුට අවුරුද්දක දිය බද්ද වශයෙන් ගෙවන්නට සිදු වන්නේ ශතයක් පමණයි. මෙම සුළු මුදලට කොමිස් ලබා ගන්නට බැරිකම නිසා ඒ උදවිය හමු වීම සඳහා බදු මුළාදෑනින් යන්නේ නැහැ. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේත් පිළිගන්නවා ඇති, මේ සඳහා ශතයක් ගෙවන්නට අකමැති කෙනෙක් මේ රටේ නැත කියන එක. එහෙත් ඒ උදවියට සිදු වී තිබෙන්නේ, එම මුදල අය කරන උදවිය තමන් මුණ ගැසීමට නොපැමිණීම නිසා අන්තිමේදී අර ශතයට තව ශත 50 ක දඩයකුත් සමග ශත 51 ක් ගෙවන්නයි. දහස් ගණනක් ගොවීන්ට මේ අතවරයට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. කොමිස් පිට බදු අය කරන බදු මුළාදෑනීන් මේ කාර්‍ය්‍ය සඳහා මුලදී පත් කර සිටියා. මෑතක සිට ඒ ක්‍රමය වෙනස් කර ඉඩම් නිලධාරීන්ට එම බදු අය කිරීම භාර දී තිබෙනවා. මේ කොට්ඨාශයේ බදු අය කරන නිලධාරියා සිටින්නේ මෙම ප්‍රදේශයෙන් පිටතයි. ඒ කියන්නේ කැකිරාව නගරයේයි. ශතයක් ගෙවීම සඳහා ඔහු මුණ ගැසීම පිණිස සැතපුම් 10 ක් 12 ක් ගෙවාගෙන එන්නට තරම් පුළුවන්කමක් ගොවීන්ට ඇත්තේ නැහැ. ඒ නිසා එම බද්ද අය කිරීම ක්‍රම ක්‍රමයෙන් පැහැර හැරී ගොස් තිබෙනවා. බදු අය කරන මුළාදෑනීන් නොඑන නිසා බදු අය නොකරනවාය කියායි, ගොවීන් සිතා සිටියේ. එහෙත් අවසානයේදී ශතයකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නව ශත 50කුත් සමග ගෙවන්නට වෙලා තිබෙනවා. දහස් ගණනක් ගොවීන්ට මෙම බලවත් අතවරයට මුහුණ පාන්නට දැන් සිදු වී තිබෙනවා.

ඔවුන්ගේ දුක්ගැනවිලි මෙම ගරු සභාවේ පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරමින් මා කියා සිටින්නේ ඔවුන්ට ගෙවන්නට සිදු වී තිබෙන මෙම අසාධාරණ දඩය ඉවත්කොට සාධාරණ පිළිවෙළකට බදු ගෙවන්නට වැඩ පිළිවෙළක් සකස් කර දෙන හැටියටයි. කොමිස් පිට බදු අය කිරීම සඳහා ප්‍රදේශයේ නියෝජිතයන් පත් කරන ලෙස ඔවුන් ඉල්ලා සිටිනවා. එම දුප්පත් ගොවීන්ට සහනයක් සලසා දීම සඳහා තමුන්නාන්සේගේ මාර්ගයෙන් මහජන පෙත්සම් කාරක සභාවට පැවරීම සඳහා මෙම පෙත්සම ඉදිරිපත් කරනවා.

**මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.**

*பொதுமனுக் குழுவுக்குச் சாட்ட கட்டளையிடப்பட்டது*

*Ordered to be referred to the Public Petitions Committee.*

## නොපැමිණීමේ අවසරය: ඩී. ඩී. එල්. ලෙටිෂියා රාජපක්ෂ මිය.

*வராதிருக்க அனுமதி : திருமதி டீ. டீ. எல். லெற்றிஷியா ராஜபக்ஷ*

LEAVE OF ABSENCE: MRS. D. D. L. LETICIA RAJAPAKSA

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 24 (1) (ඊ) ඡේදය යටතේ දොඩන්ගස්ලන්ද මන්ත්‍රිනි ලැටිෂියා රාජපක්ෂ මහත්මියට 1968 ජූලි මස 19 වැනි දින සිට මාස 3 ක් තුළ මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතුය."



**මෛත්‍රීපාල සේනානායක මයා.** (මැදවච්චිය)

*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*

(Mr. Maithripala Senanayeke—Medawachchiya)

**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

*சபை அமர்வு*

SITTINGS OF THE HOUSE

**ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු හා රැකීරක්ෂා ඇමති)**

*(கௌரவ எம். எச். முகம்மது—தொழில், தொழில் வசதி அமைச்சர்)*

(The Hon. M. H. Mohamed—Minister of Labour and Employment)

I move,

"That this House at its rising this day do adjourn untill 10 A.M. on Saturday, 20th July 1968."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**ගරු එම්. එච්. මොහමඩ්**

*(கௌரவ எம். எச். முகம்மது)*

(The Hon. M. H. Mohamed)

I move,

"That notwitstanding the provisions of Standing Order No. 8 the hours of Sitting on Saturday, 20th July 1968, shall be 10 A.M. to 12 Noon; and 2 P.M. to 8.30 P.M. and at 8.30 P.M. Mr. Speaker shall adjourn the House without Question, put."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [හතරවන දිනය]

## மகாதேசாதிபதியினது பேச்சு : உரைமீதான விவாதம் [நான்காம் நாள்]

## GOVERNOR GENERAL'S SPEECH DEBATE ON THE ADDRESS [FOURTH DAY]

**සංශෝධන [ජූලි 15] පිළිබඳ කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [ජූලි 7]—**

ஜூலை 7 ஆம் தேதிய வினவுக்கான திருத்தங்கள் [ஜூலை 15] மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order read for resuming Adjourned Debate on Amendments [15th July] to Question—[7th July].*

"අතිගරු අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පවත්වන ලද කථාවට පිළිතුරු වශයෙන් මෙම මන්ත්‍රී මණ්ඩලය පහත දැක්වෙන ස්තුති යෝජනාව ඉදිරිපත් කළ යුතුය :

'අතිගරු උතුමාණනි,

පාර්ලිමේන්තුව විවෘත කිරීමේදී ඔබතුමාණන් විසින් පවත්වන්නට යෙදුණු කථාව වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෝ වන අපි ඔබතුමාණන්ට ස්තුති කරමි. අප වෙත ඉදිරිපත් කරන ලද සියලුම කරුණුවලට අපගේ අවධානය යොමු කරන බව අපි ඔබතුමාට ස්ථිර ලෙස ප්‍රකාශ කරමු.' "—[විජේසිරි මයා.]

"மேன்மை தங்கிய மகா தேசாதிபதி அவர்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு மறுமொழியாக இச்சபை பின்வரும் நன்றியுரையைச் சமர்ப்பிப்பதாக :

'மேன்மை தங்கிய உத்தம,

பாராளுமன்றத் திறப்பின்போது மேன்மைதங்கிய தங்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு, பிரதிநிதிகள் சபை அங்கத்தினராம் நாம் எங்களது நன்றியை ரிவிக்கின்றோம். மேன்மை தங்கிய தங்களால் எம் முன் சமர்ப்பிக்கப்பட்ட எல்லா விடயங்கள் மீதும் எம் கவனத்தைச் செலுத்துவோம் என உறுதி பகர்கிறோம்.' "—[திரு. விஜேசிறி]

"That this House do present the following Address to His Excellency the Governor-General in reply to his Speech:

'May it please Your Excellency.

We, the Members of the House of Representatives, thank Your Excellency for the Speech with which you have been pleased to open Parliament. We assure Your Excellency that we shall give our attention to all matters placed before us.' "—[*Mr. Wijesiri*]

**යෝජිත සංශෝධන ප්‍රශ්නයේ අගට එකතු කිරීමට :**

பிரேரிக்கப்பட்ட திருத்தங்கள், வினவின் இறுதியில் சேர்க்கப்படுவதற்கு :

*Which Amendments were, at the end of the Question, to add :*

I

"එසේතකුදුවුවත්, උතුමාණන් වහන්සේගේ රජයේ ප්‍රතිපත්ති කෙරෙහි මහජන විරෝධය බුර බුරා නැග එන අතර රජයේ පරමාර්ථයන් කෙරෙහි පවත්නා මහජන අවිශ්වාසය පාර්ලිමේන්තු අතුරු මැතිවරණ ප්‍රතිඵල සහ පළාත් පාලන ඡන්ද ප්‍රතිඵල ඇතුළුව විවිධාකාරයට මනාව පැහැදිලි වන හෙයින් ද, රජය බලයට පැමිණි අවස්ථාවේ පටන් දිගටම ගෙන යන ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිගාමී ප්‍රතිපත්ති කිසියම් අන්දමකට හෝ වෙනස් කිරීමට උනන්දුවක් නැති බව පෙනෙන හෙයින් ද, එහි ප්‍රතිඵලයක් වශයෙන් ලක්වැසි බහු ජනතාවගේ අයිතිවාසිකම් විදේශීය අධිරාජ්‍ය වාදීන්ටත්, ඔවුන්ගේ දේශීය ඒජන්ත වරුන්ටත්, ආධාරකරුවන්ටත් පාවාදී ඇති හෙයින් ද ;

නැගී එන ආර්ථික අර්බුද සහ ජනතා ප්‍රශ්න ක්‍රියාශීලීවූද අංග සම්පූර්ණවූද ප්‍රතිපත්ති සහිත ක්‍රියා මාර්ගයකින් විසඳීමට රජය මුළුමනින්ම අසමත් නිසා එම අදක්ෂතාවය විවිධ පරිපාලන විස්තර රැසකින් වසන් කිරීමට දරන ප්‍රයත්නය උතුමාණන් වහන්සේගේ කථාවෙන් පැහැදිලිව පෙනෙන හෙයින් ද ;

රජය දුන් පොරොන්දු ඉටු නොකිරීමෙන් හා අවස්ථාවාදී උපක්‍රම සහ ප්‍රතිගාමී ප්‍රතිපත්ති හේතු කොටගෙන රජය වෙත එල්ල වෙන විපාක මග

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හරින්ට උත්සාහ කරමින් දිගින් දිගටම හැකි තාක් කල් බලයේ එල්ලී සිටීමට උත්සාහ දරීම උතුමාණන් වහන්සේගේ ආණ්ඩුවේ ප්‍රධාන අරමුණ බව පෙනෙන අතර, වැදගත් ජාතික ප්‍රශ්න බොහොමයක්ම මග හරිමින් ප්‍රකාශවන දේශපාලන දෙබිඩි කථා වලින් උතුමාණන් වහන්සේගේ කථාව පිරී ඇති බැවින් ද,

උතුමාණන් වහන්සේගේ කථාවෙහි විශේෂ වශයෙන් :—

(අ) එදිනෙදා ජීවිතයට උවමනා කරන අවශ්‍ය භාණ්ඩවල මිළ ඉහළ නැගීම හා හිඟකම නිසා ජනතාවට මුහුණ පාන්නට සිදුවී තිබෙන කරදර දුක් ගැහැට මග හැරවීම පිණිස කිසිම පියවරක් යෝජනා කරනු තබා බඩුවල අධික මිළ හා බඩු හිඟය පිළිබඳව වචන මාත්‍රයක්වත් සඳහන් නොකර ඇති හෙයින් ද ;

(ආ) වැඩිවී යන රක්ෂා හිඟය නිසා අනාථව බලාපොරොත්තු සුන්ව හා කළකිරීමෙන් යුතුව සිටින ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වූවන් හා විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය ලබා ගත් දස දහස් දෙනා ඇතුළු ලක්ෂ සංඛ්‍යාත තරුණ තරුණියන්ගේ රැකිරක්ෂා ප්‍රශ්නය ගැන සඳහනක්වත් නැති හෙයින් ද ;

(ඉ) දේශපාලන හා පෞද්ගලික විරුද්ධවාදීන්ගෙන් විවිධ ලෙස පළිගැනීම පිණිස පාවිච්චි කරමින් මේ රජයේ කාලසීමාව තුළ අවුරුදු දෙකහමාරකටත් වැඩි කාලයක් මුළුල්ලේ අයුක්ති සහගතව පවත්වාගෙන යන හදිසි තත්ත්වය අහෝසි කිරීම ගැන අදහසක්වත් සඳහන් නොකිරීමෙන් ද ;

(ඊ) ලංකාවේ සමගිතාවය හා අඛණ්ඩභාවයට තර්ජනයක්වූ, රාජ්‍ය භාෂාවේ තත්ත්වය අඩපණ කරන්නාවූ උතුරු නැගෙනහිර පළාත් හැර ලංකාවේ අනික් පළාත්වල වාසය කරන, දෙමළ නොවන, රටවැසියන්ට එම පළාත් දෙක තුළ රජය විසින් දෙනු ලබන ඉඩම් ගැනීමට ඇති අයිතිවාසිකම තහනම් කරන්නාවූ, කොන්දේසි ඇතුළත් කරමින්, එක්සත් ජාතික පක්ෂයේ හා ලංකා ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ නායකයන් විසින් 1965 මාර්තුවේදී රහසේ ඇතිකරගත් අධම ගිවිසුම ක්‍රියාත්මක කිරීම පිණිස ගන්නා ලද අලුත්ම පියවර වූ දිස්ත්‍රික් සභා පිහිටුවීමට විරුද්ධ බව පැන නැගුණ මහජන උද්ඝෝෂණ නොතකා එම රහස් ගිවිසුම ක්‍රියාත්මක කිරීමට දරන ප්‍රයත්නය අත්හැරීමට ආණ්ඩුව අදහස් නොකරන බව පෙනී යන හෙයින් ද ;

(උ) නොයෙකුත් පරිපාලන සංශෝධන මගින් නිදහස් අධ්‍යාපනය සීමා කිරීම හා අඩපණ කිරීම නිසා මේ ආණ්ඩුව විශ්ව විද්‍යාලයේ සිට පහළට අධ්‍යාපන ක්‍රමය අවුල් කිරීම අත්හැර දමන අදහසක් එළි නොකරන හෙයින් ද ;

(ඌ) විදේශ කටයුතුවලදී මධ්‍යස්ථ ප්‍රතිපත්තියෙන් බැහැරව නිතර නිතර ගුප්ත ක්‍රියා කිරීම නැවැත්වීමට රජය අදහස් කරන බවක් නොදක්වන හෙයින් ද ;

(එ) රාජ්‍ය භාෂාව උසාවි භාෂාව කිරීමට පටන් ගැනීමටවත් යෝජනාවක් අඩංගු නොවන හෙයින් ද ;

(ඒ) තමන් අයිති කුලය නිසා සමාජයේ සමානාත්මතාව නොලැබෙන අයගේ අයිතිවාසිකම් තහවුරු කිරීමටත්, විශේෂයෙන්ම සුළු ද්‍රවිඩ ජනතා නැමැති අයට ඔවුන්ගේ වර්තමාන උද්ඝෝෂණය පරිදි දැනට විදින්ට වී ඇති විෂමතා හා අවමාන අස් කිරීම පිණිසත්, 1957 සමාජ දුබලතා වැළැක්වීමේ පනත ප්‍රාණවත් කිරීමට අවශ්‍ය සංශෝධන යෝජනා කර නොමැති හෙයින් ද ;

(ඔ) රජයේ වෘත්තීය සංගම් විරෝධී ප්‍රතිපත්තියට අනුකූලවන පරිදි, ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ වැඩි කොටස හෙළා දකින, ජයවර්ධන කාරක සභාවේ පක්ෂග්‍රාහී හා ප්‍රතිගාමී වාර්තාව අනුව වෘත්තීය සංගම් ආඥාපනත සංශෝධනය කිරීමට අදහස් කරන හෙයින් ද ;

(ඕ) මෙරට නිපදවන ආහාර ද්‍රව්‍ය පාරිභෝගිකයාට සැපයීමේ දෘෂ්‍යමාන වැඩිවීමක් හෝ එහි මිළ අඩුවීමක් හෝ පෙනෙන්නට නැති බැවින් ඊනියා ආහාර වගාවේ සාර්ථකත්වය සත්‍ය වශයෙන්ම පුහු ඝෝෂාවක් බව පිළිගෙන නැති හෙයින් ද ;

(අ) ඔබගේ රජයේ කැපී පෙනෙන නිර්ලජ්ජා අංශයන් වන දේශපාලන හිතවත්කම උඩ වැඩි සැළකීම, දූෂණවලට ඉඩ තැබීම, දේශපාලනමය සහ පෞද්ගලික විරුද්ධවාදීන් පෙළීමට රාජ්‍ය තන්ත්‍රය යෙදීම යනාදී දේ අත්හැර දැමීමට උත්සාහ දරන බව පෙනෙන්නට නැති හෙයින් ද ;

උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි අපගේ විශ්වාසයක් නොමැත."—[ඉලංගරත්න මයා.]

" எனினும், பாராளுமன்ற உப தேர்தல் முடிவுகள் உள்ளூராட்சிச் சபைத் தேர்தல் முடிவுகள் உட்படப் பல்வேறு வழிகளில் அரசாங்கத்தின் நோக்கங்கள் மீது அவநம்பிக்கையையும், அதன் கொள்கைகள் மீது என்றும் வளர்ந்துவரும் எதிர்ப்பையும், பொது மக்கள் வெளிக்காட்டியிருந்துங்கூட மேன்மைதங்கிய

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தங்கள் அரசாங்கம் பதவியேற்ற காலம் தொடக்கம் பின்பற்றி வந்துள்ளதும், அந்நிய ஏகாதிபத்தியத்துக்கும், அதன் உள்ளூர் ஆதரவாளர்களுக்கும், முகவர்களுக்கும் இலங்கை மக்களின் சீவாதார உரிமைகளைத் தியாகம் செய்யும் விளைவை யேற்படுத்திவிட்டதுமான ஜனநாயக விரோதமானதும் பிற்போக்கானதுமான அடிப்படைக் கொள்கைகளை மாற்றும் நோக்கம் எதற்குமான அறிகுறிகளைத் தெரிவிக்காதபடியாலும்,

வளர்ந்துவரும் பொருளாதாரப் பிரச்சினைகளையும் மக்களின் ஏனைய பிரச்சினைகளையும் கையாள்வதற்குத் திட்டவட்டமான, விசாலமான கொள்கையை வகுத்துக் கொள்வதில் அடிப்படையிலான இயலாமையை நானுவித நிர்வாக விபரங்களின் பின்னல் அரசாங்கம் மறைக்க முயலுவதாக சிம்மாசனப் பிரசங்கம் எடுத்துக்காட்டுவதாலும்,

மேலும், அவசர தேசிய முக்கியத்துவமான பிரச்சினைகளில் தங்கள் பிரசங்கம் இரட்டைப் பேச்சுகளும் அரசியல் நேர்ப்பதிலின்மைகளும் மலிந்ததாயிருப்பதுடன், பிற்போக்குக் கொள்கைகள், சந்தர்ப்பவாத சூழ்ச்சிகள் நிறைவேற்றுத வாக்குறுதிகள் ஆகியவற்றின் தவிர்க்க முடியாத விளைவுகளிலிருந்து, ஒரு புறத்தில், தப்பிவிட முயல்வதுடன் மறு புறத்தில் இயன்றளவு காலம் பதவியில் ஒட்டிப் பிடித்துக் கொண்டிருப்பதற்கான வழிவகைகளைக் காண்பதே தங்கள் அரசாங்கத்தின் பிரதான தூண்டுதலாக இருக்கின்றதாக தங்கள் பிரசங்கம் எடுத்துக்காட்டுவதாலும்,

மேலும் குறிப்பாகத் தங்கள் பிரசங்கம்—

(அ) மக்களுக்குக் கஷ்டங்களையும் தொந்தரவுகளையும் ஏற்படுத்திவிட்ட நிலைமைக்குப் பரிகாரம் தேடும் நடவடிக்கைகளுக்கான உத்தேசங்களைத் தெரிவிப்பது ஒருபுறமிருக்க, நாளாந்த வாழ்க்கையின் அத்தியாவசியப் பொருட்களில் இவ்வாறுன உயர்ந்த வாசிகள், பற்றுக் குறைகள் என்ற நிலைமை பற்றிக் குறிப்பிடத்தானுமில்லை என்பதாலும்,

(ஆ) பல்லாயிரக்கணக்கான சிரேட்ட தராதரப் பத்திரம் பெற்றவர்கள் பல்கலைக்கழகப் பட்டதாரிகள் உட்பட பல இலட்ச மக்களுக்கு மனச்சோர்வும், மனச் சலிப்பும் ஏற்படுத்திச் சோம்பல் நிறைந்த வாழ்க்கைக்கு அவர்களைத் தீர்த்திருக்கும் வளர்ந்துவரும் வேலையின்மைப் பிரச்சினை பற்றித் தொடு கூற்று ஒன்றுத்தானும் கூறத் தவறிவிட்டபடியாலும்,

(இ) பல்வேறு வழிகளில் தனிப்பட்ட எதிரிகள் மீதும் அரசியல் எதிரிகள் மீதும் பழி வாங்குவதற்குப் பயன்படுத்தப்பட்டு வருவதும் இந்த அரசாங்கத்தின் பதவிக்காலத்தின் இரண்டரை வருடங்களுக்கும் மேலாக நீடித்திருப்பதும் நியாயமற்றதுமான அவசரகால நிலையை அகற்றுவதற்கான நோக்க மெதையும் அரசாங்கம் கொண்டிருக்கவில்லை என்பதை எடுத்துக் காட்டுவதாலும்,

(ஈ) ஐக்கிய தேசியக் கட்சியினதும் இலங்கைத் தமிழ் அரசுக் கட்சியினதும் தலைவர்களிடையே 1965, மார்ச் மாதம் இரகசியமாக ஏற்பட்ட ஒப்பந்தத்தின் நிபந்தனைகளை நிறைவேற்றுவதைக் கைவிடும் உத்தேசம் அரசாங்கத்திற்கு இல்லையென்றும் இத்தகைய நடவடிக்கைகளில் மிகப்பிந்தியதான மாவட்ட சபைகள் நிறுவும் முயற்சிக்குப் பொது மக்கள் பரந்த அளவில் எதிர்ப்பு காட்டியுங்கூட மேலும் இத்தகைய துரோகமான ஒப்பந்தத்தை நிறைவேற்றுவது இலங்கையின் ஒற்றுமையையும் தேசிய ஒருமைப்பாட்டையும் பயமுறுத்தியும் அரசகரும மொழியின் நிலையைப் பலவீனப்படுத்தியும், வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு வெளியேயுள்ள தமிழரல்லாத குடி மக்கள் இம்மாகாணங்களில் அரசாங்கம் வழங்கும், காணிகள் பெறும் உரிமையை மறுத்து வருவதாயிருந்துங்கூட இம்முயற்சியைக் கைவிடும் நோக்கமில்லையென்றுங் காட்டுவதாலும்,

(உ) பல்வேறு நிருவாகப் புனரமைப்புக்கள் மூலம் பல்கலைக்கழகம் தொட்டு கீழ்ப்படிகள் வரையிலான கல்வித் திட்டத்தில் குழப்ப நிலையை ஏற்படுத்துவதன் மூலம் இலவச கல்வித்திட்டத்தைக் கட்டுப்படுத்திப் பலவீனப் படுத்தும் முயற்சியைக் கைவிடும் நோக்கத்தை வெளிப்படுத்தாததாலும்,

(ஊ) வெளிநாட்டு விவகாரங்களில் கட்சி சேராக் கொள்கையிலிருந்து அடிக்கடி கள்ளத்தனமாக விலகி நடப்பதை நிறுத்திக்கொள்ளும் நோக்கம் அரசாங்கத்துக்கு உண்டென்பதைக் காட்டாததாலும்,

(எ) நீதி மன்றங்களில் அரசகரும மொழியைப் புகுத்துவதை ஆரம்பிப்பதற்கான எந்தவொரு உத்தேசத்தைத் தானும் கொண்டிருக்காதபடியாலும்,

(ஏ) தமக்கு இழைக்கப்படும் பல்வேறு விதமான பாரபட்சமும் அவமரியாதையும் நிறுத்தப்பட வேண்டுமென்று கோரிக்கொண்டிருக்கும் சிறுபான்மைத் தமிழரைக் குறிப்பாக உள்ளடக்கி, சாதியின் அடிப்படையில் சமூக சமத்துவம் மறுக்கப்பட்டிருப்பவர்களைப் பாதுகாப்பதற்கு வலு மிகுந்ததும் கூடிய பயன் பயப்பதுமான வகையில் 1957 ஆம் ஆண்டின் சமூகக் குறைபாட்டுத் தடுப்புச் சட்டத்தை திருத்தும் உத்தேசம் கொண்டிருக்காதபடியாலும்,

(ஐ) இலங்கையின் தொழிற் சங்க இயக்கத்தின் மிக பரவலான பகுதியினரால் கண்டிக்கப்பட்ட ஜய வர்த்தனக் குழுவின் பிற்போக்கானதும், பக்கச் சார்ந்ததுமான அறிக்கையின் அடிப்படையில், அரசாங்கம் தனது பொதுவான தொழிற் சங்கக் கட்டளைச் சட்டத்துக்குத் திருத்தங்கள் கொண்டுவர உத்தேசித்திருப்பதாகக் காட்டுவதாலும்,

(ஒ) உணவு உற்பத்தி இயக்கத்தில் அரசாங்கம் பெரிது படுத்திக் காட்டும் தனது வெற்றிகளை நுகர்வாளர்க்குக் கிடைக்கும் உள்ளூரில் விளைந்த உணவுப் பொருட்களின் தொகை அதிகரிப்பின்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

மூலமோ அவற்றின் விலைகளில் குறிப்பிடக் கூடிய இறக்கத்தின் மூலமோ காணக்கூடியதாயில்லை என்ற உண்மையை கணக்கிற்கொள்ளத் தவறுவதாலும்,

(ஓ) இந்த அரசாங்கத்தின் குறிப்பான, அபகீர்த்தி நிறைந்த அம்சமாயிருக்கும் அரசியற் பாரபட்சம், ஊழலைச் சகித்தல், அரசியல் எதிரிகளையும் தனிப்பட்ட எதிரிகளையும் உத்தியோக தோரணையில் துன்புறுத்தல் ஆகியவற்றைக் கைவிடும் நோக்கமுண்டென்று காட்டாதிருப்பதாலும்,

மேன்மை தங்கிய தங்கள் அரசாங்கத்தில் எமக்கு நம்பிக்கையில்லை."—[திரு. இலங்கரத்ன]

"but inasmuch as Your Excellency's Government, despite the ever-growing public opposition to its policies and distrust of its intentions that have been manifested in various ways including in the results of parliamentary by-elections and local government elections, has given no indication that it intends to change in any way the basic anti-democratic and reactionary policy that it has followed since it assumed office and which has resulted in the sacrifice of the vital interests of the people of Ceylon to those of foreign imperialism and its local agents and supporters,

and as the Address shows that the Government seeks to hide behind a collection of miscellaneous administrative details its fundamental inability to evolve a positive and comprehensive policy to deal with the growing economic crisis and other problems of the people,

and moreover as the Address is full of political evasions and double-talk on most matters of urgent national importance and indicates that the main consideration that animates Your Excellency's Government is to find ways and means to cling on to office for as long as possible, while seeking to escape from the inevitable consequences of its own broken promises, opportunistic manoeuvres and reactionary policies, and in particular as the Address—

(*a*) does not even mention the high prices and scarcities of essential goods in everyday use, let alone propose any steps to remedy this situation which has brought about great difficulties and hardships for the people ;

(*b*) fails to make even a passing reference to the ever-growing problem of unemployment, which condemns several lakhs of persons including tens of thousands of S. S. C. qualified and university-educated young people to a life of idleness, frustration and despair ;

(*c*) reveals no intention on the part of the Government to end the unjustified State of Emergency which has existed for over two and a half years of this Government's term of office and has also been used by the Government to inflict vengeance on political and personal opponents in various ways ;

(*d*) shows that the Government does not intend to abandon its efforts to implement the terms of the agreement drawn up in secret in March 1965 between the leaders of the United National Party and the Ilankai Thamil Arasu Kadchi, despite the overwhelming public opposition to the latest of these efforts, namely the attempt to establish District Councils and also despite the fact that the implementation of this nefarious agreement threatens the unity and state integrity of Ceylon, undermines the position of the Official Language, and denies non-Tamil citizens resident outside the Northern and Eastern Provinces any right to obtain land distributed by the State in these provinces ;

(*e*) does not disclose any intention by the Government to abandon its efforts to restrict and undermine the free education scheme by various administrative re-arrangements, thereby creating a chaotic situation in the educational system from the universities downwards ;

(*f*) does not show that the Government intends to put a stop to its repeated furtive attempts to depart in practice from the policy of non-alignment in external affairs ;

(*g*) does not contain any proposal even to begin the introduction of the official language into the courts ;

(*h*) does not propose to amend the Prevention of Social Disabilities Act of 1957 in order to make it a stronger and more effective instrument to protect those who are denied social equality on the grounds of the caste to which they belong, and, in particular, the so-called Minority Tamils who are at the moment demanding that the various discriminations and indignities to which they are subject should be ended ;

(*i*) indicates that the Government in line with its general anti-trade union policy intends to base its proposals to effect amendments

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

to the Trade Unions Ordinance on the biassed and reactionary report of the Jayawardene Committee which has been condemned by the widest sections of the trade union movement in Ceylon ;

(*j*) fails to take account of the fact that the tall claims made by the Government about the success of its so-called food drive are not reflected in any reduction in the prices or any noticeable increase in the supply to the consumer of locally-grown foodstuffs ; and

(*k*) does not show that the Government intends to give up the political favouritism, tolerance of corruption, and official persecution of political and personal opponents which are a marked and scandalous feature of its regime ;

we have no confidence in Your Excellency's Government. "—[*Mr. Ilangaratne.*]

II

" එනෙකුදුවුවත්, දිස්ත්‍රික් සභා පිහිටුවීම පිණිස ව්‍යවස්ථා ඉදිරිපත් නොකරන ලෙස අපි උතුමාණන් වහන්සේගේ රජයෙන් ඉල්ලා සිටිමු. "—[ඉලංගරත්න මයා.]

" எனினும், மாவட்ட சபைகள் அமைப்பதற்குச் சட்டம் கொண்டு வரவேண்டாமென மேன்மை தங்கிய தங்கள் அரசாங்கத்தைக் கேட்டுக்கொள்கிறோம். "—[திரு. இலங்கரத்தின]

" but we request Your Excellency's Government not to present legislation to establish District Councils ".—[*Mr. Ilangaratne.*]

III

" එනෙකුදුවුවත්, දැනට ප්‍රංශයෙහි වියට්නාම් යුද්ධය සමථය කිරීමට පවත්වන සාම සාකච්ඡාවල සතුටු දායක ප්‍රතිඵල ලැබිය හැක්කේ පළමුකොට අමෙරිකානු එක්සත් ජනපදය වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී ජන රජයට බෝම්බ දැමීම ආදී ආක්‍රමණික ක්‍රියා වහාම නවතා දකුණු වියට්නාමයෙන් තම සන්නාහ සන්නද්ධ හමුදා අස්කර ගැනිමට සතුට ප්‍රකාශ කළහොත් පමණක් බව අපගේ හැඟීමයි. "—[ඉලංගරත්න මයා.]

" ஆனால், ஐக்கிய அமெரிக்க இராச்சிய அரசாங்கம் வியட்நாம் ஜனநாயகக் குடியரசுக்கு எதிராகக் குண்டு வீசுவதையும், ஏனைய பகைமை நடவடிக்கைகள் மேற்கொள்வதையும் முதலில் நிறுத்தி, தென் வியட்நாமிலிருந்து ஆயுதப் படைகளை வாபஸ் பெறுவதற்கு அது ஆயத்தமாக இருக்கிறதென்பதையும் தெரிவிக்குமேயானால் வியட்நாம் யுத்தம் பற்றி இப்பொழுது பிரான்சில் நடைபெறுகின்ற பேச்சுவார்த்தைகளில் மிக திருப்திகரமான முன்னேற்றம் காணமுடியுமென்பது எமது அபிப்பிராயமாகும். " —[திரு. இலங்கரத்ன]

" but it is our view that the talks now taking place in France in regard to the war in Vietnam can make most satisfactory progress if in the first instance the Government of the United States of America stops its bombing and other hostile acts against the Democratic Republic of Vietnam and also expresses its readiness to withdraw its armed forces from South Vietnam ".—[*Mr. Ilangaratne.*]

IV

" ඒසේ වුවද, හය වෙනි පාර්ලිමේන්තුවේ හතර වැනි සැසි වාරය විවෘත කරමින් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් කරන ලද කථාව පිළිබඳව පහත දැක්වෙන කරුණු නිසා මගේ කණගාටුව පළ කරමි :—

(අ) ඊනියා නිදහස ලැබී විසි වසරක් ගත වී අපේ ආර්ථිකය මත අද මේ වනතුරුත් විදේශික අධිරාජ්‍යවාදයේ ඇති ග්‍රහණය පිළිබඳවත්, මෙම ආණ්ඩුව විසින් අපේ ආර්ථිකය විදේශික අධිරාජ්‍යවාදයේ විය ගසට වඩා තදින් බැඳීමට දිගින් දිගටම ගත් පියවරවල් ගැනවත්, කිසිවක් සඳහන් නොවීම ;

(ආ) පසුගිය අවුරුද්දේ හාල් සලාකයෙන් අඩක් කපා දැමීමටද, දෙවරෙක රුපියලේ අගය අඩු කිරීමටද, හේතුවූ, දැනට පවත්නා මහ ආර්ථික අර්බුදය එනම් 1929-31 අර්බුදයෙන් පසුව ඇතිවූ බරපතලම අර්බුදය ගැන හා ඉහත කී පියවරවල් ගැන්ම නිසා ජීවන වියදම අහස උසට නැගීම හා ඇතිවූ පාරිභෝගික භාණ්ඩ හිඟය ගැන නිවැරදි විග්‍රහයක් එහි නොමැතිවීම ;

(ඇ) ජීවන වියදම පහළ බස්වා ජන සමූහයන්ට සහනය සැලසීමට හෝ බරපතල ප්‍රමාණයන්ට වැඩී ඇති උග්‍රවන රැකියා ප්‍රශ්නය විසඳීමට හෝ කිසිදු යෝජනාවක් එහි නොවීම ;

(ඈ) දැරිය නොහැකි අන්දමින් ජීවන වියදම ඉහළ යැමත්, ඒ හේතුවෙන් ජීවන තත්ත්වයන් පහල වැටීම නිසා අසීරු තත්ත්වයකට මුහුණ පා සිටින කම්කරුවන්ට, ගොවීන්ට හා මැද පංතීන්ට සහනය සැලසීම සඳහා කිසිදු යෝජනාවක් අඩංගු නොවීම ;

(ඉ) 1967 හා 1968 වාර්තා බිඳ හෙලන අස්වැන්න ලැබුවායයි කයිවාරු කීවද, ආහාර වගාව දියුණු කිරීම සඳහා වන ආණ්ඩුවේ ව්‍යාපාරය සාර්ථක බව කියා පෑවද, කැපූ හාල් සලාකය නැවත ලබාදීමට කිසිදු යෝජනාවක් අඩංගු නොවීම ;

(ඊ) මෙම ආණ්ඩුව බලයේ සිටි මාස 39කින්, මාස 30ක් නිස්සේම පවත්වා ගෙන යන හදිසි අවස්ථාව ඉවත් කිරීමට හා ජනතාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් නැවත ලබාදීමට කිසිදු යෝජනාවක් අඩංගු නොවීම ;

(උ) අප නිර්යාත වැවිලි එකක් දෙකක් මත සම්පූර්ණයෙන්ම යැපීමෙන් මුදාගනු වස්, අප ආර්ථිකය විවිධාකාර කිරීම උදෙසා මේ රටේ වේගවත් කර්මාන්තමය කිරීම කට භාජන කිරීම සඳහා කිසිදු ක්‍රමානුකූල සැලැස්මක් ඒ තුළ නොවීම ;

(ඌ) ලංකාව ආහාර අතින් ස්වයංපෝෂිත වීමේ ප්‍රගති මාර්ගයට එකම විශාලතම බාධකය වී ඇති කෘෂිකර්මය සඳහා වාරිමාර්ග පහසුකම් හීනවීමේ ප්‍රශ්නය විසඳාලීම උදෙසා විදේශීන් සතු තේ වතු පවරාගෙන, කඳු මුදුන් නැවත වනගත කිරීමෙන් පස සෝදා යැමේ ප්‍රශ්නය විසඳාලීමටද, තැනිතලා බිම්වල ගොවිතැන් කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා, නාස්තියකින් තොරව වැහි ජලය ගෙන යැම පිණිස අපේ ගංගා භාර ගැඹුරු කිරීමටද, කිසිදු යෝජනාවක් එහි අඩංගු නොවීම ;

(එ) සමාජ අවහිර වැළැක්වීමේ පනත ක්‍රියාවේ යෙදවීමට හෝ උතුරු ලංකාවේ පවත්නා ස්පර්ශ නොකිරීමේ නින්දිත තත්වය හා කුල පීඩනය මුලිනුපුටා දැමීමට ආණ්ඩුව ඕනෑකමක් දක්වන බවක් වත් එයින් ප්‍රකාශ නොවීම ;

(ඒ) මේ රටේ අධ්‍යාපනය හා සමාජ ක්‍රමයේ මූලික වෙනසක් ඇති කිරීමට ශිෂ්‍යයින්ගේ සිත් යොමු කර ඇති, ඔවුන් තුළ ඇති කළ කිරීමට හේතු භූත වූ ප්‍රශ්නයන් වන, දේශන ශාලා නැතිකම, ප්‍රමාණවත් ආචාර්ය මණ්ඩලයක් නොවීම, ප්‍රමාණවත් පුස්තකාල පහසුකම් හා දුප්පත් සිසුන්ට අවශ්‍ය ශිෂ්‍ය ආධාර නොගෙවීම, විභාග ගාස්තු වැඩි කිරීම, විශ්ව විද්‍යාලවල උප කුලපතිවරුන් ලෙස ශාස්ත්‍රීය අංශයෙන් සුදුසුකම් නැති පරිපාලකයින් පත් කිරීම ආදී ප්‍රශ්නවලට කිසිදු සහනයක් එහි අඩංගු නොවීම ;

(ඔ) මෙම ආණ්ඩුව විසින් ඇති කළේය කියන බොරු ජාතික සමගිය—එනම් ඈත්ත වශයෙන්ම දෙමළ සිංහල දෙජාතීන්ගේ ජන සමූහයන් අතර නොව. ඔවුන් අතර ප්‍රතිගාමී බල වේගයන්ගේ සමගියක් පමණක් වන සමගිය හෙළිදරව් කළාවූ, ආණ්ඩුව ප්‍රතිගාමී පෙඩරල් පක්ෂය සමග ඇති කර ගත් රහස් ගිවිසුම, ගරු කිරීමට යාමෙන් රටේ ඇති වූ අසමගිය ගැන සඳහනක්වත් එහි නොවීම ;

(ඕ) පසුගිය අවුරුදු 37 තිස්සේම පැවතියද, අදත් මේ රට මත ඇති අධිරාජ්‍යවාදී—ධනවාදී සූරාකෑමේ ක්‍රමය මදකුදු වෙනස් නොකළාවූද, කපටි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් අප මත බලහත්කාරයෙන් පටවන ලද්දා වූද, ධනේශ්වර පාර්ලිමේන්තු ක්‍රමයේ බංකොළොත් භාවය පෙන්නුම් කර දීම නොසලකා හැරීම ;

(ක) එක්සත් ජනපද අධිරාජ්‍යවාදය, වියට්නාම් ජනතාවට එරෙහිව කරන ආක්‍රමණය ගැන මේ රටේ ජනතාව දරන මතය වන, එක්සත් ජනපද හා ඔවුන්ගේ පරිවාර හමුදා සම්පූර්ණයෙන්ම වියට්නාමයෙන් ඉවත්විය යුතුය ; ඔවුන්ගේ සියලු කඳවුරු දකුණු වියට්නාමයෙන් ඉවත් කළ යුතුය ; ප්‍රජාතන්ත්‍රවාදී උතුරු වියට්නාම් ජනතාවට එරෙහිව කරන බෝම්බ දැමීම සම්පූර්ණයෙන් අත් හිටුවිය යුතුය ; තම අනාගතය තීරණය කිරීමට වියට්නාම ජනතාවටම භාර දිය යුතුය ; යන ඉල්ලීම් එයින් කිසිදු අයුරකින් ප්‍රකාශ නොවීම.

(ග) අමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ඔත්තු සේවාවේ (සී.අයි.ඒ) අංශයක් ලෙස එළිදරව් වී ඇති දූර්ජන සාම හමුදාවට මේ රටට නැවත පැමිණෙන්නට අවසර දීමෙනුත්, අපගේ ජනතාවට එරෙහිව යටිකුට්ටු වැඩවල යෙදීම සඳහා අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේ "හෝප් නැවට" කොළඹ වරායේ නැංගුරම් දමාගෙන සිටීමට අවසර දීමෙනුත් පෙන්වා දෙන පරිදි, එම ආණ්ඩුව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අණ පරිදි ක්‍රියා කරන්නේය යන සත්‍ය තත්වය පැහැදිලි කිරීමට අපොහොසත් වීම ආදිය නිසාය.

එම නිසා මෙම සභාව ඔබේ ආණ්ඩුව කෙරෙහි කිසිදු විශ්වාසයක් නැති බව ප්‍රකාශ කර සිටින්නිය."—[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

"எனினும், ஆறுவது பாராளுமன்றத்தின் நான்காவது கூட்டத் தொடரின் ஆரம்பத்தின்போது மேன்மை தங்கிய தாங்கள் நிகழ்த்திய உரையில்—

(1) இருபது வருடங்களாகச் சுதந்திரம் அடைந்திருக்கின்றோம் என்று கூறப்பட்ட போதிலும், எமது பொருளாதாரத்தில் அந்நிய ஏகாதிபத்தியம் தொடர்ச்சியாக வகித்துவரும் இறுக்கமான பிடிப்பைப் பற்றியோ அந்நிய ஏகாதிபத்தியத்தின் தேர்ச்சில்லில் எமது நாட்டுப் பொருளாதாரத்தை விலக முடியாதபடி இறுக்கமாக இணைப்பதற்கு இவ்வரசாங்கத்தால் அடுத்தடுத்து எடுக்கப்பட்ட நடவடிக்கைகள் பற்றியோ குறிப்பிடாததையிட்டும்,

(2) எமது பங்கீட்டரிசியைப் பாதியாக குறைத்துள்ளதற்கும், சென்ற ஆண்டு இரு முறைகள் ரூபாவின் மதிப்பைக் குறைந்துள்ளதற்கும் அதன் காரணமாக வாழ்க்கைச் செலவு வானளாவ உயர்ந்துள்ளதற்கும், அத்தியாவசியப் பொருட்களுக்குத் தட்டுப்பாடு ஏற்பட்டுள்ளதற்கும் காரணமான, குறிப்பாக, 1929–31 ஆம் ஆண்டு முதல் எமது நாட்டை எதிர்நோக்கியுள்ள

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

மிகவும் மோசமான பொருளாதார நெருக்கடி பற்றித் தெளிவான ஆராய்வு இடம் பெறுததை யிட்டும்,

(3) வாழ்க்கைச் செலவைக் குறைத்து அதன் மூலம் மக்களின் துயரைத் தீர்ப்பதற்கும் மிகவும் உச்சக்கட்டத்தை அடைந்துள்ள வேலையில்லாத் திண்டாட்டத்தைத் தீர்ப்பதற்கும் எத்தகைய ஆலோசனைகளும் இடம் பெறுததையிட்டும்,

(4) விலைவாசியின் தாங்கமுடியாத உயர்வு காரண மாக வாழ்க்கைத் தரம் பாதிக்கப்பட்டுள்ள தொழிலாளர்கள், விவசாயிகள், நடுத்தர வர்க கத்தினர் ஆகியோருக்கு நிவாரணமளிப்பதற்கு மான எத்தகைய ஆலோசனைகளையும் குறிப் பிடாததையிட்டும்,

(5) 1967, 1968 ஆம் ஆண்டுகளில் அதிக விளைச்சல் எனத் தம்பட்டமடித்த போதிலும் உணவு உற்பத்திப் பெருக்கத்துக்கான அரசாங்கத்தின் நடவடிக்கைகள் பூரணமாக வெற்றியளித்துள் ளது என்று பெருமையடித்துக் கொள்ளும் அதே நிலையிலும் வெட்டிய அரிசியை மீண்டும் மக்களுக்குக் கொடுப்பது சம்பந்தமாக எதுவும் குறிப்பிடாததையிட்டும்,

(6) இந்த அரசாங்கம் பதவியிலிருந்து முப்பத்து ஒன்பது மாதங்களில், முப்பது மாதங்களாக இருந்துவருகின்ற அவசரகால நிலைமையை அகற்றி மக்களுடைய ஜனநாயக உரிமைகளை மீண்டும் பெறச் செய்வதற்கான எத்தகைய திட்டத்தையும் குறிப்பிடாததையிட்டும்,

(7) இரண்டொரு ஏற்றுமதிப் பொருட்களில் மாத் திரம் தங்கியிருக்கும் எமது பொருளாதாரத் தைப் பலவகைப்பட்ட பொருளாதாரமாக மாற்று வதற்கேதுவாகத் துரிதமான கைத்தொழில் வளர்ச்சியை ஏற்படுத்துவதற்கான சரியான திட்ட மிடப்பட்ட பொருளாதாரத்தை நிறைவேற்று வதற்கான பிரேரணை எதையும் குறிப்பிடாத தையிட்டும்,

(8) எமது நாட்டுச் சமதரைகளில் வாழ்கின்ற விவ சாயிகளுக்குப் பயன்தரத்தக்கதாக விலைமதிப் பற்ற மழை நீரைக் கொண்டு செல்லக்கூடிய விதத்தில் எமது ஆறுகளை அவற்றிலுள்ள சேறுகளை அகற்றி ஆழமாக்கி, அந்நியர்களுக் குச் சொந்தமான தேயிலைத் தோட்டங்களைத் தேசியமயமாக்கி, மலை உச்சிகளில் காடு வளர்த்து மண் அரிவைத் தடுத்து, எமது நாட்டு உணவுத் தேவையைப் பூர்த்திசெய்வதற்கான வளர்ச் சிக்கு பெருந்தடையாயிருக்கக்கூடிய நீர்ப் பாசன வசதியின்மையை இல்லாமல் செய்து எமது விவசாயப் பிரச்சினையைத் தீர்ப்பதற் கான எத்தகைய திட்டத்தையும் குறிப்பிடா ததையிட்டும்,

(9) சமூகக் குறைபாட்டுத் தடுப்புச் சட்டத்தை அமுல் செய்வதற்கோ, வட இலங்கையில் நிலவி வரு கின்ற இழிவான தீண்டாமைக் குறையை ஒழிப்ப தற்கோ அரசாங்கம் சற்றேனும் உறுதிகொண் டிருப்பதாக எடுத்துக்காட்டத் தவறியதையிட்டும்,

(10) விரிவுரை அறைகள் போதாமை, போதிய ஆசிரி யர்கள் இல்லாமை, போதிய நூல்நிலைய வசதி கள் இல்லாமை, உதவிப்பணம் தேவையான மாணவர்களுக்கு அது போதியளவு இல்லாமை, பரீட்சைக் கட்டணத்தை உயர்த்தியமை, பல் கலைக் கழகத் துறையில் அனுபவமில்லாத நிருவாகிகளைப் பல்கலைக் கழகங்களில் துணை வேந்தர்களாக நியமித்தமை, ஆகிய காரணங் களினால் பெரிதும் ஏமாற்றமடைந்து இந்நாட் டின் கல்வித்துறையிலும் சமூக அமைப்பிலும் பூரணமான, தீவிரமான ஒரு மாற்றத்தை ஏற்படுத்த வேண்டுமென்ற எண்ணத்தைக் கொண்டுள்ள மாணவர்களை எதிர்நோக்கியுள்ள பிரச்சினைகளுக்கு எவ்வித தீர்வையும் காட்டத் தவறியதையிட்டும்,

(11) இந்நாட்டின் சிங்கள, தமிழ் மக்களிடையே ஐக் கியத்தை ஏற்படுத்தாது சிங்களவர் தமிழர் மத்தியிலுள்ள பிற்போக்குச் சக்திகளிடையே மாத்திரம் ஐக்கியத்தை ஏற்படுத்தி இவ்வர சாங்கம் தம்பட்டமடிக்கின்ற போலித் தேசிய ஐக்கியத்தை அம்பலப்படுத்துகின்ற விதத்தில் பிற்போக்குத் தமிழரசுக் கட்சிக்கு அரசாங்கத்தா லளிக்கப்பட்ட இரகசிய வாக்குறுதிகளை நிறை வேற்றும் முயற்சியில் இந்நாட்டில் ஏற்படுத்திய ஐக்கியமின்மையைப் பற்றிக் குறிப்பிடாததை யிட்டும்,

(12) தந்திரசாலியான பிரித்தானிய ஏகாதிபத்தியம் எம்மீது திணித்துள்ள திறனற்ற முதலாளி த்துவ பாராளுமன்ற ஜனநாயகம் கடந்த முப்பத்தேழு வருடகாலமாக இருந்துங்கூட எமது நாட்டில் இன்றுவரை சிறிதும் குறை யாது தொடர்ந்து இருந்துவரும் ஏகாதிபத்திய முதலாளித்துவ சுரண்டல் முறையைப் பற்றி எதுவும் குறிப்பிடாததையிட்டும்,

(13) வியட்நாம் மக்கள் தமது எதிர்காலத்தை தாமே தீர்மானித்துக்கொள்வதற்கு அனுமதிப்பது, அமெரிக்க ஏகாதிபத்தியம் வியட்நாம் மக்கள் மீது தேவையற்ற ஆக்கிரமிப்பு நடத்துவது., அமெரிக்காவின் கூலிப்படைகளை வாபஸ் வாங் குவது, தென் வியட்நாமிலிருந்து அவர்களின் தளங்களை அகற்றுவது வட வியட்நாம் ஜன நாயகக் குடியரசு மீது நடத்தும் குண்டு வீச்சைப் பூரணமாக நிறுத்துவது ஆகிய பிரச்சினைகள் சம்பந்தமாக எமது நாட்டு மக்களின் விருப்பத் தைப் பிரதிபலிக்கத் தவறியதையிட்டும்,

(14) அமெரிக்காவின் மத்திய உளவு ஸ்தாபனத் தின் ஓர் அங்கமாக அம்பலப்படுத்தப்பட்ட பிர சித்தி பெற்ற அமெரிக்க சமாதானப் படையை மீண்டும் எமது நாட்டுக்கு வருவதற்கு அனுமதி யளித்ததாலும், எமது நாட்டு மக்களுக்கு எதிராக நாசகார வேலையில் ஈடுபடுவதற்கு அமெ ரிக்க ஏகாதிபத்தியத்தின் "ஹோப்" கப்பலைக் கொழும்புத் துறைமுகத்துக்குவர அனுமதி யளித்ததாலும் அமெரிக்க ஏகாதிபத்திய உத் தரவுகளுக்கு இந்த அரசாங்கம் அடிமைப் பட்டிருக்கின்ற தென்றும் உண்மையைக் குறிப் பிடத்தவறியதையிட்டும் வருந்துகிறோம்.

எனவே, இச்சபைக்கு தங்கள் அரசாங்கத்தில் நம்பிக் கையில்லை."—[திரு. எஸ். டி. பண்டாரநாயக்க]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"but regret that Your Excellency's Address at the opening of the Fourth Session of the Sixth Parliament—

(a) does not contain any reference to the continued stranglehold exercised on our economy by foreign imperialism despite twenty years of so-called independence ; nor to the successive steps taken by this Government to chain our economy ever more securely to the chariot wheels of foreign imperialism ;

(b) does not contain a correct analysis of the economic crisis—the most serious since 1929-31—that has overtaken our country and that has led to halving of the rice ration and the devaluation of the rupee on two occasions during the last year and to the consequent fantastic rise in the cost of living and the non-availability of many essential consumer goods ;

(c) does not contain any proposals to bring down the cost of living and afford relief to the masses or to solve the mounting problem of unemployment which has assumed serious proportions ;

(d) does not contain any proposals to afford relief to the workers and peasants and to the middle classes who have been badly affected by the unbearable rise in the cost of living and whose standards of living have been lowered as a consequence ;

(e) does not contain any proposal for the restoration of the rice-cut despite the boast of repeated record harvests for 1967 and 1968 and alleged successes of the Government's campaign to increase food production ;

(f) does not contain any proposal to lift the State of Emergency, which has now lasted for thirty months out of the thirty-nine months during which this Government has been in power, and to restore the democratic rights of the people ;

(g) does not contain any systematic plan for the rapid industrialization of our country, with a view to diversifying our economy and free us from complete dependence on one or two export crops ;

(h) does not contain any proposals for solving the problem of lack of irrigation facilities for agriculture, which is the single biggest stumblng block in the path of Ceylon's progress to self-sufficiency in food, by nationalizing the foreign owned tea estates, re-foresting the hill-tops and solving the problem of soil erosion, dredging and deepening our rivers and enabling our rivers to carry the precious rain water, without waste, to the cultivators in the plains ;

(i) does not reflect any determination on the part of the Government to enforce the Prevention of Social Disabilities Act or to help in the eradication of the obnoxious system of untouchability and caste oppression that prevails in North Ceylon ;

(j) does not contain any relief to the problems facing the students such as lack of lecture rooms, inadequate tutorial staff, insufficient library facilities, inadequate bursaries for needy students, the imposition of higher examination fees, appointment of non academic administrators as vice chancellors of universities, all of which have combined to create a sense of frustration among the students who have expressed a desire for a complete and radical change in the educational and social structure of this country ;

(k) does not refer to the disunity caused in the country by the attempt of the Government to honour its secret pledges to the reactionary Federal Party and which exposed the sham national unity that this Government claimed to have built—which unity was in fact only a unity between the reactionary forces among the Sinhalese and Tamils and not between the masses of both peoples ;

(l) neglects to point out the bankruptcy of bourgeois parliamentary democracy which was imposed on us by the cunning British imperialists and which, during the past 37 years, has brought no change in the system of imperalist-capitalist exploitation which continues unabated to this day ;

(m) does not reflect the wishes of the people of this country on the question of the unwarranted aggression of U. S. imperialism against the people of Vietnam by demanding the immediate withdrawal of U. S. and satellite troops and the disbandment and removal of their bases from South Vietnam, the complete cessation of all bombings of the Democratic Republic of Vietnam

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and allowing the Vietnamese people to decide their future by themselves ;

(*n*) does not reflect the truth of the subjection of this Government to the dictates of U. S. imperialism which was demonstrated by the permission given to the notorious U. S. Peace Corps, which has been exposed as an arm of the Central Intelligence Agency of the U.S.A., to return to Ceylon and the permission granted to the U.S. imperialist ship "Hope" to dock in Colombo harbour and engage in subversive activities against our people ;

and therefore this House has no confidence in your Government".—[*Mr. S. D. Bandaranayake.*]

V

"එතකුදු වුවත්, රට සභා පිළිබඳ විෂයෙහි,—

(අ) ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් (අපි දෙමළ) පක්ෂය වැනි දේශද්‍රෝහි දේශපාලන සංවිධානවල ශාඛා පිහිටුවීම සහ එම සංවිධානයේ බලය වැඩි දියුණු කරවීමට හා සංවිධානාත්මක ක්‍රියා මාර්ග ඉදිරියට ගෙන ඒමත් සහ ප්‍රචාරක කටයුතු දියුණු වීමට ඉඩ ප්‍රස්තාව දීමෙන් ද ඉහත කී සංවිධාන තහනම් නොකිරීමෙන් ද මේ රටේ ස්වෛරිතාවට තර්ජනයක් බවට පරිවර්තනය වී තිබියදීත්,

(ආ) පෙඩරල් පක්ෂයේ (දෙමළ රාජ්‍යයේ) එකම පරමාර්ථය වෙනම දෙමළ රාජ්‍යයක් පිහිටුවීමය යනුවෙන් ප්‍රසිද්ධ ප්‍රකාශන මැතිසබයේදී පවා කියා තිබියදීත් අද වනතෙක් එම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් සිංහලයාටද මේ රටේ ඒකීයතාවයට මේ තාක් කල් නොපැවතුන භයානක තර්ජනයක් පෙඩරල් පක්ෂයෙන් එල්ල වී තිබියදීත්,

(ඇ) කාරතිව් සිට කිරින්ද දක්වා උතුරු නැගෙනහිර වෙරළේ මසුන් මැරීමේ යෙදී සිටින සිංහල ධීවර කාර්මිකයින් හට වෙරළින් 2/3 ප්‍රමාණයක් වාරකන් කාලයේදී අහිමි වී යෑමේ තර්ජනයක් පවතින නමුදු ද්‍රවිඩ ධීවරයන් හට වාරකන් කාලයේදී මෙන්ම අනික් කාලයේත් මසුන් මැරීමෙන් ජීවත් වීමට දෙපැත්තකින් ඇති ඉඩකඩ ගැන සලකා සිංහල ධීවරයන්ගේ යහපත තකා ක්‍රියා මාර්ගයක් නොගැනීමෙන් ද,

(ඈ) සිංහල භාෂාවට හිමි විය යුතුව ඇති ප්‍රමුඛත්වය දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලට දීමෙන් 1956 අංක 33 දරණ රාජ්‍යභාෂා පනතට පටහැණිව උතුරු නැගෙනහිර දෙපළාතේ පාලන කටයුතු වලින් රාජ්‍ය භාෂාව තල්ලු කොට දමා ඇති හෙයින් ද,

(ඉ) උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඇති වගාවට සුදුසු ඉඩම් වගා කිරීම පිණිස ජනපද පිහිටුවීමට පෙඩරල් පක්ෂය විසින් පළ කළ විරෝධය මේ රජය පිළිගෙන තිබීමෙන් ද,

(ඊ) නාගදීප සේරුවාවිල වැනි උතුරේත් නැගෙනහිරේත් ඇති ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාවට තර්ජන එල්ල විය හැකි හෙයින් ද,

(උ) රටසභා ඇති කිරීමෙන් හෝ රටසභා ඇති කිරීමේ ප්‍රතිපත්තිය පිළිගෙන ක්‍රියාත්මක කිරීමෙන් හෝ මේතාක් කල් ජීවිත පරිත්‍යාගයෙන් ආරක්ෂා කළාවූත් සදාකල් හිම ආරක්ෂා කළ යුතුව ඇත්තාවූත් රටේ ඒකීය භාවය අහෝසි වී රට දෙකඩ වන බැවින් ද,

කිනම් අයුරකින් හෝ කිනම් නමකින් හෝ මින් ඉදිරියට රටසභා ඇති නොකරන බව උතුමාණන් වහන්සේගේ රජය අවංකව පළ කර නොතිබීම ගැන බලවත් කණගාටුව පළ කරන්නෙමු."—[ආර්. ජී. සේනානායක මයා.]

"எனினும், மாவட்ட சபைகள் சம்பந்தப்பட்ட விடயத்தில்,

(அ) திராவிட முன்னேற்றக் கழக (நாம் தமிழர்) கட்சியைப் போன்ற தேசத்துரோகமான அரசியல் தாபனங்களின் கிளைகளை நிறுவவும், அத்தாபனத்தின் சக்தியை வலுப்படுத்தவும், தாபன ரீதியான நடவடிக்கைகளை எடுக்கவும், பிரச்சார வேலைகள் அபிவிருத்தி செய்யவும் சந்தர்ப்பம் அளித்ததனாலும், மேற்கூறிய தாபனத்தைத் தடைப்படுத்தாததனாலும், இந்நாட்டின் இறைமைக்கு ஆபத்துச் சூழும் தன்மை உருவாகியிருக்கின்ற பொழுதும்,

(ஆ) தமிழரசுக் கட்சியின் (தமிழ் இராச்சியத்தின்) ஒரே இலட்சியம், தனிப்பட்டதான தொரு தமிழ் அரசைத் தாபிப்பதாகும் எனப் பகிரங்கமாக பிரதிநிதிகள் சபையிலும் கூறியிருப்பதோடு, இது நாள் வரை அக்கொள்கையைக் கடைப்பிடிப்பதன் மூலம், சிங்கள மக்களுக்கும், இந்நாட்டின் ஒற்றையாட்சித் தன்மைக்கும், இது காலம் வரை ஏற்படாத பயங்கரமான ஆபத்து தமிழரசுக் கட்சியினால் உருவாக்கப்பட்டிருக்கின்ற பொழுதும்,

(இ) காரைதீவிலிருந்து கிரிந்தை வரை வடக்கு, கிழக்குக் கரையிலே மீன்பிடித் தொழிலில் ஈடுபட்டுள்ள சிங்களக் கடற்றொழிலாளருக்கு, கடற்கரையின் 2/3 பகுதியில், பருவ மழைக் காலத்திலே உரிமையில்லாமற்போகும் நிலையேற்படும் ஆபத்து இருக்கின்ற நேரத்திலேயே, தமிழ்க் கடற்றொழிலாளர்களுக்கு, பருவ மழைக் காலத்திலும், மற்றக்காலத்திலும், மீன்பிடித்துவாழ இருபக்கத்திலும் அமைந்துள்ள வசதிகளைக் கவனத்திற் கொண்டு சிங்களக் கடற்றொழிலாளர்களின் நன்மையைக் கருதி நடவடிக்கை எடுக்காமலிருப்பதனாலும்,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ஈ) சிங்கள மொழிக்கு உரித்தான முதலிடத்தைத் தமிழுக்கும், ஆங்கிலத்திற்கும் அளிப்பதன் மூலம், 1956 ஆம் ஆண்டு 33 ஆம் இலக்க அரசகருமமொழிச் சட்டத்திற்கு முரணாக வடக்கு, கிழக்கு மாகாணங்களில் நிர்வாகத்திலிருந்து அரசகரும மொழியை ஒதுக்கியிருப்பதனாலும்,

(உ) வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள விவசாயத்திற்குத் தகுதியான காணிகளை, விவசாயத்திற்குட்படுத்துவதற்காக குடியேற்றத் திட்டங்களை நிறுவும் விடயத்தில் தமிழரசுக் கட்சியின் எதிர்ப்பை இவ்வரசாங்கம் ஏற்றுக் கொண்டிருப்பதனாலும்,

(ஊ) நயினாதீவு, சேருவாவிலை போன்ற வடக்கிலும், கிழக்கிலுள்ள சரித்திரப் பிரசித்தி பெற்ற பௌத்த புனிதத் தலங்களின் பாதுகாப்புக்கு ஆபத்து ஏற்படலாமென்பதனாலும்,

(எ) மாவட்ட சபைகளை நிறுவுவதன் மூலமோ, மாவட்ட சபைகளைத் தாபிக்கும் கொள்கையை ஏற்று நடவடிக்கை எடுப்பதன் மூலமோ, இது நாள் வரை உயிர் கொடுத்துக்காக்கப்பட்டு வந்ததும் எக்காலத்தும் பாதுகாக்கப்படவேண்டியதுமான நாட்டின் ஒற்றையாட்சித் தன்மை மறைந்து, நாடு இரண்டு துண்டாகப் பிரியுமாகையினாலும்,

எவ்விதத்திலாவது, எப்பெயரிலாவது, எதிர்காலத்தில் மாவட்ட சபைகளை உருவாக்க மாட்டோமென மேன்மை தங்கிய தங்களது அரசாங்கம் உளத்தூய்மையுடன் வெளியிடாமலிருப்பது குறித்து ஆழ்ந்த கவலையைத் தெரிவிக்கின்றோம். "—[திரு. ஆர். ஜி. சேனநாயக்க].

"but, in the matter of District Councils—

(*a*) whereas the fact that the setting up of branch institutions of anti-national political organisations such as the (We Tamil) Dravida Munethra Kazagam and the opportunities afforded to them to pursue their activities in this country on an organised scale, and the fact that these institutions have not been proscribed, continue to constitute a threat to the sovereignty of this country ;

(*b*) whereas the Federal (Tamil State) Party which has publicly stated even in Parliament that its sole objective is the setting up of a separate Tamil State in this country, continues to follow that policy and thus this party constitutes a hitherto non-existent and dangerous threat to the Sinhalese people and also to the unitary character of the country ;

(*c*) whereas steps have not been taken in furtherance of the interests of the Sinhalese fishermen who are engaged in fishing in the Northern and Eastern coasts from Karativu to Kirinda and who are in danger of losing their right to fish during the monsoon season in two-thirds the coast of Ceylon, while the Tamil fishermen continue to enjoy the right to earn a living both in the North and East as well as elsewhere in Ceylon ;

(*d*) whereas the official language has been pushed out of the work of administration in the Northern and Eastern Provinces, with the Tamil and English languages being given the primacy due to the Sinhalese language contrary to the provisions of the Official Language Act, No. 33 of 1956 ;

(*e*) whereas the Government has given in to the opposition expressed by the Federal Party over the establishment of colonization schemes for the purpose of bringing arable land in the North and East under cultivation ;

(*f*) whereas the security of the historic Buddhist places of worship in the North and the East, such as Nagadipa and Seruvavila, can be endangered ;

(*g*) whereas th establishment of District Councils or the acceptance and implementation of the policy of establishing District Councils while destroying the unitary character of the country which to this day has been defended with the very lives of the people and which has to be defended for ever, will also divide the country ;

this House regrets that Your Excellency's Government has failed to state unequivocally that it will not establish District Councils in any form or name whatsoever."—[*Mr. R. G. Senanayake.*]

VI

"එතකුදු වුවත්, ජීවන වියදම පිළිබඳ විෂයෙහි,—

(අ) දිනෙන් දින ඉහළ නගිමින් පවත්නා ජීවන වියදම නියත වශයෙන් පහත හෙලීමට ඇති එක් පියවරක් හැටියට පිළිගෙන, නිදහස් වූ ආර්ථික සංවර්ධන ක්‍රමයක් මෙරටෙහි ඇති කර ගනු පිණිසත්,

(ආ) විදේශික ජාවාරම් කාරයින් අතර පවත්නා වෙළඳ උපක්‍රම මැඩලීමෙන් සිංහල ජනතාවගේ නියම අයිතිවාසිකම් රැක දෙනු පිණිසත්,

(ඇ) මෙම දේශද්‍රෝහී ජාවාරම්කාරයන් හට ඔවුන්ගේ ඕනෑ එපාකම් අනුව අවශ්‍ය වූ අවස්ථාවලදී ජීවන අංකය ඉහළ පහළ යැවීමට බැරි වන පිණිසත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඇ) භයානක ලෙස පිට රටට ඇදෙන ජාතික ධනය මෙහිම රඳවා ගනු පිණිසත්,

(ඉ) ඉන්දියානුවන් ප්‍රධාන අනිකුත් විදේශික ධන කුවේරයන් විසින් උදුරා ගෙන තිබෙන අපගේ වෙළඳ බලය යළිත් ආපසු ලබා ගැනීම පිණිසත්,

වෙළඳාම ලාංකික කිරීමට උතුමාණන් වහන්සේගේ රජය ක්‍රියා කොට නොතිබීම ගැන බලවත් ලෙස කණගාටුව පළකරන්නෙමු."—[ආර්. ජී. සේනානායක මයා.]

" எனினும், வாழ்க்கைச் செலவுபற்றிய விஷயத்தில்

(அ) நாள்தோறும் ஏறிக்கொண்டேபோகும் வாழ்க்கைச் செலவை நிரந்தரமாகக் குறைப்பதை ஒரு நடவடிக்கையாக ஏற்றுக் கொண்டு சுதந்திரமான பொருளாதார அபிவிருத்தித் திட்டமொன்றை இந்நாட்டில் ஏற்படுத்துவதற்காகவும்,

(ஆ) வெளிநாட்டு வியாபாரிகளிடையே உள்ள வியாபாரச் சூழ்ச்சிகளை முறியடிப்பதன் மூலம் சிங்கள மக்களின் சரியான உரிமையைப் பாதுகாத்துக்கொடுக்கவும்,

(இ) இத்தேசத்துரோகி வியாபாரிகளுக்கு அவர்களின் விருப்பு வெறுப்பின்படி அவசியமான சந்தர்ப்பங்களில் வாழ்க்கைப் புள்ளியை மேலும் கீழுமாக்க இயலாமற் செய்யவும்,

(ஈ) பயங்கரமாக வெளியேறும் தேசிய செல்வத்தை இங்கேயே தங்கச் செய்யவும்,

(உ) பிரதானமாக இந்தியர் உட்பட, ஏனைய அந்நிய செல்வந்தர்களினால் பறிக்கப்பட்டுள்ள எங்களுடைய வர்த்தக அதிகாரத்தை மீண்டும் பெற்றுக் கொள்ளவும்,

வர்த்தகத்தை இலங்கையர் மயமாக்க மேன்மை தங்கிய தங்கள் அரசாங்கம் நடவடிக்கையெடுக்காததையிட்டு எமது மிகுந்த வருத்தத்தைத் தெரிவிக்கின்றோம். "—[திரு. ஆர். ஜி. சேனநாயக்க].

"but regret that in the matter of the cost of living Your Excellency's Government has taken measures to Ceylonize trade with a view to—

(*a*) recognizing an unfettered system of economic development as one of the steps which will definitely bring down the steadily rising cost of living and ensuring the setting up of such an economic system in this country ;

(*b*) protecting the legitimate rights of the Sinhala people by eradicating the corrupt practices resorted to by the foreign businessmen ;

(*c*) preventing the fluctuations in the cost of living as a result of the manipulation of prices at the will and pleasure of these anti-national businessmen ;

(*d*) arresting the outflow of our national wealth, which has assumed dangerous proportions ;

(*e*) restoring the dominance in trade which has been wrested from us by foreign capitalists, principally the Indians."—[*Mr. R. G. Senanayake.*]

VII

" එතකුදු වුවත්, ඉන්දියානු ප්‍රශ්නය පිළිබඳ විෂයෙහි,—

(අ) සිංහලයාගේ රැකීරක්ෂා ප්‍රශ්නය දැඩි ලෙස උග්‍ර වී තිබෙන මෙම වකවානුවේ පුරවැසිකම් නොලත් ඉන්දියානුවන්ට හා තාවකාලික බල පත්‍ර යටතේ පදිංචිව සිටින අයට රැකීරක්ෂා සැපයීමට ඉඩකඩ යෙදීම සහ ඔවුනට නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය, හාල් සලාකය වැනි වරප්‍රසාදත්, වෘත්තීය හා දේශපාලන අයිතිවාසිකම් දී තිබීමත් අසාධාරණයක් හැටියට අද වන තුරුත් නොසලකා මේ රටේ ජනතාවගේ අයිතියන් වෙනුවෙන් විධිමත් පියවරක් නොගැනීමෙන් ද,

(ආ) ඉන්දියානුවන් ඉන්දියාවට යැවීම සඳහා අවංක ක්‍රියා මාර්ගයක් අද වන තෙක් නොගැනීමෙන් ද,

(ඇ) කන්ද උඩරට සිංහලයාගේ ජන්ම උරුම යන් රැකෙන පරිදි පුරවැසිකම් ලබා තිබෙන ඉන්දියානුවන් වෙනම ඡන්ද ලේඛනයකට ඇතුළත් නොකිරීමෙන් ද,

(ඈ) මෙරට ජනතාවට ජීවත් වීමට පවා සෑහෙන බිම් ප්‍රමාණයක් නොමැතිව තිබිය දී මිලයට ගැනීමෙන් මෙරට චංචල නිශ්චල දේපල සතු කර ගැනීමට විදේශිකයින්ට ඉඩ සැලසීමෙන් ද, කර්මාන්ත, ගොවි කර්මාන්ත හා වෙනත් මුදල් උපයන ව්‍යාපාර පවත්වාගෙන යැමට විශාල වශයෙන් ඉඩකඩ සැලසීමෙන් ද,

උතුමාණන් වහන්සේගේ රජය ඉන්දියානු ප්‍රශ්නය දිනෙන් දින උග්‍ර වීමට ඉඩ ප්‍රස්තාව යෙදීම ගැන කණගාටුව පළ කරන්නෙමු."—[ආර්. ජී. සේනානායක මයා.]

" எனினும், இந்தியர் பற்றிய விடயத்தில்,

(அ) சிங்களவர்களின் வேலையில்லாப் பிரச்சினை மிகவும் உக்கிரமடைந்திருக்கும் இச்சந்தர்ப்பத்தில் பிரஜா உரிமை பெறாத இந்தியர்களுக்கும் தற்காலிகமாக அனுமதிபெற்றுக் குடியிருக்கும் நாடற்றவர்களுக்கும் தொழில் வசதி அளித்தல், இலவசக் கல்வி, இலவச வைத்திய சேவை, பங்கீட்டரிசி போன்ற சலுகை, தொழில், அரசியலுரிமை கொடுத்திருப்பது அநீதியானதென்று இதுவரை கவனியாது இந்நாட்டு மக்களின் உரிமைகள் சார்பாகப் பல நடவடிக்கைகளை எடுக்காமையாலும்,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ஆ) இந்தியர்களை இந்தியாவிற்கு அனுப்புவதற்காக நேர்மையான செயல் வழி வகைகளை இன்று வரை கைக்கொள்ளாமையாலும்,

(இ) மலை நாட்டு சிங்கள மக்களின் பிறப்புரிமைகள் பாதுகாக்கப்படக் கூடிய வகையில் பிரஜா உரிமை பெற்றுள்ள இந்தியர்களை வேறு தேர்தல் இடாப்பில் சேர்க்காமையாலும்,

(ஈ) இந்நாட்டு மக்கள் வாழ்வதற்குத்தானும் போதிய நிலமில்லாதிருக்கையில் நாடற்றவர் பணப்பலத்தினால் இந்நாட்டில் அசைவுள்ள, அசைவற்ற சொத்துக்களை உரிமையாக்கிக் கொள்ள இடமளித்தமையாலும், தொழில், விவசாயம், வேறு பணம் சம்பாதிக்கக்கூடியவற்றைச் செய்வதற்கு இடமளித்தமையாலும்,

மேன்மை தங்கிய தங்களுடைய அரசாங்கம் இந்தியப் பிரச்சினையை நாளுக்கு நாள் உக்கிரமடையச் செய்வதையிட்டு நாம் கவலையைத் தெரிவிக்கிறோம்."—[திரு. ஆர். ஜி. சேனநாயக்க].

"but regret that as far as the Indian problem is concerned Your Excellency's Government has allowed it to become acute from day to day by—

(*a*) affording opportunities of employment to Indians who have not obtained citizenship and Temporary Resident Permit Holders at a time when the problem of unemployment is very acute among the Sinhalese ; and by not taking proper steps with regard to the rights of the people of this country as a result of not considering up to date the grant of privileges such as free education, free health service and rice ration, and trade union and political rights to the said Indians and T.R.P. holders to be an injustice ;

(*b*) not taking an honest step up to date to repatriate Indians to India ;

(*c*) not taking steps to safeguard the birthrights of the Kandyan Sinhalese by including in a separate electoral register the names of the Indians who have obtained citizenship ;

(*d*) affording opportunities on a large scale to foreigners to purchase and thereby gain ownership of movable and immovable properties at a time when sufficient land is not available even for the people of this country ; and by allowing them to engage in industries and agricultural activities and other money making concerns."—[*Mr. R. G. Senanayake.*]

VIII

"එනමුදු වුවත්, භාෂාව පිළිබඳ විෂයෙහි,—

වැදගත් වෘත්තීය අයිතිවාසිකමක් වන භාෂාවේ අයිතිවාසිකම රැක ගැනීම සඳහා ඉදිරිපත්ව, 1966 ජනවාරි 8 වෙනිදා සිද්ධියේදී දඩුවම් ලැබූ භාෂා ප්‍රේමී රජයේ හා සංස්ථාවල සේවකයන් හට එම දඩුවම ඉවත් කොට සහනයක් සැලසීමට උතුමාණන් වහන්සේගේ රජය ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් බලවත් කණගාටුව පළ කරන්නෙමු."—[ආර්. ජී. සේනානායක මයා.]

" எனினும், மொழி சம்பந்தமான விடயத்தில்,—

முக்கியமான தொழிற்சங்க உரிமையாகிய மொழியுரிமையைப் பாதுகாக்கும் நோக்கத்துடன் முன்வந்து, ஜனவரி 8 ஆம் திகதி நிகழ்ச்சியின் காரணமாகத் தண்டனை பெற்ற அரசாங்கத் திணைக்களங்கள், கூட்டுத்தாபனங்கள் ஆகியவற்றைச் சேர்ந்த மொழிப்பற்றுள்ள ஊழியர்களின் தண்டனைகளை அகற்றி சலுகை வழங்குவதற்கு, மேன்மை தங்கிய தங்கள் அரசாங்கம் நடவடிக்கை எடுக்காதது குறித்து ஆழ்ந்த கவலையைத் தெரிவிக்கின்றோம். "—[திரு. ஆர். ஜி. சேனநாயக்க].

"but regret that as far as the language is concerned, Your Excellency's Government has not taken action to remove the punishments imposed on the language loving public servants and employees of corporations who by coming forward to safeguard the right of language which is an important professional right were concerned in the incident of 8th January 1966 ; and to grant them redress."—[*Mr. R. G. Senanayake.*]

"එම වචන එතැනට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

" அச்சொற்கள் அங்கு சேர்க்கப்படுமாக " எனும் வினா மீண்டும் எடுத்தியம்பப் பெற்றது.

*Question again proposed, "That those words be there added."*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 2.5

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.** (සොරනාතොට)

*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை)*

(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

ගරු කථානායකතුමනි, මේ රජයේ කෘෂිකර්ම සැලැස්ම පිළිබඳවයි මා ඊයේ කතා කරමින් සිටියේ. ප්‍රාදේශීය සහකාර ගොවි ජන සේවා කොමසාරිස්වරුන්ට මීට පෙර බලය තිබුණා සුළු වාරිමාර්ග සඳහා රුපියල් 7,500 ක ඇස්තමේන්තුවක් අනුමත කරන්නට. ඒ අනුව ඒ ඒ ප්‍රදේශවල තිබුණු වාරිමාර්ග කටයුතු ඉතා ඉක්මණින් දියුණු කරන්නට වැඩි කරදරයක් නැතුව පුළුවන්කම ලැබුණා. මෑතක සිට එම බලය රුපියල් 5,000 දක්වා අඩු කර තිබෙනවා. 5,000 න් ඉහළ ශතයක්වත් වියදම් කරන්නට බැරි වන හැටියට දැන් කටයුතු යොදා තිබෙනවා. එසේ හෙයින් ගම්බද ගොවීන්ට බලවත් සේ අවශ්‍ය වන ජල පහසුව සලසා ගැනීම උගහට වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, කථා කිරීම සඳහා මට ලැබී ඇති කාලය ඉතා කෙටියි. එම නිසා කෘෂිකර්මය පිළිබඳ කරුණු ඉතා සුළුවෙන් ඉදිරිපත් කරන්නටයි, බලාපොරොත්තු වන්නේ. 1968 ජූලි මස 6 වැනිදා "දිනමිණ" පත්තරයේ පළ වුණු ප්‍රවෘත්තියක මෙසේ සඳහන් වෙනවා :

> බීජ අල නැත්නම් බතල වවන්න කීවා. වැලිමඩ මන්ත්‍රීගෙන් ඇමතිට චෝදනා. මේක හතර බීරි කතාවක්. බිරි අලින්ට වීණා ගැයීමක්. තව වරක් කියා අස් වෙනවා.

පත්තරයේ මුල් පිටුවෙහි, වැලිමඩ මන්ත්‍රීතුමාගේ (පර්සි සමරවීරමයා.) පින්තූරයත් සමග පළ වුණු මේ ප්‍රවෘත්තියෙන්, අද අර්තාපල් වගාව සම්බන්ධයෙන් රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය හොඳින් පැහැදිලි වෙනවා. බීජ අර්තාපල් පිළිබඳ තත්ත්වය අද ඉතාමත් කනගාටුදායක වී තිබෙනවා. මේ පිළිබඳව කථා කරතොත් විනාඩි 5 කින් නොව පැය ගණනකින්වත් කියා අවසන් කරන්නට බැරි තරම් කරුණු තිබෙනවා. මේ කන්නයේදී වගා කිරීම සඳහා දළ වශයෙන් බීජ අර්තාපල් ටොන් 3,150 ක් අවශ්‍ය බව දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර තිබුණා.

එහෙත්, අපට දැන ගන්නට ලැබී තිබෙන සංඛ්‍යා ලේඛන අනුව මේ කන්නයේදී ගෙන්වන්නට අදහස් කරන්නේ, බීජ අල ටොන් 720 ක් පමණයි. ලංකාව අර්තාපල්වලින් ස්වයංපෝෂිත වෙයි, අල ගැන මේ රටේ ජනතාවට බිය වන්නට හේතුවක් නෑ කියමින් ජනතාව බලා සිටිනවා. එහෙත් කටයුතු කෙරෙන්නේ වෙනත් විධියකටයි.

නුවරඑළියේ සීතාවක ගොවිපොළ සම්බන්ධයෙන් කෘෂිකර්ම ඇමතිතුමාට ඉදිරිපත් කරන ලද ලිපියත් මේ අවස්ථාවේදී තමුන්නාන්සේගේ අනුමැතිය ඇතිව සභාගත කිරීමට මා බලාපොරොත්තු වෙනවා. දීර්ඝ ලිපියක් නිසා මෙය සම්පූර්ණයෙන් කියවන්නට මා අදහස් කරන්නේ නැහැ. ඒ නිසායි මෙය සභාගත කිරීමට තමුන්නාන්සේගේ අනුමැතිය ඉල්ලා සිටින්නේ. මේ සම්බන්ධව එක් වැදගත් කරුණක් කිව යුතුව තිබෙනවා. මෙම ලිපිය රජයේ විරුද්ධවාදියකු විසින් ඉදිරිපත් කරන ලද්දකැයි බාගවිට රජය අදහස් කරන්නට පුළුවනි. මෙය ඉදිරිපත් කර තිබෙන්නේ, උඩරට ගැමි පුනරුත්ථාපන උපදේශක මණ්ඩලයේ නුවරඑළියේ නියෝජිතයා වන ඞී. පී. වීරසිංහ මහත්මයායි. ඔහු මේ ලිපිය ඉදිරිපත් කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ නුවරඑළිය ශාඛාවේ ලේකම් වශයෙනුයි. අර්තාපල් වගාව සම්බන්ධයෙන් ඔහු විසින් කෘෂිකර්ම ඇමතිතුමා වෙත ඉදිරිපත් කරන ලද කරුණු ගැන ඇමතිතුමා කිසිම සැලකිල්ලක් දක්වා නැත යන චෝදනාවයි මේ ලිපියෙන් කෙරෙන්නේ. බීජ අර්තාපල් නාස්ති වන හැටි, සීතාවක ගොවිපොළේ පවතින දූෂණ ආදිය ඇතුළුව තවත් වැදගත් කරුණු රාශියක් මෙම ලිපියෙහි සඳහන් වී තිබෙනවා. මේ විධියේ කරුණු ගැන පරීක්ෂණයක් නොකර, මේ රටේ සාමාන්‍ය ගොවි ජනතාවට සහනයක් සලසන්නටවත් රට ස්වයංපෝෂිත කරන්නටවත් කවදාවත් පුළුවන් වන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තවත් මන්ත්‍රීවරුන් කථා කරන්නට අදහස් කරන නිසා මා මීට වැඩි වේලාවක් ගත කරන්නට අදහස් කරන්නේ නැහැ. සීතාවක ගොවි ජනපදය සම්බන්ධව ඇති මේ ලිපිය සභාගත කිරීමට නැවත වරක් මා ඔබ තුමාගේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
ඒක ඇමතිතුමාට දෙන්න.

**විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. விஜேரத்ன பண்டா)*
(Mr. Wijeratne Banda)
ඇමතිතුමා මෙතැන නැහැ කථානායක තුමනි. ඒ නිසා ලිපිය සභාගත කළොත් හොඳයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
The Hon. Leader of the House can accept it.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**
*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)
Yes.

**විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. விஜேரத்ன பண்டா)*
(Mr. Wijeratne Banda)
මෙය හමස් පෙට්ටියට නොදමන ලෙස ගරු ඉඩම් ඇමතිතුමාගෙන් මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මීට කලින් කෘෂිකර්ම ඇමතිතුමා වෙත ලිපියකින් ඉදිරිපත් කරන ලද කරුණු ක්‍රියාවට පරිවර්තනය නොවුණු නිසායි, එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයකු විසින් මේ ලිපිය මා වැනි විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු අතට පත් කර තිබෙන්නේ. එම නිසා, මේ ලිපිය හමස් පෙට්ටියට හෝ කුණු කූඩයට හෝ නොදමා, මෙහි සඳහන් කරුණු සත්‍යයද, මේවා ක්‍රියාත්මක කිරීමෙන් යහපතක් වේද යනාදී කරුණු සොයා බලා නිසි පරිදි කටයුතු කරන ලෙස ඉල්ලමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 2.11

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)
ගරු කථානායකතුමනි, රාජාසන කථාව පිළිබඳ විවාදයට සහභාගි වන්නට මටත් අවස්ථාවක් ලැබීම ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනවා. පළමුවෙන්ම මා කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාගේ (පී. බී. ඉලංගරත්න මයා.) තර්කවලට පිළිතුරු දීමට අදහස් කරනවා. ඒ ගරු මන්ත්‍රී තුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතයකු වන නමුත් මාක්ස්වාදීන් ගේ ප්‍රතිපත්ති අනුගමනය කරන බව අප සියලු දෙනාම හොඳහැටි දන්නවා.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)
තමුන්නාන්සේත් කාලයක් කොමියුනිස්ට් පක්ෂයේ සිටියා නේද ?

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)
මා කිසි කාලයක කොමියුනිස්ට් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් නොසිටි බවත් මා පළමුවන වරට පක්ෂයකට බැඳුණා නම් එසේ බැඳුණේ එක්සත් ජාතික පක්ෂයට බවත්, මා මෙම ගරු සභාවේදීම ප්‍රකාශ කර තිබෙනවා. ඒ බව නැවතත් මතක් කරන්නට කැමතියි.

කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළ බවත් ගරු අගමැතිතුමාට හා මේ ජාතික ආණ්ඩුවට පහර ගැසූ බවත් මතක ඇති. අපි ප්‍රජාතන්ත්‍රවාදය රකින්නේ කටින් පමණක්ය, ක්‍රියාවෙන් ඒකාධිපති වාදයක් පවත්වනවාය කියා කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කීවා. එහෙත් ප්‍රජා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. එච්. මොහමඩ්]

තන්ත්‍රවාදය ගැන කථා කිරීමට අයිතියක් හෝ උරුමයක් කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට නැති බව මා කියනවා.

**සොයිසා සිරිවර්ධන මයා.**
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ඇයි?

**ගරු එම්. එච්. මොහමඩ්**
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

මම ඒ ගැන විස්තර කර දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Please do not interrupt the Hon. Minister. After all, you should appreciate the fact that he is speaking in Sinhala.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

He must talk sense.

[illegible]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

If he does not talk sense, you can reply.

**ගරු එම්. එච්. මොහමඩ්**
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත් කලින් තිබුණු ආණ්ඩුවේ ඇමතිවරයෙක් වශයෙන් සිටි නිසා ඒ කාලයේ මේ රටේ තිබුණු තත්ත්වය ගැන එතුමා හොඳට දන්නවා ඇති. ඒ ආණ්ඩුව පැවැති කාලයේදී ප්‍රජාතන්ත්‍රවාදයට පයින් ගසා ප්‍රජාතන්ත්‍රවාදය මේ රටින් තුරන් කිරීමට එම ආණ්ඩුව සූදානම් වූ බව මා තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි. ඒ නිසයි මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කළේ කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නට උරුමයක් නැතෙයි කියා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන ඒ අයගෙන් මා ප්‍රශ්නයක් අහන්නට කැමතියි. පසුගිය මහා මැතිවරණයේදී එවකට පැවැති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හවුල් ආණ්ඩුවට විරුද්ධව මහජනතාව තීරණයක් දුන්නාට පසුවත් රජය ඉල්ලා අස්වීම දවස් කීපයකින් ප්‍රමාද කළේ ඇයි? දින කීපයක් ගතවුණාට පසුවයි ඉල්ලා අස්වුණේ. ඒකද තමුන්නාන්සේලාගේ ප්‍රජාතන්ත්‍රවාදය කියා මා අහනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආණ්ඩු බලය තිබුණු කාලයේ පුවත්පත් නිදහසට පහර ගසන්නට ඒ රජය සූදානම් වුණා. එය තමුන්නාන්සේත් දන්නවා. ඒ අවස්ථාවේ ඒ සම්බන්ධව පනත් කෙටුම්පතකුත් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එදා ඒ පුවත්පත් නිදහස නැති වුණා නම් අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයකුත් නැහැ. ඒ නිසා ඒ අවස්ථාවේ මහජනතාව ඒ පනතට විරුද්ධව රැස්වීම් තබා මහජනාවගේ විරුද්ධත්වය ප්‍රකාශ කළ නමුත්, ඒ රජය ඒ ගැන සැලකිල්ලක් නොදැක්වූ බවත්, මහජන විරුද්ධත්වය නොපිළිගත් බවත්, ඒකාධිපති බලතල පාවිච්චි කර ඒ පනත ස්ථිර කර ගැනීමට ඔවුන් සූදානම් වූ බවත් අපට මතකයි. මේ ශ්‍රී ලංකාවේ වාසනාවට එම ආණ්ඩුව බලයේ නොතිබුණු නිසා අද මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර නිදහස තිබෙනවා. යම්හෙයකින් ඒ ආණ්ඩුව බලයට පත්වී එම පනත සම්මත කර ගත්තා නම් අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. ඒ නිසා තමයි මා කීවේ විරුද්ධ පාර්ශ්වයේ සිටින කිසිම මන්ත්‍රීවරයකුට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නට අයිතියක් හෝ උරුමයක් නැත කියා.

ඒ වාගේම, කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා භික්ෂූන් වහන්සේලා ගැන කථා කළා. හොඳයි අපි බලමු, ඒ ගොල්ල ආණ්ඩු කළ කාලයේ කළ දේවල් මොනවද කියා. කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගේ ආණ්ඩුව පැවති කාලයේ භික්ෂූන් වහන්සේලා පෙළපාළියක් ගිය අවස්ථාවේදී, ඒ ආණ්ඩුවේ උපදෙස් අනුව පොලීසිය ඒ භික්ෂූන් වහන්සේලාට බැටන් පොලුවලින් පහර දී එළවා ගත් බව තමුන්නාන්සේට මතක ඇති. ඒ භික්ෂූන් වහන්සේලාගේ ඔළු පැළු බවත්, සමහර භික්ෂූන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වහන්සේලා තමන්ගේ සෙරෙප්පු පවා පාරේ දමා දුව ගිය බවත්, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරන්න කැමතියි. ඒ විතරක් නොවෙයි. හදිසි නීති පාවිච්චි කර, ප්‍රවෘත්ති පත්‍ර පනතට විරුද්ධව රැස්වීම් තබන්නට පවා පසුගිය ආණ්ඩුව ඉඩ දුන්නේ නැති බව ප්‍රකාශ කරන්න කැමතියි. ඒ විධියේ ප්‍රජාතන්ත්‍රවාදයක් තමයි, ඒ ගොල්ලන්ගේ ආණ්ඩුව—ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව—ගෙන ගියේ.

එහෙත් අපේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන අතර, අපේ අගමැතිතුමා ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන බවත් මා තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි. තමුන්නාන්සේලාගේ අයිතිවාසිකම් උදුරා ගෙන ඒකාධිපති ආණ්ඩුවක් පිහිටුවන්න අපි කිසි විටකත් සූදානම් නැති බව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. ඒ වාගේම, 1970 දී මැතිවරණයකට මුහුණ දෙන්න අප සූදානම් බවත්, තමුන්නාන්සේලා වාගේ මැතිවරණයක් නොපවත්වා ඒකාධිපති පාලනයක් ගෙන යන්නට අප සූදානම් නැති බවත්, කියන්න කැමතියි. තමුන්නාන්සේලාගෙන් ප්‍රජාතන්ත්‍රවාදය බේරා ගත්තේ අපියි. නියමිත කාලයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැර මැතිවරණයක් පවත්වා මහජනයා ඉදිරියට ගිහින් ඡන්දය ඉල්ලන්න අප ලැස්ති වන අතර, අප නැවත වරක් බලයට පත් කරන්න මහජනයා සූදානම් බවත්, මින් ඉදිරියට කවදාවත්ම මහජනයා අපට ඡන්දය නොදී ඉන්නේ නැති බවත් ප්‍රකාශ කරන්න කැමතියි.

ඊළඟට, කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී සඳහන් කළා, පොරොන්දු 21 ක් ගැන. 1965 දී එක්සත් ජාතික පක්ෂය රටවැසියාට පොරොන්දු 21 ක් දුන් බවත්, ඒ පොරොන්දු කිසිවක් ඉෂ්ට කළේ නැති බවත්, එතුමා කීවා. පොරොන්දු 21 කේ විත්තිය තමුන්නාන්සේලා සියලු දෙනාටම මතක ඇති. ඒ පොරොන්දු දුන්නේ ලංකා සමසමාජ පක්ෂයේ—

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඒ පොරොන්දු නොවෙයි.

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

—උදවිය බව් කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මේ, මැතිවරණ පොරොන්දු.

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

"අපි බලයට ආවා නම් මේ පොරොන්දු 21 ම ඉෂ්ට කරනවා" යයි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ගෝල්පේස් පිට්ටනියේ පැවැත්වුණු රැස්වීමකදී ප්‍රකාශ කළ බව්, ගරු මන්ත්‍රීවරුන්ට මතක ඇති. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමති වුණාට පස්සේ ඒ පොරොන්දු 21 ඉෂ්ට කළාදැයි කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමතියි. පොරොන්දු 21 ක් ඉදිරිපත් කර දුප්පත් කම්කරුවන් රවටා, මුදල් ඇමති වුණාට පස්සේ ඒ පොරොන්දු අමතක කළා. ඒ සම්බන්ධයෙන් එතුමා ඉදිරිපත් කළ විධියේ තර්ක ඉදිරිපත් කරන්නට නම් අපටත් පුළුවනි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඒවා පොරොන්දු නොවෙයි. පොරොන්දම්.

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

එම නිසා, මේ විධියට පොරොන්දු ගැන කථා කරන්න විරුද්ධ පාර්ශ්වයට පුළුවන් කමක්, අයිතියක්, නැති බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. පොරොන්දු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. එච්. මොහමඩ්]

ගැන කථා කරනවා නම් ඒ අය දුන් පොරොන්දු ගැනත් පැය ගණනක් කථා කරන්න පුළුවනි. ඒ අය පොරොන්දු දුන්නා, පොරොන්දු කැඩුවා. එම නිසා දුන් පොරොන්දු ගැන විස්තර කරන්න මේ අවස්ථාවේදී මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ.

අපේ කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ෆෙඩරල් පක්ෂය ගැන කියා තිබෙනවා. එතුමා කියනවා, ෆෙඩරල් රාජ්‍යයක් මේ රටේ පිහිටුවන්න උදව් දීමට අපේ ආණ්ඩුව පෙඩරල් පක්ෂයත් සමග රහස් ගිවිසුමක් ඇති කරගෙන තිබෙනවාය කියා. එහෙම නම් මම විරුද්ධ පක්ෂයට මතක් කරන්න කැමතියි, ෆෙඩරල් රාජ්‍යයක් පිහිටුවීමේ අදහස හෝ ඒ ප්‍රතිපත්ති අපේ ආණ්ඩුව කිසිම විධියකින්වත් පිළිගන්නෙ නැති බව. එම නිසා මේ අන්දමේ සංශෝධන ගෙනැවිත් මහජනතාව නොමග යවන්න, එයින් දේශපාලන ප්‍රයෝජන ලබා ගන්න, විරුද්ධ පක්ෂය උත්සාහ කිරීම ගැන අපි කනගාටු වෙනවා.

එපමණක් නොවෙයි, දිස්ත්‍රික් සභා ගැන විශාල ඝෝෂාවක් ඇති කළා. මේ රටින් භාගයක් ද්‍රවිඩ ජනතාවට දෙන්න යනවාය කියාත් ප්‍රචාරයක් ගෙන ගියා. ඔය අන්දමේ අසත්‍ය ප්‍රකාශයන් මගින් මහජනතාව රවටන්න විරුද්ධ පක්ෂය සූදානම් වුණු බව තමුන්නාන්සේට මතක ඇති. අපේ අගමැතිතුමා, මා කලින් කීවා වාගේම ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන අගමැතිවරයකු නිසා තමයි, ධවලපත්‍රිකාවක් මෙම ගරු සභාවට ඉදිරිපත් කර එමගින් තමුන්නාන්සේලාගේ අදහස ඉදිරිපත් කිරීමට ඉඩකඩ සලසා දුන්නෙ. මෙබඳු ගරු සභාවක, මහජන මන්ත්‍රීවරුන් වශයෙන් විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන්ට යුතුකමක් තිබුණා, ධවල පත්‍රිකාව සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කිරීමට. නමුත් ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නෙ නැතුව, මේ ගරු සභාවෙන් ඉවත් වී හයිඩ් පාක් එකට ගොස් රැස්වීම් තබා මහජනතාව රවටන්න උත්සාහ කළ බව මතක් කර දෙන්න කැමතියි. තමුන්නාන්සේලාට අයිතිවාසිකමක් තිබුණා, බලයක් තිබුණා, මේ ගරු සභාවට ඇවිත් ධවල පත්‍රිකාව සම්බන්ධයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරන්න, තම අදහස් ප්‍රකාශ කරන්න. නමුත් තමුන්නාන්සේලා ඒ දෙය කරන්නෙ නැතුව මහජනතාව රවටන්න උත්සාහ කළා. එහෙම කළේ තමුන්නාන්සේලාට ධවල පත්‍රිකාවට මුහුණ දෙන්න බැරි නිසයි. එවැනි පියවරක් ගැනීම ගැන මා කනගාටු වෙනවා.

ධවල පත්‍රිකාව සම්බන්ධයෙන් මහජනතාව දක්වන කරුණු ගැන පරීක්ෂා කරන බවත්, මහජනතාවගේ කැමැත්ත හැටියට ක්‍රියා කරන බවත්, රාජාසන කථාවෙන් ප්‍රකාශ කර තිබෙනවා. අපේ අගමැතිතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන අගමැතිවරයකු නිසා දිස්ත්‍රික් සභා පිහිටුවීමට වුවමනා නැතැයි මහජනතාව කියනවා නම් අපේ ගරු අගමැතිතුමා කිසි කලෙක ඒ විධියෙ පනතක් ඉදිරිපත් කරන්නෙ නැති බවත් තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි. මේ විධියේ දේශපාලන ප්‍රයෝජන ගැනීම පිණිස තමුන්නාන්සේලා මේ විධියට මහජනයා රවට්ටන්නේ ඇයි කියා මා අහන්න කැමතියි. මේ ආකාරයට සැමදම මහජනතාව රවට්ටන්න බැරි බව මා විරුද්ධ පක්ෂයට මතක් කරනවා.

වෘත්තීය සමිති සම්බන්ධයෙන් කථා කරමින් කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනය සමථයකට පත් කිරීම පිණිස මගෙන් කිසිම දෙයක් ඉටු වුණේ නැහැ කියා. ඒ ගැන මේ අවස්ථාවේදී යමක් කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් මා එතුමාගෙන් එක ප්‍රශ්නයක් අහන්න කැමතියි. එතුමන්ලාගේ කාලයේදී නොයෙකුත් වැඩ වර්ජන ඇති වුණ බව තමුන්නාන්සේ දන්නවා ඇති. ලංකා වෙළඳ සේවක සංගමයේ වැඩ වර්ජන ඇති වුණා. වරායේ වැඩ වර්ජන ඇති වුණා. ලංකා ගමනා ගමන මණ්ඩලයේ වැඩ වර්ජන ඇති වුණා. ඒ අවස්ථාවලදී එවකට බලයේ සිටි ඒ උදවිය වෘත්තීය සමිති සමග සාකච්ඡා කර එම වැඩ වර්ජන සමථයකට පත් කිරීම සඳහා තීරණ ගත්තාද කියා මා අහන්න කැමතියි. එසේ තීරණ ගන්නවා වෙනුවට එතුමන්ලා මොකද කෙළේ ? හදිසි නීතිය පාවිච්චි කර වැඩ වර්ජන කඩා කප්පල් කළා. ඒ වාගේම එදා විදුලි ඉංජිනේරු මහත්වරුන්ගේ වැඩ වර්ජනයක් ඇති වූ අවස්ථාවේදී ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරනවායයි කියන මේ උදවිය ඒ ඉංජිනේරු මහත්වරුන් කැඳවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථා බස් කර තීරණයක් ගත්තාද කියා මා අහන්න කැමතියි. නැහැ, කථානායකතුමනි, හදිසි නීති බල තල පාවිච්චි කර, හමුදාව යොදවා, හමුදාවෙ පෙට්රල් පාවිච්චි කර ඒ ඉංජිනේරු මහත්වරුන් බලෙන් අරගෙන ආ බව කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට මා මතක් කරන්න කැමතියි.

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)

*(திரு. பெர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*

(Mr. Bernard Soysa—Colombo South)

විදුලි පුවත් නිලධාරීන්ගේ වැඩ වර්ජනයේදී තමුන්නාන්සේලා මොකක්ද කෙළේ ? සෝටර් නිලධාරීන්ගේ වැඩ වර්ජනයේදී තමුන්නාන්සේලා මොකක්ද කෙළේ ?

**ගරු එම්. එච්. මොහමඩ්**

*(கௌரவ எம். எச். முகம்மது)*

(The Hon. M. H. Mohamed)

මිලිටේරිය පාවිච්චි කර බයිනෙත්තුවෙ බලෙන් ඒ අය වැඩට ගෙනාවෙ නැති බව මා ප්‍රකාශ කරන්න කැමතියි. ඒ විධියට කිරීමට අපි සූදානම් නැති බවත් මා දකුණු කොළඹ මන්ත්‍රීතුමාට මතක් කරනවා.

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பெர்னட் சொய்ஸா)*

(Mr. Bernard Soysa)

විදුලි පුවත් සේවකයන්ගේ වැඩ වර්ජනයේදී මිලිටේරිය ගියේ නැද්ද ?

**ද සොයිසා සිරිවර්ධන මයා.**

*(திரு. டி சொய்சா சிறிவர்தன)*

(Mr. de Zoysa Siriwardena)

ඒවා මතක නැහැ.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Please do not listen to interruptions.

**ගරු එම්. එච්. මොහමඩ්**

*(கௌரவ எம். எச். முகம்மது)*

(The Hon. M. H. Mohamed)

කථානායකතුමනි, දැන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන මේ මහත්වරුන් එදා වැඩ වර්ජන කඩාකප්පල් කෙළේ ඔය විධියටයි. ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන මහත්වරු පෞද්ගලික වෙළඳාමටත් ගමේ ගොඩේ සිටින දුප්පත් වෙළෙන්දාටත් පහර ගැසූ බව තමුන්නාන්සේට මතක ඇති. ඒ බව වෙළඳුන්ට නවම මතක තිබෙන බව මා ගරු කොලොන්නාවේ මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි. වෙළෙන්දන් මෝඩයන් නොවෙයි. තමුන්නාන්සේලාගේ අතට බලය ලැබුනා නම් අද පොඩි වෙළෙන්දනුත් නැති බව, ලොකු වෙළෙන්දනුත් නැති බව, තමුන්නාන්සේලා පෞද්ගලික අංශය සම්පූර්ණයෙන්ම නැති කරන බව ඒ අය දන්නවා. ඒ නිසා දැන් තමුන්නාන්සේලා පෞද්ගලික අංශයට පන්දම් ඇල්លුවාට ඒ අය ඒ පන්දම්වලට රැවටෙන්න නැති බවත් මා මතක් කරන්නට කැමතියි. පෞද්ගලික අංශයටත්, ආණ්ඩුවේ අංශයටත් දෙකටම එක විධියේ උරුමයක්— අයිතිවාසිකමක්— තිබෙන බව අපේ ආණ්ඩුව පිළිගන්නවා. ඒ නිසා පෞද්ගලික අංශයට හිරිහැරයක් නැතිව ඔවුන්ගේ වෙළඳාම ගෙන යාමට ඉඩ තිබිය යුතු බව අප පිළිගන්නවා. ඒ නිසා දැන් තමුන්නාන්සේලා පෞද්ගලික වෙළඳුන්ට පන්දම් අල්ලන්නට උත්සාහ කරන විට ඒ අය ඒකට රැවටෙනවාය කියා හිතනවා නම් ඒක දවල් හීනයක් බව මා මතක් කරන්නට කැමතියි. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ තර්කවලින් අවශ්‍ය ඒවාට පිළිතුරු දුන්නාය කියා මා කල්පනා කරනවා. ඒ ගැන ඊට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, අපේ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මහජනයා රවටන්නට මේ විධියේ සංශෝධන කීපයක් ඉදිරිපත් කර තිබෙනවා. සමහර කරුණු ගැන කිසිම දෙයක් දන්නෙ නැතිව ඒ කරුණු ගැන සංශෝධන ඉදිරිපත් කර තිබෙන බව මට ඔප්පු කරන්නට පුළුවන්. විරුද්ධ පාර්ශ්වය විසින් ඉදිරිපත් කර තිබෙන සමහර සංශෝධන ඒ අයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. එච්. මොහමඩ්]

තේරෙන්නේ නැහැ. මහජනයා රැවටීම සඳහා ඒ විධියේ සංශෝධන ඉදිරිපත් කර තිබෙන බව මා මතක් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, මගේ අංශය ගැන බලමු. (බාධා කිරීමක්) මා රජයේ භාෂාවෙන් කථා කිරීම විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට විහිළුවක් වගේ පෙනෙනවා. සිංහල භාෂාව ගැන කැක්කුමක් තියෙනවාය කියන මන්ත්‍රීවරුන්ට මගේ සිංහල කථාව විහිළුවක් වීම ගැන සිංහල ජනතාවට මගේ කණගාටුව ප්‍රකාශ කරන්නට කැමතියි. වෘත්තීය සමිති ආඥාපනත ක්‍රියාවේ යෙදෙන අන්දම පරීක්ෂා කර බැලීමට පත් කරන ලද කොමිටියේ සමහර තීරණ අනුව වෘත්තීය සමිති ආඥාපනත සංශෝධනය කරන්නට බලාපොරොත්තු වන බව රාජාසන කථාවේ සඳහන් වී තිබෙනවා. ඒ කොමිටියේ රපෝර්තුව ඒ කිසිම කෙනකු දැකලවත් නැති බව මට ඔප්පු කරන්නට පුළුවන්. ඒ පිළිබඳව විරුද්ධ පාර්ශ්වයේ සංශෝධනය මොකක්ද ?

මේකයි, විරුද්ධ පාර්ශ්වයේ සංශෝධනය :

" indicates that the Government in line with its general anti-trade union policy intends to base its proposals to effect amendments to the Trade Unions Ordinance on the biassed and reactionary report of the Jayawardene Committee . . . . ".

What is the Jayawardene Committee ?

ජයවර්ධන කොමිටියක් තිබෙන්නේ කොහේද? වෘත්තීය සමිතිය සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීමට පත් කළ කොමියට ජයවර්ධන කෙනකු ඇත්තේ නැහැ. එහෙම නම් එහි සභාපතිතුමා කවුද ? රාමනාදන් මහත්මයායි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් ඒ රාමනාදන් වාර්තාව තවමත් කියවා නැහැ. එසේ කියෙව්වා නම් ජයවර්ධන කෙනකුගේ නමක් මේ සංශෝධනයට ඇදා ගන්නේ නැහැ. ජයවර්ධන කෙනකු තවත් කොමිටියක වැඩ කරගෙන යනවා. එහෙත් තවම ඒ වාර්තාව සූදානම් නැහැ. කම්කරු ආරාවුල් පනත ගැන සොයා බලන්නටයි, ඒ කොමිටිය පත් කර තිබෙන්නේ. අර ඉහත කී කොමිටියට රාමනාදන් මහතාත් තවත් දෙදෙනකුත් ඇතුළත් වෙනවා. හැබැයි, ජයවර්ධන කෙනකු නම් ඒ කොමිටියට නැහැ. මෙයින් පෙනී යන්නේ ඒ කොමිටියේ වාර්තාව නොකියවා මෙම සංශෝධනය ඉදිරිපත් කර තිබෙන බවයි. මෙය කරුණු හරිහැටි කල්පනා කර ඉදිරිපත් කරන ලද සංශෝධනයක් නොව දේශපාලන ප්‍රයෝජන සලකා ඉදිරිපත් කළ සංශෝධනයක් පමණයි. මේ විධියේ සංශෝධන ඉදිරිපත් කිරීම ගැන අප කනගාටු වෙනවා. තවද, ප්‍රතිගාමී අදහස් තිබෙන වාර්තාවක් ඒ කොමිටිය විසින් ඉදිරිපත් කරනු ලැබ තිබෙන බවත් විරුද්ධ පාර්ශ්වයේ සංශෝධනයෙන් කියැවෙනවා. රාමනාදන්, ජයසුන්දර අබූබකර් යන තිදෙනායි, ඒ වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ වාර්තාවේ සඳහන් නිර්දේශවලින් සුදුසු ඒවා පමණක් ක්‍රියාත්මක කිරීම සඳහා සංශෝධන ඉදිරිපත් කරන්නටයි, ආණ්ඩුව අදහස් කරන්නේ. වෘත්තීය සමිති පිළිබඳ ආඥාපනත සංශෝධනය කරන්නට පෙර ඒ වාර්තාවේ සඳහන් නිර්දේශ ගැන හොඳ හැටි කල්පනා කර බලනවා. වෘත්තීය සමිතිවලට පහර නොවදින කාරණා සම්බන්ධයෙන් පමණක් සංශෝධන ඉදිරිපත් කරන්නටයි, බලාපොරොත්තු වන්නේ. මේ කොමිටිය කියා ඇති කාරණා ගැන ටිකක් කල්පනා කර බලමු.

" to provide for the recognition of trade unions for workers by employers "

මොකක්ද මේකේ තිබෙන වරද? වෘත්තීය සමිති පිළිගන්නා හැටියට සවාමි පක්ෂයට නියම කිරීම වරදක්ද? කලින් සිට පැවත එන නීතියේ මේ සඳහා ඉඩක් නැහැ. වෘත්තීය සමිති පිළිගන්නැයි ස්වාමි පක්ෂයට බල කිරීමට ඉඩක් නැහැ. ඒ කොමිෂන් සභා වාර්තාවේ කියා තිබෙනව, වෘත්තීය සමිති පිළිගන්න ලෙස ස්වාමි පක්ෂයට බල කළ යුතුය කියා. ඒකෙ වරදක් නැහැ නේද? අපි ඒ විධියේ සංශෝධනයක් ගෙනෙනව නම් තමුන්නාන්සේලා සියලු දෙනාම ඒක පිළිගන්න ඕනෑ. "චෙක් ඕෆ්" නැත්නම් වෘත්තීය සමිති දායක මුදල් වැටුපෙන් අය කර ගැනීමට බල කළ යුතු යයි කොමිෂන් සභාව නිර්දේශ කර තිබෙනව. ලංකාවේ පළමුවෙනි වරට පෞද්ගලික අංශයේ සේවකයින්ගේ වැටුපෙන් වෘත්තීය සමිති දායක මුදල් අය කර ගන්න බලය දුන්නෙ මේ ආණ්ඩුවයි. වෘත්තීය සමිති නායක

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

වශයෙන් සිටි නමුත් ඒ උදවිය ඒ කාර්යය ඉටු නොකළ බව මතක් කරන්ට සතුටුයි. දැන් සී. ඩබ්ලිව්. සී. සී. එම්. යූ. ආදි වෘත්තීය සමිතිවල සේවකයින්ගේ දායක මුදල් ඔවුන්ගේ වැටුපෙන් අඩු කර ගන්නව. ඒ ප්‍රගතිශීලී ක්‍රමය මේ ආණ්ඩුව පිළිගත් බව මතක් කරන්ට කැමතියි. ඒක නීතියක් වශයෙන් ගෙනාවාම නරකද?

ගරු කථානායකතුමනි, වෘත්තීය සමිති පිළිබඳ වැඩ කටයුතු සඳහා කම්කරු දෙපාර්තමේන්තුව නොව, වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවන්නට අපි සූදානම්. ඒක හොඳ දෙයක්ද, නරක දෙයක්ද, තමුන්නාන්සේලා ඒක පිළිගන්නවාද, නැද්ද කියා මා ප්‍රශ්න කරනව.

ඊළඟට වෘත්තීය සමිතිවල මුදල් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් මම සුළු විස්තරයක් කරන්ට කැමතියි. නීතියේ හැටියට වෘත්තීය සමිතිවලට අද පුළුවන්කම තිබෙනව, ඒ උදවියට වුව මනා හැටියට වෘත්තීය සමිතියට අයත් මුදල් පාවිච්චි කරන්න. මැතිවරණ අපේක්ෂකයකු හැටියට ඉදිරිපත් වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ ලංකා සමසමාජ පක්ෂයේ හෝ වෙනත් ඕනෑම නියෝජිතයකු හෝ වෙනුවෙන් මැතිවරණ කටයුතු සඳහා මුදල් වියදම් කළ යුතුයයි යෝජනාවක් සම්මත කරගෙන ඔහු වෙනුවෙන් වෘත්තීය සමිතියේ මුදල් වියදම් කරන්ට දැනට වෘත්තීය සංගම්වලට බලය තිබෙනව. අද පාර්ලිමේන්තුවට පත් වී සිටින ඇතැම් මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඒ අන්දමට මුදල් පාවිච්චි කර තිබෙන බව කොමිසම කරුණු විභාග කරද්දී එළිදරව් වූ බව මතක් කළ යුතුයි. ඒ වගේම ඇතැම් වෘත්තීය සමිති නිලධාරීන් පිටරට යාම සඳහා මේ වෘත්තීය සංගම්වල මුදල් පාවිච්චි කර තිබෙනව. මෙය නුසුදුසු දෙයක් බව, මෙය දුප්පත් කම්කරුවන්ගේ මුදල්වලින් අයුතු ප්‍රයෝජනයක් ගැනීමක් බව, අපි පිළිගන්න ඕනෑ. එම නිසා කොමිෂන් සභාව නිර්දේශ කර තිබෙනව, මේ තත්ත්වය වළක්වන්න නීති ගෙනෙන්ට ඕනෑය කියා. එහෙත් වෘත්තීය සමිතියට සම්බන්ධ කෙනෙක් මැතිවරණයකට ඉදිරිපත් වෙනවා නම් ඔහු වෙනුවෙන් වෘත්තීය සමිතියේ මුදල් වියදම් කරන්නට බලය ලැබෙන පරිදි මේ නීති සංශෝධනය සිදු විය යුතු බව කොමිෂන් සභාව රෙකමදාරු කර තිබෙනව. ඒක සුදුසු දෙයක්. වෘත්තීය සමිතියට සම්බන්ධකම් නැති කෙනකු වෙනුවෙන් වෘත්තීය සමිතියේ මුදල් වැය කිරීම නුසුදුසු දෙයක් බව තමුන්නාන්සේලාත් පිළිගන්න ඕනෑ. එම නිසා මේ තත්ත්වය වැළැක්වීම සඳහා නීති පනවන්ට අපි බලාපොරොත්තු වන බව මතක් කරන්ට කැමතියි.

වැඩ වර්ජනයක යෙදෙන්නට තීරණය කරන්නට ඉස්සර ඒ ගැන රහස් ඡන්දයක් මගින් කැමැත්ත දැන ගැනීම වැදගත් දෙයක්. වෘත්තීය සමිතියක සාමාජිකයින් වැඩි දෙනෙක් වැඩ වර්ජනයකට කැමැත්ත පළ කර සිටියොත් වැඩ වර්ජනය කරන්නට බලය තිබීම සුදුසුයි. මේ ගැන අපි මොහොතක් කල්පනා කර බලමු. මේ ප්‍රතිපත්තිය අපේ ආණ්ඩුව පිළිගෙන ඇතැයි මම කියන්නේ නැහැ. ඒ ගැන ආණ්ඩුව සාකච්ඡා කරගෙන යනවා. ලංකාවේ අද ඇති වන වැඩ වර්ජන ගැන කල්පනා කර බලන්න. සාමාජිකයින් තිස්පන්දහක් ඉන්න සමිතියක් තිබෙනවායයි හිතමු. එවැනි සමිතියක කොමිටියක් තිබෙනවායයි හිතමු. ඒ කොමිටියේ තිස් දෙනෙක් පමණ සාමාජිකයන් ඇති. ඒ තිස් දෙනා එකතුවෙලා, අපි අද සිට වැඩ වර්ජනයක් කරමු කියා තීරණය කරනවා. මෙයින් සිද්ධ වන්නේ මොකක්ද? මීට කී දෙනෙක් ඇත්තෙන්ම කැමැතිදැයි දන්නේ නැහැ. අද මෙවනි දේවල් සිදු වෙනවා. එයින් අපේ කම්කරුවන්ට විශාල හානියක් සිදු වෙනවා. සමහර කම්කරුවන් මේ විධියේ වැඩ වර්ජනයක් ගැන කිසිම දෙයක් දන්නේ නැහැ. වැඩ වර්ජනයක් ඇති වුණාම, කම්කරුවන් බොහොම දෙනා තමන්ගේ කැමැත්තක් ඊට ප්‍රකාශ කර නැතැයි කියනවා. ඒ කොයි හැටි වෙතත් ඒ අයත් ඒ වැඩ වර්ජනයට සහභාගි වෙනවා. එතකොට මොකක්ද සිද්ධ වන්නේ? ඒ අයට පඩි නැති වෙනවා. වැඩ වර්ජනය පටන්ගත් දා සිට පඩි නැති වෙනවා. එයින් ඒ අයට විශාල හානියක් සිදු වන නිසා මේ සම්බන්ධයෙන් තමන්ගේ කැමැත්ත අනුව ක්‍රියා කරන්නට බලයක් ඒ අයට තිබෙන්නට ඕනෑ. වැඩ වර්ජනයක් ඇති කිරීම සම්බන්ධයෙන් රහස් ඡන්ද මාර්ගයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. එච්. මොහමඩ්]

කැමැත්ත හෝ අකැමැත්ත ප්‍රකාශ කිරීමේ අයිතියක් ඒ අයට තිබීම ඒ නිසා සුදුසුයි. ඒ අයිතිය කම්කරුවන්ට ලබා දීම සඳහා නීතියක් සකස් කර ගැනීමේදී අපට විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලාගේත් සහයෝගය අවශ්‍යයි. ඒ සහයෝගය දෙතොත් ඒ මගින් මේ රටේ කම්කරුවන්ට විශාල දියුණුවක් ලබා ගන්නට පුළුවන් වන බව මතක් කරන්නට කැමතියි. මේ ගැන බිය වන්නට කිසිම හේතුවක් නැහැ. තමුන්නාන්සේලා වාගේ හදිසියෙන් මේ නීතිය ඉදිරිපත් කර, සම්මත කරවා ගන්නට අපි බලාපොරොත්තු වන්නේ නැහැ. තව දුරටත් මේ ගැන කරුණු සොයා බලනවා. තව දුරටත් කල්පනා කර බලනවා. ආණ්ඩුව හැකි තාක් ඉක්මණින් ඒ ගැන තීරණයක් ගන්නවා. මේ ගැන වෙන කියන්නට දෙයක් නැහැ. මේ සම්බන්ධයෙන් ජයවර්ධන කොමිටි වාර්තාව කියා දෙයක් නැහැ. ඒ බව නොදන්නා වෘත්තීය සමිතියක් නැහැ. ශ්‍රී රාමනාදන් මහත්මයාගේ ප්‍රධානත්වයෙන් ඉදිරිපත් කළ වාර්තාවක් තිබෙනවා. ජයවර්ධන මහත්මයා ඊට සම්බන්ධ නැති බව නැවත වරක් මතක් කරන්නට කැමතියි.

පඩි මණ්ඩලයක් ඇති කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ බව රාජාසන කථාවේ සඳහන් වෙනවා. ඊට කම්කරු පක්ෂයෙන් දෙදෙනකුත්, ස්වාමි පක්ෂයෙන් දෙදෙනකුත්, මහජනයාගෙන් දෙදෙනකුත්, ආණ්ඩුවෙන් දෙදෙනකුත් පත් කරන්නට බලාපොරොත්තු වෙනවා. අනෙකුත් කම්කරුවන් ගැන කරුණු සියල්ලක්ම සම්පූර්ණයෙන් සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වෙනවා. ඉංජිනේරු අංශයේ ඉන්න සියලු දෙනාත් ඇතුළු හැම දෙනාගේම පඩි සම්බන්ධයෙන් ද ඒ විධියේ දෙයක් ඇති කරන්නට බලාපොරොත්තු වෙනවා. මා හිතන හැටියට මෙය ප්‍රගතිශීලී ක්‍රියාවක්. ප්‍රතිගාමී ක්‍රියාවක් කියා කිසි කෙනෙකුට කියන්න පළුවන් කමක් නැහැ. මෙම පඩි මණ්ඩලයෙන් කම්කරුවන්ට විශාල සේවාවක් වන බව මා ප්‍රකාශ කරන්න කැමතියි. දැන් මේ සම්බන්ධ නීති මාලාවත් සූදානම් කර අවසානයි. මේ නීති මාලාව පුළුවන් තරම් ඉක්මනින් තමුන්නාන්සේලා ඉදිරි

යේ තබන්න අදහස් කරනවා. තමුන්නාන්සේලා හැම විටම කියනවා තමුන්නාන්සේලා කරන්නේ ප්‍රගතිශීලි වැඩය කියා. තමුන්නාන්සේලා කරන හැම වැඩක්ම ප්‍රගතිශීලියි. අපි කරන හැම වැඩක්ම ප්‍රතිගාමියි. තමුන්නාන්සේලා කියන්නේ ඒ විධියටයි. මේක හරිම පුදුම කතාවක් නේද? තමුන්නාන්සේලා කරන දේවල් ඔක්කොම ප්‍රගතිශීලියි. අපි කරන හැම දේවල්ම ප්‍රතිගාමියි. ගරු කථානායකතුමනි, මෙය හරිම පුදුම කතාවක් නේද? ඒ නිසා ප්‍රගතිශීලිය, ප්‍රගතිශීලිය, කියන මහත්වරුත් මේ ප්‍රගතිශීලි පනතටත් පක්ෂව ඡන්දය දෙනවා ඇති කියා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මා දැන් පැයක් පමණ වේලාවක් කථා කර තිබෙනවා. රුපියලේ මිල අඩු කිරීමෙන් පසුව කම්කරුවන්ට ප්‍රයෝජනවත් වන අන්දමට හදිසි නීතිය පාවිච්චි කළ ආණ්ඩුවක් වේ නම් ඒ අපේ ආණ්ඩුව බව මා තමුන්නාන්සේලට ප්‍රකාශ කරන්න කැමතියි. තමුන්නාන්සේලා මෙන් කම්කරුවා බිය විද්දවා වැඩ ගැනීමට අපි මේ හදිසි නීතිය පාවිච්චි කළේ නැහැ. අපි හදිසි නීතිය පාවිච්චි කළේ කම්කරුවන්ට සහනයක් ලබා දීම සඳහා බව මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. අතිකුත් කරුණු ගැන අයවැය ලේඛනය ඉදිරිපත් කළ විට තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්නම්. මේ රාජාසන කථාවෙන් කියා තිබෙන පරිදි පඩි පාලක මණ්ඩලයක් අප විසින් ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේලා සියලු දෙනා විසින්ම එය පිළිගන්න ඕනෑ. මේ විධියේ පඩි පාලක සභා වැඩිම ගණනක් ඉදිරිපත් කරන ලද්දේ මේ ආණ්ඩුව බලයට පැමිණීමෙන් පසුව බව තමුන්නාන්සේලා හැම දෙනාම පිළිගන්නවා ඇති. ලක්ෂ ගණන් කම්කරුවන්ට මෙයින් සහනයක් ඇති වෙන බව මේ අවස්ථාවේදී ප්‍රීතියෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, තවත් කරුණක් කියන්න ඕනෑ. කම්කරු ඇමති හැටියට මගෙන් හෝ මෙම ආණ්ඩුවෙන් හෝ වෘත්තීය සමිතිවලට පහරක් නොවැදෙන බව ප්‍රකාශ කරන්න ඕනෑ. වෘත්තීය සමිති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

චලට තවත් වැඩියෙන් බලතල දෙන්න මේ ආණ්ඩුව සූදානම් බව තමුන්නාන්සේලාට මතක් කර දෙන්න ඕනෑ. ඒ නිසා මේ විධියේ ප්‍රගතිශීලී දේවල් ඉදිරිපත් කරන විට තමුන්නාන්සේලාගේ සහයෝගය අපට ලැබෙන්න ඕනෑ. මැද කොළඹ තුන්වෙනි මන්ත්‍රීතුමා නම් හිනහ වෙනවා. එයින් පෙනී යන්නේ එතුමා නම් මෙයට සහයෝගය දෙන බවයි. මා තව දුරටත් මේ ගැන කථා කරන්න අදහස් කරන්නේ නැහැ. මගේ කථාවට සවන් දුන් කථානායකතුමාටත්, මේ ගරු සභාවටත් ස්තුති කරමින් කථාව අවසන් කරනවා.

අ. භා. 2.57

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரி. பி. எம். ஹேரத்—வளப்பனை)*
(Mr. T. B. M. Herath—Walapane)

ගරු කථානායකතුමනි, මේ රාජාසන කතා විවාදයේ ආණ්ඩු පක්ෂයේ වැදගත් ඇමතිවරයකුගේ කථාවකින් පසු මගේ කථාව කරන්න අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. කෙසේ වුණත් එතුමා රාජ්‍ය භාෂාවෙන් කථා කිරීම ගැන මගේ ස්තුතිය එතුමාට පිරිනමන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ සිටින අනිකුත් සිංහල ඇමතිවරුන්ගෙන් මා ඉල්ලා සිටිනවා කම්කරු ඇමතිතුමන් ආදර්ශයට ගන්නා ලෙස. එතුමාගේ කථාව ආරම්භ කළ තැන සිට ඉදිරිපත් කරන ලද කරුණු පසුව මම විවේචනය කරන්නම්. එහෙත් එතුමා අද කරන ලද ක්‍රියාව නම් ඇත්ත වශයෙන්ම ප්‍රශංසනීයයි. එතුමාගේ කථාවෙන් හතරෙන් තුන් කොටසක් පමණ පාවිච්චි කරන ලද්දේ කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) විසින් පවත්වන ලද කතාව විවේචනය කිරීමට සහ කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා විවේචනය කිරීමටයි. එතුමා කිව්වා, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරන්නට කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට අයිතියක් නැත; එතුමා මාක්ස්වාදියෙක්ය යනුවෙන්. මාක්ස්වාදය සමාජවාදය යනාදියෙහි අදහස් ලෝකයෙහි පැතිරෙන අවස්ථාවලදී එසේ පතුරුවන්නාවූ ව්‍යාපාරවලට විරුද්ධව කුණු බාල්දි හැලූ උදවිය ලෝක ඉතිහාසයෙන් පවා ඕනෑ තරම් පෙනෙනවා. ජර්මනියේ හිට්ලර්, ඉතාලියේ මුසෝලිනී, වැනි අය එවැනි ව්‍යාපාරවලට කුණු බාල්දි හැලීමට යාම නිසා තමන්ගේ රාජ්‍යයත් තමන්ගේ රටත් තමන්ගේ නායකත්වයත් නැති කර ගත් බව ලෝක ඉතිහාසයෙන් පෙනී යනවා. එසේම තමන් විසින් හලන ලද කුණු බාල්දියටම කම්කරු ඇමතිතුමා යට නොවේවා කියා මා පතනවා. කම්කරු ඇමතිතුමා දේශපාලනය ආරම්භ කළේ කෙසේද කියා එතුමා සිතුවා නම් කවදාවත් මෙම කතාව කරන්නේ නැහැ.

**සී. ආර්. බෙලිගම්මන මයා. (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. சி. ஆர். பெலிகம்மன—உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. C. R. Beligammana—Parliamentary Secretary to the Minister of Home Affairs)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මාක්ස්වාදය අනුගමනය කරනවාද? [බාධාකිරීමක්]

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒකට උත්තර දෙන්නම්. මටත් කලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටි කෙනෙක් හැටියට තමුන්නාන්සේ—

**බෙලිගම්මන මයා.**
*(திரு. பெலிகம்மன)*
(Mr. Beligammana)

ඒක වෙනම දෙයක්. මම එහි ආරම්භක සාමාජිකයෙක්. [බාධාකිරීමක්]

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මා ආවේ කාගෙවත් ප්‍රශ්නවලට උත්තර දෙන්නට නොවෙයි. මා ආවේ මට වුවමනා ප්‍රශ්නවලට උත්තර දෙන්නයි. ප්‍රශ්නයක් ඇහුවොත් ඒ ප්‍රශ්නයට උත්තර දෙනවා.

කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ප්‍රජාතන්ත්‍රවාදියෙක් නොවේය, මාක්ස්වාදියෙක්ය යනුවෙන් කම්කරු ඇමතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

විසින් කරන ලද ප්‍රකාශයට පිළිතුරක් දෙන්නටයි, මා උත්සාහ දරන්නේ. එහෙම චෝදනාවක් කරන්නට කම්කරු ඇමතිතුමාට අයිතියක් නැහැ. කම්කරු ඇමතිතුමා දේශපාලන ජීවිතය ආරම්භ කර තිබෙන්නේ මාක්ස්වාදය තුළිනුයි; මාක්ස්වාදියකු හැටියටයි. [බාධාකිරීමක්] එතුමා සාමාජිකයකු නොවෙයි කිව්වා. එතුමා සාමාජිකයකු වුණා නම් සමහරවිට ඔහොම කතා කරන එකක් නැහැ. උන්නැහේ සාමාජිකයන් පස්සේ ගිය කෙනෙක්. එම නිසයි, එම උෂ්ණය හරියාකාර වැදිලා නැත්තේ. එම උෂ්ණය හරියට වැදුණා නම් උන්නැහේ කවදාවත් මෙහෙම කතා කරාවිය කියා මා සිතන්නේ නැහැ.

අපේ ගරු අගමැතිතුමාගේ දේශපාලන කතාවකට ඇහුම්කන් දෙනවා නම්, එතුමාගේ දේශපාලන ප්‍රතිපත්ති ගැන කතා කරනවා නම්, අපට පෙනී යන්නේ කුමක්ද? අද රාජ්‍ය ඇමතිතුමා පවා කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ක්‍රමයක් මේ රටේ ඇති කරනවාය කියන එකයි. එතුමන්ලාට තියෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ප්‍රතිපත්තියක් නම්, එතුමන්ලාගේ පක්ෂය කුමන පක්ෂයක් වුවත් එය ඇතුළේ සමාජවාදී ක්‍රමයක් තිබෙන්නට ඕනෑ. [බාධාකිරීම්] මාක්ස්වාදයත් සමාජවාදයත් කියන දෙකේ තේරුම තමුන්නාන්සේට නොතේරෙනවාට මොකද මේ රටේ පුංචි ළමයකුට වුවත් තේරෙනවා. ඒක බොහොම සුළු දෙයක්. [බාධාකිරීමක්] දවසක තමුන්නාන්සේලා ආවොත් පැය දෙකක පාඩමක් දෙන්නම්. ඒවා පැරණි පුරුදු පාඩම්. තමුන්නාන්සේ සමසමාජ පක්ෂයේ සිටියදී මාක්ස්වාදය ඉගෙන ගන්නට ඇති. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටියදී එහි ප්‍රතිපත්ති ඉගෙන ගන්න ඇති.

**බෙලිගම්මන මයා.**
*(திரு. பெலிகம்மன)*
(Mr. Beligammana)

සමසමාජ පක්ෂයේ කිසිම දිනෙක ඉඳලා නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භක සාමාජිකයෙක්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටියා. ඊට ඉස්සෙල්ලායි එහෙනම් තමුන්නාන්සේ කම්කරු ඇමතිතුමා වාගේ පස්සෙන් ගිහිල්ල තියෙන්නේ. තමුන්නාන්සේලා හුඟ දෙනෙකුට මේවා ගැන පාඩම් උගන්වන්නට සිදු වී තිබෙනවාය කියා මට සිතෙනවා. රටේ ජනතාව වැඩි කල් යන්නට මත්තෙන් එය කරනවා ඇති. [බාධාකිරීමක්] බය වන්නට එපා. ඒ වැඩේ හරියට කෙරේවි.

ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයිතියක් නැතිලු. ප්‍රජාතන්ත්‍රවාදය රැක්කේ මේ ආණ්ඩුවලු; ඒ උදවිය නොසිටින්නට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැතිලු. මේක පුදුම කථාවක්. 1964 දී සභාග රජය බලයේ සිටින අවස්ථාවේදී, තමුන්නාන්සේලා කියන විධියට, මැතිවරණයක් නොතබන්නට ඒ රජය අදහස් කළා නම් එසේ කරන්නට ඕනෑතරම් ඉඩකඩ තිබුණා. කවදාවත් එවැනි දෙයක් කරන්නට ඒ රජය අදහස් කෙළේ නැහැ. මැතිවරණයකින් රජයක් තෝරා ගැනීමට මහජනයාට නිදහස දීම සඳහා මැතිවරණයක් පැවැත්තුවා. 1956 බණ්ඩාරනායක රජයත් ඒ අයිතිය මහජනයාට දුන්නා; 1960 දී ඇති වුණු සිරිමා බණ්ඩාරනායක රජයත් ඒ අයිතිය මහජනතාවට දුන්නා. එහෙම නම්, තමුන්නාන්සේලා මේ ගරු සභාවට ඇවිත්, "ඒකාධිපති ක්‍රමයක් ඇති වන්නට ගිය නමුත් අප එය නැති කළාය" යි කියන්නේ කොහොමද? තමුන්නාන්සේලා නැති කළ දෙයක් නෑ. එදා තිබුණු ආණ්ඩුව පාර්ලිමේන්තුව විසුරුවා හැර, තමන් කැමති රජයක් ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා ගැනීමට මහජනයාට ඉඩ දුන්නා. එම නිසා, අප ඒකාධිපති ක්‍රමයක් ඇති කරන්නට සූදානම් වුණායයි චෝදනා කිරීම සම්පූර්ණයෙන්ම අසාධාරණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රජාතන්ත්‍රවාදය රක්කාය කියමින් කෑගහන මේ ආණ්ඩුව එය රක්ක හැටි අප දන්නවා. අද බොහෝම ලොකුවට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන මේ ආණ්ඩුව 1965 දී පළමුවෙන්ම කෙළේ මිනිසුන්ගේ රැකීරක්ෂා නැති කිරීමයි. ගුරුවරුන්ගෙන් පටන් ගත්තා. මාතර සිටි ගුරුවරයා වවුනියාවට යැව්වා ; කොළඹ සිටි ගුරුවරයා මන්නාරමට යැව්වා ; එහෙම නැත්නම් මඩකලපුවට හෝ ත්‍රිකුණාමලයට යැව්වා. භාර්යාව තංගල්ලේ, සවාමිපුරුෂයා වඩුක්කොඩේ. මන්ත්‍රීවරුන්ගේ භාර්යාවන් පවා රක්ෂාවලින් දොට්ට දැම්මා. දිගට හරහට රජයේ සේවකයන්ට පහර ගැහුවා. එහෙත් එක්සත් ජාතික පක්ෂයට වැඩ කළ උදවියට ඕනෑතරම් ඉඩ දුන්නා. ඔවුන්ට විරුද්ධව තිබුණු චෝදනාවලින් ඔවුන් සම්පූර්ණයෙන්ම නිදහස් කළා. මේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදය එයයි. ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් හඳුන්වන්නේ තමන්ට පමණක් බෙදා ගැනීමද ? මේවාට උත්තර දෙන්නට බැරි නිසා තමයි ගරු කම්කරු ඇමතිතුමා කලින්ම නැගිට ගියේ. එතුමන්ලාගේ ප්‍රජාතන්ත්‍රවාදය තමන්ට පමණක් බෙදා ගැනීමයි. 1966 ජනවාරි 8 වැනිදා කළු කොඩියක් එල්ලීම නිසා හෝ සංකේත වැඩ වර්ජනයක යෙදීම නිසා හෝ රැකීරක්ෂා නැති වුණු දේශ ප්‍රේමී, භාෂා ප්‍රේමී කම්කරුවන් දහස් ගණනක් තවමත් ඉතා දුක්ඛිත තත්ත්වයක සිටිනවා. මේකයි මේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදය. එදා ගරු අගමැතිතුමාට පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා ඉතා සන්සුන්ව මේ ස්ථානයට එන්නට පිටත් වුණු මහා සංඝයා වහන්සේට වෙඩි තබා දඹරාවේ රතනසාර ස්වාමීන් වහන්සේ මරා දැම්මේ මේ රජයේ ප්‍රජාතන්ත්‍රවාදය අනුවද ? එහෙත් කම්කරු ඇමතිතුමා මෙතැනට ඇවිත්, "අප තමයි නියම ප්‍රජාතන්ත්‍රවාදියෝ, අප තමයි ප්‍රජාතන්ත්‍රවාදය රක්කේ, අප තමයි ප්‍රජාතන්ත්‍රවාදය බේරා ගත්තේ" කියමින් මේ සභා ගර්භය දෙදරින්න කෑගහනවා. රැකීරක්ෂා කාර්යාලය තිබෙන්නේ එතුමාගේ ගෙදර. එතුමා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන හැටි එයින්ම පෙනෙනවා. [බාධාකිරීමක්] ඔව්. කාට හෝ රක්ෂාවක් ලබා දෙන්නට තමුන්නාන්සේට ඕනෑකම තිබෙනවා නම්, ඒ සඳහා රැකීරක්ෂා කාර්යාලයට යන්න එපා. යන්න කම්කරු ඇමතිතුමාගේ ගෙදරට. හෙට රක්ෂාව ලැබෙයි.



**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்ரும் அங்கத்தவர்)*
(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

සම්පූර්ණ ඇත්ත.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

එතුමාගේ ප්‍රජාතන්ත්‍රවාදය ඔක තමයි. මේ තත්ත්වය නිසා එක් අතකින් රජයේ සේවකයාත් අනික් අතින් රටේ පොදු මහජනතාවත් බියෙන් වෙවුලමින් ඉතාම ත්‍රාසජනක තත්ත්වයකට පත්ව සිටිනවා. පීඩනයෙන් පීඩනයට පත්ව සිටිනවා. තවත් අතකින් මහජනතාව කන්න නැතිව, රක්ෂා නැතිව පීඩා විඳිනවා. තවත් පැත්තකින් ජ්‍යෙෂ්ඨය සමතුන් ලක්ෂ ගණනකුත් විශ්ව විද්‍යාලවලින් පිට වන උපාධිධරයන් දහස් ගණනකුත් රැකීරක්ෂා නැතිව ළත වෙනවා. සමහර ඇමතිවරුන්ට යන යන තැන හූව ලැබෙන්නේ ඒ නිසයි. රටේ මෙවැනි තත්ත්වයක් තිබියදී, තමුන්නාන්සේලා මෙතැනට ඇවිත්, "මේ තරම් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් මේ රටේ ඇති වුණේත් නැහැ, ඇති වන්නේත් නැහැ යි කියන්නේ කොහොමද ? මෙවැනි ගරු සභාවකට ඇවිත් එසේ කියන්නට පුළුවන්ද තමුන්නාන්සේලාට ? "අප කර තිබෙන්නේ මොනවාද" යනුවෙන් හිතා බලන්නට ඇමතිවරයකුට පුළුවන් විය යුතුයි.

විරුද්ධ පාර්ශ්වය රාජාසන කථාවට සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ මහජනයා රැවටීමටයයි ගරු කම්කරු ඇමතිතුමා කියනවා. රාජාසන කථා පැවැත්වුණු හැම අවස්ථාවකදීම විරුද්ධ පාර්ශ්වය ඊට සංශෝධන ඉදිරිපත් කළා. එතුමාගේ පක්ෂය මේ පැත්තේ සිටින කාලයේදීත් ස්තුති යෝජනාවලට සංශෝධන ඉදිරිපත් කළා. විරුද්ධ පක්ෂයක් සිටින්නේ ආණ්ඩුව කළත් හැම එකකටම "එහෙයි"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]
කියන්න නොවෙයි; ඒවා විවේචනය කරන්නයි. එමෙන්ම සංශෝධන ඉදිරිපත් කර තර්ක විතර්ක කර, වාද විවාද කර මේ පාර්ලිමේන්තුවෙන් කෙරෙන සේවය වඩා හොඳ තත්ත්වයකින් කරන්නටයි විරුද්ධ පක්ෂයක් සිටින්නේ. එසේ නැතිව විරුද්ධ පක්ෂයක් සිටින්නේ මෙතන වාඩි වී සිට පුටු රත් කර ආපසු යන්න නොවෙයි. පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව විරුද්ධ පක්ෂයක් සිටින්නේ රජය කරන කියන දේවල වැරදි පෙන්වා දීමටයි. කම්කරු ඇමතිතුමා ඒ සම්ප්‍රදායටත් දන්නේ නැහැ. එතුමා කියනවා, හැම එකකටම විරුද්ධ වෙනවාලු. ඒක කරන්න ඕනෑ නැතිලු. උන්නැහේලාට ඕනෑ විධියට කරන්න ඉඩ දී නිකම් ඉන්නලු. එහෙම කියමින් එතුමා ප්‍රජාතන්ත්‍රවාදයේ නායකයා වෙන්න හදනවා.

ගරු කථානායකතුමනි, ගරු කම්කරු ඇමතිතුමා අපට චෝදනාවක් කළා රටසභා ධවල පත්‍රිකාව විවාදයට ගන්න අවස්ථා වේදී අප මේ ගරු සභාවට ආවේ නැත කියා.

**බෙලිගම්මන මයා.**
*(திரு. பெலிகம்மன)*
(Mr. Beligammana)
පැනල දිව්වා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
නැහැ, පයින් ගියේ. මෙතනත් පුච්චල එතනත් පිච්චුවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
මම හිටිය නම් පුච්චන්නේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේ සිටියා නම් පුද්ගලික සැලකිල්ලක් හැටියට එසේ නොකරන්නත් තිබුණා. එහෙත් ඒ කඩදාසියට නම් ඒ සැලකිල්ල දක්වන්න බැහැ.

කම්කරු ඇමතිතුමා පෙඩරල් පක්ෂය වෙනුවෙන් කථා කළා. පෙඩරල් පක්ෂය තුළ පෙඩරල් රාජ්‍යයක් පිහිටුවීමේ බලාපොරොත්තුවක් නැතිලු. එහෙත් අද "ලංකාදීප" පත්තරයේ මෙන්න මෙහෙම තිබෙනවා :

"වෙනම ද්‍රවිඩ රජයක් ඉල්ලති.

වෙනම ද්‍රවිඩ රාජ්‍යයක් මෙරට ද්‍රවිඩ ජනතාව සඳහා ඇති කළ යුතුය යන යෝජනාවක් පෙරේදා සවස යාපනයේ පැවති පෙඩරල් පක්ෂ තරුණ පෙරමුණේ ක්‍රියාකාරී කමිටු රැස්වීමේදී ඒකමතිකව සම්මත කර ගන්නා ලදී."

දෙමළ රාජ්‍යයක් ඕනෑමලු. මේ කියන්නේ පෙඩරල් පක්ෂයේ තරුණ පෙරමුණේ ක්‍රියාකාරී කමිටුවයි. එහෙත් කම්කරු ඇමතිතුමා කියනවා, පෙඩරල් රාජ්‍යයක් ඉල්ලන්නේ නැතිලු. හොඳයි, කම්කරු ඇමතිතුමා කොහොමද දන්නේ ? එහෙනම් එතුමා පෙඩරල් පක්ෂයට බැඳී සිටින්නට ඕනෑ. එය ඇත්ත නම් පෙඩරල් පක්ෂයේ තරුණ පෙරමුණේ ක්‍රියාකාරී කමිටුවේ වාර්තාව බොරු වෙන්න ඕනෑ. එතුමා කෙසේ කීවත් පෙඩරල් පක්ෂය කෙලින්ම පෙඩරල් රාජ්‍යයක් පිහිටුවීමේ පරමාර්ථය උඩ ක්‍රියා කරන බව අපි කවුරුත් දන්නවා. මුළු රටමත් දන්නවා. කවුරුවත් නැතෙයි කියන්නෙත් නැහැ. ඒ නිසා පෙඩරල් ක්‍රමයක් ඇති කිරීමේ පරමාර්ථය ඇතිව ගෙනෙන පනතකට හෝ ධවල පත්‍රිකාවකට හෝ මේ රට බෙදන්නට ගෙනෙන වෙන යම් දේකට හෝ අපි විරුද්ධයි.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා. (මීගමුව)**
*(திரு. என். டென்சில் பெர்ணண்டோ—நீர்கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)
ඇයි 1964 දී නොකීවේ ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේලාගේ උත්කෘෂ්ට නායකයා, ප්‍රජාතන්ත්‍රවාදී ජනරංජන නායකයා වන ඩඩ්ලි සේනානායක මහතා 1960 දී බෙදූ පත්තර මෙන්න. එදා 1960 දී ඩඩ්ලි සේනානායක මහතා කී කරුණු උඩමයි අපිත් මෙයට විරුද්ධ වන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**

*(திரு. டென்சில் பெர்ணண்டோ)*

(Mr. Denzil Fernando)

එදා රටසභා, අද දිස්ත්‍රික් සභා.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

ඔය දෙකේ වෙනස දන්නේ නැත්නම් කථා නොකර නිකම් ඉන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

ඒවාට නම් අපි අදත් විරුද්ධයි.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

එදා කොහොමද කිව්වේ ?

"සිංහල දරුවාට ගොඩබිමද ? ගොළු මුහුදද?

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අදහස හරිගියොත්—"

එදා මෙහෙම කියන්නේ අපටයි.

" සියලුම විශාල වාරිමාර්ග හා ජනපද ව්‍යාපාරද ඇති උතුරු නැගෙනහිර පළාත් සිංහලයාට අහිමි වේ. ඌව, මධ්‍යම, සබරගමුව යන පළාත්වල ඉන්දියානු රාජ්‍යයක් බිහි වේ. දළදා මාලිගාව, මයියන් ගනය, නාගදීපය, සේරුවාවිල හා කතරගම ද්‍රවිඩ බලයට යට වේ.

සිංහලයා තම රටේ අනාථ කුඩා ජාතිය බවට පත් වේ. අවුරුදුපතා වැඩි වන අපේ දරු මුණුපුරන්ට යන්නට ගොළු මුහුද විනා ගොඩබිමක් නැති වේ. සිරිමාගේ ව්‍යාපාරය ජාතිය නසන්නටය. ඩඩ්ලිගේ ව්‍යාපාරය ජාතිය රකින්නටය— "

දැන් කොහොමද ? ඒකේ අනෙක් පැත්ත නේද ? කවුද මේවා මුද්‍රණය කර තිබෙන්නේ ?

"එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කොල්ලුපිටියේ, ගාලු පරේ, 532 දරන තැන පදිංචි හෙට්ටි කංකානම්ගේ ඉවුනිස් සිංඤ්ඤෝ... "

1960 ජූලි මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ගෙයක් පාසා බෙදුවේ මේවායි. එදා එක්සත් ජාතික පක්ෂය මහ ජනයාට මේවා කිවේ අවංකව නම්, රට සභා හෝ වේවා, දිස්ත්‍රික් සභා හෝ වේවා ෆේඩරල් ආණ්ඩු ක්‍රමයකට තුඩු දෙන වෙන ඕනෑම සභාවක් හෝ වේවා ඉල්ලා අස් කර ගන්නා ලෙස අපි තමුන්නාන්සේලාට බල කරනවා. ආණ්ඩුවක් පිහිටුවීම සඳහා තමුන්නාන්සේලා හොරෙන් ගිවිසුම් ඇති කර ගත්තා. අගමැතිතුමාත් පිළිගත්තා පෞද්ගලික ගිවිසුමක් තිබෙන වාය කියා. රටට හෙණ ගැහුවත් කමක් නැහැ, ඒ රහස් ගිවිසුමේ පොරොන්දු ඉෂ්ට කොට, ආණ්ඩුව රකින්න, අගමැතිකම ආරක්ෂා කර ගන්න පුළුවන් නම්. ගරු කම්කරු ඇමතිතුමා කෑ ගැහුවෙත් තමාගේ ඇමතිකම ආරක්ෂා කර ගන්නටයි.

**බෙලිගම්මන මයා.**

*(திரு. பெலிகம்மன)*

(Mr. Beligammana)

කව්ද, දෙන්නෙ ?

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

දෙන්නෙ නැත්නම් රාජාසන කථාවේ තිබෙන්නේ මොකක්ද ? සිංහල දන්නවා නම් රාජාසන කථාව කියවා බලන්න.

**බෙලිගම්මන මයා.**

*(திரு. பெலிகம்மன)*

(Mr. Beligammana)

" ...සුපරීක්ෂාකාරීව සලකා බලනු ඇත." කියායි තිබෙන්නේ.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේලා ඒ කාලයේ බෙදා හැරිය පිංතූර කීපයකුත් තිබෙනවා. තමුන්නාන්සේලා මේවා කොයි තරම් බෙදා හැරියත් 1960 ජූලි මහා මැතිවරණයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් 75 දෙනකු තේරී, මැතිණිය බලයට පත් වුණා. මැතිණිය රට බෙදුවාද ; කැඩුවාද ; වෙල්ව නායගම්ට දුන්නාද ; රට සභා පනතක් ගෙනාවාද ? රට සභා දෙන්නට යන්නේ, තමුන්නාන්සේලායි. තමුන්නාන්සේලාගේ හිත් තුළ තිබුණු දේවල් තමයි, ක්‍රියා කරන්නට බලාපොරොත්තු වුණු දේවල්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

තමයි, 1960 ජුලි මහා මැතිවරණය කාල යේදී තමුන්නාන්සේලාම බෙදා හැරිය මේ පත්‍රිකාවල සඳහන් වන්නේ.

"රට බෙදීමට පොරොන්දු වූ පක්ෂවලට කුමක් කළ යුතුද?..."

මේවා මේ රටේ ඉතිහාසයට එකතු වන්නට ඕනෑ. මෙය බොහොම දිග ලියවිල්ලක් නිසා එය සම්පූර්ණයෙන්ම කියවන්න මට වෙලාවක් නැහැ.

"...ඔබට අයිති—ඔබගේ ජීවිතයට වඩා වටිනා ඔබේ මව් බිම, සිංහල-දෙමළ දෙකොටසකට බෙදන බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමේ පොරොන්දු හතර මෙන්න:—..."

දැන් තමුන්නාන්සේලා කියන්නේ මොනවාද? "බණ්ඩාරනායක චෙල්වනාය ගම් දෙපළ ඒ විධියට සාකච්ඡා කර ගිවිසුමක් ඇති කර ගත්ත නිසායි අපිත් කරන්නේ" කියා දැන් තමුන්නාන්සේලා කියනවා. බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම ඇති වුණු අවස්ථාවේ මහජනයා ඊට විරුද්ධ වුණා. ඒ මහජන විරෝධය නිසා මහජන මතයට කන් දී ඒ ගිවිසුම ඉරා දමන්න, එදා බණ්ඩාරනායක මැතිතුමාට ශක්තියක් තිබුණා. එහෙත් මෙපමණ මහජන විරෝධයක් පළ කොට තිබෙද්දීත්, මේ දිසා සභා දීමේ අදහස ඉවත් කර ගන්න මේ රජයට පුළුවන්කමක්, ශක්තියක් තවම ඇති වී නැහැ. ඉදිරියට මොනවා කියාවිදැයි මා දන්නේ නැහැ. එහෙත් තවම නම් මේ රජයට ශක්තියක් ලැබී නැහැ, දිසා සභා අදහස ඉවත දමන්න. මහජන මතය පිළිගත්තොත් අර අය එළියට යාවි, මේ අයට ගෙදර යන්න සිදු වේවි. ඒකයි, මේ අයට සිදු වී තිබෙන්නේ.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

ඔය කියවන පත්‍රිකා සභාගත කරන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේලාගේ කවි කොළ මෙන්න :

" සිංහලයිනි ඔබේ උරුමය මෙන්න..."

මෙහෙම කියන්නේ කවුද? ආනන්ද සමරකෝන්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

සභාගත කරන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

"...රමණීය කුඩා දිවයින අප මාතාව—දෙකඩක් කරන්නට නැත් කළහොත් ඇයට—ඔබටත් ඔබේ දරුවනටත් ලැබෙයි පව—දෙකඩක් කරනවා වැනි එය ඔබේ මව..."

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

ගරු මන්ත්‍රීතුමා ඕවා කියවනවා නම් සභාගත කරන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

කියවන ඔක්කොම සභාගත කරනවා. කථානායකතුමනි, මේ සියල්ලම හැන්සාඩ් වාර්තාගත කරන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මහජනයා මේවා දැන ගන්න ඕනෑ.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

හැම එකකටම ඉඩ දෙන්න බැහැ. දැනට කියවපු ඒවාට ඉඩ දෙන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්, කියවන ඒවා විතරයි.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்க)*
(Mr. Shelton Jayasinghe)

දෙකක් කියෙව්වා, ඉස්සෙල්ලා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

පිත්තුරත් සභාගත කරන්න ඕනෑ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

පිංතුර කියෙව්වෙ නැහැනේ ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

පිංතුර බලනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

පිංතුර බලන බව ඇත්ත. එහෙත් ඔය හැම පිංතුරයකම කියවන්න දෙයක් තිබෙනවා. එම නිසා කියවන හැම දෙයක්ම සභාගත කරන්න ඕනෑ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේලාගේ ඒවා සභාගත කරන්න මට තිබෙන අමාරුව මොකක්ද ? මෙය ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

තමුන්නාන්සේට දී තිබෙන්නේ, පැය භාගයයි. ඒ නිසා ඉක්මණින් කථා කරන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කාලය වැඩියෙන් ගත වුණත් මේවා කියවීම වැදගත් යයි මා කල්පනා කරනවා. මෙන්න තවත් කවි කීපයක් :

“ දෙව්දුනි උපුල්වන් රකිනා මෙදිවයි න
එලෙසින දෙකඩ කෙරුමට ඉඩ නොදෙනු මැන
පීගසින වලක්වා ලන්නට එවිපති න
නිසි මග යොදනු මැන දද දන අද සිටි න”

මේ, අද සිටින දද දනට රට බෙදීමට ඉඩ දෙන්න එපාලු. ඒ දද දනයි මේ ඉස්සරහ පේලියෙ සිටින්නෙ. එම නිසා, ආනන්ද සමරකෝන් මහතා ඉල්ලුවා වාගේ අපත් දෙවියන්ගෙන් ඉල්ලා සිටිනවා, රට දෙකඩ කරන්න මේ දද දනට ඉඩ දෙන්න එපාය කියා.

**බෙලිගම්මන මයා.**
*(திரு. பெலிகம்மன)*
(Mr. Beligammana)

එය වෙන්නෙත් නැහැ, ඊට ඉඩ දෙන්නෙත් නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මම තවත් කවියක් කියවන්නම් :

“ ගැමුණු මහ රජුන් සමයෙහි එඩිතර ව
එවැනි උවදුරින් ලක්මාතා මිදු ව
නියම සිහල ගති ඇතියන් ඇතොත් ත ව
එලෙස මුදා ගැනුමට හැකි වෙයි තිර ව”

එවැනි අය තවමත් ඉන්නවා දැයි කියන්න මා දන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, මේ කවි සියල්ලක්ම කියවන්න මා අදහස් කරන්නෙ නැහැ. මා මෙම පත්‍රිකා සභාගත කරනවා.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்க)*
(Mr. Shelton Jayasinghe)

ඕවා ඔක්කොම කියලත් අපට එදා දිනන්න බැරි වුණා නම්, මන්ත්‍රීතුමා අද ඕවා කියල දිනන්න ලැබෙන්නෙ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒක මැතිවරණයෙදි බලා ගනිමු. මහජනයා එය තීරණය කරාවි. මහජනතාව දෙන තීරණය අප භාර ගන්නවා, බොහොම සන්තෝෂයෙන්. ඒකයි ප්‍රජාතන්ත්‍රවාදයය කියන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்க)*
(Mr. Shelton Jayasinghe)

බලන්න බැරියැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

හොඳයි බලන්න අද විසුරුවා හරින්න, එවිට මොකද වෙන්නෙ කියල බලාගන්න පුළුවනි.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

එදා පනතක් නැතුව බොරු ප්‍රචාරය කළා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මෙන්න එදා කළ ප්‍රචාරයන්, අපට විරුද්ධව. " පැඩරල් රජයක් බිහි වුණොත් සිංහල බෞද්ධයා කපෝති. " මෙන්න තවත් එකක් : " රාජ්‍ය ලෝභී ශ්‍රී. ල. නි. පාක්ෂික නායකයෝ බිහිසුණු පෙඩරල් කුමන්ත්‍රණ මගින් සිංහල ජාතිය විනාශ කිරීමට නැත් නොකළෝද ? " මෙන්න තවත් එකක් : " ජාතික අවදානම—ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පෙඩරල්-සම සමාජ කොමියුනිස්ට් පක්ෂ එක පෙර මුණේය. "

ගරු කථානායකතුමනි, ඊළඟට මෙම පත්‍රිකාවේ අඩංගු කර ඇති විස්තර මා කිය වන්නෙ මගේ ප්‍රදේශයටත් බල පාන නිසයි. මා එය සම්පූර්ණයෙන්ම කියවන් නම්.

" ඔවුන්ට රට ගිය දාට සිදු වන විනාශය මෙන්න :

| ආසනය | දුන් ඡන්දදායක පිරිස | ඉන්දියානුවෝ |
|---|---|---|
| නුවරඑළිය ... ... ... | 12,195 ... | 1,17,400 |
| මස්කෙළිය ... ... ... | 15,450 ... | 1,20,500 |
| නාවලපිටිය ... ... ... | 23,000 ... | 46,900 |
| කොත්මලේ ... ... ... | 16,831 ... | 38,000 |
| පස්සර ... ... ... | 11,511 ... | 35,200 |
| හේවාහැට ... ... ... | 11,579 ... | 20,000 |
| බණ්ඩාරවෙල ... ... ... | 14,106 ... | 31,600 |
| හපුතලේ ... ... ... | 10,344 ... | 42,200 |
| ගම්පොළ ... ... ... | 21,977 ... | 31,000 |
| වලපනේ ... ... ... | 15,686 ... | 34,500 |

අපේ සරුසාර සුන්දරතර කඳුකරය වූ ඌව, සබරගමුව, මධ්‍යම, පළාත්වල අපේ ජාතික බලය අව සන් කොට ඉන්දියානුන්ට පුරවැසිකම දීමට සූදානම් වී සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සහ පෙඩරල් කොමියුනිස්ට් සමසමාජ පක්ෂ හවුලට අපි ඉඩ දෙමුද ? "

ගරු කථානායකතුමනි, 1960 ජූලි මාස යේදී මහජනතාව අපට බලය දුන්නා. නමුත් මේ කිව් එකක්වත් කළාද ? එසේ වුණත් දුන් තමුන්නාන්සේලා ඒ අයට අයිතිවාසිකම් දෙන්න යන්නෙ 1960 ජූලි මාසයේදී තමුන්නාන්සේලා කී දේවල් සියල්ලක්ම අමතක වෙලාද ? එහෙම නැතුව තමුන්නාන්සේලා නැවතත් උපදී ඇවිත්ද ? එදා කිව් සිංහලකම අද නැද්ද ? කෝ, එදා තිබුණාය කිව් ගැමුණු පෙරමුණ ? එදා මහනුවර දක්වා පයින් ගියා, කතර ගම දක්වා රිය පෙරහැරවලින් ගියා. ඒ ගැමුණු පෙරමුණට අද සිදු වී තිබෙන්නෙ මොනවාද ? මෙන්න එදා කී තවත් දේවල් : " ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දෙන ඡන්දය රට දෙකඩ කිරීමට අතට දෙන කඩුවකි. " මෙන්න තවත් එකක් : " සිංහලයන්ගේ පක්ෂ භේද නිසා ද්‍රවිඩ ඡන්ද 15 න් රජය පෙරළුවා. " මෙන්න තවත් එකක් : " ලංකාවේ වනිතා පක්ෂයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සන්දේශයක් එහි මුලටම අගමැතිතුමාගෙ ඡායාරූපයකුත් පළ කර තිබෙනවා. ජාතිය බේරා ගන්නටයයි එදා වනිතාවන් ගෙන් ඉල්ලීමක් කර තිබෙනවා. හොඳයි, එය ජාතිවාදය ඇවිස්සීමක් නොවේද? ජාතිය රැක ගන්න, බේරාගන්න අම්මලා ඉදිරියට එන්න ඕනැය කියනවා. ජාතිය බේරා ගන්න කථා කරන මේ රජය දැන් අම්මලාට කියනවා, වඳ පෙති බොන්නය කියා. එදා 1960 ජූලිවලදී කිව්වා ගෙවල්වල තිබෙන කැත්ත හෝ අරගෙන අම්මලාට ඉදිරියට එන්නය කියා ජාතිය බේරගන්න. දැන් කියනවා ජන ගහනය වැඩිය, ඒ නිසා වඳ පෙති ගන්නය කියා. වඳ පිදෙන දානය දෙන්න ඕනැලු. ඇයි ඒක දස රාජ ධර්මයෙන් එකක් නෙ! දැන් තමුන්නාන්සේලාගේ සෞඛ්‍ය ඇමතිතුමා කියනවා, ජනගහනය වැඩිය ඒ නිසා වඳ පිදෙන දානය දෙන්න ඕනැය කියා. කථානායකතුමනි, මේ පත්‍රිකා සියල්ලක්ම මා සභාගත කරනවා.

රාජාසන කථාව පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ගේ කථා කිපයකට මා ඇහුම්කන් දුන්නා. රට සභා ගෙනෙන බවක් මෙහි කියා නැතිලු. මට තේරෙන හැටියට නම් මෙහි හොඳ සිංහලෙන් එය සඳහන් වී තිබෙනවා :

“ මහ ආණ්ඩුවේ මෙහෙයවීම සහ පාලනය යටතේ ක්‍රියා කරන දිස්ත්‍රික් සභා පිහිටුවාලීම පිළිබඳව වූ ධවල පත්‍රයක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. ව්‍යවස්ථා ඉදිරිපත් කිරීමට පෙර එම ධවල පත්‍රිකාව පිළිබඳව ඇති වූ සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද අදහස් ගැන මාගේ ආණ්ඩුව සුපරීක්ෂාකාරීව සලකා බලනු ඇත.”

ධවල පත්‍රිකාව පිළිබඳව ඉදිරිපත් වූ අදහස් ගැන හොඳට පරීක්ෂා කර බලනවලු. කොහොමද? ව්‍යවස්ථා ඉදිරිපත් කිරීමට පෙර. එහෙම නම් ව්‍යවස්ථා ඉදිරිපත් කරනවා.

**බෙලිගම්මන මයා.**
*(திரு. பெலிகம்மன)*
(Mr. Beligammana)
එහෙම කියන්නේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඇයි නැත්තේ? ව්‍යවස්ථා ඉදිරිපත් කිරීමට පෙර පරීක්ෂා කර බලනවාලු. බලන්නේ ව්‍යවස්ථාව ඉදිරිපත් කිරීමට පෙරයි. ඒක බලනවා විතරයි. ව්‍යවස්ථා ඉදිරිපත් කිරීම නවත් වන්නේ නැහැ. ඇයි මේ හැංගිමුත්තන් කෙළින්නේ? කෙළින්ම කියන්නකො “ ව්‍යවස්ථා ගෙනෙනු නොලැබේ ” කියා. අපි සංශෝධනයක් ගෙනැවිත් තිබෙනවා, මොනම හේතුවක් නිසාවත් රට සභා ව්‍යවස්ථා මේ සභාවට ඉදිරිපත් නොකළ යුතුය කියා. අනික් ඒවායින් අයින් කර අපි එය වෙනම සංශෝධනයක් වශයෙන් ගෙනැවිත් තිබෙනවා. ඒක පිළිගනිමු.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
එහෙම කිව්වෙ නැත්නම් තමුන්නාන්සේලාට කථා කරන්න එකක් නැහැ !

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
අපි තමුන්නාන්සේත් සමග විවාද නොකරන නිසා ඒකට පිළිතුරු දෙන්න විධියක් නැහැ.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.** (අකුරණ පළමුවන මන්ත්‍රී)
*(திரு. ஹேமச்சந்திர சிறிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*
(Mr. Hemachandra Sirisena—First Akurana)
ඒක ඉංගිරිසියෙන් කියනවා නම් කියන්න තිබෙන්නේ “ The D. C. Bill will come after consideration ”. යනුවෙනුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
තමුන්නාන්සේට කථා කරන්න කවුද ඉඩ දුන්නේ?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේලාගේ පොරොන්දු පිළිබඳව කම්කරු ඇමතිතුමා සඳහන් කළා. අගමැතිතුමාගේ පින්තූරයද සහිතව පත්‍රිකාවක් 1965 දී ගෙයක් පාසා බෙදා දුන්නා. මෙය මුද්‍රණය කර තිබෙන්නේ වර්තමාන නිවාස ඇමතිතුමායි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ලේකම් වශයෙන්. පක්ෂයේ ලේකම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

එයින් වගන්ති කීපයක් මම කියවන්නම්.

> "ඔබේ ආහාරය සහ රෙදි පිළි සඳහා අද තරම් ගිනි ගණන් මින් පෙර කවදාවත් ගෙවා නැත."

මේ කියන්නෙ 1965 දියි. 1968 දී දැන් තත්ත්වය කොහොමද? මෙන්න නව දුරටත් :

> "දහඩිය මහන්සියෙන් ඔබ උපයන ධනය මොහොතකින් අළු වෙයි. ඔබේ රුපියලේ වටිනාකම දැන් අඩු වී ඇත. ඔබ හරි හම්බ කරන මුදලින් මීට වඩා සැපවත් ජීවිතයක් ගත කිරීමට ඔබට අයිතියක් තිබේ. එක්සත් ජාතික පක්ෂය බලයට පත් කළහොත් මාර්ග දෙකකින් අපි ඔබ ජීවන බරින් නිදහස් කරන්නෙමු. (1) ක්ෂණික සහන ලබා දෙන කෙටි කාලීන වැඩ පිළිවෙලක් හා (2) ස්ථිර සහනය සලසන දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් අනුව අග හිඟ කමින් තොර, ලාබෙට කෑම, බීම, ඇඳුම්, පැළඳුම් සුලබ සෞභාග්‍යමත් සමාජයක් එක්සත් ජාතික පක්ෂය ඔබට පොරොන්දු වෙයි."

කොහොමද රාජ්‍ය ඇමතිතුමනි, සෞභාග්‍යමත් තත්ත්වය? සව් බාගයක් තබා කාලක්වත් නැහැ !

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்க)*
(Mr. Shelton Jayasinghe)

පොරොන්දු ඉෂ්ට කරන් නම්!

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

පොරොන්දු ඉෂ්ට කරන්නම්! තමුන්නාන්සේලා කෑම බීම ඇඳීම පැළඳීම සියල්ලම දී තිබෙන එක ඇත්ත. කාටද දී තිබෙන්නේ? තමුන්නාන්සේලාගේ ධනපති පන්තියට. ධනපති පන්තියට වුවමනා කරන සෑම දෙයක්ම තමුන්නාන්සේලා ගෙනැවිත් දී තිබෙනවා. ඒක ඇත්ත. විස්කි, බ්‍රැන්ඩි, මස් වර්ග—වීස් ටික පවා—ගෙන්වන්නට සල්ලි තියෙනවා. අපට වුවමනා කරන මිරිස් කරල, කොත්තමල්ලි ඇටය ගෙන්වන්නට සල්ලි නැහැ. ධනපතියාට වුවමනා කරන ලොරි, ජීප්, කාර්, ට්‍රැක්ටර්, සාරි, කොළඹ හතේ නෝනලා තොල් රතු කිරීමට ගන්න සායම් පවා, ගෙන්වීම තහනම් කර තිබුණු හුලං බල්ලන් පවා ගෙන්වන්නට සල්ලි තියෙනවා. අපේ මිනිසුන්ට වුවමනා කරන හාල් ටික, පොඩි ළමයින්ට වුවමනා කරන කිරි පිටි ටික ගෙන්වන්නට සල්ලි නැහැ; භාණ්ඩාගාරය හිස්. සාමාන්‍ය මිනිහාට අද පරිප්පු නැහැ; අල නැහැ; මොකුත් නැහැ; තමුන්නාන්සේලා මේ රටේ ධනපති පන්තිය නම් සුඛිත මුදිත කරලා තියෙනවා; සෞභාග්‍යමත් කරලා තියෙනවා.

මේ රටේ ඉතාම වැදගත් සේවාවක් කරන මන්ත්‍රීවරයකුට කාර් එකක් නැහැ. මන්ත්‍රීවරයා පරණ කාර් එක මග දිගට තල්ලු කර කර යන්නට ඕනෑ. නමුත් මේ රටේ ඉන්න ධනපති හොරකඩ කාරයන්ට මේ ආණ්ඩුව කාර් 2,500 ක් ගෙනැවිත් දීල තියෙනවා. 5 ශ්‍රී නොම්මරය දැන් 2500 ටත් වඩා ඉහළ නැගලා. මේ විධියේ පොරොන්දු මහජනයාට දී බලයට පත් වෙලා දැන් තමුන්නාන්සේලා කරන්නෙ මොනවද කියා මා මේ රජයෙන් අහන්නට කැමතියි. අපි බොහොම ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙලට මේ රට ආණ්ඩු කරනවය කියා ගරු කම්කරු ඇමතිතුමා කියනවා. ඔව්, තමුන්නාන්සේලා තියෙන අයට හොඳට දෙනවා; නැති අයට මොකුත් නැහැ. දැන් ගරු අගමැතිතුමා ගොවීන්ව රජ කරවලා; ගොවීන්ට ඔටුණු පළඳවලා. ගරු කථානායකතුමනි, පොහොසත් ගොවීන්ට අක්කර 97,500 ක් දී තිබෙන බව, කුඹුරු ගොවීන්ට ට්‍රැක්ටර් ගෙනැවිත් දුන්න බව,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුඹුරුවලට, වතුපිටිවලට යන්නට ජීප් ගෙනැවිත් දුන්න බව තමුන්නාන්සේ දන්නවා. අක්කරයක පරණ තේ ගලවා අළුතෙන් තේ හිටවන්නට රුපියල් 3,750 ක් නිකම් දෙනවා, ආපසු නොගන් නට. පොල් වැවීමට ආධාර දෙනවා. රබර් වැවීමට ආධාර දෙනවා. ධනපති ගොවීන්ට තමුන්නාන්සේලා සලකන්නේ ඒ විධිය ටයි. දුප්පත් ගොවීන්ට තමුන්නාන් සේලා සලකන්නේ කොහොමද? එදා සියයට හයේ පොළියටයි, ගොවියාට ණය දුන්නේ. අද හාල් පොතුත් උකස් තියා ගෙන ගොවියාට ණය දෙන්නේ සියයට 12 පොළියටයි. මගේ කොට්ඨාශයේ තිබුණු කුඹුරු අක්කර ප්‍රමාණය පසුගිය අවුරුදු 3 තුළ පහළ බැස තිබෙන බව මා තමුන් නාන්සේට ඔප්පු කරන්නට ලෑස්තියි. පොඩි අමුණක්, සුළු වාරි මාර්ගයක් හදා දෙන්නට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ශක්තියක් නැහැ. එදා රුපියල් 12 ට තිබුණු පෝර හොණ්ඩරය අද රුපියල් 24 යි. වී බුසලට රුපියල් 2ක් වැඩි කළාය කියා තමුන්නාන්සේලා කෑගහනවා. රුපියලේ වටිනාකම අඩු කළාට පස්සෙ ශත 20 ඒවා 12 ක් වත්—2.40 ක් වත්— ගොවියාට වැඩිපුර දෙන්නට ඕනෑ. ඒ අනුව වී බුසලකට 14.40 ක් දෙන්නට ඕනෑ. රුපියල් 14 ක් පමණක් දී එතැනි නුත් ශත 40 කට තට්ටු කළා. දැන් සාමාන්‍ය ගම්බද ගොවියා කබලෙන් ලිපට වැටී සිටිනවා. ගොවියාට වුවමනා හැම දේකම මිළ වැඩි වෙලා තියෙනවා. අද ගොවියා අන්තිමටම පිරිහී සිටිනවා. තමුන් නාන්සේලා ස්කෝලේ ළමයින් යවා පැළ හිටුවනවා. ගම්බද ළමයින්ට පැළ හිටවීමට පුරුදු වන්නට වුවමනා නැහැ. ඒ ළමයින් පැළ හිටවන්නට දන්නවා; කොටන්න ටත් දන්නවා; වපුරන්නටත් දන්නවා; ගොයම් කපන්නටත් දන්නවා. කොළඹ හතේ—කුරුඳු වත්තේ—ළමයින්ට තමයි, පැළ හිටවන්නට දන්නෙ නැත්තෙ. ඒ ගොල්ලන්ව එක්කගෙන ගියාම, ඒගොල්ලෝ මිනි ගවුම් ඇඳගෙන පැළ හිටවනවා. තව සමහර උදවිය කැමරා අර ගෙන ගිහින් ඡායාරූප ගන්නවා. කාව රවටන්නද තමුන්නාන්සේලා මේවා කරන්නේ? කුඹුරු අක්කරයක් අස් වද්දන කෙනකුට, රුපියල් 250 ක් දෙන වාය කියා කියන්නට තමුන්නාන්සේලා බැරිද? එහෙම කිව්වොත් අස්වද්දන කුඹුරු ප්‍රමාණය වැඩි වෙයි. මිනිස්සු වතුර තියෙන තැන්වල කුඹුරු ඇති කරයි.

ගරු කථානායකතුමනි, තේ වවන්නට අක්කරයකට රුපියල් 3,750 ක් දෙන්නට පුළුවන් නම්, අළුතෙන් වී පැලක් ඇති කරනවට ගණනක් ගෙවන්නට බැරිද? එහෙම ශතයක් දෙන්නට බැහැ. පෝර, සහනාධාර ක්‍රමයට දෙන්නට බැහැ. පොළි ය අඩුවෙන් ණය දෙන්නට බැහැ. ධනපති ගොවීන්ට ඕනෑ තරම් ට්‍රැක්ටර් තියෙනවා; ජීප් තියෙනවා; ඉඩම් අක්කර 97,500 ක් තියෙනවා; මිනිමෝක් තියෙනවා. ඔව්, ඒ අනුව මේ ආණ්ඩුව තවත් පන්තියක් හදා තියෙනවා, ධනපති ගොවියන්ය කියා. දැන් ධනපති ගොවියන්ය, දුප්පත් ගොවියන්ය කියා පන්ති දෙකක් ඉන්නවා.

වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (සමරවීර මයා.) ආණ්ඩුව පැත්තේ ඉන්නවා. අර්තාපල් වගාවට වෙලා තියෙන්නේ මොකක්ද කියා මා එතුමාගෙන් අහන්නට සතුටුයි. අක්කර දහය, දොළහ පොලොව කොටා ගෙන ගොවීන් බලාගෙන ඉන්නවා. අද එක් ගොවියකුට දෙන්නේ බීජ අර්තාපල් හොණ්ඩර දෙකයි. ඒ නිසා අර්තාපල් කොහෙන් අරගෙන වගා කරන්නටදැයි ඒ ගොවීන් කල්පනා කරනවා. ගොවීන් බිම් සූදානම් කර තිබෙන හැටියට එක් කෙනකුට ලැබෙන හොණ්ඩර දෙකෙන් මොනවා කරන්නද? දැන් කාගේ අර්තාපල් අරගෙන වගා කරන්නටදැයි ඔවුන් කල්පනා කරනවා.

හොඳයි, අධ්‍යාපන ප්‍රශ්නය ගැන කල්පනා කර බලමු. මේ ආණ්ඩුවේ අධ්‍යා පන ඇමතිවරයා මේ රටේ අධ්‍යාපනය කෑවා. දැන් මේ රටේ අධ්‍යාපනයක් නැහැ. පාඨශාලාවල සිටි ගුරුවරුන් ටික එහාට මෙහාට මාරු කර දැම්මා. මා නියෝජනය කරන කොට්ඨාශයේ විද්‍යාලයාධිපතිවරුන් 10 දෙනකුම 1965 දී මාරු කර දැම්මා. 1968 දී එයින් ඇබෑර්තු දෙකක් පමණක් පුරවා තිබෙනවා. තවත් ඇබෑර්තු 8 ක් පිරවිය යුතුව තිබෙනවා. උපාධිධාරී ගුරුවරුන් ඒ විද්‍යාලවලට එවන්නේ නැහැ. සාදාගෙන ගිය ගොඩනැගිලි නවත්වා දමා තිබෙනවා. පසුගිය අවුරුදු තුන තුළ අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

කොට්ඨාශවල පාඨශාලා සඳහා වැසිකිළියක් වත් සාදා දෙන්නට මේ අධ්‍යාපන ඇමතිවරයාට පුළුවන් වී නැහැ. කොටින්ම දැන් මේ රටේ අධ්‍යාපනයේ ගන්නට දෙයක් ඉතුරු වී නැහැ. මේ ඇමතිවරයා එය කාබාසිනියා කර දැම්මා. ගිය ගිය තැන්වලදී විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ටත්, මහාචාර්යවරුන්ටත් බණිනවා. ඊළඟට බැණුම් අහනවා ; හූව අහනවා ; පල්ලම් බහිනවා. ඇත්තෙන්ම මොකක්ද මේ අධ්‍යාපන ඇමතිවරයාට දැන් සිදු වී තිබෙන්නේ ? ඔහු පිළිගන්නට කවුරුන්වත් එන්නේ නැහැ. ඒ නිසා ඔහු යන යන තැන්වලට පාඨශාලා ශිෂ්‍යයන් පෝලිම් ගස්සාගෙන එනවා. අධ්‍යාපන ඇමතිවරයා පිළිගන්නට ළමයින් පෝලිම් ගස්සාගෙන ආවාම අන්තිමේදී සිදු වන්නේ ඔවුන් විභාගවලින් අසමත් වන එකයි. ශ්‍රමදානය කියා තවත් දෙයක් දැන් තිබෙනවා. සමහර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ශ්‍රමදාන උත්සවයටත්, පාඨශාලාවේ පැවැත්වෙන උත්සවයටත්, ඇමතිවරුන් එන උත්සවවලටත් අගමැතිතුමා එන උත්සවවලටත් ළමයින් කැඳවාගෙන එන ලෙස විද්‍යාලවලට දන්වනවා. ස්කෝලවලින් ලැබෙන නියෝගය අනුව අපේ ළමසිනුත් ඔය උත්සවවලට යවන්නට සිදු වී තිබෙනවා. මේ විධියට දැන් රට රැවටීමේ වැඩ පිළිවෙළක් ගෙන යනවා.

රටසභා ප්‍රශ්නය සම්බන්ධයෙනුත්, ජීවන වියදම් ප්‍රශ්නය සම්බන්ධයෙනුත්, රැකීරක්ෂා ප්‍රශ්නය සම්බන්ධයෙනුත්, අධ්‍යාපන ප්‍රශ්නය සම්බන්ධයෙනුත්, කම්කරු ප්‍රශ්න සම්බන්ධයෙනුත් දැන් මේ ආණ්ඩුව ගෙන යන්නේ රට රැවටීමේ වැඩ පිළිවෙළක් පමණයි. කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනය සමථයකට පත් නොකරන්නේ මන්දැයි ගරු කම්කරු ඇමතිතුමාගෙන් ඇසුවාම එතුමා කියන්නේ පසු ගිය ආණ්ඩුව පවතිද්දීත් ඔය විධියේ ප්‍රශ්න තිබුණු බවයි. ඇත්තෙන්ම ඕකත් උත්තරයක්ද ? ඔය විධියේ උත්තරයක් දී තියමම ප්‍රශ්නයෙන් පැන යන්නට බැහැ. ඇයි කම්කරු නිලධාරීන්ගේ ප්‍රශ්නය නොවිසඳන්නේ ? දැන් මෙය මුළු රටේම කම්කරු ජනතාවට බලපාමින් පවතිනවා. දැන් කම්කරු කාර්යාලවල වැඩ නොකෙරෙන නිසා එය මුළු කම්කරු ජනතාවටම බලපානවා. මේවා මාක්ස්වාදී ව්‍යාපාර, මාක්ස් විරෝධී ව්‍යාපාර, අර ව්‍යාපාර මේ ව්‍යපාර යනාදී වශයෙන් කියා ප්‍රශ්න විසඳන්නට පුළුවන්කමක් නැහැ. කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනය පුළුවන් තරම් ඉක්මනින් අවසන් වන පරිදි කටයුතු කිරීමට කම්කරු ඇමතිතුමාට පුළුවන් විය යුතුයි. එසේ බැරි නම්, තමන්ගේ අදක්ෂතාව පිළිගෙන කැබිනට්ටුවෙන් එළියට යන්නැයි කම්කරු නිලධාරීන් වෙනුවෙනුත්, ජනතාව වෙනුවෙනුත් මා ඉල්ලා සිටිනවා.

හැබැයි, බැරි සිංහලෙන් වුණත් එතුමා කථා කිරීම ගැන මා එතුමට ස්තුති කරනවා. එතුමාගේ සිංහල කථාව ඉදිරි පෙළ ආසනවල සිටින අනෙකුත් ඇමතිවරුන්ට ආදර්ශයක් වෙනවා ඇතැයිද බලාපොරොත්තු වෙනවා. කම්කරු ඇමතිතුමාගේ අනෙක් වැඩ නම් ආදර්ශයට ගන්නට එපා. ඒවායේ කිසිම හරයක් නැහැ. අනුන්ට කුණු බාල්දි පෙරළන්නට ගොස් ආපසු ඒවා තමන්ගේ ඔළුව උඩම දමා ගැනීමේ සිරිත නවත්වන්නැයි මා ගරු කම්කරු ඇමතිතුමාට මතක් කරනවා.

අවසාන වශයෙන් තවත් එකක් මතක් කරනන්ට කැමතියි. රටසභා ප්‍රශ්නය ගැන ආණ්ඩු පක්ෂයේ සමහර ගරු මන්ත්‍රීවරුන් අතරත් එක්තරා විරෝධයක් පවතිනවා. රටසභා පිළිබඳ ව්‍යවස්ථා ඉදිරිපත් කරන බවක් රාජාසන කථාවෙන් පෙනී යනවා. ඒ සඳහා ව්‍යවස්ථා ඉදිරිපත් නොකරන බවක් රාජාසන කථාවේ කියා නැහැ. ඒ නිසා ගරු අගමැතිතුමාගේ කථාවේදී හෝ ඒ පිළිබඳව ස්ථිර ප්‍රකාශයක් කරනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. රටසභා එතැයි දැන් ජනතාව ඉන්නේ මහත් බියකින් ; මහත් චකිතයකින්. ඒ නිසා ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් ස්ථිර ප්‍රකාශයක් කරන්න. රටසභා සඳහා ව්‍යවස්ථා ඉදිරිපත් නොකළ යුතුයයි කියැවෙන විරුද්ධ පාර්ශ්වයේ සංශෝධනයට හැම පැත්තේම සිටින සියලු දෙනාගේම සහයෝගය ලැබෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. අහසේ මාලිගා හැදීමේ ව්‍යාපාර නවත්වා මහජනයාට ඔවුන්ගේ ප්‍රශ්න විසඳා ගැනීමට අවස්ථාවක් සලසා දීම සඳහා විකක් ඉක්මන් කර මහා මැතිවරණයක් පවත්වන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.37

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

ගරු කථානායකතුමනි, වලපනේ ගරු මන්ත්‍රීතුමාගේ (ටී. බී. එම්. හේරත් මයා.) කථාවෙන් පසු බොහෝ දෙනෙකුට තේරුම් ගන්නට පුළුවන් වන්න ඇති, ධවල පත්‍රිකාව ඉදිරිපත් කළ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ නායිකාවත් සමසමාජ සහ කොමියුනිස්ට් පක්ෂවල නායකවරුනුත් තම පක්ෂවල මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව පැවති විවාදයට සහභාගි වන්නට ඉඩ නුදුන්නේ මොන හේතුවක් නිසාද කියා. මේ රාජාසන කථා විවාදය ආරම්භ වුණු දවසේ පටන් විරුද්ධ පාර්ශ්වයෙන් කථා කළ සෑම මන්ත්‍රීවරයෙකුම වගේ ධවල පත්‍රිකාව ගැන කථා කළා. නියම අවස්ථාවේදී මේ ගරු සභාවේ ප්‍රකාශ නොකර, මුළු රටපුරාම ගිහින් ප්‍රකාශ කළ කරුණු ඒ කථාවලින් අපට අහන්නට ලැබුණා. 1960 අවුරුද්දේ එක්සත් ජාතික පක්ෂය අච්චු ගැසූ නොයෙක් පත්‍රිකා වගයක් ඉදිරිපත් කරමින් වලපනේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා, "තමුන්නාන්සේලා 1960 දී මෙහෙම කිව්ව. දැන් මොකද කියන්නෙ ?" කියා. ගරු කථානායකතුමනි, අපි එදා 1960 දි කිව්ව දේවල්මයි අදත් කියන්නෙ. අපේ අදහස් අබමල් රේණුවකින් තරම්වත් වෙනස් වෙලා නැහැ.

බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම ගැන තමුන්නාන්සේලා දන්නව ඇති. ඒ ගිවිසුම ඉදිරිපත් වුණු අවස්ථාවෙදි අපේ නායක වර්තමාන අගමැති ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි ඒ සම්මුතියට විරුද්ධව ක්‍රියා කළා. එසේ අපි විරුද්ධත්වය ප්‍රකාශ කරන අවස්ථාවේදී, අපි ඊට විරුද්ධ වන්නේ මොන හේතුන් නිසාදැයි පැහැදිලි වශයෙන් ජනතාවට ප්‍රකාශ කළා. මෙන්න මේ හේතුව නිසා මේ කාරණයට විරුද්ධයි; මෙන්න මේ හේතුව නිසා අසුවල් කාරණයට විරුද්ධයි, ආදි වශයෙන් අපි එක් එක් කරුණ පැහැදිලි කළා. එහෙත් වලපනේ ගරු මන්ත්‍රීතුමා අද මිනිත්තු 35 ක් පමණ මේ රටසභා ගැන කථා කළ නමුත් ධවල පත්‍රිකාවේ සඳහන් මෙන්න මේ කරුණු නිසා සිංහල ජනතාවට හානියක් සිදු වෙනවය, මෙන්න මේ කරුණු නිසා රටට හානියක් සිදු වෙනවය කියා මේ ගරු සභාවට පැහැදිලි කර දුන්නද කියා මා අහනව. අප ඉදිරිපත් කළේ ධවල පත්‍රිකාවක් බව තමුන්නාන්සේලා මතක තබා ගන්න ඕනෑ. මේවා ඉදිරිපත් කරන්නෙ මනුෂ්‍යයන් විසින් නිසා සමහරවිට අදහස් වැරදි විධියට ඇතුළත් වී තිබෙන්නට පුළුවන්. එහෙම දෙයක් තිබෙනව නම් ඒක ලොකු ප්‍රශ්නයක්. මෙවැනි දෙයකින් රටට බාධාවක් ඇති වෙන්නට ඉඩ දෙන්න බැහැ. එම නිසා ධවල පත්‍රිකාව පිළිබඳව හැමදෙනාගේ අදහස් අපි බලාපොරොත්තු වුණා. මෙහි යම් වරදක් තිබෙනව නම්, මෙන්න මේ යෝජනාව නිසා රටට හානියක් සිදු වෙන්ට ඉඩ තිබෙනවා යයි පෙන්වා දුන්නොත් අපි ඒක භාර ගන්න සූදානම්. හොඳ දෙයක් තිබෙනව නම් ඒ හොඳ දෙය පිළිගන්න අතර, නරකක් පෙන්වා දුන්නොත් ඒකත් නරක බව පිළිගන්න අපි සූදානම්. ධවල පත්‍රිකාව ඉදිරිපත් කළේ එවැනි පිරිසිදු චේතනාවක් ඇතිවයි. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් ගම්බද පළාත්වලට ගිහින් 1960 දී එක්සත් ජාතික පක්ෂය අච්චු ගැසූ පින්තූර ඉදිරිපත් කරමින් ජනතාවට කියනව, "මෙන්න 1960 දි එක්සත් ජාතික පක්ෂය කිව්ව දේ. අද කරනම් ගහල මොන වද කරන්නෙ ?" කියා. එවිට ගම්බද දුප්පත් ජනතාව මේවාට මුළා වෙනව; රැවටෙනව. තමන්ගේ රට බෙදනවාට කිසිම සිංහලයකු කවදාවත් කැමති වෙන්නෙ නැහැ. මගේ රට බෙදනවාට මම සතුටු වෙන්නෙ නැහැ. මගේ භාෂාවට හිරිහැරයක් වෙනවා නම් මම ඊට සතුටු වෙන්නෙ නැහැ. මේ ගරු මන්ත්‍රීතුමන්ලා මුළු රට පුරාම ගිහිල්ලා කියන්නේ අද වලපනේ ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ කළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

කථාවේ අඩංගු කරුණුමයි. මෙහි තිබෙන භයානකකම මෙයයැයි පහදා දෙන්නේ නැහැ. එදා තිබුණු තත්ත්වය අනුව යම් කිසි කරුණු වගයක් නිසා විරුද්ධත්වය ප්‍රකාශ කරන්නට යෙදුණා නම් ඒ භයානක කරුණු ගැන සලකා බලා ඒවා නැති වන ආකාරයටයි දැන් කටයුතු කරන්නේ. හානියක් ඇති නොවන අන්දමට, ආරක්ෂාව ඇති වන අන්දමට, ඒ සෑම දෙයක්ම කල්පනාවට ගෙන ආරක්ෂක විධිවිධාන ඇතිවයි ධවල පත්‍රිකාව ඉදිරිපත්කර තිබෙන්නේ. මේ යෝජිත පනතේ වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ එසේ කල්පනා කර බැලීමෙන් පසුව බව මතක් කරන්නට කැමතියි. සිංහල භාෂාව සම්පූර්ණයෙන් ආරක්ෂා වන අන්දමටත් ඒ කටයුතු සඳහා අවශ්‍ය නීති අඩංගු කරන්නටත් බලාපොරොත්තුවෙලා තමයි සිටියේ. ඉතින්, රට දෙකට බෙදෙන වැඩ පිළිවෙළකට ඉඩක් ලැබෙන්නේ නැහැ. රට දෙකට බෙදන්නට ඉඩක් ලැබෙන ආකාරයට ඒ සභාවලට ඒකාබද්ධ වන්නට ඉඩ නොලැබෙන විධියට නීතියෙන්ම විධිවිධාන යොදා තිබෙනවා. එවැන්නක් කරන්නට බැරි බව නීතියෙන්ම සඳහන් වෙනවා. ඒ විධියට වැඩ කටයුතු පිළියෙල කෙළේ.

ගොවිජනපදවලට යැමට සිංහල ජනතාවට පුළුවන් වන අන්දමට වැඩ කටයුතු සම්පාදනය කර තිබෙනවා. සිංහල ජනතාවගේ ආරක්ෂාව ඇති කරමින්, නිකම් කථාවෙන් පමණක් නොවෙයි නීතියෙනුත් වැඩ සකස් කර තිබෙනවා. මේවායේ වගකීම මණ්ඩලවලට භාර දීලා නොවෙයි අපි වැඩ කර තිබෙන්නේ. නියම ආරක්ෂාව ලැබෙන ආකාරයටයි ඒවා සකස් කෙළේ. ඒ කොයි හැටි වෙතත්, තවත් යම් අඩුපාඩුකම් තිබෙනවා නම් ඒවා පෙන්වා දීමට කැමති අයට එසේ කරන්නටත් අවස්ථාව සලසා දුන්නා. අපට දකින්නට නොලැබුණු අඩුපාඩුවක් වැරැද්දක් තිබෙනවා නම් රටේ මහජන නියෝජිතයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඒවා සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් දී තිබුණා. ඒ කාරණය නියම විධියේ සාකච්ඡාවකට භාජන කරන්නටයි මේවල පත්‍රිකාව ඉදිරිපත් කෙළේ. වාසනාවකටද, අවාසනාවකටදැයි කියන්නට මම දන්නේ නැහැ, කාගේ වාසනාවකටද, කාගේ අවාසනාවකටද කියන්ටත් මම දන්නේ නැහැ, එදා සිංහලයා වෙනුවෙන් සටන් කරන්නටත්, සිංහලයා වෙනුවෙන් දිවි පුදන්නටත් සූදානම් වූ උදවිය මේ ප්‍රශ්නය ඉදිරිපත් වන විට මේ පැත්තේවත් සිටියේ නැහැ. මේ මහා ලොකු සිංහල උදවිය ඊට මුහුණ නොදී අයින්වෙලා ගියා. මේ ගරු සභාවට එන්නට බැරි ඇයි? මේ ප්‍රශ්නය මීට පෙරත් මම ඇහැව්වා. ඒක අපට දැනගන්නට වුවමනායි. විරුද්ධ පක්ෂවල නායකයින් මේ ගරු සභාවට එන්නට බය ඇයි? මේ ගැන මේ ගරු සභාවේදී ක්‍රමානුකූල සාකච්ඡාවකට මුහුණ නොදෙන්නේ ඇයි? ඒ අයට මේ ගරු සභාවේදී මේවා ගැන අදහස් ප්‍රකාශ කරන්නට බැහැ. තමන්ගේ ඉතිහාසයත් එහිදී මතු වන්නට ඉඩ තිබෙන බව දන්නා නිසයි එන්නට බැරි. මේ කාරණය ක්‍රමානුකූලව සාකච්ඡා කරන්නට ඉඩක් ලැබුණු අවස්ථාවේදී ඔය විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරන්නට ආවේ නැත්තේ ඇයි? මම කලින්ම කියාපු කාරණය නිසයි ආවෙ නැත්තෙ. විරුද්ධ පාර්ශ්වයේ ගරු නායිකාවටත් එන්නට බැරි වුණා. ලංකා සමසමාජ පක්ෂයේ නායකතුමාටත් මෙතැනට පැමිණ මේ ගැන සාකච්ඡා කරන්නට බැරි වුණා. මෙතැන සාකච්ඡා කරන්නට, තර්ක කරන්නට පටන් ගත්තොත් නොයෙක් දේවල් මතු වේය යන බිය තිබෙන නිසයි නාවේ. නියම විධියට තර්කයක් ඉදිරිපත් කරන්නට බැරි වෙතැයි කල්පනා කළ නිසා වෙන්නට ඕනෑ එතුමා ආවේ නැත්තේ. මෙයින් තමන්ට දේශපාලන වාසියක් ගන්නට බැරි වෙයි කියාලා හිතුණු නිසයි ආවේ නැත්තේ. ඔන්න ඔය කාරණා නිසා මෙතැනට එන්නේ නැතිව සටන් කරනවාය කිය කියා, රටට ගිහිල්ලා සටන් කරනවාය කිය කියා, යන්නට ගියා. වලපනේ ගරු මන්ත්‍රීතුමා කී ආකාරයටම රටට ගිහිල්ලා, සිංහලයා කපෝති වෙනවාය, රට බෙදෙනවාය යනාදී වශයෙන් කියන්නට පටන් ගත්තා. ඔන්න ඔකයි

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

තත්ත්වය. ධවල පත්‍රිකාව ගැන මෙතැනදී සාකච්ඡා නොකරන්නට හේතුව ඔන්න ඕකයි. විරුද්ධ පාර්ශ්වයේ අනෙකුත් මන්ත්‍රීවරුන්ට ඊට ඉඩක් ලැබුණේත් නැහැ.

මේ ගැන අවස්ථාවක් ලැබුණු පළමුවැනි වාරයේදී ගරු මන්ත්‍රීන් මෙහිදී ඊට සහභාගි වී තමන්ගේ අදහස් ඉදිරිපත් කරනවා. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ ඉන්න ඒ ඒ පක්ෂවල නායකයන්ගෙන්, වැදගත් නායකයන්ගෙන්, පක්ෂවල ලේකම්වරුන්ගෙන් මේ සම්බන්ධව ස්ථිර ප්‍රකාශයක් ලබා ගන්නට අපට වුවමනා කරනවා. දිස්ත්‍රික් සභාවලට ඇත්ත වශයෙන්ම එතුමන්ලා විරුද්ධද යන්න අපට දැන ගන්නට වුවමනා කරනවා. යම්කිසි විධියකට ඒවා ගෙනාවොත් එකඟ වෙනවාදැයි දැන ගන්නට වුවමනායි. එහෙම නැත්නම් මොන නමකින් ගෙනාවත් විරුද්ධද යන්නත් දැනගන්නට අපට ඕනෑ. ඒ එක්කම මේ විධියේ දිස්ත්‍රික් සභා හෝ වෙනින් වචනයකින් හඳුන්වන මේ විධියේ වැඩ පිළිවෙලක් ගෙන එනවාද නැද්ද කියා ස්ථිර වචනයක් දෙන්න. අපි තමුන්නාන්සේලාගෙන් ස්ථිර වචනයක් බලාපොරොත්තු වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
රට බෙදන වැඩ පිළිවෙල.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ඔන්න ඕවාට තමයි කියන්නෙ බඩේ බිජු තබා ගෙන කතා කරනවාය කියා. එන්. එම්. පෙරේරා මහතාත් ඔය විධියේ කතාවක් කර තිබෙන බව අපි පත්‍ර මගින් දුටුවා. රට සභාවලට සියයට සියයක් පක්ෂයි කිව්ව එතුමා අද කියනවා රට බෙදන වැඩ පිළිවෙලක් ඉදිරිපත් කර තිබෙනවාය කියා. රටට ඒ විධියට ප්‍රකාශ කරනවා. මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා තේරුම් ගන්න ඕනෑ, මේ විධියේ ප්‍රකාශ කරන උදවියත් සමග වැඩ කරන්නේ කොහොමද කියා. මේ සම්බන්ධ ස්ථිර වචනයක් අපි දැනගන්නට කැමතියි. අලුතෙන් පැමිණි මන්ත්‍රීවරුන්ගෙන් නොවෙයි, නායකවරුන්ගෙන්—වැදගත්, වගකීමක් ඇති නායකවරුන්ගෙන්—අපි දැන ගන්න කැමතියි. මෙවැනි දෙයක් ඉදිරිපත් කරනවාද, එසේ නම් කොයි විධියටද එහෙම නැත්නම් එයට සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනවාද කියන එක අපි ඒ අයගෙන් දැනගන්න කැමතියි.

මේ විවාදයේදී නම් මේ සම්බන්ධව නොයෙක් අදහස් මන්ත්‍රීවරුන්ගෙන් එළි වුණා. සමහර විට ඒ අය කරුණු හරියට දන්නේ නැති නිසා වෙන්න පුළුවනි. දෙවිනුවර මන්ත්‍රීතුමා බොහොම දක්ෂ උගත් මහත්මයෙක්. ඒ මහතාගේ කථාවේදී මේ දිස්ත්‍රික් සභා ගැන කරුණු ඉදිරිපත් වුණා. එතුමා කිව්වා මේ දිස්ත්‍රික් සභාවලට එතුමා එදත් විරුද්ධයි, අදත් විරුද්ධයි, හෙටත් විරුද්ධයි කියා. අන්න ඒ විධියට, ඒ කරුණ ගැන අපි දැන ගන්න කැමතියි, ඔය පැත්තේ සිටින නායකවරුන්ගෙන්. මේ සම්බන්ධයෙන් ඒ අයගේ ප්‍රතිපත්තිය මොකක්ද? ඒ අය අදත් හෙටත් මේයට විරුද්ධ වෙනවාද කියා අපි දැන ගන්න කැමතියි. එහෙම නැතිව ටිකක් ඉඩ තබා ගෙන රට බෙදනවාට අපි විරුද්ධය, නැත්නම් විරුද්ධ නැත කියා කීමෙන් කිසිම වැඩක් නැහැ. මේ යෝජිත පනතින් රට බෙදෙන විධියක් අපට නම් පෙනෙන්නේ නැහැ. මේ මගින් රට බෙදෙන ක්‍රමයක් ඒ අය විසින් පෙන්නා දුන්නෙත් නැහැ. මාස ගණනක් තිස්සේ මේ ගැන කතා කළත් රට බෙදෙන විධියක් ගැන පැහැදිලි කර දුන්නේ නැහැ. මෙහි තිබෙන භයානකකම ගැන ප්‍රකාශ කරනවා. ඇත්ත, භයක් තිබෙනවා. නමුත් හැම දෙයක්ම භයෙන් කරන්න බැහැ. භයක් තිබෙනවා. අපි නැහැයි කියන්නේ නැහැ. නමුත් මෙතෙක් කිසිම කෙනෙක් තර්කානුකූලව පෙන්වා දුන්නේ නැහැ, මෙයින් මේ විධියේ විපත්තියක් සිදු වෙනවාය කියා. දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් නොයෙක් කාරණා ඉදිරිපත් කළා. දඹදෙනියේ මන්ත්‍රීතුමා වගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් සමග තර්ක කරන්න මට වුවමනාවක් නැහැ. ඇත්ත වශයෙන්ම අපට නිතා වෙන්න පුළුවන් කාරණා එතුමා කිව්වා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]
කිසිම තේරුමක් ඇති කාරණාවක් එතුමා ඉදිරිපත් කළේ නැහැ. එදා මේ සම්බන්ධ සාකච්ඡාවේදී විරුද්ධ පක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් කථා කළේ නැහැ. ඒ සම්බන්ධයෙන් තරමක් දුරට කථා කරන්න දැන් ඒ අයට අවස්ථාව ලැබී තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී හෝ මේ ගැන කරුණු ඉදිරිපත් කරන විට තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරාවියයි අපි බලාපොරොත්තු වෙනවා. අපත් මහජනතාවත් ඒවා දැන ගන්න ආශාවෙන් සිටිනවා. අපි මේ සම්බන්ධව ස්ථිර වචනයක් තමුන්නාන්සේලාගෙන් බලාපොරොත්තු වෙනවා. දිස්ත්‍රික් සභා හෝ ඒ නමින් නැතිව වෙනත් නමකින් හෝ මෙවැනි වැඩ පිළිවෙලක් කවදාවත් ඉදිරිපත් කරන්න සූදානම් නැත කියා ස්ථිර වචනයක් දෙන්න. අපි එය අසා ගන්නට බොහොම සතුටින් බලා ඉන්නවා. වගකිවයුතු පුද්ගලයින්ගෙන් නායකයින්ගෙන් අපට ඒ වචනය අසා ගන්න ඕනෑ. සමසමාජ පක්ෂයේ නායක එන්. එම්. පෙරේරා මන්ත්‍රීතුමා එදා කිව්වා මේ ක්‍රමයට සියයට සියයක් කැමතිය, එකඟය කියා. කච්චේරි ක්‍රමය අහෝසි කර දැමීමට සියයට සියයක් පක්ෂයි කිව්වා. ඒ විධියට එදා කියා දැන් වෙනත් කථාවක් පටන් අරගෙන තිබෙනවා. එහෙත් ළඟදී නැවතත් කියා තිබෙනවා, ෆෙඩරල් පක්ෂය සිටින නිසා එය කරන්නට බැරි වග. සියයට සියයක් එකඟ වෙනවාය කිව්ව කාලයේදී කොහොමද කතා කළේ? සියයට සියයක් පක්ෂයි කියා කතා කළේ 1966 දීයි. එවිටත් ෆෙඩරල් පක්ෂය මේ ආණ්ඩුවට සහයෝගය දීගෙන සිටියා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඉක්මනින් ගෙනෙන්නෙ නැත්තෙ ඇයි කියා ඇසුවා.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ඉක්මනින් ගෙනෙන්නෙ නැත්තේ ඇයි කියා අසා තිබෙනවා. "හැමදාම හැම දිනාම මේක ගෙනෙනවාය කියනවා. මේකක්ද මේකෙ තේරුම? හැම රාජාසන කතාවේම මේ ගැන කියනවා. කවදාද මිනිහෝ මේක ගෙනෙන්නේ?" කියා උනන්දුවෙන් අසා තිබෙනවා.

මනුෂ්‍යයන්ගේ අදහස් කලින් කලට වෙනස් වන්නට පුළුවනි. අපි ඒක ඒ අයුරින්ම තේරුම් ගනිමු. ඇත්ත වශයෙන්ම මහජන මතයට කවුරුත් එකඟ වන්නට ඕනෑ. මේ ගැන බියක් තිබෙන බව ඇත්තයි. [බාධාකිරීමක්] ඒ තමුන්නාන්සේලා ඇති කරපු බියයි. ඒ පිළිබඳව වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) හොඳට නිදර්ශන පෙන්නුවා. පිංතූරත් අරගෙන ගම්වලට ගිහිල්ලා කෑගහා කරන කතා ගැන එතුමා කිව්වා. [බාධාකිරීමක්] මන්ත්‍රීතුමාට තේරුම් ගිහින් නැහැ, එදා අපි විරුද්ධ වුණේ කුමන කරුණක් නිසාද කියා.

**විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. விஜேரத்ன பண்டா)*
(Mr. Wijeratna Banda)
පනත ගෙනෙන්න. එවිට අපි උත්තර දෙන්නම්.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
යමක් ගෙනෙන්නට නරක නම් එය ගෙනෙන්නට හොඳ නැහැ. එම නිසයි, මෙහි තිබෙන නරක කුමක්දැයි දැනගැනීම පිණිස ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කළේ. මෙය එක් පක්ෂයකට පමණක් වුවමනා නිසා කරන වැඩක් නොවෙයි. මෙය මුළු රටටම බල පාන කරුණක්. එසේ හෙයින් ඔවැනි කතා කරන අවස්ථාවලදී තමුන්නාන්සේලාගේ පපුවලට මීට වඩා ටිකක් තච්චු කර කතා කරන්නට ඕනෑ. මෙවැනි කරුණුවලදී අවංකව කතා කිරීම අවශ්‍යයි.

මෙම ජාතික රජය පත් වන විට භාණ්ඩාගාරයේ මුදල් අමාරුවක් තිබුණේ නැති බවත් සල්ලි හොඳට තිබුණු බවත් පෙන්වන්නට කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) වෑයම් කළා. භාණ්ඩාගාරය බොහොම දුර්වලයි කියා අපි කියන විට එහෙම තත්ත්වයක් නැතෙයි කියා පෙන්වන්නට එතුමා බොහොම මහන්සි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගත්තා. එතුමන්ලාගේ ආණ්ඩුව මේ රට පාලනය කරන කාලයේදී ඒ අන්දමට සල්ලි තිබුණා නම් එතකොට බඩු මිල ඉහල ගියේ මන්දැයි මා එතුමාගෙන් ප්‍රශ්න කරනවා. එතුමන්ලාගේ කාලයේදීත් බඩු හිඟ වුණා; කරවල හිඟ වුණා; අමුඩ ලේන්සු පවා නැති වුණා. ඒ කාලයේදී නිකවැරටියෙ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) ඔප්පු කර දුන්නා උදැල්ලක් හෝ අමුඩ ලේන්සුවක් සොයා ගන්නට බැරි බව; කරවල ටිකක් සොයා ගන්නට බැරි බව; බැටරි කෑලි හොයා ගන්නට බැරි බව. අපටත් වඩා දක්ෂ අන්දමින් එතුමා නිකවැරටිය අතුරු මැතිවරණයේදී මේවා පෙන්වා දුන්නා. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කියන අන්දමට එදා සල්ලි තියාගෙනත් මිනිසුන්ට බඩු දුන්නෙ නැත්තෙ ඇයි? එසේ කළේ මිනිසුන්ගෙන් බැණුම් අසන්නට සතුටු නිසාද? මේ උදවියට හරිම ආසාවක් ඇති, මිනිසුන්ගෙන් බැණුම් අහන්නට. භාණ්ඩාගාරයේ සල්ලි තිබුණා නම් බඩු හිඟය නැති කරන්න නොතිබුණාද? බඩු හිඟය ඒ කාලයේදීත් ඇති වුණා. එසේ වුණේ මුදල් හිඟ නිසා බව කවුරුත් පිළිගන්නවා. 1965 දී ජාතික රජය මේ රටේ පාලනය භාර ගන්න විට මුදල් තත්ත්වය සතුටුදායක අන්දමකින් පැවතුණේ නැහැ. දිනෙන් දිනම තත්ත්වය පහත බැහැගෙන ගියා. ඒ කාල පරිච්ඡේදයේදී රටේ මුදල් තත්ත්වය අවුරුද්දෙන් අවුරුද්ද මාසයෙන් මාසය දවසින් දවස අඩු වේගෙන ගියා, බැහැගෙන ගියා. ඒ නිසා අපගේ ජාතික රජයටත් ඉතා භයානක තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වුණා. ජාතික රජය පත් වී දැන් අවුරුදු 3ක් සම්පූර්ණ වේගන එනවා. මේ කාලය තුළදී විරුද්ධ පාර්ශ්වයටත් පින් සිදු වන්නට, අපට නොයෙක් විධියේ බැණුම් අහන්නට සිදු වුණා. අපේ ගම් පළාත්වලට යන විට, මිරිස් නෑ, ළූනු නෑ, අල නෑ, ආදී වශයෙන් නොයෙක් දුක්ගැනවිලිවලට ඇහුම්කන් දෙන්නට අපට සිදු වුණා. මන්ත්‍රීවරුන් වශයෙන් අප මේවාට කන් දුන්නේ සන්තෝෂයකින් නොවෙයි. හිතේ ලොකු වේදනාවක් ඇතිව ඉතාම අමාරුවෙනුයි අප මේවා අසාගෙන සිටියේ. මේවාට ඇහුම්කන් දීගෙන සිටින්නට අපට ශක්තියක් ලැබුණේ, අපගේ සැලැස්ම අනුව අප යන ගමන නිසා කල් යාමේදී මෙකී සෝෂාව අඩු වන බවත්, රටේ කිසියම් දියුණුවක් ඇති වන බවත්, ගරු අගමැතිතුමා අපට පෙන්වා දී තිබුණු නිසායි. අද ඒ තත්ත්වය එක්තරා ප්‍රමාණයකට රටේ ඇත් වේගන එන බව දකින්නට ලැබීම ගැන අපට සන්තෝෂ වන්නට පුළුවනි. රටේ අනාගතය දෙස බලා අප ගත් පියවර නිසා, හැම පැත්තෙන්ම බැණුම් අහන්නට සිදු වුණු තීරණ නිසා, අද රටේ කිසියම් දියුණුවක් ඇති වේගන එන බව දකින්නට ලැබීම සන්තෝෂයට කරුණක්. අප එවැනි වැඩ පිළිවෙළක් ගෙන ගියේ, එවැනි පියවරවල් ගත්තේ, කල් යාමේදී රටේ සතුටුදායක තත්ත්වයක් ඇති වී කිසියම් දියුණුවක් ළඟා කර ගන්නට අපට පුළුවන් වන බවට විශ්වාසයක් ඇතිවයි. එහි ප්‍රතිඵල දැන් එක්තරා ප්‍රමාණයකින් අපට දකින්නට ලැබී තිබීම ගැන අප සතුටු වෙනවා.

මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළෙන් ගොවි මහත්වරුන්ට කිසිම වැඩක් වී නැතැයි වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කිව්වා. හැබැයි, ඒ කියමන කීදෙනකු පිළිගනීදැයි මා දන්නේ නැහැ. මාත් මේ රටේ එහා මෙහා තරමක් දුර ඇවිද තිබෙනවා. ජනතාව මුණගැසී අප කතාබස් කරනවා, ගොවි මහත්වරුන් මුණගැසී අප කතාබස් කරනවා. වෙන මොනවා නැතත් අපට එක් කරුණක් නම් කියන්නට පුළුවනි. එනම් මේ රටේ ගොවි මහත්වරුන් අද වෙන දාට වඩා උනන්දුවකින්, වෙන දාට වඩා මහන්සියකින්, වැඩ කරගෙන යන බවයි. ඒ ගොවි මහත්වරුන් මීට පෙර දක්වූ උනන්දුවට වඩා ලොකු උනන්දුවකින් දැන් වැඩ කරන්නේ මොන හේතුවක් නිසාද යන වග අප කල්පනා කරන්නට ඕනෑ. ඊට මොකක් නමුත් හේතුවක් තිබිය යුතුනේ. එය ඔවුන් රටට දක්වන ආදරය උඩම කරන දෙයක්ද, විනෝදයට කරන දෙයක්ද, යන වග අප සොයා බැලිය යුතුයි. අවුරුදු සිය ගණනකට පසු අද, වෙන දා නොතිබුණු උනන්දුවක් මේ රටේ ගොවි මහත්වරුන් තුළ ඇති වුණේ මොන හේතුවක් නිසාද? ඒ වෙන කිසි දෙයක් නිසා නොවේ. ඔවුන්ගේ දහඩිය මහන්සිය වෙහෙසෙන් වෙන දාට වඩා විශාල ආදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]
යමක්, වෙනදට වඩා විශාල ප්‍රතිඵලයක්, ලබා ගන්නට ඔවුන්ට පුළුවන්කම ලැබී තිබෙන නිසයි. 1965 අවුරුද්දේදී මේ රටට පිටරටින් හාල් ටොන් ලක්ෂ හයහමාරක් ගෙන්නුවා. මේ වතාවේ ගෙන්වන්නේ හාල් ටොන් ලක්ෂ 2½ ක් පමණයි කියා මට දැනගන්නට ලැබී තිබෙනවා. හාල්වල මිලත් 1965 තිබුණු මිලට වඩා අද හුඟක් වැඩියි. 1965 දී හාල් ටොන් එකක මිල පවුම් 35ක් හෝ 37ක් පමණ වුණා. අද හාල් ටොන් එකක මිල පවුම් 67 ක් හෝ 70 ක් වෙනවා. අද මිල එදා මිල මෙන් දෙගුණයක් වී තිබෙනවා. එසේ හාල් මිල දෙගුණයක් වී ඇතත් අපේ කෘෂිකාර්මික ව්‍යාපාරය හා අනිකුත් ව්‍යාපාර යන් නිසා අපේ විදේශ විනිමය එක්තරා ප්‍රමාණයකින් ඉතිරි කර ගන්නට අපට පුළුවන් වී තිබෙනවා. ගරු කර්මාන්ත ඇමතිතුමා කෑගහන පුද්ගලයෙක්ය, බාර ගත් වැඩ කෝ කරනවා, කියා මීට කලින් හුඟදෙනෙක් එතුමාට දොස් කීවා. මේ රටේ කර්මාන්ත ඇති කිරීම සඳහා නොයෙකුත් යන්ත්‍රෝපකරණ ගෙන්වා ගන්නට ඕනෑ. ඒ සඳහා මුදල් ඕනෑ කරනවා. මහ ආණ්ඩුවෙන් ඒ ඇමති අංශයට ඒ සඳහා මුදල් දෙන්නට ඕනෑ. එසේ කළොත් පමණයි ඕනෑ කරන යන්ත්‍ර සූත්‍ර ගෙන්වන්නට පුළුවන් වන්නේ. ඒ සඳහා මුදල් තිබුණේ නැහැ. එහෙත් අවුරුදු 3 ක් තිස්සේ බැනුම් අසමින් අප ගෙන ගිය ක්‍රියා මාර්ගයන් නිසා දැන් සෑහෙන මුදල් ප්‍රමාණයක් අපට තිබෙනවා. අන්න ඒ නිසා තමයි අලුතින් කර්මාන්ත 116ක් ආරම්භ කරන්නට පුළුවන්ය යන අදහස මේ රාජාසන කථාවේ සඳහන් කර තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ අය රැකීරක්ෂා ප්‍රශ්නය ගැන කථා කරනවා. එය ඉතා උග්‍ර ප්‍රශ්නයක්. එහෙත් මේ ජාතික රජය බලයට පත් වුණාට පසුව නොයෙක් නොයෙක් මාර්ග වලින් නොයෙක් නොයෙක් තැන්වල විශාල පිරිසකට රක්ෂා ලබා දී තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. ගොවි හමුදාවක් හදා තිබෙනවා. ගංගා නිම්නභූමි සංවර්ධන මණ්ඩලය යටතේ ඇති නොයෙකුත් තැන්වල ඔවුන් වැඩ කරනවා. ඒ අන්දමට රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා ලොකු උනන්දුවකින් වැඩ කරගෙන යනවා. අලුතින් ලක්ෂ ගණනකට රක්ෂා ලබා දී තිබෙනවා. එහෙත් ප්‍රශ්නය හුඟක් විශාල නිසා ලක්ෂ ගණනකට රක්ෂා සපයා දී ඇතත් එය දැනෙන්නේවත් නැහැ. ජන ගහණයත් වැඩි වීගෙන එනවා. ඒ නිසා ආර්ථික තත්ත්වය අතින් දුර්වල රටකට එවැනි ප්‍රශ්නයක් සුළු කාලයකදී විසඳන්නට පුළුවන්කමක් නැහැ. ප්‍රථමයෙන්ම කළ යුතුව තිබෙන්නේ ආර්ථික තත්ත්වය එක්තරා පිළිවෙළකට සකස් කර ගැනීමයි. ඒ සඳහා මේ රජය එඩිතරව මුහුණ දී ක්‍රියා කර තිබෙනවා. නිදහස ලැබුණාට පසුව එදා සිටම ඒ ප්‍රශ්නයට කවුරුවත් කෙලින් මුහුණ දුන්නේ නැහැ. ආර්ථිකය නැමැති රෝගියා අසනීපයෙන් කෙඳිරිගාන විට ඔහුට සීනිබෝලයක් ගෙනගොස් දෙනවා. එය පැණිරස නිසා එය ලැබුණු පසු රෝගියා කෙඳිරිගෑම අඩු කරනවා. අවුරුදු ගණනාවක් තිස්සේ එසේ සීනිබෝල දීම නිසා ඒ රෝගියා ඉතා භයානක තත්ත්වයකට පත් වී සිටියා. 1965 දී මේ ජාතික රජය වැඩ බාරගන්නා අවස්ථාවේදී ඒ රෝගියාගේ ජීවිතය නැති වන්නට ඔන්නා මෙන්න කියන තත්ත්වයකයි තිබුණේ. ඒ නිසයි, ගරු අගමැතිතුමා මන්ත්‍රීවරුන් කැඳවා කරුණු පෙන්වා දී "නුඹලා මේ මන්ත්‍රීකම බාරගත්තේ පච්චමක් ගහ ගන්නට නොවෙයි, රට කෙරෙහි ආදරයක් ඇතිවයි, ඒ නිසා මෙන්න මෙහෙම දෙයක් තිබෙනවා, අපට එයට එඩිතරව මුහුණ දී ක්‍රියා කරන්නට සිදු වේවි" කියා මන්ත්‍රීවරුන්ට කියා සිටියේ. "උඹලාට බැණුම් අහන්න වෙයි. මේ දේවල් කිරීමේදී අමාරුකම් විඳින්න සිදු වෙයි. ඒ වුණත් අපේ ලක් මෑණියන් බේරා ගන්නට නම් එඩිතරව මේ ප්‍රශ්නවලට මුහුණ දී ක්‍රියා කරන්නට සූදානම් විය යුතුය"යි අගමැතිතුමා වැඩිදුරටත් අපට අවවාද කළා. අගමැතිතුමාගේ ඒ අවවාදයෙන්, උපදේශයෙන් අප තුළ යම්කිසි ධෛර්යයක් ඇති වුණු නිසා, එසේ බැණුම් අසමින්, ප්‍රශ්නවලට මුහුණ දෙමින්, පසුගිය අවුරුදු 3 තුළ ක්‍රියා කරගෙන ආවා.

කිරි පිටි ප්‍රශ්නය ගැන කෑ ගැහිල්ලක් දැන් ඒ තරම් ඇහෙන්නේ නැහැ. මේ රටේ කිරි පිටි නිෂ්පාදනය කිරීම සඳහා පියවර අරගෙන, දැන් ඒ ව්‍යාපාරය කරගෙන යනවා. අපි බැණුම් අහන්න සතුටු නැහැ. එහෙත් අපට බැණුම් අහන්න සිදු වුණා. මිරිස් රාත්තල රුපියල් අටට නැග්ගාය

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

කියමින් ඒ අවස්ථාවේදී දුප්පත් ජනතාව කෑ ගහන්නට වුණා. කෑ ගහන්නේ,—ආණ්ඩු පක්ෂයේ හෝ වේවා විරුද්ධ පාර්ශ්වයේ හෝ වේවා—මන්ත්‍රීවරුන්ටයි. ඒ කෑ ගැසීම ලෙහෙසි කෑ ගැසීමක් නො වෙයි, මුහුණ දෙන්න අමාරු කෑ ගැසීමක්. එසේ කෑ ගසන අවස්ථාවේදී පිටරටින් මිරිස් තොගයක් ගෙන්නුවා නම්, මිරිස් මිළ අඩු කරන්න තිබුණා. එහෙත් අපේ රට ස්වයංපෝෂිත කිරීම සඳහා අපි යම්කිසි වැඩ පිළිවෙළක් ගෙන යමින් තිබුණා නම්, රටේ දියුණුව සඳහා යම්කිසි ව්‍යාපාරයක් ක්‍රියාත්මක වෙමින් තිබුණා නම්, අර විධියට පිටරටින් ද්‍රව්‍ය ගෙන්වූ ගමන් ඒ ව්‍යාපාරය, වැඩ පිළිවෙළ කඩාකප්පල් වෙනවා, අහෝසි වෙනවා නේද ? එතැනින් ම ඒ සේරම ඉවර වෙනවා නේද ?

එම නිසා අපට සිදු වුණා, බැණුම් අසමින්, නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දෙමින්, මේ රටේ මිරිස් වගාව දියුණු කිරීම සඳහා ආධාර දෙන්න. අද මිරිස් රාත්තලක මිළ කීයද? රුපියල් 2.50 යි නැත්නම් රුපියල් 3 යි. සමහර තැන්වල රුපියල් 2 යි. ඊයේ මගේ පළාතේ මිළ ගණන් මා විමසුවා. ඒ අවස්ථාවේදී මට දැන ගන්න ලැබුණා, මිරිස් රාත්තලක් රුපියල් 2.50ක් බව. අද මිරිස් ගැන කෑ ගැසීමක් නැහැ. හොඳට හෝ වේවා නරකට හෝ වේවා අපි මේ රටේ මිරිස් වගා කෙරෙව්වා. එහෙත් අප කලින් පුරුදු වී සිටියේ, ඒවා ගෙන්වා ගැනීම සඳහා සල්ලි පිටරට යවන්නටයි. මීට කලින් හැම දාමත් කළේ මොකක්ද ? යම්කිසි ආර්ථික ප්‍රශ්නයක් මතු වුණාම, ඒ ආර්ථික ලෙඩාට ලොසින්ජරයක් සූප්පු කරන්න දෙනවා. ලොසින්ජරය පැණි රස නිසා අර ආර්ථික ලෙඩාගේ කෙඳිරිය, කෑ ගැහිල්ල තාවකාලිකව නවතිනවා.

යම්කිසි අමාරු ප්‍රශ්නයක් මතු වුණාම මිනිසුන්ට ඇස්වලට වැලි නොගසා, රටේ දියුණුව සඳහා ගෙන යන ඒ සෑම වැඩකටම අත හිත දී වැඩ කරන ලෙස මා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. "මේ රජය ගෙන යන වගා ව්‍යාපාරය ඒ තරම් ප්‍රයෝජනවත් දෙයක් නොවෙයි. එහිදී පෝරවලට ඉතා විශාල මුදලක් වැය වෙනවා" යන අන්දමේ ප්‍රකාශයක් අකුරුස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) කර තිබෙනවා, පුවත් පත් මඟින් මා දැක්කා. ගල්-ඔය ව්‍යාපාරය ආරම්භ කළ අවධියේදී ඒ ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශ අපට අද වාගේ මතකයි. එහෙත් අප එතුමන්ලාගෙන් බලාපොරොත්තු වන්නේ එවැනි දෙයක් නොවෙයි. අපේ රටට ප්‍රයෝජනවත් වැඩක් කරනවා නම්, තාවකාලික වශයෙන් කොයි තරම් අමාරුකම් වලට මුහුණ දෙන්න සිදු වුණත්, අපේ රට වෙනුවෙන් අපි යම්කිසි පරිත්‍යාගයක් කරන්න ඕනෑ, යන අදහස අපි දෙගොල්ලම එක්කාසු වී රටේ මහජනතාවට දෙන්න ඕනෑ. එසේ කළොත් තමයි, ඔවුන් තුළ ජාතික කැක්කුමක්, හැඟීමක් ඇති වී, තාවකාලික වශයෙන් යම් යම් අමාරුකම් වලට මුහුණ පාමින් වුණත් මේ රටේ ජනතාව ඒ ප්‍රයෝජනවත් ව්‍යාපාරවල කොටස්කරුවන් වන්නේ. අපි එවැනි අදහස් මහජනතාවට නොදුන්නොත්, යම් යම් අමාරුකම් ඇති වන විට ඔවුන් ඒ ජාතික ව්‍යාපාරවලින් ඈත් වන්නට බලනවා. එම නිසා, එසේ ඒ ජාතික ව්‍යාපාරවලින් ඈත් වන්නට තුඩු දෙන අදහස් නොවෙයි, අප ඔවුන්ට දිය යුත්තේ. ඔවුන් තුළ ජාතික කැක්කුමක්, හැඟීමක් ඇති වන ආකාරයට කටයුතු කිරීම සෑම ගරු මන්ත්‍රීවරයකුගේම යුතුකමක්.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉටු කිරීමට අදහස් කරන කාරණා තුන හතරක් ගැනත් මෙම රාජාසන කථාවෙහි සඳහන් කර තිබෙනවා. මගේ කථාව අවසන් කිරීමට පෙර ඒ පිළිබඳව යමක් කීම මගේ යුතුකමක් ලෙස මා සලකනවා. බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයක් පිහිටුවීමේ පනත දැන් අප සම්මත කර ගෙන තිබෙනවා. මේ රටේ එක්තරා අන්දමක උද්ඝෝෂණයක් ඇති වුණා, අපේ විශ්ව විද්‍යාලවලින් භික්ෂූන්වහන්සේලාට ලැබෙන උසස් අධ්‍යාපනය එතරම් සතුටුදායක නොවේය කියා. අපේ මහා සංඝයා වහන්සේලාට උසස් අධ්‍යාපනයක් ලබාදීම රජයක යුතුකමක් නිසා ඒ යුතුකම හරියාකාර ඉටු කිරීමට උසස් අධ්‍යාපන මණ්ඩලයක් නැතිනම් ආයතනයක් ඇති කරන්න ඕනෑය කියන හැඟීමෙන් ඒ පියවර ගෙන තිබෙනවා. ඒ අනුව, බෞද්ධ ශ්‍රාවක ධර්ම පීඨයක් ළඟදීම, සමහර විට මාස කීපයකින්ම අනුරාධපුර පිහිටුවන්න අප බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

මහා සංඝයා වහන්සේලාට උසස් අධ්‍යාපනය ලබාදෙන විට කාරණා පහක් ගැන විශේෂයෙන් කල්පනා කරමිනුයි එය ලබා දීමට බලාපොරොත්තු වන්නෙ. එනම්, බුදුන්වහන්සේගේ උගැන්වීම අනුව භික්ෂුන්වහන්සේලාගේ විනය ප්‍රගුණ කිරීම. දෙක, විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන් අතරේ බණ භාවනාදිය ප්‍රගුණ කිරීමට මාර්ග සැලැස්වීම. තුන, බුදුන්වහන්සේගේ ධර්මය මෙරට සහ විදේශ රටවල ප්‍රචාරය කිරීමට භික්ෂුන්වහන්සේලා පුහුණු කිරීම. හතර, බෞදධ ධර්මය අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමටත් ශිෂ්‍යයන් උනන්දු කරවීම. පහ, බෞද්ධ සංස්කෘතිය දියුණු කිරීමට මාර්ග සැලැස්වීම.

එ සමගම, මේ රටේ සාහිත්‍යය, චිත්‍ර ශිල්පය, නාට්‍ය මූර්ති ශිල්පය හා චිත්‍රපට පෝෂණය කිරීමේ අදහසින් හොඳම කෘතියට රුපියල් විසි පන්දාහක ත්‍යාගයක් ද ඇතුළත්වූ රුපියල් ලක්ෂයක වටිනාකමක් ඇති ත්‍යාග වාර්ෂිකව ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳවත් රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා. මේ සඳහා දැනටමත් ජාතික සංස්කෘතික ත්‍යාග මණ්ඩලයක් පිහිටුවා තිබෙනවා. මේ අවුරුද්දෙ සැප්තැම්බර මාසයේ සිට වර්ෂයක් පාසා මෙම තෑගි ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙසේ කරන ගමන්ම අගමැතිතුමාගේ විශේෂ ත්‍යාගයක් වශයෙන් රුපියල් විසි පන්දාහක ත්‍යාගයක් සාහිත්‍යය පිළිබඳව පරිත්‍යාග කරන්න කටයුතු යොදා තිබෙනවා. මෙසේ කරන්නෙ, මේ රටේ සාහිත්‍යය හා අනිකුත් ශිල්ප වැඩි දියුණු කිරීම සඳහායි. සිංහල නාට්‍ය කලාව, පසුගිය කාලය තුළදී විශාල දියුණුවක් ඇති වී තිබෙන බව සිංහල නාට්‍ය නැරඹීමට යන තමුන්නාන්සේලාට අවබෝධ වී ඇති. මෙය තව තවත් දියුණු කිරීම සඳහා නොයෙකුත් වැඩ පිළිවෙළවල් සකස් කර ගෙන යනවා. උසස් නාට්‍ය පිටපත් තෝරා ගෙන, එසේ තෝරා ගත් නාට්‍ය නිෂ්පාදනය කිරීම සඳහා මුදලින් ආධාර කරන අතර වාර්ෂික නාට්‍ය තරඟ ඇති කොට දක්ෂකම් ඇති නවකයින්ට කළ එළි බැසීමට අවකාශ සලසා දෙනවා ඇති. එමෙන්ම පළපුරුදුකම් ඇති නාට්‍යකරුවන්ට අත්හදා බැලීම් කිරීමටද අවස්ථාවක් සලසා දීමට ආණ්ඩුව අදහස් කරනවා. වර්තමාන නාට්‍ය රචකයන්ට, නිෂ්පාදකයන්ට, නළු නිළියන්ට තම දක්ෂකම් පෙන්වීමට අවස්ථාවත් නිදහසත් ලැබෙනවා ඇති. ඒ වාගේම වාර්ෂිකව අන්තර් පාඨශාලීය නාට්‍ය තරඟ පැවැත්වීමෙන් බාල පරපුර අතර නාට්‍ය පිළිබඳව උනන්දුවක් ඇති වීමට මෙම වැඩ පිළිවෙළ අනුව අවස්ථාවක් ලැබී ඒ තරුණ පිරිසටත් ප්‍රයෝජනයක් සැලසෙනවා.

වැඩ හුරුවීම ගැන සඳහන් කළ වලපනේ මන්ත්‍රීතුමා එය විහිළුවට ලක් කරමින් කථා කළා. මෙම වැඩ හුරුවීමේ වැඩ පිළිවෙළ උඩ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල පිරිසක් දිවයිනේ නොයෙකුත් පළාත්වලට ගොස් කෘෂිකර්ම ව්‍යාපාරයට උදව් උපකාර කර තිබෙනවා. මේක මහා විහිළුවක්ය, මේ වැඩ කරන්න අපේ ගම්බද ළමයින් දන්නවාය, කොළඹ උදවිය තමාය දන්නෙ නැත්තෙ කියමින් වලපනේ මන්ත්‍රීතුමා මෙයට නොගැළපෙන තේරුමක් හා අදහසක් දී ඒ වැඩ පිළිවෙළ විහිළුවක් හැටියට පෙන්නුම් කළා. එහෙත් කථානායකතුමනි, මෙම ව්‍යාපාරයේ ඇති ප්‍රයෝජනය කුමක්ද කියා හොඳින්ම දන්නේ මායි. කරුණාකර අපේ පැළ සිටුවන්න, වල් නෙළන්න ශිෂ්‍යයන් එවන්නය කියා අපේ අමාත්‍යාංශයට දන් නොයෙකුත් පළාත්වලින් කරනු ලබන ඉල්ලීම් සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩි වී තිබෙනවා. මෙය පටන්ගැන්මේදී නම් ගොවි මහත්වරුන් බොහෝ දෙනෙක් මෙයට අකැමැති වුණා. එහෙත් දැන් ඉල්ලන තරමට දෙන්න බැරි තත්ත්වයක් උදා වී තිබෙනවා.

කථානායකතුමනි, මෙම වැඩ හුරුවීමේ අංශය කෘෂිකර්ම ව්‍යාපාරවලට පමණක් නොවෙයි, පාඨශාලාවේ බංකු පුටු මේස අලුත්වැඩියා කිරීම ගොඩනැගිලිවල හුනු පිරියම් කිරීම ආදී නොයෙක් වැඩවලටත් ව්‍යාප්ත වී තිබෙනවා. ශිෂ්‍යයන් ඒ වැඩ වලට සහභාගි වීමෙන් මෙම වැඩ ගැන යම් කිසි හැඟීමක් ඔවුන්ට ඇති වෙනවා පමණක් නොව, ආණ්ඩුවට විශාල මුදලක් ඉතුරු කරගන්නට පුළුවන් වෙනවා. එපමණක්ද නොව, මෙය තමාගේ කටයුත්තක්ය, තමාගේ දෙයක්ය කියන හැඟීමක් ඒ දරුවන් තුළ ඇති වෙනවා. මෙයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබෙන ප්‍රයෝජනය ඉතා විශාල නිසා වැඩ හුරුවීම දැන් සෑම පංක්තියකට වාගේ අනිවාර්යයෙන් කිරීමට වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා.

වේලාව දැන් අවසන් වීගෙන යන බැවින් තවත් එක කාරණයක් ගැන මතක් කර මගේ කථාව අවසන් කරන්නට බලාපොරොත්තු වෙනවා. අද අපේ රටේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාවයි. කවුරු මොනවා කිව්වත් කවදාවත් මේ රටේ නොතිබුණ අන්දමට රාජ්‍ය භාෂාව ලංකාවේ සෑම පළාතකම භාවිතා වෙනවා. සිංහල අකුරක්වත් දකින්න නොතිබුණ උතුරු නැගෙනහිර ආදී පළාත්වල කොයි තරම් කඩාකප්පල් ව්‍යාපාර තිබුණත් රජයේ කාර්යාලවල අද සිංහල භාෂාව පාවිච්චි වෙනවා; සිංහල අකුරු පෙනෙන්න තිබෙනවා; සිංහල ලිපි ගොනු දකින්න තිබෙනවා.

මුළු රටේම සිංහල භාෂාව රජ කරන්න පටන් ගත්තේ ජාතික රජය බලයට පත් වුණාට පසුව බව කවුරු විසිනුත් පිළිගත යුතු කාරණයක්. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් සමහර විට කියාවි ඒක එසේ නොවේය කියා. එහෙත් ඒ මන්ත්‍රීවරුන්ටත් පිළිගන්න සිදු වී තිබෙනවා, කොයි තරම් කඩාකප්පල් ව්‍යාපාර තිබුණත් අද මුළු රටේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව හැටියට පිළිගෙන වැඩ කටයුතු කරගෙන යන බව. ඒ අනුව සිංහල භාෂාවේ පාවිච්චිය වැඩි දියුණු කරන අතර සිංහල භාෂාව මාතෘ භාෂාව නොවන උදවියට යම් කිසි පහසුකමක් ලබා දීම සඳහා සිංහල භාෂාව ඉගෙනගැනීම පිණිස විශෙෂ පොත් පත් වගයක් දැන් පළ කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, මීට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. මට මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේටත්, අනිකුත් ගරු මන්ත්‍රීවරුන්ටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 4.22

**ටී. බී. සුබසිංහ මයා.** (කටුගම්පොළ)
*(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)*
(Mr. T. B. Subasinghe—Katugampola)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කථාව අසාගෙන සිටි මට කල්පනා වුණේ එක්සත් ජාතික පක්ෂයේ ග්‍රහයින් අතර අළුත් තාරකාවක් නැගීගෙන එනවාද කියායි. එතුමා පසුගිය අවුරුදු තුණ තුළ විශාල දියුණුවක් ලබාගෙන, ප්‍රධාන පෙළට පැමිණීමට සුදුසුකම් ලබාගෙන තිබෙන බව එතුමාගේ කථාවෙන් මට පෙනුනා. එසේම එතුමා බාල බඩු විකිණීමට දක්ෂතාවයක් ලබාගෙන තිබෙන බවත් මට පෙනුනා. බාල ලී වර්ගයකින් හදන ලද ලී බඩු, පලුදු ඇති පුටු, බංකු, සෙටි ආදියේ පලුදු වසා පැලැස්තර දමා, ඒවා පොලිෂ් කර හොඳ ගණන්වලට විකුණන්නට හදනවා වගෙයි, රට සභා පනත ගැනත්, ගොවිතැන් ව්‍යාපාරය ගැනත්, අනිකුත් දේ ගැනත් එතුමා කථා කළේ. මා අද මේ ප්‍රශ්න දීර්ඝ ලෙස විග්‍රහ කරන්නට තැත් කරන්නේ නැහැ. තව සති දෙක තුනකින් සංඛ්‍යා ලේඛන ඇතිව, ආණ්ඩුවේ වාර්තා ඇතිව මේවා ගැන කථා කරන්නට අපට අවස්ථාව ලැබෙන බව මං දන්නවා. අද මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ මේ රාජාසන කථාවේ සඳහන් කර තිබෙන දේ පිළිබඳව ප්‍රතිපත්ති අනුකූලවූ කරුණු කීපයක් ගැන පමණයි.

ගරු කථානායකතුමනි, මට පෙර කථා කළ සෑම ගරු මන්ත්‍රීවරයෙක්ම පාහේ රට සභා පිළිබඳව මතක් කළා. මාත් දෙවනුව ඒ ගැන යමක් කියන්නට බලාපොරොත්තු වෙනවා. එහෙත් මගේ කථාව ආරම්භයේදීම, අධ්‍යාපන ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා, ගෙතූ වචන මාලාවක් කියන්නාක් මෙන් රට සභා සම්බන්ධව කී දේ ගැන සඳහන් කරන්නට කැමතියි. අද අප කරන්නට යන්නේ එදා බණ්ඩාරනායක අගමැතිතුමා කරන්නට ගිය වැඩේ නොවේය, අද අප රට සභා ඇති කරන්නට යන්නේ රට නොබෙදන පිළිවෙළටය, මහජන මතය දැන ගැනීම සඳහා අප ඉදිරිපත් කළේ රට සභා ධවල පත්‍රිකාවක් පමණය කියමින් මේ ගරු සභාවත්, රටත් නොමග යවන්නටයි, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා උත්සාහ කළේ. තමුන්නාන්සේලා කව්රුත් දන්නවා, ගරු කථානායකතුමත් දන්නවා, රටත් දන්නවා, ගරු අගමැතිතුමාගේ සිතේ දෙවැනිව ඇති වූ අදහසක් අනුව බව, රට සභා පිළිබඳ ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කළේ. මෙම ගරු සභාවට පළමුවෙන්ම ඉදිරිපත් කරන්නට තැත් කළේ ධවල පත්‍රිකාවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

නොවෙයි, ආඥා පනතක්. කැබිනට් මණ්ඩලය මාස ගණනක් සාකච්ඡා කළේ ධවල පත්‍රිකාවක් නොව ආඥා පනතක් බව තමුන්නාන්සේලා කව්රුත් දන්නවා. රටේ මහජන මතය නැඟිගෙන ඇවිත්, මහජන කෝපය ඇවිස්සිගෙන ඇවිත් ඒකට විරුද්ධත්වය ප්‍රකාශ වන විට අගමැතිතුමා නම්බුකාර ලෙස එය ඉල්ලා අස් කර ගන්නේ නැතිව නැවත වරක් මේ සභාවත්, ජනතාවත් මුළා කිරීමට ධවල පත්‍රිකාවක් කියා එකක් ගෙනාවා. තමුන්නාන්සේලා නටන සෑම නෙයියාඩමක්ම බලා, මේ රටත්, මේ ගරු සභාවත් මුළා කිරීමට තමුන්නාන්සේලා අටවන සෑම උගුලකටම අපි අහු වෙලා, තමුන්නාන්සේලාට වුවමනා දේ කරන්නට අපි තමුන්නාන්සේලාට උදව් කරාවිය කියා තමුන්නාන්සෙලා කල්පනා කරනවාද ?

අපේ අදහස් දැන ගන්නට කැමතිලු. රට බෙදෙන විධියේ රට සභාවක් දෙනවාද, රට නොබෙදන විධියේ රට සභාවක් දෙනවාද යන්න ගැන අපේ අදහස් දැන ගැනීමට කැමතිලු. ඔව්, අප යම් මතයක් දැරුවත්, යම් අදහසක් ප්‍රකාශ කළත්, ඒ අදහස ක්‍රියාවේ යෙදීමෙන් මේ රටට විනාශයක් වෙනවාය කියා, මේ රටට හානියක් වෙනවාය කියා අපට පෙනී යනවා නම් ඒ අදහස වෙනස් කර ගැනීමට අපි නිතරම සූදානම්. විරුද්ධ පාර්ශ්වය කලින් මොන අදහස් ප්‍රකාශ කර තිබුණත්, අද මේ රටේ පවතින තත්ත්වය දෙස බලන කොට, අද මේ රටේ තිබෙන සමාජ චංචලභාවය දෙස බලන කොට, අද මේ රටේ වෙසෙන ජාතීන් අතර පවතින අන්‍යොන්‍ය සම්බන්ධතාවේ දුර්වලකම ගැන සලකන කොට, අන්‍යොන්‍ය සැකය ගැන සලකන කොට, ෆෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරුන් හා එම පක්ෂයේ තරුණ සංවිධානය ඉල්ලන දේ ගැන කල්පනා කරන කොට, ද්‍රවිඩ රාජ්‍යයක් වුවමනා යයි උද්ඝෝෂණය කරන කොට, ෆෙඩරල් ක්‍රමයක් මේ රටේ බිහි කිරීම තම පක්ෂයේ අවසාන පරමාර්ථය යයි ෆෙඩරල් පක්ෂය කියන කොට, රටසභා සඳහා එකඟ වන්නට අපට අද පුළුවන්කමක් නැහැ. ෆෙඩරල් පක්ෂයේ අවසාන පරමාර්ථය සඳහා ළඟා වීම පිණිස ඉනිමං බැඳීමට අපට පුළුවන්කමක් නැහැ. අප ඒ සඳහා සූදානම් වන්නේ නැහැ. ඒ නිසා රට සභා පිළිබඳ පනතක් ඉදිරිපත් කිරීම ගැන අප සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනවා. මා මේ ප්‍රකාශය කරන්නේ විරුද්ධ පාර්ශ්වයේ සිටින ප්‍රධාන පක්ෂ තුනම වෙනුවෙනුයි. වේලාව තිබුණොත් මේ ප්‍රශ්නය ගැන තවත් ටිකක් පසුව කථා කරන්නට මා අදහස් කරනවා.

ගරු කථානායකතුමනි, අතර මැද අවුරුදු තුනක හතරක කාලය හැරෙන්නට අවුරුදු 20 ක පමණ කාලයක් මා මෙම ගරු සභාවේ සිටියා. මේ කාලය තුළ මා රාජාසන කථා ගණනාවකට කන් දී තිබෙනවා. ඇත්තෙන්ම අද නම් රාජාසන කතාවක් පැවැත්වීමේ වැදගත්කමක් තිබෙනවාද ? රාජාසන කථාවකින් හෝ ජනාධිපතිවරයා අවුරුද්දකට වරක් පාර්ලිමේන්තුව අමතා කරන ප්‍රකාශයකින් හෝ බලාපොරොත්තු වන්නේ ඒ ආණ්ඩුවේ ඉදිරි වර්ෂයේදී කරන්නට බලාපොරොත්තු වන වැඩ පිළිවෙළේ ප්‍රතිපත්ති සම්බන්ධ විස්තරයක්. එහෙත් මේ රටේ අද පැවැත්වෙන රාජාසන කථාවක අපට ඒ ලක්ෂණය දකින්නට පුළුවන්ද ? බැහැ. ලේකම්වරුන් සහ අනෙකුත් නිලධාරීන් විසින් සකස් කොට එවන ඒ ඒ අමාත්‍යාංශවල වැඩ කටයුතු පිළිබඳ විස්තර ලණුවක් සේ එකට අමුණා ගරු අග්‍රාණ්ඩුකාරතුමා ලවා මෙතැනදී කියවනවා. නොකෙරෙන දේවල් ලණුවක් සේ එකට අමුණා අර වැදගත් අග්‍රාණ්ඩුකාරතුමාට දඬුවම් දීමක් වශයෙන් එතුමා ලවා දීර්ඝ වේලාවක් කියවමින් අප කරගෙන යන විහිළුව නවත්වන්නට ඕනෑ. මීට වඩා කෙටියෙන් මේ වැඩේ කරන්නට පුළුවනි. අපේ කාලය නාස්ති නොවෙන ආකාරයට මේ වැඩේ කරන්නට පුළුවනි. මින් මත්තට එය එසේ කරතැයි අප බලාපොරොත්තු වෙනවා. මේ විහිළුව පසුගිය අවුරුද්දේත් අප දැක්කා. කොතරම් ඉවසිල්ලෙන් අසා ගෙන සිටියත් ඇත්තෙන්ම අද මේ කරන වැඩේ ඔබින්නේ නැහැ. කාලයට ගැළපෙන ලෙස අප සකස් වන්නට ඕනෑ. ඒ වාගේම මෙය කාලයට නොහොබිනා උත්සවයක් යයි මා හිතනවා. ඒ නිසා කුමන ආණ්ඩුවක් බලයට පත් වුණත් මේ ගැන කල්පනා කිරීම වටිනවා.

රාජාසන කථාවේ සඳහන් සෑම දෙයක්ම අප විවේචනය කරනවා. ආණ්ඩු පැත්තේම සමහර උදවියත් රාජාසන කථාවේ එන සමහර කාරණා විවේචනය කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධ පාර්ශ්වයෙන් කෙරෙන්නේ තද විවේචනයක්. අප විතරක් නොව, 1965 දී සහ 1966 දී අපට කට අරින්න ඉඩ නොදුන් උදවිය අද අපේ ඉස්සරහින් හා පස්සෙන් සිට මේ රාජාසන කථාව විවේචනය කරනවා. අපට හු කී අය අද මේ රාජාසන කථාව විවේචනය කරනවා. එදා අප තමුන්නාන්සේලාගේ රාජාසන කථාව විවේචනය කිරීම ගැන අපට දොස් නැඟූ ධනපති පුවත්පත්ද මෙය විවේචනය කරනවා. මෙම රාජාසන කථාව පුස්සක් ලු. වැදගත් යයි සලකන මේ රාජාසන කථාව ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරුන්ට දිවි කදුරු මෙන් තිත්ත වී තිබෙනවා. ඇත්තෙන්ම පාර්ලිමේන්තුව ඇතුළතත් ඉන් පිටතත් අද ඇති වී තිබෙන්නේ මෙවැනි තත්ත්වයක්. මෙම රාජාසන කථාව වෙනුවෙන් ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්, පාර්ලිමේන්තු ලේකම්වරුන් සහ මන්ත්‍රීවරුන් කියන දේවල් මහජනයා උනන්දුවෙන් කියවනවා යයි තමුන්නාන්සේලා විශ්වාස කරනවාද? නැහැ. 1965 දී ගරු අගමැතිතුමා මෙතැනට ආවේ පංච තූර්ය නාදයක් අතිවයි. මේ රටේ අලුත් ලෝකයක් බිහි කරන්නට යනවා යයි කියමිනුයි. එහෙත් අද අවුරුදු තුනකට පසු තත්ත්වය මොකක්ද? අද තමුන්නාන්සේලාට කියන්ට පුළුවන්කම තිබෙන්නෙ කෘෂිකර්ම ඇමතිතුමාගේ ගොවිතැන් ව්‍යාපාරය ගැන පමණයි. ඒ ගැන මම දෙවනුව යමක් කියන්ට බලාපොරොත්තු වෙනවා. අද පාරට්ටු කරන්ට තිබෙන්නෙ එපමණයි.

මේ රාජාසන කථාව සකස් කර තිබෙන හැටි බලන්න. පටන් ගන්නෙ ආර්ථික තත්ත්වය පිළිබඳව කියමිනුයි. ඊළඟට ගොවිකර්මාන්තයටත් බහිනව. කර්මාන්තවලින් පසුව විදේශීය ප්‍රතිපත්තිය ගැන පේළි හත අටක් සඳහන් කර තිබෙනව. විදේශ ප්‍රතිපත්තියෙන් නැවතත් ගොවිකර්මාන්තයටත්, කර්මාන්තයටත් වෙන වෙන දේවලටත් බහිනව. මේක සකස් කර තිබෙන ආකාරයෙනුත් අපට පෙනී යනව, පාර්ලිමේන්තුව ඉදිරියේ යමක් කියන්නට වුවමනා නිසා තදියම් වෙලා හදිසියේ හැදූ දෙයක් බව.

විදේශ ප්‍රතිපත්තිය ගනිමු. මේ රටේ විදේශ ප්‍රතිපත්තිය හැඩගැස්වීම අගමැතිතුමාට භාරව තිබෙන කර්තව්‍යයක්. ජාත්‍යන්තර වශයෙන් 1968 අවුරුද්ද ලෝකයේ තීරණාත්මක අවුරුද්දක් හැටියට මම කල්පනා කරනව. නැවත වරක් තුන් වෙනි ලෝක යුද්ධයක් ඇති වීමට නොයෙක් අතින් තුඩු දී තිබෙන අවස්ථාවකයි, 1968 අවුරුද්දේ අපි මේ ජීවත් වෙන්නෙ. කොයි වෙලාවේ යුද ගිනි ඇවිළෙයිද කියා විශ්වාස කරන්ට බැරි තැන් දෙකක් අද ලෝකයේ තිබෙනවා. එකක්, වියට්නාමය. අනික, මැද පෙරදිග. වියට්නාමය සම්බන්ධයෙන් අපේ අගමැතිතුමා අපට කියන්නෙ මොකද? මේ රාජාසන කථාවේ ඉංග්‍රීසි පිටපතෙන් මම ඒ කොටස කියවන්නම්. මෙන්න ඒ කොටස :

"The promotion of greater international understanding and establishment of a stable and just international order continue to be one of the principal aims of the foreign policy of My Government. It will give its full support to all efforts directed to this end, undertaken within the United Nations and outside.

My Government has always viewed with great distress and anxiety the tragic conflict in Vietnam and welcomes the talks now in progress. It is the earnest hope of My Government that these talks will move towards the finding of a just and lasting settlement which will accord with the interest and wishes of the people of Vietnam."—[OFFICIAL REPORT, 7th July 1968; Vol. 79, c. 40].

ඉංග්‍රීසි කියමනක් තිබෙනව, "The road to hell is paved with good intentions." යනුවෙන්. අපායට යන මාර්ගය හොඳ බලාපොරොත්තුවලින් ගහන වෙලාය කියනවා. මේක කියවන විට ඒ බලාපොරොත්තු විතරක් ප්‍රකාශ වෙලා තිබෙන බවයි හැඟී යන්නෙ. වියට්නාමයේ පවතින තත්ත්වය ගැන අද ලෝකයේ තිබෙන ජනමතය මොකක්ද? වියට්නාමයට කඩා පැන එහි ජනතාව විනාශ කිරීමට අධිරාජ්‍යවාදී බල වේගයක් විසින් ගෙන යනු ලබන මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන්, ඒ අධිරාජ්‍යවාදී රටට ආධාර දෙන මිත්‍ර රටවල් පවා කියා සිටින්නේ වියට්නාමයේ සාමය අවශ්‍ය නම් උතුරු වියට්නාමයට බෝම්බ දැමීම වහාම නැවැත්විය යුතු බවයි. ඇමෙරිකන් මිත්‍ර කඳවුරේ සිටින ආණ්ඩු පවා කියන්නෙ ඒකයි. අනිත් පැත්තෙන් ඉන්දියාවේ ආණ්ඩුවත්, ආසියාතික අනික්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

රටවලුත් කියා සිටිනව, උතුරු වියට්නාමයට බෝම්බ දැමීම වහාම නැවැත්විය යුතුයි කියා. පැරිසියේ පැවැත්වෙන සාකච්ඡාවලදී උතුරු වියට්නාම් ආණ්ඩුවේ නියෝජිතයන් තරයේම කියා සිටිනව, "වියට්නාමයේ සාමය අවශ්‍ය නම් ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට වැදගත් පිළිවෙලට ඉදිරිපත් වෙනව නම්, නුඹලා අපේ රටට බෝම්බ හෙළීම සම්පූර්ණයෙන්ම නවත්තපල්ලා" කියා. ලෝකයේ අනෙකුත් ආණ්ඩු වැඩි ගණනක් ඒක අනුමත කරනව. ඒ අන්දමට මහජන මතය බුර බුරා පැන නැගී තිබෙන වෙලාවේදීවත් අපේ අගමැතිතුමාට බැරි වුණා, ඒ පිළිබඳව ලෝකයාට පැහැදිලි ප්‍රකාශයක් කරන්න. "උතුරු වියට්නාමයේ සාමය තහවුරු වනු දකින්නට අප තුළ විශාල බලාපොරොත්තුවක් තිබෙනවා. අපේ ඒ බලාපොරොත්තුව සම්පූර්ණ කිරීම ඉතාමත් අවශ්‍යයි. අමෙරිකන් යුද්ධ හමුදාව විසිනුත්, අහස් යාත්‍රා හමුදාව විසිනුත් උතුරු වියට්නාමයට බෝම්බ හෙළීම, උතුරු වියට්නාමයේ සාමය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවට උදව්වක් වශයෙන් වහාම නැවැත්විය යුතුයි" යනුවෙන් කියා සිටින්නට අපේ ගරු අගමැතිතුමාට තවමත් බැරි වුණා. ඒ කොයි හැටි වෙතත්, සාමය ගැන නම් කථා කරනවා.

ගරු අගමැතිතුමාගෙන් මම ප්‍රශ්නයක් අහනවා. උතුරු වියට්නාම් ප්‍රශ්නය සම්බන්ධව බල පාන යම් යම් මූලික සත්‍යයන්, අදවත් අපේ ගරු අගමැතිතුමා පිළිගන්නවාද? අදත් ගරු අගමැතිතුමා කියා සිටින්නේ කුමක්ද? වියට්නාම්වරුන්ගේත් අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේත් ගැටුම් නමැති පොරයට මැදි වී උතුරු වියට්නාමය සිටින මේ අවස්ථාවේදී පවා අපේ ගරු අගමැතිතුමා උතුරු වියට්නාම් බලවේගයත්, ඇමෙරිකන් බලවේගයත් යන මේ බලවේගයන් දෙකම එකම මට්ටමෙන් මනිනවාදැයි ගරු අගමැතිතුමාගෙන් මම අහනවා. උතුරු වියට්නාම් ජනතාව තමන්ගේ නිදහස ලබා ගැනීමට, දෙපැත්තකට බෙදී තිබෙන තමන්ගේ රට ඒකාබද්ධ කර ගැනීමට, සටනක් කරගෙන යන බව අපේ ගරු අගමැතිතුමා අදවත් පිළිගන්නවාදැයි මම එතුමාගෙන් අහනවා. තමන්ගේ ජාතික විමුක්තිය රැක ගැනීමට සටනක් ගෙන යන මේ අවස්ථාවේ ස්වජාතිකයන්ම, ඒ ජනතාවට දෙන ආධාරයත්, අමෙරිකන් අධිරාජ්‍යවාදීන් පැමිණ ඒ සටනට විරුද්ධව කරන බෙදජනක මනුෂ්‍ය ඝාතනයත් අපේ ගරු අගමැතිතුමා එක මට්ටමේම දේ හැටියට මනිනවාදැයි මම අහනවා, ගරු අගමැතිතුමාගෙන්. මේ ප්‍රශ්නය හා සම්බන්ධ යම් යම් මූලික ප්‍රතිපත්ති නොපිළිගන්න නිසයි මේ තත්ත්වය ඇති වන්නේ. අද අමෙරිකාවේ පවා දේශපාලනඥයින්, විද්‍යාඥයින්, ශාස්ත්‍රඥයින් මේ ප්‍රශ්නයට මුල් වූ කරුණු මොනවාදැයි පිළිගෙන තිබෙනවා. එහෙත් අද මේ රටේ ආණ්ඩුවට, ගරු අගමැතිතුමාට, විදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට මේ සම්බන්ධයෙන් පැහැදිලිව යමක් කියන්නට බැහැ. වියට්නාමයේ කෙරෙන දරුණු මනුෂ්‍ය ඝාතනය නැවැත්වීමට නම් උතුරු වියට්නාමයට බෝම්බ හෙළීම නවත්වා, අමෙරිකන් භට හමුදා, නාවුක හමුදා, අහස් යාත්‍රා හමුදා වහාම ඒ ප්‍රදේශයෙන් ආපසු යා යුතුයයි කියන්නට අපේ ගරු අගමැතිතුමා සූදානම් නැහැ. උන්නැහේට එවැන්නක් කියන්නට තරම් ශක්තියක් නැහැ.

මැද පෙරදිග තත්ත්වයත් එහෙමමයි. ඒ ප්‍රදේශවල දැවෙන ප්‍රශ්න කොයි වේලාවේ නැවත උග්‍ර තත්ත්වයකට පත් වේදැයි කියන්නට බැහැ. කාලතුවක්කු හමුදා, යුද්ධ හමුදා, අහස් යාත්‍රා හමුදා, ආදිය කොයි මොහොතේ සටනට මැදිහත් වේදැයි කියන්නට බැහැ. එවැනි තත්ත්වයක් අද තියෙනවා. ගිය අවුරුද්දේ ජූනි මාසයේදී ඊශ්‍රායලය විසින් අයුතු විධියට අසාධාරණ විදියට අරාබි රාජ්‍යයට පහර ගැසූ සැටි අද මුළු ලෝකයම දන්නවා. ඒ වාගේම බටහිර අධිරාජ්‍යවාදීන්ගෙන් සහයෝගයත් ධෛර්යයත් ලැබුණේ නැත් නම් ඊශ්‍රායලය එවැන්නකට ඉදිරිපත් නොවන්නට ඉඩ තිබුණු බව අද මුළු ලෝකයම පිළිගන්නවා. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයත් යෝජනාවකින් ඒ බව පිළිගෙන තිබෙනවා. මැද පෙරදිග සාමය ආරක්ෂා කිරීමට නම්, තහවුරු කර ගැනීමට නම්, ඉස්රායලය විසින් අරාබි රටවලට අයිති ප්‍රදේශවලින් යටත් කර ගත් ප්‍රදේශය අත්හැර දමා ඒ ප්‍රදේශවලින් වහාම ආපසු යන්නට ඕනෑය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්න අද මුළු ලෝකයම පිළිගෙන තිබෙනවා. එහෙත් සමහර අධිරාජ්‍යවාදී රටවල සහයෝගය, උදව්ව, අනුකූලතාව ඇතිව ඉස්රායලය තවමත් පෙර පරිද්දෙන්ම වැඩ කටයුතු කරගෙන යනවා. ඒ අය තවමත් එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ යෝජනාවෙන් කියවුණු අදහස පිළිගන්නට සූදානම් නැහැ. මෙවැනි පැහැදිලි ප්‍රශ්නයක් සම්බන්ධව පැහැදිලි මතයක් ප්‍රකාශ කරන්නට අපේ ගරු අගමැතිතුමාට බැරිද? තමන් ගන්නේ මොන පැත්තදැයි එළිමහනේ ප්‍රකාශ කරන්නට බැරිද? අපේ ආණ්ඩුව හදන්නේ හාවා එක්ක දුවන ගමන් බල්ලා එක්ක දඩයම් කරන්නටයි. නරියා එක්කය කියන එක වඩාත් හොඳයි වෙන්ට ඇති. මැද පිළිවෙතය කියන්නේ මෙවැනි ප්‍රතිපත්තියකටද? “non-aligned policy” කියන්නේ මෙයටද? යුක්තියත් අයුක්තියත් යන දෙක ගැන සිහි නුවණින් යුතුව කල්පනාකාරීව සිටීමත්, අවශ්‍ය පරිදි ක්‍රියා කිරීමත් අවශ්‍ය නැද්ද, එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නකුට?

විරුද්ධ පාර්ශ්වයේ ගරු නායිකාව මේ රටේ අගමැතිනිය හැටියට සිටිද්දී 1962 දී චීනයත් ඉන්දියාවත් අතර ඇති වූ සටනේදී ආණ්ඩුව ක්‍රියා කළ ආකාරය මට මතකයි. එහෙත් එදා අපේ ගරු අගමැතිතුමා මොකද කිව්වෙ? එතුමා එදා විරුද්ධ පාර්ශ්වයේ නායක හැටියටයි හිටියේ. එදා අපේ ගරු අගමැතිනිය සාමයේ දූතිකාවක් හැටියට ක්‍රියා කළා. රටවල් දෙක අතර ඇති වූ ඒ යුද්ධය නැවැත්වීමට—පුළුවන් තරම් ඉක්මනින් නැවැත්වීමට—එතුමිය තැත් කළා. සාම දූතිකාවක් හැටියට, මධ්‍යස්ථ කෙනෙක් හැටියට ප්‍රශ්නය විසඳන්න සූදානම් වන විට එදා විරුද්ධ පක්ෂයේ නායකයා වශයෙන් සිටි අද අගමැතිතුමා මොකක්ද ප්‍රකාශ කළේ? එතුමා එදා ආණ්ඩුවට දොස් කිව්වා. එදා සිටි අගමැතිනියම දොස් කිව්වා.

ඉන්දියාවට චීනය පහර දුන් නිසා චීනය හෙළා දක්කෝ නැත කියා එදා සිටි අගමැතිනියට දොස් කිව්වා. එදා සිටි අගමැතිනිය අර පුටුවේ වාඩි වී සිටින විට, ඇය සාම දූතිකාවක් හැටියට ක්‍රියා කරන විට අද අගමැතිතුමා වශයෙන් සිටින තමුන්නාන්සේ මොකක්ද කිව්වෙ? පළමුවෙන් පහර ගසන්න තැත් කළ රට හෙළා දැකිය යුතු බවයි එතුමා කිව්වෙ. අද තමුන්නාන්සේලා වියට්නාමය සම්බන්ධවත්, ඊශ්‍රායලය සම්බන්ධවත් එදා කියන ලද ප්‍රතිපත්තියද අනුගමනය කරන්නේ? ගරු කථානායකතුමනි, අද ගෙනයන විදේශ ප්‍රතිපත්තිය නිසා අද රටේ ආර්ථික ප්‍රතිපත්තියත් අධිරාජ්‍ය බලවේගයට යට වෙලා. අධිරාජ්‍යවාදීන් කියන අන්දමටයි මේ ආණ්ඩුව ක්‍රියා කරන්නෙ. ආර්ථික ක්‍රමය ගෙන යන්නේත් ඒ අන්දමටයි. තමුන්නාන්සේලා 1965 සිට ක්‍රියාත්මක කරන්න තැත් කර තිබෙන ප්‍රතිපත්ති මොනවාද? මේ රටේ ආර්ථික නිදහස ලබා ගැනීමයි අපේ ප්‍රධාන කර්තව්‍යය කියා තමුන්නාන්සේලා හැම විටම කියනවා. ඒ නිසා ගොවියාට කියනවා, “හිටවපල්ලා, වපුරපල්ලා, කපාපල්ලා” කියා. නමුත් නියම වශයෙන් ක්‍රියාත්මක වී තිබෙන්නේ මොකක්ද? 1956 සිට 1964 තෙක් මේ රටේ පැවති ආණ්ඩු, පළමුවෙන් බණ්ඩාරනායක මැතිතුමාගේ ආණ්ඩුවත්, දෙවනුව බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවත් යන ආණ්ඩු දෙක විසින් මේ රටේ අධිරාජ්‍යවාදී ආර්ථික බැමි ටිකක් වත් ලිහිල් කිරීමට යම් වැඩ පිළිවෙලක් ගත්තාද, ඒ වගේම මේ රටේ ආර්ථික ඒකාධිකාරය දුර්වල කර රජයේ අංශය ටිකක් පළල් කර ආර්ථික ක්‍රමය ඉදිරියට ගෙන යාමට යම් ක්‍රියා මාර්ගයක් අනුගමනය කළාද, ඒ වගේම මේ රටේ සංවර්ධනය පිණිස, බදු බර ආදිය ඔසවන්න පුළුවන් උදවියගේ කර පිට බදු බර පැටවීමෙන් මුදල් ප්‍රමාණයක් සොයා ගැනීමට තැත් කළාද, ඒ සෑම ප්‍රතිපත්තියක්ම අද ආපසු කරකවා තිබෙනවා. ලෝක බැංකුවේ උපදෙස් අනුව, ඒ වගේම බටහිර පන්නයටම කල්පනා කරන ආර්ථික විශේෂඥයින්ගේ උපදෙස් අනුව මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම ලෝක ධනපති ක්‍රමයට පරිවර්තනය කර තිබෙන බව අපි කවුරුත් පිළිගන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, වී ගොවිතැන ගැන කථා කළා. කර්මාන්ත ගැන කථා කළා. ඒ වගේම මුදල් පරිපාලනය ගැනත් කථා කළා. ඔය සෑම අතින්ම මේ රටේ ආර්ථිකයට අද බලපාන්නේ අධිරාජ්‍යවාදී බලවේගයනුයි. මේවා පැහැදිලි කර දෙන්න ගියොත් කාල වේලාව ගත වෙනවා. එහෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]
නැත්නම් මට හොඳට පැහැදිලි කර දෙන්න පුළුවනි. අයවැය ලේඛන විවාදයේදී කරුණු සහිතව මා තවත් විස්තර කර දෙන්නම්.

අද රටේ ආහාර ප්‍රශ්නය ගැන ටිකක් බලන්න. මුන්නැහේලා නම් කියනවා ආහාර ප්‍රශ්නය බොහෝ දුරට විසඳී තිබෙනවාය කියා. මේ අවුරුදු තුන ඇතුළත ආහාරය සම්බන්ධ කිසිම හැඩීමක් නැතිලු. කන්න ඕනෑ තරම් තිබෙනවාලු. මිරිස් රාත්තල රුපියල් 2 කට ගන්න තිබෙනවාලු. නමුත් ගිය සුමානේ දිනක අපේ මාසියා කිව්වා මිරිස් රාත්තලට රුපියල් 5 ක් ගෙවන්න සිදු වුණාය කියා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*
(Dr. Colvin R. de Silva—Agalawatta)
අර පැත්තේ මන්ත්‍රීවරයෙක් විසින් කිව්වා දැන් පෝලිම් නැත කියා. නමුත් අම්බලන්ගොඩ මන්ත්‍රීතුමා විසින් ඊයේ කිව්වා, ඊට කලින් දිනයේ උදේ 7 සිට පෝලිමේ ඉන්න සිදු වුණාය කියා අවශ්‍ය දෙයක් ලබා ගැනීමට.

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)
ඔය විධියේ පරස්පර විරෝධී අදහස් උන්නැහේලාගේ කතාවලින් අපට අසන්න ලැබෙනවා. මා ඒවා ගැන කතා කරන්න යන්නේ නැහැ. නමුත් මොකක්ද අද සිදු වී තිබෙන්නෙ? ආහාර ඇමතිතුමාත් අද මෙතන සිටිනවා. එතුමාගේ යුතුකමක් තිබෙනවා නේද, යම් භාණ්ඩයක හිඟයක් පවතින අවස්ථාවකදී ඒ භාණ්ඩ සාධාරණව බෙදා හැරීමට මාර්ග සැලැස්වීමට? එය ආණ්ඩුවේ යුතුකමක් නේද? නමුත් මේ ආණ්ඩුව බලයට ආ දිනයේ සිට මොකක්ද කළේ? පසුගිය යුද්ධ කාලයේදී මේ සමුපකාර ව්‍යාපාරය ආරම්භ කළේ මොන චේතනාවකින්ද? සාමාන්‍ය ජනතාවට අවශ්‍ය භාණ්ඩ සාධාරණව බෙදා හැරීමේ පරමාර්ථය උඩයි එය පටන් ගත්තේ. ඇත්ත වශයෙන්ම සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා අගමැතිතුමාගේ පියා මූලික ස්ථානයක් ගෙන කටයුතු කළා. එම සමුපකාර ව්‍යාපාරය නියම මහජන ව්‍යාපාරයක් හැටියට ගොඩනැගුණා. මේ ආණ්ඩුව පැමිණි හැටියේ කළේ කුමක්ද? සීමාසහිත බඩු ප්‍රමාණයක් ජනතාව අතර බෙදා හැරීම පිණිස ආණ්ඩුව විසින් ගොඩනගා තිබුණු, ආණ්ඩුව විසින් ධෛර්‍ය දෙමින් තිබුණු වැඩ පිළිවෙළ පුද්ගලික වෙළෙන්දන් අතට දීමයි. සීමාසහිත බඩු ප්‍රමාණයක් බෙදා හැරීමේ කර්තව්‍යය කරගෙන යාම සඳහා රජය විසින් සංවිධානය කර තිබුනු කර්තව්‍යය යම් යම් අංශවලින් අස් කර එම කර්තව්‍යය පුද්ගලික වෙළෙන්දන් අතට භාර දීම හේතුකොටගෙන අද ඇති වී තිබෙන තත්ත්වය කුමක්ද? ඒ උදවිය බ්ලැක්මාකට් ක්‍රමයෙන් කෝටි ගණන් හම්බ කරනවා.

අද සමුපකාර ව්‍යාපාරය අඩපණ වෙලයි තියෙන්නේ. එහෙත් මුන්නැහේලාගේ ප්‍රතිපත්තිය කුමක්ද? ඒ උදවිය තමුන්නාන්සේලාගේ දේශපාලන යහළුවෝයි. ඇමතිතුමාත් ඒක දන්නවා. "උන්නැහේලාට අත ගහන්න අපට බැහැ; එම නිසා උන්නැහේලා ලාබය රැස් කර ගන්නාවේ" කියන ප්‍රතිපත්තියයි තිබෙන්නේ. වෙළඳාමට ගියත්, Private enterprise must be encouraged. ගොවිතැනට ගියත්, Private enterprise must be encouraged. අද ගොවිතැන්වලින් කාටද ප්‍රයෝජනය ලැබෙන්නේ? නියම ගොවියාට නොවෙයි; මැදින් සිටින ජාවාරම්කාරයාටයි. ඒවා තමුන්නාන්සේලාට පෙනෙන්නේ නැහැ. මේවා ගැන කියන්නට කරුණු ඕනෑ තරම් තිබෙන නමුත් මේ ඊට අවස්ථාව නොවෙයි.

මේ ආණ්ඩුව අනුගමනය කරන මූලික ආර්ථික ප්‍රතිපත්තිය වැරදි නිසා අද මෙරට ජනතාවට මෙවැනි බරක් උසුලන්නට සිදු වී තිබෙන බවයි, මා දැන් ඔප්පු කරන්නට උත්සාහ දරන්නේ. අද මේ රට තුළ නිෂ්පාදනය කරන සහ මේ රටට පිටරටවලින් ගෙන්වනු ලබන බඩු ප්‍රමාණ සාධාරණ අන්දමින් පාරිභෝගිකයන් අතරට බෙදී යාම සඳහා මීට වඩා හොඳ ක්‍රමයක් අනුගමනය කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැකි වුවත්, මේ ආණ්ඩුවේ පවතින පන්ති ස්වභාව නිසා එය කරන්නට පුළුවන්කමක් නැහැ. මේ ආණ්ඩුව බැඳී සිටින්නේ ධනපති පන්තියට නිසා, මේ ආණ්ඩුව බැඳී සිටින්නේ මේ රටේ අන්තිම කළුකඩකාරයාට නිසා, මහජනතාවගේ බඩගින්න නිවාලීම සඳහා සාධාරණ අන්දමට බඩු බෙදා හරින්නට ශක්තියක් නැහැ.—[බාධාකිරීමක්.] කර්මාන්ත දෙස බැලුවත් වෙළඳාම දෙස බැලුවත් ඕකයි තත්ත්වය.

"අයිආර් 8" යනාදී වී වර්ග පිළිබඳව අද පවතින රාවය කුමක්ද? අළුත් දේට මාත් බොහොම කැමතියි. මේ රටේ ගොවිතැන නවීන ක්‍රම අනුව දියුණු කළ යුතුය යන්න මාත් පිළිගන්නවා. එහෙත් අළුත් දේවල් මේ රටට බෝ කරන විට අපි ටිකක් පරිස්සමින් කටයුතු කරන්නට ඕනෑ. ඒවායින් ලැබෙන පල විපාක මොනවාද කියා හොඳින් සොයා බලන්නට ඕනෑ. අද හැම තැනම "අයිආර් 8" වී වර්ගය බෝ කරන්නට තැත් කරනවා. මේවායින් ලැබෙන සෑම පල විපාකයක් ගැනම සොයා බැලීමෙන් පසුවද, මේ රටේ පසට මෙම වී වර්ගය ගැළපෙනවාද කියා පරීක්ෂා කර බැලීමෙන් පසුවද මේ ගැන කටයුතු කරගෙන යන්නේ? මේ වී වර්ගය පිළිබඳව ලොකු බියක් තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවා නේද? මෑතදී පවත්වන ලද ජාත්‍යන්තර විද්‍යාඥයන්ගේ රැස්වීමකදී කෘෂිකර්ම රෝග පිළිබඳව සාකච්ඡා කරද්දීත් මේ සම්බන්ධ මතයක් ඇති වුණා නේද? මෙම වී වර්ගය භයානක ලෙස රෝග පතුරුවන්නාවූ වී වර්ගයක් හැටියට පිළිගන්න බව පෙනෙනවා නේද? අත්හදා බැලීමෙන්ම මාතර දිස්ත්‍රික්කය වැනි දිස්ත්‍රික්කවල උදවිය මේවා ගැන දැන ගෙන තිබෙනවා නේද? මෙම වී වර්ගයේ අස්වැන්න වැඩියි. එම නිසා ගොවීන් එකපාරටම කැමැත්තෙන් භාර ගන්නත් පුළුවනි. එහෙත් මේ වාගේ ඉටි හාල්, ජැපෝනිකා වර්ගයේ හාල්, අද මේ රට තුළ ශීඝ්‍රයෙන් බෝ කර ගෙන යනවා. එසේ හෙයින් අපේ රටට පරණ පුරුදු රත් ඇල් වැනි සිංහල වී වර්ග සම්පූර්ණයෙන්ම නැති වේගන යනවා. අලුත් දේවල් මෙහි බෝකිරීමේදී යම් කිසි විධියකින් අපට දැනට ලැබෙන අස්වැන්න ප්‍රමාණය අඩු වන්නට පටන් ගත්තොත්—අයි.ආර් 8 වැනි "හයිබ්‍රිඩ්" වී ජාති නිසා එවැනි තත්ත්වයක් ඇති වන්නට ඉඩ තිබෙනවා—අපට තිබුණු එකත් නෑ; අලුත් එකත් නෑ; අන්තිමේදී මේ රටේ අනාගතයත් සම්පූර්ණයෙන්ම අඳුරු වන්නට පුළුවනි. මේ රජය වී අස්වැන්න වැඩි වීම පිළිබඳ ඉලක්කම් අපට පෙන්වනවා. කාලයක් තිස්සේ මේ රටේ වී අස්වැන්න අවුරුද්දෙන් අවුරුද්ද සෑහෙන දියුණුවක් ලබා තිබෙන බව මා පිළිගන්නවා. වී අස්වැන්න දැන් ඉතා විශාල වශයෙන් වැඩි වී තිබෙන නිසා 1970 වන විට රට ස්වයංපෝෂිත වී පිටරටවලටත් මෙහෙන් හාල් යවන්නට පුළුවන් තත්ත්වයක් ඇති වෙනවාය යන හැඟීමක් මහජනයා අතර පතුරුවා හරින්නට තමුන්නාන්සේලා උත්සාහ කරනවා. [බාධා කිරීමක්] එහෙම නොවෙයි නම්, වී අස්වැන්න පිළිබඳව සංඛ්‍යා ලේඛන සකස් කරන පිළිවෙළ ගැන තමුන්නාන්සේලා තුළ විශ්වාසයක් තිබෙනවාද? මේ ඉලක්කම්වල නිවැරදිතාව ගැන තමුන්නාන්සේලාගේ නිලධාරීන්ම සැක කරනවා නේද? [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ අර්ථ ශාස්ත්‍රඥයන් මේවා සැක කරන්නේ නැද්ද? මධ්‍යම බැංකුවේ අර්ථ ශාස්ත්‍රඥයන් මේවා සැක කරන්නේ නැද්ද?

අද මේ රටේ ඉඩම් අක්කර දස ලක්ෂ 1.5 ක් හෙවත් 15 ලක්ෂයක් යලටත් මහටත් අස්වද්දන බව තමුන්නාන්සේලා කියනවා. එයින් මෙපමණ අස්වැන්නක් ලබා ගන්න බවත් කියනවා. ඉඩම් සංවර්ධන ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය අනුව අද මේ රටේ ගොඩ ඉඩම් රාශියක් හේන් ගොවිතැනට යට කර තිබෙනවා. ඉහත කී අක්කර 15 ලක්ෂයට මේ හේන් ගොවිතැනට යට කර තිබෙන ඉඩම් ප්‍රමාණයත් ඇතුළත් වෙනවාද? නෑ. එහෙත් ඒ ගොඩ ඉඩම්වලිනුත් වී අස්වැන්නක් ලැබෙනවා. එය තාවකාලික අස්වැන්නක්. තමුන්නාන්සේලා සේලාගේ ඉලක්කම්වලින් පෙන්නුම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

කෙරෙන්නෙ මේ අස්වැන්නත් අර අක්කර 15 ලක්ෂයෙන් ලැබෙන එකක් හැටියටයි.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**

*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

නෑ.

**සුබසිංහ මයා.**

*(திரு. சுபசிங்க)*

(Mr. Subasinghe)

එහෙම නම් කොහොමද ඒකේ වෙනස පෙන්නන්නේ ?

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

අස්වැන්න ගණන් බලන්නේ කලින් බැලූ ක්‍රමයටමයි. එහි වෙනසක් නැහැ.

**සුබසිංහ මයා.**

*(திரு. சுபசிங்க)*

(Mr. Subasinghe)

මට ලැබී තිබෙන ආරංචියේ හැටියට නම් එය එසේ නොවෙයි. අස්වැන්න එකතු කරනවා මිස ඉඩම් අක්කර ගණන පෙන්වන්නේ නැහැ. එම නිසා, වී වගාව දියුණු වී තිබෙනවායයි පෙන්නීම සඳහා ඉදිරිපත් කෙරෙන මේ ඉලක්කම් කෙරෙහි විශ්වාසය තබන්නේ කොහොමද ? ඒවා නිවැරදි බව ඔප්පු වෙනවා නම් මා ඊට කැමතියි. එහෙත් ඒ ගැන අප තුළ විශාල සැකයක් තිබෙනවා. තමුන්නාන්සේලා තදියම් වී කඩිමුඩියේ ගෙන යන මේ වැඩ පිළිවෙළෙන් සමහර විට තමුන්නාන්සේලා බලාපොරොත්තු වන ප්‍රතිඵලවලට වඩා භයානක ප්‍රතිඵල අපේ රටට ලැබෙන්නට ඉඩ තිබෙනවා. ඉඩම් ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය ගැන දැනටමත් මේ රටේ භූමි විද්‍යාඥයන් විශාල බියක් පළ කර තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඉඩම් ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාවේ යෙදෙවුවොත් උතුරු මැද පළාතේ ඉඩම් කාන්තාර නොවෙතැයි සිතන්නට පුළුවන්ද ? භූමි විද්‍යාඥයන් එවැනි බියක් ප්‍රකාශ කර තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

මොන ඉඩම්ද ?

**සුබසිංහ මයා.**

*(திரு. சுபசிங்க)*

(Mr. Subasinghe)

හේන් ගොවිතැනට යටකර තිබෙන ගොඩ ඉඩම්. කඩිමුඩියේ ගෙන යන මේ ව්‍යාපාරයෙන් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ. එපමණක් නොවෙයි, අනාගත පරම්පරාවටත් මෙහි විපාක විඳින්නට සිදු වන බව අප මතක තබා ගත යුතුයි. අලුත් ක්‍රම යොදවන්නට එපාය කියා මා කියන්නේ නැහැ. සැලැස්මක් ඇතිව අපේ ගොවිතැන දියුණු කරන්නට එපාය කියලත් මා කියන්නේ නැහැ. එහෙත් මා අහන්නේ මේ ගෙන යන ව්‍යාපාරය කල්පනා කර බලා ගෙන යන එකක්ද කියන එකයි.

ගරු කථානායකතුමනි, මට තව මිනිත්තු 5ක් දෙන්න. ජාතිවාදය සම්බන්ධව අද හැම තැනකම පාහේ කියැවෙනවා. අපි පෙඩරල් පක්ෂයට විරුද්ධව යමක් කීවොත් අපි ජාතිවාදීන් හැටියට හඳුන්වනවා. එහෙත් කවුද මේ ජාතිවාදීන් ? එදා 1958 දී එවකට පැවති බණ්ඩාරනායක ආණ්ඩුවේ මමත් සුළු නිලයක් දරමින් සිටියා. එදා බණ්ඩාරනායක මැතිතුමාට මේ ප්‍රශ්නයේදී අකුල් හෙළූ උදවිය කවුද කියා මට මතකයි. එදා ජාතිවාදී කෝලාහලවලදී "ලේ හලව්, මරව්" කියා ඒවාට ධෛර්ය දුන් උදවියත් මට මතකයි. එදා එසේ කළ එක්සත් ජාතික පක්ෂයේ හා මේ පැත්තේ සිටි උදවිය අද ඔය පැත්තට වී ජාතික සමගිය ගැන කථා කරනවා. ඔවුන් තවමත් පාඩම් ඉගෙනගෙන නැහැ. අර කහටමයි ඒ අයගේ හිතේ තවමත් තිබෙන්නේ.

අද පෙඩරල් පක්ෂය කියනවා ඔවුන් මේ රටේ පැගෙන ජනතාවක්ය කියා. ද්‍රවිඩ ජනතාව මේ රටේ පැගෙන ජනතාවක් යයි පෙඩරල් පක්ෂය කියනවා නම්, එවැනි බොරුවක් කවදාවත් කවුරුවත් කියා නැහැ. මේ රටේ ද්‍රවිඩ ජනතාව පැගෙන ජනතාවක් හැටියට සලකන්නට පුලුවන්ද ? ද්‍රවිඩ ජනතාවට මොනවායින්ද හිඟයක් තිබෙන්නේ ? ඔවුන්ට පුරවැසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කමේ හිඟයක් තිබෙනවාද? මේ රටේ ප්‍රධාන රැකීරක්ෂා මාර්ගය වශයෙන් තිබෙන ආණ්ඩුවේ රක්ෂාවල හිඟයක් තිබෙනවාද? තමන්ගේ ජනගහනය අනුව ලැබිය යුතු කොටසටත් වැඩි කොටසක් ඔවුන්ට ලැබී නැද්ද? රජයේ උසස්ම පාලන තනතුරු ද්‍රවිඩ ජනතාවට ලැබී නැද්ද? සිංහල ඇමතිවරුන් විසින් ද්‍රවිඩ ජනතාව උසස්ම තනතුරුවලට පත් කරන්නේ නැද්ද? ගොවිතැන අතින් බලන විට යාපනය ප්‍රදේශයේ ඇති ඉඩම් පමණක් නොවෙයි, ද්‍රවිඩ ජනතාව සතු වතු දකුණු පළාතේ නැද්ද? ඒවායේ පාලනය ගෙන යන්නට ඔවුන්ට අවහිර යක් තිබෙනවාද? අක්කර දහස් ගණන් විශාල වතු ද්‍රවිඩ ජනතාවට නැද්ද? මේ රටේ තිබෙන වෙළඳ ව්‍යාපාරවල විශාල තැනක් ඔවුන්ට නැද්ද? අද කොළඹ තිබෙන බිස්නස් සංවිධානවල උසස්ම තනතුරු දරන්නේ ද්‍රවිඩ අය නොවේද? නීතිඥයින් හා වෛද්‍යවරුන් වශයෙන් මේ රටේ උසස්ම තැන්වල ද්‍රවිඩ ජනතාව නැද්ද? කන්කසන්තුරේ ගරු මන්ත්‍රීතුමා (චෙල්වනායගම් මයා.) හා නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය නාගනාදන්) කියන මේ කථාවේ තේරුම කුමක්ද? විශ්ව විද්‍යාලවල යම් යම් අංශවල සිංහල අයටත් වඩා ද්‍රවිඩ ළමයින් නැද්ද? එවැනි තත්ත්වයක් තබාගෙන කියනවා, තමන් පෑගෙන ජාතියක්ය කියා. මහ ජාතිය ඔවුන් පාගන්න හදනවාලු. "ඒ නිසා ඊට විරුඬව ද්‍රවිඩ රාජ්‍යයක් හදගැනීම ටයි අපි සටන් කරන්නේ" කියා ඔවුන් කියනවා. මේවා විහිළු නේද? මේවා ගැන ඔය පැත්තේ මන්ත්‍රීවරුත් මේ පැත්තේ මන්ත්‍රීවරුත් ටිකක් කල්පනා කර බලන්න.

මම එකක් කියන්නම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙනුත්, අප සමග කටයුතු කරන අනික් පක්ෂ දෙක වෙනුවෙනුත් මම කියන්නම්, අපි මේ රටේ පුරවැසිකම් දරන කිසි කෙනෙකුට දෙවැනි තැනක් දෙන්නට උත්සාහ කරන්නේ නැහැ. එවැනි අයුක්තියක් කරන්නේ නැහැ. ඒ අයටත් අනික් අයට හා සමානව සෑම අයිතිවාසිකමක්ම දෙන අතර, මේ රටේ බහු ජනතාව සුළු ජාතියකගේ තත්ත්ව යට පත් නොවන්නට කටයුතු කිරීමට ඒ අයත් වග බලා ගන්නට ඕනෑ. එමෙන්ම අපේ රටේ අඛණ්ඩතාව තහවුරු කර ගැනීමට බහු ජනතාවගෙ භාෂාව රජයේ භාෂාව හැටියට ඔවුන් විසින් පිළිගන්නට ඕනෑ. එමෙන්ම ද්‍රවිඩ ජනතාවගේ භාෂාවට සාධාරණ තැනක් දීමට අපි සූදානම්.

"මේ රටේ පෙඩරල් ක්‍රමයට ඉක්මනක් වශයෙන් රටසභා ඇති නොකර ද්‍රවිඩ ජන තවාට නිදහසක් නැත, පෑගීමෙන් නිද හස් වන්නට පුලුවන් කමක් නැත" කියන විට, ඒවා කාට කියන්නද?

මේ ප්‍රශ්න මෙහෙම විසඳන්නට බැහැ. හොඳයි, මේ රටේ ෆේඩරල් ක්‍රමයක් ඇති වුණාය කියමු; දිස්ත්‍රික් සභා ක්‍රමයක් ඇති වුණාය කියමු; ෆේඩරල් පක්ෂයේ උදවිය ඒ දිස්ත්‍රික් සභාවල නියෝජිතයන් වුණාය කියමු. ද්‍රවිඩ ජනතාවගේ රැකීරක්ෂා හිඟය, දිලිඳුකම, ඉඩම් නැතිකම, විශ්ව විද්‍යාලවලින් පිට වී එළියට එන, ද්‍රවිඩ ගොවි ජනතාවගේත්, කම්කරු ජන තාවගේත් දරුවන්ට රැකීරක්ෂා නැති කම ඒ මාර්ගයෙන් විසඳිය හැකි යයි ෆේඩරල් පක්ෂය කල්පනා කරනවාද?

අද ද්‍රවිඩ ජනතාවත්, සිංහල ජනතාවත් අතර අන්‍යෝන්‍ය සැකයක් ඇති වී තිබෙ නවා නම් එසේ ඇති වී තිබෙන්නේ, මෙපමණ කාලයක් ෆේඩරල් පක්ෂය ගෙන ගිය අසාධාරණ ඉල්ලීම් නිසායි. මේ රටේ ජාතික උන්නතිය සඳහා හෝ ජාතික විමුක්තිය පිණිස හෝ යම්කිසි ප්‍රගතිශීලී වැඩක් වෙනුවෙන් හෝ ආධාර දුන්නා යයි කියන්නට ෆේඩරල් පක්ෂයට පුළු වන්කමක් නැහැ. ඉංග්‍රීසීන් මේ රට පාලන කල කාලයේදී ඔවුන්ගේ සෙවනැල්ලේ සැතපෙන්නට ෆේඩරල් පක්ෂය නැත් කළා. මේ රටට නිදහස ලබා ගන්නට සටන් කරන අවස්ථාවේදී ඉංග්‍රීසින්ගේ මාර්ගයෙන් තම වරප්‍රසාද ආරක්ෂා කර ගන්නට එවකට සිටි යාපනේ ගරු මන්ත්‍රී තුමා (ජී. ජී. පොන්නම්බලම් මයා.) උත් සාහ කළා. පොන්නම්බලම් රාමනාදන් උන්නැහේගේ කාලයේදී පමණක්, මේ රටේ ධනපති පන්තිය යම් යම් ප්‍රතිසංස් කරණ ඉල්ලන විට ඔවුන් එයට සහයෝ ගය දුන්නා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

එහෙත් ඒ ජාතික සටන ජනතා සටන කට පරිවර්තනය වුණාට පසුව සෑම අවස්ථාවකදීම ඔවුන් තැත් කළේ, අධිරාජ්‍ය වාදීන්ගේ සෙවනැල්ලේ සැතපෙන්නටයි. එම නිසා දිස්ත්‍රික් සභා පමණක් නොව ෆෙඩරල් ක්‍රමය ලැබුණත්, ත්‍රිකුණාමලය වරාය වුණත් විකුණා උන්නැහේලා නැවත වරක් අධිරාජ්‍යවාදීන්ගේ සෙවනැල්ල යටතේ තම වුවමනාකම් පිරිමසා ගන්නට හදයි කියා අප තුළ ලොකු බියක් තිබෙනවා. ඇයි, හිනා වෙන්නේ? ලෝකයේ වෙනත් රටවල එහෙම දේවල් සිදු වී තිබෙනවා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ත්‍රිකුණාමලය වරාය ජනසතු කරද්දී ෆෙඩරල් පක්ෂයේ උදවිය ඊට විරුද්ධව ටෙලිග්‍රෑම් ගැහුවා——

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)

ත්‍රිකුණාමලය වරාය අප අතට ගන්න අවස්ථාවේදී ෆෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරු ඊට විරුද්ධ වුණේ නැද්ද? කුඹුරු පනතට විරුද්ධ වුණේ නැද්ද? හොඳට හෝදිසි කර බලන්න.

කථානායකතුමනි, එම නිසායි මා කියන්නේ, ෆෙඩරල් ක්‍රමවලින්, දිස්ත්‍රික් සභාවලින් මේ ප්‍රශ්න විසඳන්නට බැරිය කියා. මේ ආර්ථික ප්‍රශ්න, සමාජයීය ප්‍රශ්න, සංස්කෘතික ප්‍රශ්න විසඳන්නට පුළුවන්කම ලැබෙන්නේ, ඊට සරිලන පරිවර්තනයක් ඇති කළොත් පමණයි. අද මේ රටේ තිබෙන රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නට පුළුවන් වන්නේ, මේ රටේ තරුණ පරම්පරාව තුළ තිබෙන අසහනය නැති කළ හැකි වන්නේ, බඩ ගින්න නැති කිරීමට පුළුවන් වන්නේ, මේ රටේ සිංහල ජනතාවගේ හෝ වේවා ද්‍රවිඩ ජනතාවගේ හෝ වේවා ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා ආධ්‍යාත්මික දියුණුව රඳා හිටින්නේ, අධිරාජ්‍යවාදීන් විසින් මේ රටේ පිහිටුවනු ලැබූ මේ යල් පිනූ ආර්ථික ක්‍රමය, සමාජ ක්‍රමය වෙනස් කර, මේ රටේ සමාවාදී පදනමක් දැම්මොත් පමණයි. එසේ කොට මේ ආර්ථික ප්‍රශ්න, සාමාජීක ප්‍රශ්න විසඳන්නට පටන් ගත්තොත්, ජාතීන් දෙකක් අතර තිබෙන මේ අන්‍යෝන්‍ය සැකය දුරු කරන්නට ඉඩ ලැබෙනවා. අපි අද බැලිය යුත්තේ, අන්න ඒවා දිහායි. එහෙත් මේ ආණ්ඩුව ගෙන යන ආර්ථික ප්‍රතිපත්තිය උඩ, දේශපාලන ප්‍රතිපත්තිය උඩ එවැනි තත්ත්වයක් ඇති කරන්නට පුළුවන් යයි හිතනවා නම්, එය හීනෙන් ගෙවල් හදනවා වාගේ වැඩක්.

එවැනි තත්ත්වයක් ඇතිකළ හැක්කේ සමාජවාදී පදනමක් උඩ පමණයි. අන්න ඒ සඳහායි, අද අප සටන් කරන්නේ, ඒ උදෙසායි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ලංකා සමසමාජ පක්ෂයත්, ලංකා කොමියුනිස්ට් පක්ෂයත් අද සටන් කරන්නේ. ඒ මිස කාටවත් නිකරුණේ හානියක් කරන්නට නොවෙයි. අපි සටන් කරන්නේ, මේ රටේ නිදහස තහවුරු කරන්නටයි; මේ රටේ අළුත් ආර්ථිකයක්, අළුත් සමාජයක්, අළුත් ආණ්ඩු ක්‍රමයක්— ජනතාවගේ ආණ්ඩු ක්‍රමයක්—බිහි කරන්නටයි. ඒ බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.7

**එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා. (මූතූර් පළමුවන මන්ත්‍රී)**
*(ஜனாப். எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)*
**(M. E. H. Mohamed Ali—First Mutur)**

*சபாநாயகரவர்களே, தேசிய அரசாங்கத்தின் நான்காவது சிம்மாசனப் பிரசங்க விவாதத்திலே பங்குபற்றி சில வார்த்தைகள் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு நான் மகிழ்ச்சியடைகிறேன். முதலாவதாக, சிம்மாசனப் பிரசங்கத்துக்கு நன்றி தெரிவித்த கௌரவ பிரதிநிதிக்கும் அதை ஆமோதித்த கௌரவ பிரதிநிதிக்கும் எனது பாராட்டுதல்களை நான் தெரிவிக்க விரும்புகிறேன். பல்லாண்டுகாலமாக இங்கே வழங்கிவருகின்ற வழக்கத்திற்கேற்ப, தங்களுடைய நன்றி தெரிவிக்கும் பிரேரணையில் சிம்மாசனப் பிரசங்கத்தை மிக நுண்ணிய முறையிலே அலசி ஆராய்ந்து, அதிலுள்ள பல அம்சங்களை எங்களுக்கு விளக்கி, மிக அழகான முறையிலே தங்களுடைய பாராட்டுதல்களை மாட்சிமை தங்கிய மகா தேசாதிபதியவர்களுக்கு, அவர்கள் செலுத்தினார்கள். அதற்காக அந்த இரு கௌரவ அங்கத்தவர்களையும் நாங்கள் பாராட்டாமல் இருக்க முடியாது.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இவ்வருடத்தைய சிம்மாசனப் பிரசங்கம் இம்மாதம் 7 ஆம் தேதியன்று இங்கே நடந்து கொண்டிருந்த பொழுது, சிலர் தங்களுடைய தொகுதியிலே, "தமிழரசுக்கட்சி அரசாங்கத்தைவிட்டு வெளியேறிவிட்டது ; அரசாங்கம் கவிழ்ந்து விட்டது ; பொதுத்தேர்தல் நடக்கப் போகின்றது" என்று சொல்லிச் சீன வெடிகள் சுட்டார்கள். அப்படிச் சுட்டவர்கள், இப்படியான விஷமப் பிரசாரங்களைச் செய்தவர்கள் இப்பொழுது ஏமாற்றமடைந்து போயிருக்கிறார்க ளென்பதையும் நான் இங்கே சொல்லலாமலிருக்கமுடியாது.

நாங்கள் மக்களால் தெரிவுசெய்யப்பட்ட பிரதிநிதிகள். மிகப் பொறுப்புள்ளவர்கள். பொறுப்புணர்ச்சியுள்ள பல்லாயிரக்கணக்கான வாக்காளர்கள் தங்கள் பொன்னான வாக்குகளைக் கொடுத்து மக்களின் பிரதிநிதிகளாக இந்தக் கௌரவ சபைக்கு எங்களை அனுப்பியிருக்கின்றார்கள். இப்படியான பொறுப்புணர்ச்சியுள்ள பிரதிநிதிகள் தங்களுடைய குரல்களை எழுப்பும் பொழுது, மிகவும் நிதானமான முறையிலே, உண்மையின் அடிப்படையிலே விடயங்களை எடுத்துக் கூற வேண்டியது அவர்களுடைய கட்டாயக் கடமையாக இருக்கிறது. கௌரவ பிரதிநிதிகள் பலர் சிம்மாசனப் பிரசங்கம் ஒரு புறமிருக்க அதற்கு அப்பாற்பட்ட விடயங்களில் சென்றுகொண்டிருக்கின்றார்கள். இன்னும் சில கௌரவ பிரதிநிதிகள் வாயில் வந்தபடியெல்லாம், எங்களால் பேச முடியுமென்று அடித்துப் பேசுகின்றார்கள். இந்நிலை தவிர்க்கப்படுதல் மிகவும் அவசியமாகும் என்பது எனது அன்பான வேண்டுகோளாகும். பொறுப்புள்ளவர்களைத்தான் மக்கள் தெரிவுசெய்து அனுப்பியிருக்கிறார்கள். அவர்கள் பொறுப்பான முறையிலே தங்களுடைய கடமைகளைச் செய்யவேண்டியது வரவேற்கத்தக்கது.

சபாநாயகரவர்களே, இவ்வருடத்தைய சிம்மாசனப் பிரசங்கம் மிக நீண்ட பிரசங்கமாக இருந்தபோதிலும் அதில் பல நல்ல அம்சங்கள் பொதிந்திருக்கின்றன. கடந்த காலப் பிரச்சினைகளைக் கிளறிவிட்டு கடந்த அரசாங்கங்களின் மீது குறைகளைக் கூறிக்கொண்டிருக்க நான் விரும்பவில்லை. கடந்த காலப் பிரச்சினைகளை நாங்கள் கிளறிக்கொண்டு போவோமேயானால், நாற்றம் கூடிக்கொண்டுபோகுமே தவிர, நன்மை ஒன்றும் ஏற்படப் போவதில்லை. ஏனென்றால், அரசாங்கங்கள் வரும், போகும். ஆட்சியிலிருக்கின்ற ஒரு அரசாங்கத்தை எதிர்க் கட்சியினர் திட்டுவது வழக்கமாக இருந்து வருகிறது. மற்றைய நாடுகளை எடுத்துப் பார்த்தால், ஜனநாயக அடிப்படையிலே அதிகப்படியான வாக்குகளைப்பெற்று, மக்கள் பிரதிநிதிகளாகத் தெரிவுசெய்யப்படுபவர்களைக் கொண்ட ஒரு கட்சியானது ஐந்து வருடங்களுக்கொரு முறை அரசாங்கத்தைப் பாரமெடுத்து நடாத்துகின்றது ; எதிர்க்கட்சியைச் சார்ந்தவர்கள் அவ்வரசாங்கம் கொண்டுவரும் நல்ல திட்டங்களுக்குத் தங்களுடைய பூரண ஒத்துழைப்பைக் கொடுக்கின்றார்கள். ஆனால், எங்களுடைய நாட்டை எடுத்துக்கொண்டால், அரசாங்கம் செய்ய எத்தனிக்கின்ற அத்தனை செயல்களுக்கும் எதிர்க்கட்சியினர் தங்களுடைய எதிர்ப்பைத் தெரிவித்துக் கொண்டுதானிருக்கிறார்கள். இது மிகவும் வருந்தத்தக்க செயலாகும். சில நல்ல அம்சங்களை நல்ல முறையிற் கொண்டுவர எத்தனிக்கும்போது எதிர்க்கட்சியினர் தங்கள் பூரண ஒத்துழைப்பைக் கொடுக்க வேண்டியது கட்டாயக் கடமை. அரசாங்கத்தின் திட்டங்களை அவர்கள் ஏற்றுக்கொள்ள விரும்பாவிட்டால் ஐந்து வருடங்களுக்குப் பிறகு அவர்களுக்கு சந்தர்ப்பம் கிடைக்கும்வரை காத்திருக்க வேண்டும். அந்த நேரத்திலே மக்கள் இருக்கின்றார்கள். அரசாங்கத்தின் செயல்களை ஏற்றுக்கொள்ளாவிட்டால் ஜனநாயக அடிப்படையில், அரசாங்கத்தை முறியடிக்க அவர்களுக்குச் சக்தி இருக்கின்றது.

இந்த சிம்மாசனப் பிரசங்கத்திலே பல நல்ல அம்சங்கள் இருக்கின்றன என்று கூறினேன். உதாரணமாக, விவசாய அபிவிருத்தி சம்பந்தமாக மகா தேசாதிபதி அவர்கள் தமது பேச்சிலே குறிப்பிட்டிருக்கிறார்கள் : இன்று விவசாயிகள் நாட்டுக்குத் தேவையான உணவிலே சுயபூர்த்தியைக் கொண்டுவர முயற்சி எடுக்கிறார்கள் ; அதற்காக அரசாங்கம் அவர்களுக்கு பாராட்டுதலைத் தெரிவிப்பதாகக் குறிப்பிட்டிருக்கிறார்கள். அது முற்றிலும் உண்மை. ஆனால், அரசாங்கத்துக்கு ஒன்று சொல்ல விரும்புகிறேன். இன்று உணவு உற்பத்தியைப் பெருக்கும் நோக்கத்துக்காக, அரசாங்கம் ஏராளமான உதவிகளைச் செய்து வருகின்றது. இந்த விவசாய அபிவிருத்திக்குக் கொடுக்கும் உதவிகளை உண்மையான வழியிலே மக்கள் பயன்படுத்துகின்றார்களா என்று சிந்தித்துப் பார்க்கும்பொழுது, அறுபது சத

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා]

விதமானவர்கள்தாம் அந்த உதவிகளை உண்மையான விதத்தில் பயன்படுத்துகின்றார்கள் என்று கூறவேண்டியிருக்கின்றது. உதாரணமாக, உணவு உற்பத்திக்காக, விவசாயத் திட்டங்களைப் பெருக்குவதற்காக, கிராமப்புற மக்கள் தங்கள் பொருளாதார வளத்தைப் பெருக்கிக் கொள்வதற்காக விவசாயக் கடன் என்று ஏராளமான பண உதவிகளைப் பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் வாயிலாகவும் இன்னும் பல இயக்கங்கள் மூலமாகவும் அரசாங்கம் கொடுக்கின்றது. ஆனால், அனேக மக்கள் அந்தப் பணத்தைப் பெற்று, விவசாயத்துக்குப் பதிலாக வேறுவிதமான தேவைகளுக்குச் செலவு செய்கிறார்கள்.

கௌரவ விவசாய, உணவு அமைச்சர் அவர்களுக்கு ஞாபகமிருக்கும், சென்ற வருடம் விவசாயிகள் பெற்ற கடனைத் திருப்பிக் கொடுக்கும்படி அவர்கள் பல வேண்டுகோள்கள் விட்டிருக்கின்றார்கள். அந்த வேண்டுகோள்கள் மக்கள் அனேகருடைய காதில் ஊடுருவிச் சென்றிருந்த போதிலும் கடன்களைத் திருப்பிக் கொடுப்பதில் அவர்கள் தாமதம் செய்கின்றார்கள். என்னுடைய தொகுதியில்—உதாரணத்துக்குச் சொல்கின்றேன்—அனேகர் தங்கள் கடன்களைத் திருப்பிக் கொடுக்கத் தயக்குகின்றார்கள். காரணம் என்னவென்றால், இந்த விவசாயக் கடனைக் கொடுக்கும்போது பல விஷமிகள் பாமர மக்களைப் பிழையான வழியில் இட்டுச் சென்றிருக்கிறார்கள். அதாவது, "விவசாயக் கடனை நீங்கள் திருப்பிக் கொடுக்கவேண்டிய அவசியமில்லை; அது அமெரிக்காவிலிருந்து கிடைத்த நன்கொடைப் பணம்; பெறவேண்டிய அளவு பணத்தைப் பெற்றுக் கொள்ளுங்கள்" என்று பிரச்சாரம் செய்திருக்கிறார்கள். அவ்விதம் பிரச்சாரம் செய்தோரின் சொல்லைக் கேட்டு பாமர மக்கள், கிராமப் புற மக்கள் ஏராளமானோர் விவசாயம் செய்யும் நோக்கத்துக்காக, அந்தப்பெயரிலே கடனைப் பெற்றார்கள். இன்று அந்தக் கடன்களைத் திருப்பிக் கட்ட முடியாமல் தவித்துக்கொண்டிருக்கிறார்கள். "கடன்களைப் பெறுங்கள், கட்டவேண்டிய அவசியம் இல்லை" என்று சொன்னவர்கள் கடனைத் திருப்பிக் கட்டிவிட்டு, மற்ற மக்களை நடுக்கடலில் தவிக்கவிட்டுவிட்டார்கள். இதனை அரசாங்கம் கவனத்துக்கெடுத்து, அத்தகைய மக்கள் மீது அனுதாபம் காட்டவேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

நமது மக்கள் தியாக உணர்ச்சியுடன் தங்கள் கடமைகளைச் செய்யவேண்டும். நம்முடைய நாட்டு மக்களிடத்திலே தேசியப் பற்று இருத்தல் மிக அவசியம். இந்தியாவை எடுத்துக் கொண்டால், அந் நாட்டிலுள்ள அத்தனை பேரும் தேசியப் பற்று உள்ளவர்களாக இருக்கிறார்கள். ஆனால், எம் மக்களில் பெரும்பான்மையானவர்கள் சுய நல அடிப்படையில் தங்கள் முன்னேற்றத்தை மட்டும் பெருப்பித்துக் கொள்ளும் நோக்கம் உள்ளவர்களாக இருக்கிறார்கள். இதன் காரணமாக நமது நாடு முன்னேறுவதற்குப் பதிலாக பின்னேறிக் கொண்டிருக்கின்றது. எனவே, மக்கள் முதலில் தங்கள் நாட்டை மதித்து தேசியப் பற்றையும் தியாக மனப்பான்மையும் வளர்த்து சகிப்புத் தன்மையைக் கைக்கொள்ள வேண்டும். அப்பொழுதுதான் நமது நாடு முன்னேற முடியும். நமது நாட்டிற்கு இன்று அவசியமாகத் தேவைப்படுவது என்ன? மக்கள் சமாதானமாகவும் சாந்தமாகவும் வாழும் வாழ்க்கை முறையே இன்று தேவைப்படுகின்றது. நாட்டு மக்கள் ஒற்றுமையாக வாழ்வதன் மூலமே நாட்டின் முன்னேற்றத்தை நாம் அடைய முடியும்.

சாதாரண மக்களுக்குத் தேவைப்படுவது உண்ண உணவு, உடுக்க உடை, வேலை செய்வதற்கு தொழில், இருப்பதற்கு வீடு இந்த நான்கும்தான். இந்த வசதிகளை மக்களுக்கு அரசாங்கம் ஏற்படுத்திக் கொடுத்தால் அவர்கள் திருப்தியாக இருப்பார்கள். ஆனால், அரசாங்கம் மட்டும் தனித்து நின்று இவைகளைச் செய்ய முடியாது. அரசாங்கத்திற்கு இவ்விடயத்தில் மக்களின் ஒத்துழைப்பும் அனுசரணையும் தேவை. மக்களிடம் தியாக உணர்ச்சி, தேசப்பற்று இல்லாவிட்டால் இப்படியான விடயங்களை அரசாங்கம் நடைமுறைக்குக் கொண்டு வருவது கஷ்டம்.

இன்று, அதிக உணவு பயிரிடும் திட்டத்தை எடுத்துக்கொண்டால் இவ்விடயத்தில் எங்கள் கௌரவ பிரதமர் அவர்கள் அதிக அக்கறைகொண்டு உழைத்து வருகின்றார்கள். அரசாங்க அதிபர்களும் அதிகாரிகளும் பிரதமர் அவர்களுடைய திட்டத்தில் வெற்றி காண அயராது உழைத்துக் கொண்டு வருகின்றார்கள். இதன் காரணமாக இன்று நாங்கள் உணவு உற்பத்தியில் ஓரளவு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

முன்னேற்றம் அடைந்து இருக்கிறோம். ஆனல் சிலர் கூறுவதைப் போல இவ் விடயத்தில் நாங்கள் நூற்றுக்கு நூறு வீதம் முன்னேற்றம் அடைந்துவிட்டோம் என்று கூறுவதற்கில்லை. இவ்விடயத்தில் நாடு ஓரளவு சுயதேவைப் பூர்த்தி அடைந்துகொண்டு வருகின்றது என்றுதான் நான் கூறுவேன். உணவு உற்பத்தியில் எமது நாட்டு விவசாயிகள் தொடர்ந்து முன்னேற்றப்பாதையில் செல்வார்களாக இருந்தால் திட்டவட்டமாக அடுத்த இரண்டு, மூன்று வருடத்திற்குள் நம் நாடு உணவு உற்பத்தியில் சுயதேவைப் பூர்த்தி அடைய முடியும். பெரும்பான்மையான மக்களும் எனது இக்கூற்றை ஏற்றுக் கொள்ளுவார்கள் என்பது எனது நம்பிக்கை.

இன்று நாங்கள் மற்றவர்களைக் குறைகூறிக் கொண்டிருப்பதை விட, கடந்தகாலப் பிரச்சினைகளைக் கிளறிக் கொண்டிருப்பதை விட எல்லோரும் ஒன்று பட்டு நாட்டு நலன் கருதி ஒற்றுமையான முறையில் நமது பொருளாதாரத்தைப் பலப்படுத்த வேண்டும். அப் பொழுதுதான் நாம் சிறப்பாக, மற்ற நாடுகளைப் போன்று வாழ முடியும். உணவுக்காக மற்ற நாடுகளிடம் பிச்சை எடுக்காத முறையில் நாம் இருக்க முடியும். எனவேதான், நான் ஆரம்பத்தில் சொன்னதுபோல எங்கள் நாடு முன்னேற்றம் அடைவதற்கு எங்கள் மக்கள் மத்தியில் தியாக உணர்ச்சியும் தேசப் பற்றும் சகிப்புத் தன்மையும் அன்பும் அவசியம். இவைகள் நம்மக்களிடம் இருக்குமாக இருந்தால் தான் நமது நாடு முன்னேற முடியும்.

இந்தச் சிம்மாசனப் பிரசங்கத்திலே எத்தனையோ அம்சங்கள் அமைந்துள்ளன. அவை ஒவ்வொன்றைப் பற்றியும் நான் குறிப்பிட்டுக்கொண்டு போக விரும்பவில்லை ; ஒரு சில வற்றை மாத்திரமே குறிப்பிட விரும்புகிறேன். இந்த அரசாங்கம், ஆயுள்வேத வைத்திய அபிவிருத்திக்காகக் கடந்த அரசாங்கம் ஆரம்பித்து வைத்த சில திட்டங்களை அமுல் நடத்தும் நோக்கத்துடன் அக்கறை காட்டுவதையிட்டு நான் மகிழ்ச்சியடைகிறேன். ஆயுள்வேத வைத்தியக் கல்லூரியின் வசதிகள் அதிகரிக்கப்பட்டுள்ளன. ஆயுள்வேத ஆராய்ச்சிக் கழகம் வைத்தியம் சம்பந்தமான சிறந்த நூல்களைப் பிரசுரித்துள்ளது. இந்த விதங்களில் ஆயுள்வேத வைத்தியத் தின் முன்னேற்றத்துக்காக அரசாங்கம் எடுக்கும் முயற்சிகளைப் பற்றி நான் பாராட்டாமல் இருக்க முடியாது. மேல்நாட்டு வைத்தியங்களுக்கு எவ்வளவு சலுகைகள் கொடுக்கப்படுகின்றனவோ அதே போன்று ஆயுள் வேத வைத்தியத்துக்கும் அரசாங்கம் ஆதரவளிப்பதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

சபாநாயகரவர்களே, நமது நாட்டில் விவசாயம், கைத்தொழில் ஆதியன முன்னேற்றம் அடைவதற்காக அரசாங்கம் குறுகிய, மத்திய, நீண்டகால கடன் உதவிகளை மக்களுக்குச் செய்து வருகிறது. இந்தத் திட்டத்தை நீடித்துக்கொண்டு போனல் மக்கள் தங்களுடைய தொழில்களில் மிக்க முன்னேற்றம் அடைவார்கள் என்ற நம்பிக்கை எனக்கு உண்டு.

இன்று பாடசாலைகள் மூலமாகக்கூட உணவு உற்பத்தியைப் பெருக்குவதற்கு அரசாங்கமும் கல்வித் திணைக்களமும் ஆர்வம் காட்டிக் கொண்டு வருகிறார்கள். 'வேலை அனுபவத் திட்டம்' என்ற ஒரு திட்டத்தின் மூலம் பாடசாலைச் சிறுர்களுக்கு நாட்டின் பொருளாதார அபிவிருத்தியில் பங்கு கொள்ள வாய்ப்பு அளிக்கப்பட்டுள்ளது. அவர்கள் சுமார் 25 ஆயிரம் ஏக்கர் நெல் வயல்களில் களை பிடுங்கி, அதன் மூலம் உணவு உற்பத்தியை அதிகரிக்கச் செய்திருக்கிறுர்கள். இதைக் குறிப்பிடும் பொழுது, என்னுடைய தொகுதியைப் பற்றியும் சில வார்த்தைகளைக் கூறுவது பொருத்தமாக இருக்கும் என்று நம்புகிறேன். திருகோணமலை மாவட்டத்திலும் பாடசாலை மாணவ, மாணவிகள் வேலை அனுபவத் திட்டத்தின் மூலம் சிறப்பான முறையில் தங்களது சேவைகளைச் செய்து கொண்டு வருகிறுர்கள்.

இந்த அரசாங்கம் கிராமங்களிலுள்ள ஏராளமான மகாவித்தியாலயங்களில் விஞ்ஞான ஆய்கூடங்கள், விவசாயக் கூறுகள், வேலைக் கூடங்கள், வர்த்தக வகுப்புக்கள் ஆகியவற்றை நிறுவி அவற்றின் மூலம் எதிர் காலச் சந்ததியினருக்கு பல தொழில் முறைகளைக் கற்றுக் கொள்ள உதவி செய்ய முன்வந்ததையிட்டு நான் மகிழ்ச்சியடைகிறேன்.

நாம் அனைவரும்—அரசாங்கமும், எதிர்க்கட்சியினரும்—ஒன்று பட்டு எங்களுடைய நாட்டினுடைய பொருளாதார அபிவிருத்தியை—

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

நாட்டினுடைய முன்னேற்றத்தை நினைத்துப் பார்க்க வேண்டும் என்று நான் அன்பாக வேண்டிக் கொள்கிறேன். அரசியலை நாம் தேர்தல் காலங்களில் வைத்துக் கொள்ள வேண்டும். இப்பொழுது எங்களுக்குத் தேவையானது, எங்களுக்குத் தேவையான முக்கியமான பொருட்களில் எங்களுடைய நாடு சுயபூர்த்தி அடைய வேண்டும் என்பதுதான். நாம் அனைவரும் ஒன்றுபட்டுழைத்தால் நிச்சயமாக நமது நாடு சிறப்பாக முன்னேற்றம் அடையும் என்ற நம்பிக்கை எனக்குண்டு. நாங்கள் எளிய வாழ்க்கையைக் கைக்கொண்டு அதன் மூலம் எங்களது பொருளாதார முன்னேற்றத்துக்காக எவ்வளவு தூரம் உழைக்க முடியுமோ அவ்வளவு தூரம் உழைத்தால்—உழைக்கப் பாடுபட்டால்—மிகவும் நன்மை பயக்கும்.

இன்று எங்களுடைய கௌரவ பிரதமர் ஜனநாயக சோஷலிஸ அடிப்படையிலே இந்த நாடு முன்னேற்றம் அடைய வேண்டும் என்று முயற்சி எடுத்துக் கொண்டிருக்கிறார். அவரைப் பலரும் பல விதமாக வர்ணித்துக் கொண்டு வருகிறார்கள். இந்த நாட்டிலே ஒரு மிகப் பெரும் ஜனநாயக, சோஷலிஸவாதியாக ஒருவர் உருவாகக் கூடிய நிலை இருக்குமேயானால் அவர் எங்களுடைய கௌரவ பிரதமர் அவர்களாகவே இருப்பார்கள் என்பதே என்னுடைய அபிப்பிராயம். சோஷலிஸம் என்று நாங்கள் பேசுகின்ற பொழுது அதைப் பலரும் பலவிதமாக வர்ணித்துக் கொண்டிருக்கிறார்கள். அறிஞர்களான, பெரியார்களான கார்ல் மார்க்ஸ், லெனின், மாசேதுங் ஆகியோர் மூலமாகத்தான் சோஷலிஸம் உதயமாகக்கப்பட்டதென்று சிலர் சொல்லுகின்றார்கள். நான் கூற விரும்புவது என்னவென்றால், 1400 வருடங்களுக்கு முன்பு எங்களுடைய முகம்மது நபி ஸல்லல்லாஹு அலைஹிவஸல்லம் அவர்கள் சோஷலிஸத்தைப் போதித்து நடைமுறையிலே காட்டினார்கள். அவர்களுக்குப் பின் வந்த அவர்களுடைய கலிபாக்களில் ஒருவரான உமர் கத்தாப் ரலியல்லாஹு அன்ஹு அவர்கள் சோஷலிஸத்தை நடைமுறையிலே செய்துகாட்டினார்கள். கலிபா உமர் அவர்கள் ஆட்சிபுரிந்த காலத்திலே ஏராளமான பொருட்களை வைத்திருந்த பணக்காரர்களிடமிருந்து பணத்தைப் பெற்று அதனை ஏழைகளுக்கு சமமாகப் பங்கிட்டதன்மூலம் சோஷலிஸத்தை வளர்த்து வந்தார்கள். அதுதான் சோஷலிஸம். இந்தச் சோஷலிஸம் 1400 ஆண்டுகளுக்கு முன்பு எங்களுடைய திரு நபி அவர்களால் உண்டுபண்ணப்பட்டதென்பதை நான் இங்கு ஆணித்தரமாகச் சொல்லி வைக்க விரும்புகிறேன்.

நான் அதிகம் பேச விரும்பவில்லை. கடைசியாக ஒன்றைமட்டும் கூற விரும்புகிறேன். இன்று, வெளிநாட்டுச் செலாவணி உரிமைச் சான்றிதழ் என்கின்ற ஒன்று—அதாவது F E E C S—அமுலுக்கு வந்திருக்கின்றது. இலங்கைவாழ் மக்களில் அநேகர் இந்தியாவிலிருந்து வருகின்ற வார, மாதச் சஞ்சிகைகளை பல ஆண்டுகளாக மிகக் குறைந்த விலையிலே பெற்று வாசித்து மகிழ்ந்து வருகிறார்கள். விசேஷமாக முஸ்லிம்கள், தமிழர்கள், இன்னும் தமிழ் தெரிந்த சிங்கள நண்பர்கள் கூட பலர் இப்படியான பல சஞ்சிகைகளை இப்பொழுது அதிக விலை கொடுத்து வாங்கவேண்டியிருக்கின்றது. அந்தச் சஞ்சிகைகள் இலங்கைக்கு அனுப்பப்படுகின்ற பொழுது அவைகள் இலங்கையிலே என்ன விலைக்கு விற்கப்பட வேண்டுமென அவற்றிலே போடப்பட்டிருக்கின்றது. அவ் விலைகளுக்குத்தான் அந்தப் புத்தகங்கள் இதுவரை இலங்கையிலே விற்கப்பட்டு வந்தன. ஆனால், இப்பொழுது இந்த வெளிநாட்டுச் செலாவணி உரிமைச்சான்றிதழ் அமுலுக்கு வந்த பிறகு இலங்கையிலே அவற்றின் விலைகளைக் கூட்டி விற்கின்றார்கள். உதாரணமாக, அச்சஞ்சிகைகளில் சிலவற்றை இங்கே குறிப்பிட்டுக்கூற விரும்புகிறேன்: கல்கி என்னும் வார சஞ்சிகையின் முன்னைய விலை 40 சதம். இப்பொழுது அதனுடைய விலை 60 சதமாக இருக்கிறது. குமுதம் முன்பு 35 சதம், இப்பொழுது விற்கப்படும் விலை 50 சதம். தினமணிக் கதிர் முன்பு 40 சதம்; இப்பொழுது 50 சதம். விகடன் முன்னர் 40 சதம்; இப்பொழுது 50 சதம். கலைமகள் முன்பு 70 சதம்; இப்பொழுது 80 சதம். அம்புலிமாமா முன்பு 80 சதம்; இப்பொழுது ரூ. 1.10. இச்சஞ்சிகைகளில் மிகவும் ஆர்வம் கொண்ட பல தமிழ் மக்கள், விலை அதிகரிப்பினால் மிகவும் கஷ்டப்படுகின்றார்கள். இதை அரசாங்கம் கவனித்து ஆவனசெய்ய வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கடந்த காலப் பிரச்சினைகளைக் கிளறவோ அல்லது மற்றவர்களைத் தாக்கவோ அல்லது சிலரைக் குருட்டுத்தனமாகப் பாராட்டவோ நான் விரும்பவில்லை. எங்கள் நாட்டின் முன்னேற்றத்தை முன்வைத்து நாம் நடக்க வேண்டும்; நாட்டின் பொருளாதார அபிவிருத்தி உச்ச நிலையடைந்து நாம் எல்லோரும் சாந்தமாகவும், சமாதானமாகவும் பயமின்றி இந்நாட்டிலே வாழவேண்டும்; இதற்குத் தேசிய அரசாங்கமும், ஜனநாயகத்தில் நம்பிக்கை கொண்ட எதிர்க்கட்சியினரும் ஒத்துழைத்து இந்நாட்டைச் சீரும் செழிப்பும் கொழிக்கும் நாடாக மாற்றவேண்டுமென்று கேட்டு எனக்குப் பேசுவதற்கு நேரத்தையளித்ததற்காக எனது நன்றியையும் தெரிவித்து எனது உரையை முடித்துக் கொள்ளுகின்றேன்.

අ. භා. 5.30

**රාජා වෙලේගම මයා.** (මොනරාගල)
(திரு. ராஜா வெலேகம—மொனருகலை)
(Mr. Raja Welegama—Moneragala)

ගරු කථානායකතුමනි, මගේ මිත්‍ර මුතූර් මන්ත්‍රීතුමාගේ කථාවට පසුව කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා එක අතකින් සන්තෝෂ වන අතර අනික් අතින් කනගාටු වෙනවා. ඒ මොකද එතුමා පියෙක් වාගේ බොහෝම අවවාදානුශාසනා සහිතව බොහෝම නිවිච්ච ශාන්ත දාන්ත කථාවක් කළ නිසා ඊට පසුව කථා කරන මටත් මගේ කථාව ඒ විධියටම කරගෙන යන්නට සිදු වන නිසයි.

මීට ස්වල්ප වේලාවකට ප්‍රථම විරුද්ධ පක්ෂය වෙනුවෙන් කථා කළ කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමා පළ කළ අදහස් මා ද සියයට සියයක්ම අනුමත කරනවා. ඒ අනුව මමත් කල්පනා කරනවා, විශාල උත්සවයක් පවත්වා, විශාල මුදලක් වියදම් කර රාජාසන කථාවක් ඉදිරිපත් කර, දවස් ගණනක් තිස්සේ අපේ කාලයත්, ශ්‍රමයත්, මහන්සියත් වියදම්
කැප කරන්නට සිදුවන අන්දමේ වැඩ පිළිවෙළක් යෙදී තිබීම අනවශ්‍ය බව. මීට කලින් අවස්ථා කීපයකදීම මා මෙම අදහස මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. විරුද්ධ පක්ෂයේ පමණක් නොව ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ ද නායකයන්ගේද අදහසවී තිබෙනවා, රාජාසන කථාව වෙනුවෙන් මෙසේ වෙහෙස මහන්සි වී වියදම් කිරීම අනවශ්‍යයි කියා. එහි ඇති ඵලය කුමක්ද කියා අප තවදුරටත් සිතා බැලුවොත්, පසු ගිය කාලවල රාජාසන කථාවල ඇතුළත් වුණ කරුණු ක්‍රියාත්මක වී තිබෙන ආකාරය ගැන කල්පනා කරන විට, ඇත්ත වශයෙන්ම මෙම විවාදයට සහභාගි වීම පවා නිශ්ඵලයි කියා අපට තීරණය කරන්න සිද්ධ වෙනවා. අපට නිදහස ලැබුණු ද සිට අප අවුරුද්දෙන් අවුරුද්ද රාජාසන කථා ඉදිරිපත් කර තිබෙනවා. එම රාජාසන කථාවලින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති සහ දෙන ලද ප්‍රතිඥා අද ක්‍රියාත්මක වී තිබෙනවා නම් මා හිතන හැටියට අපේ රටේ තවදුරටත් මොනම ආණ්ඩුවකටවත් කරන්නට වැඩක් නැති තරමට වැඩ සිද්ධ වී අවසානයි.

එපමණක් නොවෙයි, කථානායකතුමනි, මෙම ජාතික රජය 1965 දී බලයට පත් වුණාට පසුව නොයෙක් නොයෙක් විධියේ ප්‍රතිඥා දුන් බව අපට මතකයි. ටෙලිවිෂන් ලබා දෙනවාය කියා පළමුවෙනි රාජාසන කථාවේදී පොරොන්දු වුණා. තවත් නොයෙක් විධියේ පහසුකම් මහජනයාට දෙනවාය කියා පොරොන්දු වුණා. පසු ගිය රාජාසන කථාවේදී ප්‍රකාශ කරන්න යෙදුණා, ලංකාවේ සෑම තැනම ගුවන් තොටුපළවල් පිහිටුවා අපේ ජනතාවගේ ගමනාගමන පහසුකම් මීට වඩා දියුණු කරනවාය කියා. මේ කාරණා ගැන කල්පනා කර බලන විට මෙම රාජාසන කථා නිකම්ම හිස් වචන ගොඩක් කියා අපට කියන්න පුළුවන්.

අද අප ඉදිරියේ තිබෙන රාජාසන කථාව ගැන කල්පනා කර බලන විට අපට තවදුරටත් පැහැදිලි වෙනවා මේක නම් හිස්ම රාජාසන කථාවක් බව. ඒ බව ආණ්ඩු පක්ෂය පවා පිළිගෙන හමාරයි. අවුරුදු ගණනක් තිස්සේ චාරිත්‍රයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

වශයෙන් රාජාසන කථා පවත්වා යෝජනා ඉදිරිපත් කර කටයුතු කරගෙන ගොස් තිබෙනවා. මේ රජය බලයට පත් වූවාට පසුව ගත වූ අවුරුදු දෙක තුන තුළ පවත්වන ලද රාජාසන කථාවල කුඹුරු පනත ගැන සඳහන් වී තිබෙනවා. ජාතික රජයෙන් ඉදිරිපත් කළ ඒ රාජාසන කථාවල කියා තිබුණු කුඹුරු පනත අනුව එක්තරා පියවරක් ගන්නවාය කියා. මොකක්ද ඒ පියවර? කුඹුරු පනත යටතේ අද ගොවීන්ට එම ඉඩම් සින්නක්කර දෙන බවයි. එහෙත් මේ වතාවෙ ඒ බව කියන්න අමතක වී තිබෙනවා. මේ වර සඳහන් කර තිබෙන්නේ කුඹුරු පනත යටතේ අවශ්‍ය විධිවිධාන යොදා ගෙන යන බවයි. අර සින්නක්කර කිරීමේ කථාව මේ සැරේ නැහැ. ඒ නිසා රාජාසන කථාවෙ මෙවැනි කියුම් අනුවත් අපට පෙනී යන්නේ මේ ආණ්ඩුව ඉදිරියට යනවා නොව, තව තවත් පස්සට ගිහින් තිබෙන බවයි.

ගුවන් ගමන් ගැන කථා කළ මේ රජය, අඩු වශයෙන් ලංගමය ගැනවත් මෙවර රාජාසන කථාවෙහි සඳහන් කර නැහැ. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නවා ඇති විශාල මහජන මතයක් ලංගමය ගැන මේ රටේ ඇති වී තිබෙන බව. ලංගමයෙහි ඇති අදූරදර්ශී ක්‍රියා කලාපය නිසා පසුගිය අවුරුද්දෙ ඉතාමත්ම අවාසනාවන්ත සිද්ධීන් රාශියකට ජනතාව ගොදුරු වුණා. ඒ අතරම ගමනාගමන ප්‍රශ්නය ඉතාමත් අවුල් තත්ත්වයක අද පවතිනවා. ගම්බද හෝ වේවා නගරබද හෝ වේවා දහස් ගණන් මහජනතාවට, පැය ගණන් පෝලිම්වල සිටින්න සිදු වී තිබෙනවා. එමනිසා රටේ ජනතාවගේ වැදගත් ප්‍රශ්නයක් වන ගමනාගමන ප්‍රශ්නය ගැන කිසිවක් මෙහි සඳහන් කර නොතිබීම බලවත් අඩුපාඩුවක් බව සඳහන් කරන්න කැමතියි. මේ අනුව මේ රජය ඉදිරියට යනවා වෙනුවට ආ පස්සට යන බව අපට සලකන්න සිදු වී තිබෙනවා. රට එන්න එන්ටම පිරිහුණු තත්ත්වයකට වැටී තිබෙන බව, බංකොලොත් භාවයට වැටී තිබෙන බව පසුගිය කාලපරිච්ඡේදය තුළ කළ ක්‍රියාවලින් පමණක් නොවෙයි මෙම රාජාසන කථාවෙන්ද පැහැදිලිව පෙනී යනවා.

මෙයට පෙර ඉදිරිපත් කළ රාජාසන කථාවල ආණ්ඩු ක්‍රම සංශෝධන ගැනත් සඳහන්ව තිබුණා. එවැනි කරන්න බැරි දේවල් ගැන සඳහන් කිරීම අවශ්‍ය නැතත්, කරන්න පුළුවන් අන්දමේ සංශෝධනයන් කිරීම ගැනවත් සඳහනක් කර නොතිබීම, කළ හැකි දේවල් ගැන සඳහන් කර නොතිබීම, බලවත් අඩුපාඩුවක් ලෙස දක්වන්න කැමතියි. විශේෂයෙන්ම රටේ මහජනතාව තුළ විශ්වාසයක් තිබෙනවා, ලොකු උද්ඝෝෂණයක් තිබෙනවා අපට දැන් ඇති ආණ්ඩු ක්‍රමය යල් පැන ගිය ආණ්ඩු ක්‍රමයක් බවට. අපට තිබෙන මෙම පාර්ලිමේන්තුව පවා පවත්වාගෙන යන්නෙ විදේශිකයන්ගෙන් ඇබ්බැහි වුණු, විදේශියයන්ට ආවේනික වූ සිරිත් විරිත් අනුව බව මහජනතාවගේ පිළිගැනීමයි. එබඳු ක්‍රමයක් ඉවත් කර මහජනතාවගේ ප්‍රශ්න විසඳීමට ඉවහල්වන සංශෝධනයන් ඇතුළත් කර නව ආණ්ඩු ක්‍රමයක් සකස් කළ යුතු බවට රටේ අස්සක් මුල්ලක් නෑරම පැතිර ඇති මහජන හැඟීම ගැන රජය කල්පනා කර නොතිබීම බලවත් වරදක්. මෙවැනි කාරණා ගැන කල්පනා කරගෙන යන විට මෙම ආණ්ඩුව ඉතාමත්ම දුර්වල තත්ත්වයක, අකාර්යක්ෂම තත්ත්වයක පවතින බව විරුද්ධ පක්ෂයේ පමණක් නොවෙයි, ආණ්ඩු පක්ෂයේ ඇතැම් අයගේ පමණක් නොවෙයි මුළු මහත් ජනතාවගේම පිළිගැනීම වී ඇති බව මතක් කරන්න ඕනෑ. දැනට මේ ආණ්ඩුව පිහිටුවා අවුරුදු තුන හමාරකට වැඩි කාලයක් ගත වී තිබෙනවා. සමහර විට තව අවුරුද්දකින් නැතිනම් අවුරුදු එක හමාරකින් මැතිවරණයකට මුහුණ දෙන්න සිද්ධ වෙයි. එම නිසා සමහර විට තමුන්නාන්සේලා කල්පනා කරනවා ඇති මොන දහම්ගැටයක් යොදා හෝ මහජනතාව රැවටීමට. ලබන මැතිවරණයේදී මහජනතාවට මුහුණ දෙන්නෙ කොහොමද කියා කල්පනා කරනවා ඇති. එහෙම නැතිනම් ක්‍රියාත්මක කරන්න බැරි යෝජනා මෙම රාජාසන කථාවට ඇතුළත් කරන්නෙ නැහැ. ක්‍රියාත්මක කරන්න පුළුවන් යෝජනා කීපයක් වත් මෙම රාජාසන කථාවට ඇතුළත් කළා නම් එය වැදගත් බව මෙහිදී සඳහන් කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, අද හැම පැත්තෙන්ම, ප්‍රවෘත්තිපත්‍රවලින් හෝ වේවා මහජනයාගෙන් හෝ වේවා, ආණ්ඩු පක්ෂයෙන් හෝ වේවා විරුඬ පක්ෂයෙන් හෝ වේවා ඇසෙන්නෙ රට සභා, රට සභා කියන වචනයයි. අපට මතකයි, මෙම රට සභා පනත වෙනුවෙන් යම් යම් කොටස් ක්‍රියා කළ ආකාරය ගැන. මුල් අවස්ථාවලදී ජාතිකයයි කියා ගන්නා ඒකාධිකාරී ප්‍රවෘත්ති පත්‍ර සමහරක් රට සභා ක්‍රමය හොඳය කියා වර්ණනා කළා. එදා ඒ අන්දමට කී ප්‍රවෘත්ති පත්‍ර අද ඊට පට හැණිව නොයෙක් අන්දමේ අදහස් පළ කරනවා. සමහර විට මේ අන්දමේ ආන්දෝලනයක් රටේ ඇති කරන්නෙ වුවමනාවෙන්මයි මා කල්පනා කරනවා. නැගිගෙන එන ප්‍රශ්න—ආහාර හිඟය, රැකී රක්ෂා හිඟය, අධ්‍යාපන ප්‍රශ්නය, රට මුහුණ පා ඇති ආර්ථික පරිහාණිය, ඔය ආදී දහසකුත් එකක් ප්‍රශ්න—යටපත් කිමේ අදහසින්, මහජනතාව වෙනත් අතකට යොමු කිරීමේ අදහසින් රට සභා ප්‍රශ්නය මතු කර තිබෙනවා. මේ ආණ්ඩුව රට සභා දෙනවාද නැද්ද කියා කියන්නෙ නැහැ. උගුරට හොරා බෙහෙත් කන ප්‍රතිපත්තියක් තවමත් මේ රජය රට සභා වෙනුවෙන් ගෙන යන්නෙ නැගිගෙන එන බරපතළ ප්‍රශ්න යටපත් කිරීමට බව මගේ හැඟීමයි. මා හිතන හැටියට එය එසේ වන්නට ඕනෑ. මේ රාජාසන කථා විවාදයේදී දෙපක්ෂයෙන්ම කෙරුණු කථා රාශියක් මා අසාගෙන සිටියා. සමහර අවස්ථාවලදී මට කල්පනා වුණා, මේක රාජාසන කථාව පිළිබඳ විවාදයක්ද, එසේ නැත්නම් රට සභා ධවල පත්‍රිකාව පිළිබඳ විවාදයක්ද කියා. අනිකුත් ප්‍රශ්න යටපත් කිරීමට රජය මේ රට සභා ප්‍රශ්නය මගින් එක්තරා උත්සාහයක් දරන බව මා මතක් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, මේ රාජාසන කථාවේ තිබෙන කරුණු කීපයක් ගැන මේ අවස්ථාවේදී තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නට මා බලාපොරොත්තු වෙනවා. මේ රාජාසන කථාවේ ප්‍රධාන අංගයක් වශයෙන් දක්වා තිබෙන්නේ—තනන තතනා කීමට උත්සාහ කර තිබෙන්නේ—රජයේ වගා ව්‍යාපාරය සම්බන්ධවයි. 1970 දී මේ රට සවයම් පෝෂිත වෙනවාය කියා මේ රාජාසන කථාවට ස්තුති යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා කිවා මට මතකයි. මේ විධියේ ප්‍රකාශයක් කර මේ රටේ ජනතාව මුළා කරන්නට පුළුවන් වේය කියා තමුන්නාන්සේලා කල්පනා කරනවා නම් මා ඒ ගැන කණගාටු වෙනවා. ඒක කවදාවත් හරියන්නෙ නැහැ. වගා ව්‍යාපාරය පිළිබඳව අද රජය විසින් ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යා ලේඛන හරිද කියා මා අහන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, මගේ ප්‍රදේශයේ එක්තරා ගමක ගොවි රජෙක් තේරුවා. ඒ ගොවි රජාට තෑග්ග ලැබුණේ අක්කර 1½ ක කුඹුරකින්, අක්කරයකින් බුසල් 178 බැගින් නිෂ්පාදනය කළාය කියායි. මාත් ගොවියකු නිසා මා ඒ ගොවි මහත්තයා හමු වී ඇසුවා, ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේට තමුන්නාන්සේගේ කුඹුරු අක්කර 1½න් ඔය කියන විධියේ අස්වැන්නක් ලැබුනාද, අක්කරයකට බුසල් 178 ගණනේ බුසල් දෙසිය ගණනක් ලැබුනාද කියා. උන්නැහේගේ උත්තරය ඇත්තෙන්ම හිනා යන සුලු එකක් මන්ත්‍රීතුමා, ඇත්ත වශයෙන්ම මට ඒ කුඹුරෙන් ලැබුනේ බුසල් 113යි, නමුත් අක්කරයකට බුසල් 178ක් නිපදෙව්වාය කියා මට තෑග්ගක් ලැබී තිබෙනවාය කියා ඒ ගොවි මහත්තයා කිව්වා. කොහොමද ඔය ගණන් හිලව් ලබා ගත්තේ කියා ඇහුවාම කිව්වා, මගේ කුඹුරෙන් ඉතාම සරුසාර කොටස හොයා අඩි දහයේ දහයේ කොටුවක් ගසා ඒ කොටුවේ ගොයම් ටික කපා එවෙලේම පාගා අස්වැන්න අරගෙන ඒ අස්වැන්න ප්‍රමාණය අනුව අක්කරයකින් බුසල් 178ක අස්වැන්නක් ලැබුනායයි ගණන් හැදූ නමුත් මුළු කුඹුරු අක්කර 1½න්ම ලැබුනේ බුසල් 113ය කියා. රජය ඔය පිළිවෙළට එකතු කරණ සංඛ්‍යා ලේඛන අනුවයි, මේ රට සවයම්පෝෂිත කිරීමට බලාපොරොත්තු වන්නේ. ආණ්ඩුව කියන්නේ තව ටොන් ලක්ෂ 20ක් මේ රටේ නිපදවන්නට ලැබුනොත් මේ රට සවයම් පෝෂිත වෙනවාය කියායි. 1967 සංඛ්‍යා ලේඛන අනුව තව ටොන් ලක්ෂ 20 ලූ, පිටරටින් ගෙන්වන්නට වුවමනා කරන්නේ. ඒ ටොන් ලක්ෂ 20 මෙහි නිපදවුවොත් මේ රට ස්වයම්පෝෂිත වෙන්නේ බඩට අඩක් කාලද කියා මා අහන්නට කැමතියි ඒ ටොන් ලක්ෂ 20

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

නිපදවුවොත් වන්නේ අඩක් ස්වයම් පෝෂිත වීම පමණයි. ඒ ඇයි ? මීට කලින් මහජනතාවට සලාකය වශයෙන් හාල් සේරු 2 ක් ලැබුනා. සහල් සේරුවක් ලැබෙන අවස්ථාවේදී, තව ටොන් ලක්ෂ 20 ක් නිපදවූවොත් ස්වයම්පෝෂිත වෙන වාය කියනවා නම් එහි තේරුම බාගය කින් ස්වයම්පෝෂිත වෙනවාය කියන එකයි. දැනට ලැබෙන්නේ අවශ්‍ය ප්‍රමාණ යෙන් බාගයක් පමණක් නිසයි, අපට එසේ ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ රජය ගොවි තැන් ව්‍යාපාරය සම්බන්ධව ලොකු ප්‍රචාර යක් කරගෙන යන බව මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකුම ප්‍රකාශ කළා. රජයේ ගොවිතැන් ව්‍යාපාරය නිසා ගම්බද දුප්පත් ගොවියාට ලැබී තිබෙන සහනය කුමක්ද යන්න පැහැදිලි කිරීමට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. රජය කොයි විධියට ප්‍රචාරය කළත්, මේ රජයෙ ගොවිතැන් ව්‍යාපාරය නිසා ගම් බද දුප්පත් ගොවියා සුළු වශයෙන්වත් අමුතු දියුණුවක් ලබා නැති බව මා සඳහන් කරන්නට සතුටුයි. අද විශේෂ බදු ක්‍රමය යටතේ හෝ මධ්‍යම පංක්ති බදු ක්‍රමය යටතේ හෝ අක්කර දහස් ගණනක් ධන පති සල්ලිකාරයන්ට ලබා ගන්නට පුළු වන් වී තිබෙනවා. ඒ සල්ලිකාරයන් ඒ ඉඩම් ලබා ගත්තේ ගොවිතැන් කරන්නට නොව ලී ජාවාරම කරන්නටයි. එහෙත් වරදෙන් බේරෙන්නට මෙන් අක්කර දාහක් ගත් තැනැත්තා අක්කර පණහක් නැත්නම් හැටක් වගා කරනවා. ධනපති සල්ලිකාරයන්ට ජාවාරම් කරන්නට ආණ්ඩුවේ කැළෑ අක්කර දහස් ගණනින් දී ඇතත් මොණරාගල වැනි ප්‍රදේශයක සාමාන්‍ය වැසියකු අක්කර භාගයක් පමණ කැළෑව කොටා හේනක් සාදන්නට මහන්සි ගත්තොත් ඔහු අත් අඩංගුවට ගෙන ඔහුගේ කැත්තත් පොරවත් රාජ සන්තක කරනවා. කැළෑව විනාශ කරනවා යයි ඔහුට විරුද්ධව චෝදනා කරනවා. " ආණ්ඩුව නිතරම කියන්නේ වගා කරන්නටයි. එහෙත් අප ගොස් කැළෑව කපන්නට හැදුවොත් අපේ කැති පොරෝ රාජ සන්තක කරනවා. ඒ වුණාට කැළෑ ඉඩම් අක්කර දහස් ගණන් ධනපති සල්ලි කාරයන්ට දී තිබෙන්නේ මක්නිසාද " යනුවෙන් ඒ සාමාන්‍ය වැසියන් අහනවා. ඒ වැසියන්ගේ ප්‍රශ්නය මා මේ රජයට ඉදිරිපත් කරනවා. කරුණාකර පිළිතුරු සපයන්න.

මෙම රාජාසන කථාවේ තවත් කරුණු කීපයක් සඳහන් වී තිබෙනවා.

> " උඩවලවේ ජලාශය තනා නිමකොට ඇත. මහවැලි ගංගාව උතුරුමැද පළාතට හැරවීමේ වැඩ කටයුතුද මෙම පාර්ලිමේන්තු සභාවාරය තුළදී අරඹනු ඇත."

මේ අනුව දැන් උඩවලවේ ව්‍යාපාරයේ වැඩ ඉවරයි. මේ අවුරුද්දේම මහවැලි ගඟ යෝජනා ක්‍රමයේත් වැඩ පටන් ගන්නවා. මේ අවස්ථාවේදී ගරු ඉඩම් ඇමතිතුමා මෙම ගරු සභාවේ නොසිටීම ගැන මා කන ගාටු වෙනවා. මෙම ව්‍යාපාරයේ වම් ඉවුර ප්‍රදේශය මා නියෝජනය කරන කොට්ඨාශ යට අයත් වෙනවා. මා පසුගිය 16 වැනිදා ඒ ප්‍රදේශයේ සංචාරය කළා. තවද ඒ ප්‍රදේශයේ දිසාපතිතුමාත්, ඉඩම් නිලධාරි තුමාත්, තවත් නිලධාරීන් පිරිසකුත් එහි ගියා. අප ගියේ උඩවලවේ යෝජනා ක්‍රමය යටතේ ඒ ප්‍රදේශයේ පදිංචි වී සිටින උදවියගේ දියුණුව හා දුෂ්කරතා ගැන සොයා බැලීමටයි. උඩවලවේ යෝජනා ක්‍රමය යටතේ කිරිඉබ්බන් වැව නමින්ද, හබරාලු වැව නමින් ද, ඌරුසිටා වැව නමින් ද යෝජනා ක්‍රම තුනක් තිබෙනවා. මෙම ව්‍යාපාර තුන යටතේ මිනිසුන් දහස් ගණනක් පදිංචි කරවන්නට පුළුවනි. එහෙත් තවමත් උඩවලවේ ජලාශයෙන් මේ වැව්වලට වතුර ලැබී නැහැ. උඩවලවේ ජලාශයේ වැඩ අවසන් වී ඉවරයි. මේ වැව් වල ඉවුරුත් සාදා ඉවරයි. එහෙත් තවමත් වතුර ලැබී නැහැ. මේ ඉඩම්වල පදිංචි කිරීම සඳහා 1963 සිට 1967 දක්වා සෑම අවුරුද්ද කදීම මිනිසුන් තෝරාගෙන තිබෙනවා. එක් ගොවියකුට ගොඩ ඉඩම් අක්කර යකුත් මඩ ඉඩම් අක්කර දෙකකුත් දී තිබෙනවා. එහෙත් අද වනතුරු ඒ ව්‍යාපාර යටතේ එක වී ඇටයක්වත් නිපදවන්නට ඒ ගොවීන්ට පුළුවන් වී නැහැ.

මේ අවස්ථාවේදී ගරු ඉඩම් ඇමතිතුමා මේ ස්ථානයට පැමිණීම ගැන මා සතුටු වෙනවා. තවමත් උඩවලවේ යෝජනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රමය යටතේ එහි පදිංචි වී සිටින ගොවීන්ට එක වී ඇටයක්වත් නිපදවන්නට පුළුවන් වී නැති බව මා ගරු ඇමතිතුමාට මතක් කරනවා. එහෙත් රාජාසන කථාව මාර්ගයෙන් ගරු ඇමතිතුමා ලොකු පම්පෝරියක් ගසා තිබෙනවා. ඒ පම්පෝරිය රාජාසන කථාවට ඇතුළත් කරන්නට ඇත්තේ ගරු ඇමතිතුමාගේ උපදෙස් අනුව යයි මා කල්පනා කරනවා.

උඩවලවේ ජලාශය තනා නිමකොට ඇත. මහවැලි ගංගාව උතුරුමැද පළාතට හැරවීමේ වැඩ කටයුතු මෙම පාර්ලිමේන්තු සභාවාරය තුළදී අරඹනු ඇත.

මේ විධියටද මේ ආණ්ඩුව කටයුතු කර ගෙන යන්නේ? මේ විධියේ පාඨ රාජාසන කථාවල ඇතුළත් කොට මහජනයා මුළා කරන්නට අදහස් කරනවා විය හැකියි. උඩවලවේ ව්‍යාපාරයේ වැඩ අවසන්වූ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**

සාදා නිම කර තිබෙන්නේ උඩවලවේ ජලාශයයි. ව්‍යාපාරය නොවෙයි. ජලාශයය කියන්නේ වැවටයි.

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
**(Mr. Raja Welegama)**

උඩවලවේ ජලාශය හදපු එක ඇත්තයි. එහෙත් එයින් වතුර දෙන්නට බලාපොරොත්තු වන වැව් තුනක් දැන් හිඳී ගොස් තිබෙනවා. තවමත් ඒ වැව් යටතේ එක වී ඇටයක්වත් වගා කරන්නට බැහැ. උඩවලවේ ජලාශයෙන් පෝෂ්‍ය වන වැව් වලට තිබෙන තත්ත්වයයි, මා කිව්වේ. ඔය අන්දමට මහජනයා මුළා වන විධියේ ප්‍රකාශ තමයි, රාජාසන කථාවට ඇතුළත් කර තිබෙන්නෙ. ගොවිතැන සම්බන්ධයෙනුත් එහෙමයි. වැව් සම්බන්ධයෙනුත් එහෙමයි. ඉඩම් සම්බන්ධයෙනුත් එහෙමයි.

ඊළඟට රාජාසන කථාවේ මේ අන්දමට සඳහන් වෙනවා:

"ගම්බද මහා විද්‍යාල රාශියක, විද්‍යාගාර කෘෂිකාර්මික ඒකක, වැඩපොළවල් සහ වාණිජ පන්ති පිහිටුවාගෙන යනු ලැබේ."

1965-68 කාලය තුළ මේ රටේ අධ්‍යාපන තත්ත්වයත් පාසැල්වල තත්ත්වයත් ශිෂ්‍යයන්ගේ තත්ත්වයත් වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කිව්ව වගේ, අන්ත පරිහාණියකට පත් වුණා. එදා ගුරුවරුන් විස්ස-තිහ සිටි පාසල්වල අද ඉන්නෙ හත් අට දෙනකු පමණයි. විභාග ප්‍රතිඵල දෙස බැලුවත් කනගාටුදායක තත්ත්වයක් පවතින බව පෙනී යනව. ගුරු හිඟය පාසැල්වල විශාල වශයෙන් බලපවත්වනව. පසුගිය කාලයේ ඇතැම් කොට්ඨාශවල පාසල් ගොඩනැගිලි සඳහා තඹ සතයක්වත් වියදම් කර නැති බව මා මේ ගරු සභාවට මතක් කරන්නේ කනගාටුවෙන්. පාසල්වලට අවශ්‍ය විද්‍යාගාර නැහැ, විද්‍යාගුරුවරුන් නැහැ. පාසල්වල අඩු පාඩු සහ ගුරුවරුන්ගේ අඩු පාඩු පිළිබඳව පසුගිය අවුරුද්දේ නොයෙක් අවස්ථාවල මා මේ ගරු සභාවට මතක් කර තිබෙනව. ගරු ඊරියගොල්ල ඇමතිතුමා යටතේ අධ්‍යාපනය තව කාලයක් පැවතුනොත් අපේ ළමයින්ට දෙවියන්ගේ පිහිටයි කියන එකයි, මට මේ අවස්ථාවේ කියන්න තිබෙන්නෙ.

"ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට සපයා ඇති පහසුකම් වැඩි කරනු ඇත." ආදී වශයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කරන කටයුතුත් මෙහි සඳහන් කර තිබෙනව. අද ආරෝග්‍යශාලාවල පවතින තත්ත්වය තමුන්නාන්සේ පුවත්පත් මගින් දකින්නට ඇති. අද ආරෝග්‍යශාලාවලට ඇතුළත් කරන ලෙඩකු තඹා ලෙඩාගේ මළකඳවත් සොයා ගන්ට බැරි අවස්ථා මේ රටේ ඇති වීගෙන යනව.

දැනට මාසයකට විතර කලින් මගේ කොට්ඨාශයේ ඇතිවුණු සිද්ධියක් මම මතක් කරන්නම්. එක්තරා ගොවි මහතෙක් තම බිරිඳ, දරු ප්‍රසූතයක් සඳහා බුත්තල රජයේ ආරෝග්‍යශාලාවට ඇතුළත් කළා. දරු ප්‍රසූතිය සිදු වී දවස් දෙකකට පසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

ඒ මහත්මයාට විදුලි පණිවුඩයක් ලැබුණා, දරුවත් මවත් ආරෝග්‍යශාලාවෙන් කැඳවා ගෙන යන්න එන්න කියා. ඒ විදුලි පුවත ලැබී ඔහු ආරෝග්‍යශාලාවට ගිය අවස්ථා වේදී වින්නඹු මාතාව ඔහුට කියා තිබෙනව, " මව් පැනල ගිහින්. මෙන්න දරුවා විත රක් ඉන්නව ; අරන් යන්න " කියා. මම භාර දුන්න, මම කීප වතාවක් බලන්න එන විට හිටපු ලෙඩාට මොකක්ද වුණේ කියා ඇසුවාම ඒ උදවිය කිව්වෙ, පැනල ගිහින් බවයි. පසුව ඔහු ඒ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කළා. එහෙත් සොයා ගන්නට බැරි වුණා. අන්තිමේදී ඊට සතිය කට විතර පසුව ආරෝග්‍යශාලාව කිට්ටුව, ඊට යාර දෙතුන් සියයක් තරම් ඈතින් වූ ඒ රෝහලේ උපස්ථායිකාවකගේ ඉඩමක කාන්තාවකගේ සිරුරක් ගසක එල්ලී තිබෙනව කියා ඔහුට ආරංචි වුණා. පසුව ඒ පිළිබඳව මරණ පරීක්ෂණය පැවැත්වූ අවස්ථාවේදී වෛද්‍ය නිලධාරිතුමා ප්‍රකාශ කළා, එය මිනීමැරුමක් බව. පළමුව මරා පසුව එල්ලා තිබෙන බව කිව්ව. අද ඒ සම්බන්ධයෙන් පොලීසිය පරීක්ෂණ පවත්වාගෙන යනව. එහෙත් පොලිසිය ඒ කටයුතු කරන්නෙ ඉතා ඇලි මැලි දුබල ගතියකින්. ආරෝග්‍යශාලාවේ නිලධාරීන් කියන්ට දන්නේ නැහැ, ලෙඩාට මොකද වුණේ කියා. මේක අභිරහසක්. මේ විධියේ දේවල් තමයි අද රෝහල්වල සිද්ධ වෙන්නෙ. ලෙඩුන්ට අවශ්‍ය බෙහෙත් නැහැ. දුප්පත් මිනිහෙක් ලෙඩකු ආරෝග්‍යශාලාවකට ඇතුළත් කළාම දොස්තර මහත්වරු කියනව, " මේ බෙහෙත මෙහෙ නැහැ. කරුණාකර සල්ලි වලට පිටින් ගෙනෙන්න " කියා. ඔය විධි යේ කනගාටුදායක තත්ත්වයක් අද රෝහල්වල පවතිනව. එපමණක් නොවෙයි, අද මැලේරියා රෝගය ඒ ප්‍රදේශ වල ඉහ වහගෙන පැතිරී යනව. කලට වේලාවට ඒ ප්‍රදේශවල සනීපාරක්ෂක කට යුතු නොසිදුවන බව කනගාටුවෙන් මතක් කරන්ට ඕනෑ.

නිවාස ප්‍රශ්නය ගැන රාජාසන කථාවේ මෙහෙම සඳහන් වෙනව :

" කුළියට සින්නවීමේ ක්‍රමය අනුව ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ඇත්තාවූද, එම දෙපාර්තමේන්තුව විසින් අත්කර ගන්නා ලද ඉඩම් වල තනා ඇත්තාවූද නිවාස සඳහා ආදායම් බදු සහන ලබා දීමට ව්‍යවස්ථා පනවනු ලැබේ."

ජනතාවට නිවාස සාදා ගැනීමට පහසු කම් ඇති කරන බවත් කියා තිබෙනව. රාජාසන කථාවේ ඒ අන්දමට සඳහන් වුනත් අද ඇත්ත වශයෙන්ම පෞද්ග ලිගව පුරවැසියකුට තමාගේ වියදමින් ගෙයක් සාදා ගැනීමට අමාරු තත්ත්ව යක් තිබෙනව. ආණ්ඩුවෙන් ගෙවල් තනා දීම පැත්තකින් තියමු. පෞද්ගලිකව තමන්ගේ ගෙයක් තනා ගැනීමට පවා සිමෙන්ති ආදි බඩු ලබාගන්නට විධියක් නැහැ. අද මේ රටේ පවතින්නේ එවැනි තත්ත්වයක් බව කියන්නට ඕනෑ. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා සමහර විට මේවා කියනවාට කැමති නැතුවා විය හැකි වුවත් මට මේවා නොකියාම බැහැ.

අපේ ඇවෙන ප්‍රශ්න විසදා ගැනීමට මේ පාර්ලිමේන්තු ක්‍රමයෙන් අපට පුළු වන් කමක් ලැබේදැයි අප තුළ සැකයක් ඇතිවේගන එනවා. මට පෙණෙන හැටි යට නම් පාර්ලිමේන්තුව තිබෙන්නේ වැඩ කරන්නට නොවෙයි. මේ පාලන ක්‍රමය සකස් කර තිබෙන්නේ විදේශයන්හි තිබෙන සම්ප්‍රදායයන් කොපි කරමිනුයි. අවුරුදු පතා මහා ලොකුවට රාජාසන කථාත්, අයවැය කථාත් ඉදිරිපත් කර නවා. ඒවා කෙරෙන්නේත් සම්ප්‍රදායයක් ආරක්ෂා කිරීමට මිස රටට වැඩක් කරන් නට නම් නොවන බවයි දැන් දැන් අප ටත් අපේ ජනතාවටත් පෙනී යන්නේ. අවුරුදු විසි ගණනක් තිස්සේ රාජාසන කථාත් අයවැය කථාත් ඉදිරිපත් කර තිබෙනවා. එහෙත් එන්ට එන්ටම අපේ ප්‍රශ්න භයානක අතටයි හැරෙන් නේ. අපේ ප්‍රශ්න බොහොම උග්‍රයි. මේ විධියට තව දුරටත් වැඩ කරගෙන ගියොත් අපේ ප්‍රශ්නවල තිබෙන බැරෑ රුම්කම තව තවත් වැඩි වීමෙන් මේ පාර්ලිමේන්තු ක්‍රමය අපට කොහෙත්ම නොගැළපෙන්නක් ලෙස ජනතාව පිළි ගන්නවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 6

**ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන්කෙත)

*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கரா—ஹங்குராங்கெத்த)*

(Mr. George Abeyagoonasekera—Hanguranketa)

ගරු කථානායකතුමනි, ඔබතුමා දේශ සංචාරක නැත්නම් දේශාටනයක යෙදී සති හතක් මේ රටින් බැහැරව සිට ආපසු මේ රට කරා පැමිණ මේ ගරු සභාවේ මූලාසනය හොබවනු දැකීම අප කාටත් ප්‍රීතියක් බව නොකියාම බැහැ. ඔබතුමා දේශ සංචාරයේ යෙදුණු කාලය තුළ ඔබතුමා දුටු දේත්, ඔබතුමා ඇසූ දේත්, ඔබතුමා කාපු බීපු දෙත් යථා කාලයේ කථාන්තරයක් වශයෙන් අපට කිව්වොත් එය අපට සැනසිල්ලට කාරණයක් වන බවත් මේ අවස්ථාවේදී කියන්න කැමතියි.

ගරු කථානායකතුමනි, ඔබතුමා මෙහි නොසිටි කාලයේදී මේ රටේ පොදු මහත් ජනතාවගේ අවධානය විශාල වශයෙන් යොමු වූ, සැලකිල්ල ඉතා වැඩි වශයෙන් යොමු වූ, විශේෂයෙන්ම ඇතැම් පුවත්පත් මගින් මහජනයා වෙත ඉදිරිපත් කළ බර පතල් ප්‍රශ්න ගැන තමුන්නාන්සේ අසා ඇතැයි මා කල්පනා කරනවා. ඒ ප්‍රශ්න ගැන යථා කාලයේ නියම තොරතුරු රජය මගින් මේ ගරු සභාවට ලැබෙන්නට සලස්සනවා ඇතැයි මා කල්පනා කරනවා. ඒවා රජය විසින් ඉදිරිපත් කරනු ලබනවා ඇතැයි බලාපොරොත්තු වන නිසා මේ වැදගත් අවස්ථාවේ ඒ ගැන යමක් කියන්නට මා අදහස් කරන්නේ නැහැ. පාර්ලිමේන්තු සම්ප්‍රදායයට අනුකූලව, ඡන්දයක් ගැනීමේ අපේක්ෂාවක් නොමැතිව, නිදහසේ විවේචනයට භාජන කරනුවස්, මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලද ධවල පත්‍රිකාව ගැනත් තමුන්නාන්සේ දන්නවා ඇති. කරුණු සොයා බැලීම පිණිස ඉදිරිපත් කරන ලද එය සාකච්ඡාවට යොමු වූ අවස්ථාවේදී, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරනවාය කියමින් ප්‍රජාතන්ත්‍රවාදි සංවිධානයක් ඇතිව කටයුතු කරන මේ පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ ඉතාමත් ස්වල්ප දෙනෙකු හැර වැඩි දෙනෙක් ඒ විවාදය වර්ජනය කිරීම ගැන යමක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපේ පාර්ලිමේන්තු පාලන ක්‍රමය අනුව විරුද්ධ පාර්ශ්වයෙන් ඉටු විය යුතු වගකීම් රාශියක් තිබෙනවා. එදා විරුද්ධ පාර්ශ්වය කෙළේ ඒවා පැහැර හැරීමක් බව නොකියා බැහැ. මේ රටේ ගරු අගමැතිතුමා ඉතාමත් මහාත්ම ලීලාවෙන් ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කළ ඒ අවස්ථාවේදී මේ ගරු සභාවේ විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් ගරු මන්ත්‍රීවරුන් එළියට යන ගමන් ඒ ධවල පත්‍රිකාව ගිනිකූරක් පත්තු කර පුළුස්සා දැමූ සැටි පිළිබඳ ආරංචියක් තමුන්නාන්සේට ලැබෙන්නට ඇති. ඇත්ත වශයෙන්ම පාඨශාලාවක සිටින ළමයින්ගේ ලීලාවෙන් සෙල්ලමක් හැටියට ගෙන විහිළුවක් හැටියට ගෙන කටයුතු කිරීම මේ උත්තරීතර ගරු සභාවට කරන ලද අගෞරවයක් හැටියට බුද්ධිමත් කවුරුන් වුවත් පිළිගන්නවා ඇති.

ගරු කථානායකතුමනි, මුළු ලෝකයේම දියුණු රටවල් අනුගමනය කරන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය අප අනුගමනය කරනකොට අපට ලැබී තිබෙන වරප්‍රසාද ආරක්ෂා කර ගන්නවාත් සමගම ඒ වරප්‍රසාද අනිසි විධියට, අයුතු විධියට, පාවිච්චි කරන්න සූදානම් වීම හොඳ දෙයක් නොවෙයි. අපේ වරප්‍රසාද අයුතු විධියට පාවිච්චි කරමින් මේ ගරු සභාව කෝලම් මඩුවකට පරිවර්තනය කිරීමට සූදානම් වීම කිසිසේත් ප්‍රඥාගෝචර නොවන බව නොකියාම බැහැ.

මේ රාජාසන කථා විවාදය ආරම්භ කරන අවසථාවේදී කතා කරන ලද විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් කියන්න යෙදුනා, මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදී හිමිකමක් නැති, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට ගරු නොකරන, ආණ්ඩුවක් නිසා ඉල්ලා අස් විය යුතුය කියා. මේ අවස්ථාවේදී අප කල්පනා කළ බැලිය යුතු කරුණක් නම්, මෙසේ ප්‍රජාතන්ත්‍රවාදයේ හොඳ නරක ගැන නොයෙක් අවසථාවලදී කියා පාන මේ උදවිය ඇත්ත වශයෙන් පසුගිය කාලයේ කටයුතු කරගෙන ගියේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරමින්ද යන්නයි. නොයෙක් අවසථාවලදී විශේෂයෙන් මේ ගරු සභාවේදීත් වෙනත් වේදිකාවලදීත් කියා පා තිබෙන පරණ තැටි නැවතත් මෙහිදී ගායනා කිරීමට මා සතුටු නැහැ. ඒ කෙසේ වෙතත් 1964 අවසාන යුගයේදී වුණ සිද්ධීන් ගැන ටිකක් මෙතෙහි කර බැලුවොත්, ඒ උදවිය ප්‍රජාතන්ත්‍රවාදයට


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අබයගුණසේකර මයා.]

ගරු කළාද, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට අදහස් කළාද යන්න අවබෝධ කර ගන්න පුළුවනි. නිදර්ශනයක් වශයෙන් අපි දන්නවා මුළු ලෝකයේම—විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය අනුගමනය කරන රටවල—පුවත් පත් කලාව ගැන දක්වන සැලකිල්ල ගැන. තමුන් නාන්සේලා දන්නවා ඇති එක්සත් ජනපදයේ තිබෙන ත්‍රිවිධ බල ඇණිය ගැන. බිෂොප්වරුන්, රදලවරුන්, මහජනතාව යන මේ ත්‍රිවිධ බල වේගය ගැන අපි දන්නවා. ඒ සමගම සිව්වැනි නැත්නම් හතර වැනි බලවේගය හැටියට සලකන්නේ ප්‍රවෘත්ති පත්‍රයි. රටේ අභිවෘද්ධියට, රටේ හොඳ පැවැත්මට ඉවහල් වන දෙයක් තමයි ප්‍රවෘත්ති පත්‍ර. ඒ ප්‍රවෘත්ති පත්‍ර සම්බන්ධයෙන් පසුගිය ආණ්ඩුව මුකවාඩම් යෝජනාවක් ගෙන ආ බව සාමාන්‍යලමයින් පවා දන්න කාරණයක්. ඒ අදහස් කළ අන්දමට යම් විධියකින් එම ක්‍රමය හරි ගියා නම් අද මේ ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදය ගැන මෙම ගරු සභාව තුළ කථා කරන්නටවත් පුළුවන්කමක් ලැබේවිය කියා මා විශ්වාස කරන්නේ නැහැ. එදා යම් විධියකින් ඒ යෝජනාව සවිර වුණා නම් එදාම තමයි ප්‍රජාතන්ත්‍රවාදී නිදහසෙහි මළ බෙරය නැති නම් මළ සණ්ටාරය නාද කර එම මළ මිනිය බහාලූ මිනී පෙට්ටියට අවසාන ඇණය ගහන්නේ. වාසනාවකට මෙන් එදා සිටි පිංවතුන්ට පුළුවන්කම ලැබුණා, මේ රටේ ජාතියේ මුර සෙබලා වශයෙන් පෙනී සිටිමින් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නට උත්සාහ දරන පුවත්පත රැක ගන්නට. දේශපාලනය පිළිබඳව විමසුම් ඇසින් බලන විට අපේ ප්‍රජාතන්ත්‍රවාදයට පහර ගසන්නට කල්පනා කළ ඇතැම් විදේශීන් ගැන පවා අප දන්නවා. නොයෙකුත් අවස්ථාවල විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කථා කරද්දී ප්‍රකාශ කර තිබෙන අදහස් මොනවා ද? අදත් ප්‍රකාශ කර තිබෙනවා, "ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයෙන් මේ රට දියුණු කරන්නට බැරිය; ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමයෙන් අප රටට කිසිදු සුබ සිද්ධියක් ඇති වන්නේ නැත; එනිසා මේ ආණ්ඩු ක්‍රමයේ වෙනස් වීමක් ඇති වන්නට වුවමනාය" කියන අදහස. එයින් අදහස් කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය අහෝසිකර ඒකාධිපති ක්‍රමයක් ඇති කිරීමයි. ඒකාධිපතිවාදී රටක නියම නිදහසක් නැතුවා පමණක් නොව විරුද්ධ පාර්ශ්වයකට තැනක්ද නැති බව අප පිළිගතයුතුයි. මේ රටේ අනාගත සුබ සිද්ධිය තකා සුබදායක යෝජනා ඉදිරිපත් කරන සෑම අවස්ථාවකදීම, උභය පාර්ශ්වයේම සහයෝගය ලැබිය යුතුයි. එවැනි යෝජනාවලින් රටට යහපතක් සැලසේද යන්න නිරාකරණය කර ගැනීම සඳහා උභය පාර්ශ්වයේම සහයෝගය ලැබිය යුතුයි.

විරුද්ධ පාර්ශ්වයේ හොඳ පළපුරුද්දක් ඇති පැරණි මන්ත්‍රීවරයෙක් කිව්වා, මෙම රජය ප්‍රතිඥා දී තිබෙන අන්දමට බුද්ධාගමට කිසි වැඩක් වී නැති බව. එසේ සඳහන් කරමින් 1966 ජනවාරිවල සිදු වූ සංවේගජනක සිද්ධිය ගැන නැවතත් සඳහන් කළා. එම ඛෙදජනක සිද්ධියේ ප්‍රතිඵලයක් වශයෙන් සංඝයා වහන්සේ නමකට අන්තරායක් සිදු වුණු බව අප දන්නවා. එම ස්වාමීන් වහන්සේ පෙළපාළියකින් ආවේ අගමැතිතුමාට ද්‍රවිඩ භාෂා විශේෂ විධිවිධාන පනත පිළිබඳ කරුණු ඇතුළත් පෙත්සමක් ඉදිරිපත් කරන්නටය කියා විරුද්ධ පාර්ශ්වය කියනවා. එම තර්කය කාටවත් පිළිගන්නට හැකිය කියා මා සිතන්නේ නැහැ. අගමැතිතුමාට පෙත්සමක් දීම සඳහා කෑකෝ ගසමින් ගෙවල් දොරවල් සාප්පු යනාදියට පහර දෙමින් පාරේ යන මෝටර් රථවලටත් මිනිසුන්ටත් ගල් ගසමින් තුවාල කරමින් එන්නට යමෙක් ඉදිරිපත් වෙනවා නම් එය පුදුමයක්. ගිහි ගෙය ගිනි ගෙයක් හැටියට සලකා, බෞද්ධ ධර්මය පිළිගෙන ඒ අනුව ක්‍රියා කරන්නට ප්‍රව්‍රජ්‍යා භූමියට ගොස් සිටින භික්ෂූන් වහන්සේ නමක් මෙසේ පෙළපාලිවලට සහභාගි වී සංඝයා වහන්සේ කෙනකුට නොතරම් විධියට හැසිරීම යුතු දැයි මා අහනවා. අද මෙහි පුරසාරම් දොඩන නායක පිරිස එදා ඇතිවුණු සිද්ධියේ නියම තත්ත්වය අවබෝධ කරගෙන නිසි පිළිවෙළට කටයුතු කළා නම් ඔවැනි ඛේද ජනක සිද්ධියක් නොවන්නට තිබුණා. බෞද්ධ භික්ෂූන් වහන්සේ කෙනකු හෝ වේවා, ක්‍රිස්තියානි ආදී වූ වෙනත් ආගමික පූජක කෙනකු හෝ වේවා, සාමාන්‍ය මනුෂ්‍යයකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හෝ වේවා, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු හෝ වේවා, මේ විධියේ අකාල අවාසනාවන්ත මරණයකට ගොදුරු වීම ගැන අප කිසිසේත් සතුටු වන්නේ නැහැ. මේවායේ නියම තත්ත්වය ගැන මෙනෙහි කිරීමෙන් අපට විශාල ප්‍රයෝජන ලැබෙනවා. බොහෝ ඉක්මනින් යමක් අමතක වීම ලාංකිකයන්ගේ—විශේෂයෙන්ම සිංහලයන්ගේ—එක්තරා චරිත ලක්ෂණයක්. යම් කෙනකු හොඳක් කළත් නරකක් කළත් ඒවායේ ආදීනව කොපමණ දැනගෙන සිටියත් එයින් කිසිම පාඩමක් ඉගෙන නොගෙනම ස්වල්ප කාලයකින් ඒ සියල්ල අමතක කර දමනවා. මේ කරුණු ටික මා සඳහන් කෙළේ නොකියාම බැරි නිසායි.

ඊළඟට මා රාජාසන කථාවෙහි අඩංගු කරුණු සම්බන්ධව වචනයක් දෙකක් කියන්නටයි අදහස් කරන්නේ. ජාතික ආණ්ඩුව විසින් "ජාතික ස්වේච්ඡා තරුණ සේවා පණත" ක්‍රියාත්මක කිරීමට තීරණය කිරීම ගැන මා බොහෝම සන්තෝෂ වෙනවා. ඇත්ත වශයෙන්ම මෙය මීට බොහෝ කලකට පෙර ඉදිරිපත් කොට ක්‍රියාත්මක කළ යුතුව තිබුණු පණතක්. අපේ තරුණ පරපුර අපට තිබෙන ජාතික සම්පතක් ජාතික වස්තුවක් හැටියට අප පිළිගෙන තිබෙනවා. ඔවුන් පාසල්වල අධ්‍යාපනය ලබා ඒවායින් පිට වුණායින් පසු ඔවුන්ගේ ජීවිත නිසියාකාර ගෙන යාම සඳහාත් ඔවුන් රටට ජාතියට වැඩ ඇති පුරවැසියන් බවට පත්කිරීම සඳහාත් රජයේ ආධාරය ඔවුන්ට ලැබිය යුතුයි. අද මුළු ලෝකයේම තරුණ පිරිස ඉදිරියට පැමිණ ඔවුන්ගේ අයිතිවාසිකම් ගැන කෑකෝ ගසමින් විශාල ව්‍යාපාරයන් ගෙන යන බව අප දන්නවා. ඒ සිද්ධීන් සලකා බලා, අපේ තරුණ පරපුරට නරකක් වන්නට ඉඩ නොදී, ඔවුන් අපේක්ෂා කරන යහපතක් සලසා ගැනීම සඳහා මේ විධියේ සංවිධානයක් ඇති කිරීම ඉතාම වැදගත් බවත් අවශ්‍ය බවත් අප කවුරුනුත් පිළිගත යුතුයි. මෙය වැඩදායක අන්දමින් ගෙන යාමට නම්, මෙයින් නියම ප්‍රයෝජනය ලබා ගන්නට නම් මෙය දේශපාලන බල පෑම්වලින් තොරව ක්‍රියාත්මක විය යුතු බව මා පෙන්වා දෙන්නට කැමතියි. එය ඒ විධියට ගෙන යාමට අප වගබලා ගත යුතුයි. ඒ සමගම, වෙනත් රටවල තරුණ පරපුර සම්බන්ධයෙන් අපට දැනගන්නට ලැබෙන කරුණු ගැන කල්පනා කර බලන විට, අපේ තරුණයන්ගේ සදාචාර දියුණුවත් ආගමික සිරිත්විරිත්වල දියුණුවත් සඳහාද කිසියම් වැඩ පිළිවෙළක් යෙදිය යුතු බව අපට පෙනී යනවා. මේ තරුණයන්ගේ ආර්ථික දියුණුව සඳහා රජය විසින් මොන විධියේ සහනාධාර ක්‍රම ඇති කළත්, ඔවුන්ගේ හික්මීමත් විනයත් දියුණු කෙළේ නැත්නම් කවදාවත් ඔවුන්ගෙන් නියම ප්‍රයෝජන රටට ලබා ගන්නට පුළුවන් වන්නේ නැහැ. ඒ සඳහා නොයෙක් දේ කළ හැකිව තිබෙනවා. මේ අවස්ථාවේදී මට නොකියාම බැරි කරුණක් තිබෙනවා. අපේ රටේ පුවත්පත් ජාතික මුර සේවයක් හැටියට අප විසින් වර්ණනා කෙරෙන නමුත් ඇතැම් පුවත්පත් නිසා අපේ තරුණ පරපුරේ සදාචාරයට විශාල බාධාවක් සිදු වන බවත් ඒ නිසා තරුණ පරපුරට ඒවායින් විශාල අපරාධයක් සිදු වන බවත් විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. සමහර පුවත්පත් මගින් ප්‍රකාශයට පත් කරන ඇතැම් දැන්වීම්, ලිපි, ඡායාරූප හා විකට චිත්‍ර දෙස බලන විට දරුවන් සිටින ගෙදරකට ගෙන යන්නට නොහැකි තරමේ ඒවාත් දකින්නට ලැබෙන බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. ඒවා සීමිත අදහසක් ඇතිව යම් සම්ප්‍රදායයක් අනුව වෙන රටවල පවතින ආකාරයට පළ වෙනවා නම් ඒ ගැන කාටවත් විරුද්ධ වන්නට පුළුවන්ය කියා මා හිතන්නේ නැහැ. යම් විකට චිත්‍රයක අපේ අගමැතිතුමා ගොවි රජකු හැටියට අමුඩ ලේන්සුවකින් සැරසී සිටිනවා දකින්නට අපේ අගමැතිතුමා අකමැතියි කියා මා හිතන්නේ නැහැ. එමෙන්ම ගරු අධ්‍යාපන අමැතිතුමා පත්තර ගැන කොතරම් කෑගැසුවත් ගාන්ධි සූට් එකක් ඇඳගෙන සිටින ආකාරයකින් විකට චිත්‍රයක් පළ කළාට එතුමා අමනාප වේය කියා මා හිතන්නේ නැහැ. එමෙන්ම ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ වුණත් අපේ උඩරට ඇඳුමකින් සැරසී හොඳ තොප්පියක් දමාගෙන පෙරහැරේ යන ආකාරයේ චිත්‍රයක් පළ කළාට තමුන්නාන්සේ අකමැත්තක් දක්වාවියයි මා හිතන්නේ නැහැ. එහෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අබයගුණසේකර මයා.]

පොඩි ළමයින්ගේ සිත් නොමනා අදහස් වලට පොළඹවන ආකාරයේ ලියුම් කියුම්, ඡායාරූප, පින්තූර ආදිය පළ කිරීම වැළැක්වීම පිණිස පුවත්පත් ආයතනවල මාර්ගයෙන්ම යම් ක්‍රියාමාර්ගයක් නැත්නම් පිළිවෙතක් ඇති කළ යුතුව තිබෙනවා. මේ සම්බන්ධව යම් න්‍යාය ධර්මයක් අනුව යම් පිළිවෙතක් ඇති කළොත් එයින් පුවත්පත් කලාවටත් පුවත්පත් අවලෝකනය කරන්නාවූ ලක්‍ෂ සංඛ්‍යාත ජනතාවටත් යහපතක් සිදු වෙනවා.

ගරු කථානායකතුමනි, කුඹුරු පනතට සංශෝධන ගෙනෙනවාය කියා රාජාසන කථාවේ සඳහන් වෙනවා. මේ කුඹුරු පනතින් අද ගොවියාගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම එහි මූලික පරමාර්ථයක්. එයට අප කවුරුත් එකඟයි. එසේ කළ යුතුයි. එහෙත් මේ රටේ වාසය කරන—විශේෂයෙන් උඩරට ප්‍රදේශයේ වාසය කරන—මධ්‍යම පන්තියේ උදවියට මේ කුඹුරු පනතින් සැලකිය යුතු හානියක් නැත්නම් පහරක් වදිනවා. යම් අධ්‍යාපනයක් ලැබූ මධ්‍යම පන්තියේ අය කච්චේරියක ලිපිකරුවෙක් හෝ ස්වභාෂා ගුරුවරයෙක් හෝ පොලිස් භටයෙක් හෝ වශයෙන් සුළු රක්ෂාවක් කර යම් මුදලක් උපයා ගත්තා නම් ඒ මුදල යෙදුවේ කුඹුරු ඉඩමක් ගැනීම සඳහායි. ඒ ගණයේ වූ අය සියයට සියයක් වාගේම තමන්ගේ ආර්ථික තත්ත්වය දියුණු කර ගැනීම සඳහා තමන් අමාරුවෙන් උපයාගත් මුදල ඒ කටයුත්ත සඳහා යෙදුවා. ඒ නිසා මේ කුඹුරු පනතින් ඒ අයට විශාල හානියක් සිදු වී තිබෙනවා. කුඹුරු පනත අනුව මේ විධියට බෙදෙන්නේ කුඹුරුවලින් ලැබෙන අස්වැන්න පමණක්ය, තේ වතු, රබර් වතු, පොල් වතු, වෙළඳ ව්‍යාපාර ආදියෙන් ලැබෙන ලාභ ඒ විධියට බෙදෙන්නේ නැත, ඒ නිසා මෙහි යම් රහසක් තිබෙනවාය කියා ඒ අය කල්පනා කරනවා. ඒ නිසා ඒ කුඹුරු පනත ක්‍රියාත්මක කරන අවස්ථාවේ අක්කර තුනකින් හෝ හතරකින් ඉහළ කුඹුරු ඉඩම් සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රියාත්මක නොකර හැම කෙනෙකුටම අදාළ වන පරිදි ක්‍රියාත්මක කිරීමෙන් ලොකු කරදරයක් ඇති වෙනවා.

විහාර දේවාල ඉඩම් සම්බන්ධවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒවායින් ලැබෙන ආදායම ඒ සිද්ධස්ථානවල නඩත්තුවට යොදවන්නට සිදු වෙනවා. රාජකාරි ක්‍රමය අනුව බොහොම ඉස්සර ගණන් බලා යම් මුදලක් ගෙවුවා නම්, නොයෙක් විධියේ වෙනස්කම්වලට, විපර්යාසයන්ට භාජන වී ඇති මේ 20 වැනි ශත වර්ෂයේදීත් රාජකාරී වෙනුවෙන් ඒ මුදලම ගෙවීම ප්‍රමාණවත් නොවන නිසා, ඒ සම්බන්ධයෙනුත් සංශෝධනයක් ඇති කළ යුතුයි.

ලංකාව ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමේ ව්‍යාපාරය ගැන ගරු මන්ත්‍රීවරුන් බොහොම දෙනෙක් කථා කළා. ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් එතුමන්ලා කී දේවල් මාත් සනාථ කරන අතර, ඒ සම්බන්ධයෙන් උනන්දුවෙන් වැඩ කරන ගම්බද ජනතාවට අපේ ප්‍රශංසාව හිමි විය යුතු බව මතක් කරන්න කැමතියි. ඒ වාගේම, අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ රට සහලින් ස්වයංපෝෂිත කිරීමට ගෙන යන ව්‍යාපාරය සාර්ථක කිරීම සඳහා දිසාපතිවරුන් ගන්නා උනන්දුව ගැනද මෙහිදී සඳහන් කරන්නට ඕනෑ. ඒ දිසාපතිවරුන්ගේ බලවත් උනන්දුව නිසා අද හොඳ ප්‍රතිඵල ලැබී තිබෙනවා. එසේ කටයුතු කරන දිසාපතිවරුන්ට මේ ව්‍යාපාර වඩාත් හොඳින් කර ගෙන යාම සඳහා, දැනට ඇති බාධක, අඩු පාඩු මගහැරවීම පිණිස ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා අවශ්‍ය කටයුතු කරනවා ඇතැයි මා විශ්වාස කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන් කථානායකතුමාට නැවතත් ස්තුතිවන්ත වන අතර, රාජාසන කථාව පිළිබඳ මේ ස්තුති යෝජනාව ඉදිරිපත් කළ හා ස්ථිර කළ ගරු මන්ත්‍රීවරුන් දෙපොළටත්, වෙන කිසිම අවස්ථාවක සිදු නොවුණු ආකාරයට අපටත් ඉස්සර මේ ස්තුති යෝජනාව විවාද කර, අනුමත කිරීම ගැන සෙනෙට් සභාවේ ගරු සෙනෙට් මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තුතිය පළ කරමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 6.25

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

Both the Deputy Speaker and the Deputy Chairman of Committees are away and there is no Member of the Chairman's Panel here. Will the hon. Parliamentary Secretary propose the name of some Member to take the Chair ?

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)*
**(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)**

I move,

"That the hon. Appointed Member, Mr. M. Izadeen Mohamed, do take the Chair."

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ—தொழில் தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
**(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)**

**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, එම්. ඉසදීන් මොහමඩ් මයා. (පත් කළ මන්ත්‍රී) මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, [நியமன அங்கத்தவர் ஜனாப் இஸ்ஸதீன் முகம்மது) அவர்கள் தலைமை தாங்கினார்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. M. IZADEEN MOHAMED (APPOINTED MEMBER) *took the Chair.*

5——15340 (68/7)

අ. භා. 6.25

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
**(Mr. P. M. K. Tennekoon)**

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ කුළුඳුල් මූලාසනාරූඪ වීමෙන් පසුව ඒ ඓතිහාසික මිහින්තලාවෙන් නැගෙන හඬ නැංවීමට ලැබීම ගැන, පළමු කොටම මා සන්තෝෂ වෙනවා. වර්තමාන ආණ්ඩුවේ 4 වැනි රාජාසන කථාවේ අසාරකම පිළිබඳව අපේ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඉතා ඉහළින් විග්‍රහ කළ නිසා, මා ඒ පිළිබඳව වැඩි යමක් කියන්නට යන්නේ නැහැ.

ආණ්ඩුවක් බලයට පත් වී 4 වැනි අවුරුද්දට පියවර තබන විට කියැවෙන රාජාසන කථාව ඇත්ත වශයෙන්ම මේ රටේ බහුතර මහ ජනතාවට අත්පොළසන් දී සතුටු වන්නට පුළුවන් තත්ත්වයක තිබිය යුතුයි. එහෙත් අවාසනාවකට වාගේ, මේ රාජාසන කථාව දෙස බලන මේ රටේ කිසිම කෙනකුට සන්තෝෂ වන්නට පුළුවන් කමක් නැති වීම ගැන අප කණගාටු වෙනවා. මේ ආණ්ඩුවට සාධාරණව ඉදිරියට කියවන්නට තිබෙන්නේ, මීළඟ අවුරුද්දේ රාජාසන කථාව පමණයි. එම නිසා, මේ ආණ්ඩුවේ කටයුතුවල දියුණුව පිළිබඳව වර්ණනා කරන්නට මේ ආණ්ඩුවට හැකියාවක් නොමැති බව මේ රාජාසන කථාවෙන් හොඳ හැටි පැහැදිලි වෙනවා.

අද බඩු මිළ ඉතා ඉහළ නැග තිබෙනවා. ඒ වාගේම, රැකීරක්ෂා නැතිකමේ ප්‍රශ්නයත් ඉතා උග්‍ර වී තිබෙනවා. අද ගොවි ජනතාව ජීවත් වන්නේ කොයි තරම් දුකකින්ද යන්න මා අමුතුවෙන් කියන්න වුවමනා නැහැ. ඉතා දුක සේ හද්ද පිටිසර ගොවිතැන් කරන ගොවියාගේ ජීවන තත්ත්වය පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගන්නට පුළුවන්කම තිබෙන්නේ, ඔවුන් හා සමඟ ඒ ප්‍රදේශයේ ජීවත් වන මිනිසුන්ට පමණයි. ගොවියාගෙන් ලබා ගන්නා වී බුසලට රුපියල් 14 ක් ගෙවනවා යයි අද මේ ආණ්ඩුව උදන් අනනවා. ගොවියාට වී බුසලකට ආණ්ඩුවෙන් රුපියල් 14 ක් ලැබුණත්, පෝර හා අනෙකුත් රසායන ද්‍රව්‍යවලට ගෙවන්නට සිදු වී ඇති අධික මිළත්, ආණ්ඩුවෙන් ලබාගෙන ඇති ණයට ගෙවන්නට සිදු වී ඇති අධික පොළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

යත් ගැන කල්පනා කරන විට, ඇත්ත වශයෙන්ම වී බුසලකින් ගොවියාට රුපියල් 8 කට 9 කට වඩා ලැබෙන්නේ නැති බව කණගාටුවෙන් වුණත් මතක් කරන්නට ඕනෑ. මේ රටේ ගොවිජනතාව රට සවයං පෝෂිත කිරීම සඳහා ගන්නා උත්සාහය අද ඊයේ සිට මතු වූ දෙයක් නොවෙයි. අපේ ගරු අගමැතිතුමා බොහොම ඉහළින් වර්ණනා කරනවා, අපේ ගොවිතැන් ව්‍යාපාරය දවසින් දවස දියුණු වේගෙන යනවාය කියා. නමුත් අවාසනාවකට වාගේ, මේ රටේ ගොවි ජනතාවට නියම අන්දමට ගොවිතැන කර ගැනීමට අවශ්‍ය ජලය නැතිකම නිසා, අවශ්‍ය ඉඩම් නො මැතිකම නිසා, උපකරණ නොමැතිකම නිසා මොන අන්දමේ අවවාද අනුශාසනා රජය මගින් කළත් ගොවියන්ගේ තත්ත්වය නගා සිටුවීමට, ගොවිතැන දියුණු කිරීමට එතුමා බලාපොරොත්තු වන තත්ත්වයෙන් බැරි බව අද පමණක් නො වෙයි මේ ගරු සභාවේ මා කථා කළ සෑම අවස්ථාවකදීම මතක් කර දී තිබෙනවා. අපේ වර්තමාන ඉඩම් ඇමතිවරයාගේ ඉඩම් ප්‍රතිපත්තිය නිසා අපේ රටේ ගොවි ජනතාව මොන තරම් දුක් විඳිනවාද කියා මේ ගරු සභාවේ වරක් දෙවරක් නොවෙයි සිය දහස් වරක් මතක් කර තිබෙන බව ආණ්ඩු පක්ෂයේ ගරු මැති ඇමතිවරු හොඳ හැටි දන්නවා ඇති. එපමණක් නො වෙයි, ගොවිජනතාවට අවශ්‍ය ඉඩම් නො ලැබීම නිසා බලහත්කාරයෙන් ඉඩම් වගා කිරීමේ, වැඩි දියුණු කිරීමේ විපාකයට සෑම ගොවියකුටම දඬුවම් පමුණුවා තිබෙනවා. ඊයෙ පෙරේදා මගේ ප්‍රදේශයේ ගොවීන් වැව්තාවුලුවල ගොවිතැන් කිරීමේ වරදට වගාකළ අක්කරයකට රුපියල් එකසිය පණහ බැගින් සෑම ගොවියකුටම දඩ ගසා තිබෙනවා. ඒ කරන ගමන්ම ආණ්ඩුව, ගොවියන් සක්විති රජුන් මෙන් සලකා ඔටුණු පළඳවන්න යනවාය කියන කියමන මේ රටේ මහජනතාව මොහොතකටවත් පිළිගන්නෙ නැහැ. ඔන්න ඔවැනි තත්ත්ව යෙකිනුයි මේ රටේ ගොවි ජනතාව අද ජීවත් වන්නෙ.

අනික් අතින් අපරාධ පැත්ත ගැනත් අප කල්පනා කර බලමු. නමුන්නාන්සේ දන්නවා ඇති, ගරු මුදල් ඇමතිතුමාගේ කොට්ඨාශයේ ගම් සභාපතිවරයකු [illegible] මහතාගේ කාර්යාලය තුළ දීම මරාදමා තිබුණු බව. එපමණක් නොවෙයි, මගේ ආසනයේ සාමාදන විනිශ්චයකාර මහ තෙක්, එක් ගොවි මහතකු කඩපලේ සිට ගෙදර යද්දී පිටිපස්සෙන් ගොස් තුවක්කු වකින් වෙඩි තබා මරා දමා තිබෙනවා. මේ අතින් කල්පනා කර බලන විට මේ රටේ ගැමි ජනතාව මොන තරම් භයානක තත්ත්වයකින් මේ ආණ්ඩුව යටතේ ජීවත්විය යුතුද යන්න ගැන විශාල සැක යක් මේ රටේ ජනතාව තුළ තිබෙනවා. මේ කාරණාවලට පිළියම් වශයෙන් යොදන කිසිවක් ගැන රාජාසන කථාවෙහි වචන මාත්‍රයකින් තරම්වත් සඳහන් කර නැහැ.

මෙයටත් වඩා වැදගත් කාරණයක් තිබෙනවා. මේ රටේ ජනතාවගෙන් වැඩි කොටසක් බෞඩයන් වන විට, ආණ්ඩුවෙ යුතුකමක්ව තිබෙනවා, බෞඩ සථාන ආරක්ෂා කිරීම පිළිබඳව යම් සහතිකයක් රාජාසන කථාව මගින් දීම. මෙම රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා, පසුගිය පාර්ලිමේන්තු වාරයේදී අනුරාධපුර බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයක් ඇති කිරීමේ පනත නීති ගත කළාය කියා. නමුත් එම විද්‍යා පීඨය පිහිටුවීමේ වැඩ තවමත් ආරම්භ කර නැහැ.

එපමණක් නොවෙයි, ඊයෙ පෙරේදා මිහින්තලේ මහ සෑයේ නිදන්වස්තූන් අතුරුදහන් වීමක් පිළිබඳ සිද්ධියක් ගැන ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් මහජනතාවට දැනගන්න ලැබුණා. ධාතු නිදන් කිරීම සඳහා ගරු අගමැතිතුමාත් එම ස්ථානයට පැමුණුනා. පළාතේ මහජන මන්ත්‍රීවරයා වශයෙන් මටත් එම ස්ථානයට යන්න සිඩ වුණා. ගරු අගමැතිතුමන් අතින් එම සෑයට ධාතූන් වහන්සේලා නැකතට නිදන් කිරීමට කටයුතු යොදා තිබුණ නමුත් එයට දවස් දෙකකට පමණ පෙර, වෙසක් පුණු පෝදා, කාගෙදෝ අතින් නැකතට ධාතු තැන්පත් කොට තිබුණා. එසේ වුණත් මෙ වැනි වැඩ පිළිවෙළක් යොදා ගෙන තිබුණෙ බෞඩ මහජනතාව විශාල වශයෙන් ගෙන්වා ගෙන විශාල ආධාරයක් ලබාගැනී මට මග පාදා ගැනීමට විය හැකියි. අගමැති තුමාත් මාත් ගිහින් ධාතූන් නිදන් කළා. ඊට පසුව එතැනට රැස්ව සිටි ලක්ෂ [illegible] බෞද්ධ මහජනතාව තමන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පැළඳ ගෙන සිටි මාල, වළලු, නොයෙක් විධියෙ කණකර, රත්රන් ආභරණ, ගළවා එම නිදන් වළට විසි කළා. එපමණක් නොවෙයි, මුදල් පවා දැම්මා. අවසානයේදී ගරු අගමැතිතුමා දායක සභාවෙන් ඇහැව්ව, මෙම නිදන් වළ දැන් වහනවාද කියා. ඒ වෙලාවේදී විහාරාධිපති ස්වාමීන්වහන්සේ, තවත් ප්‍රදර්ශනය කරන්න තිබෙනවා, තවත් ධාතු නිදන් කරන්න තිබෙනවා කියා අගමැතිතුමා රවටා, 10 වනදා ධාතු නිදන් කළ ගර්භය 13 වනදා දක්වා වසන්නෙ නැතුව තබා ගෙන සිටියා. ඊට පසුව කළේ මොකක්ද ? නිදන් වළ ඇතුළෙ තැන්පත් කර තිබුණු සල්ලි, රත්රන් බඩු මේ ආදි හැම දෙයක්ම කුට්ටි සාක්කුවලට පුරවා ගෙන පන්සලට ගෙනැවිත් තිබෙනවා. මේ අවස්ථාවේදී ඉංජිනේරු සංස්ථාවේ නිලධාරීන් එයට විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා. එවිට, විහාරාධිපතීන් වහන්සේ කියා තිබෙනවා, ධාතු ගර්භය වසන අවස්ථාවට ආපසු ගෙනවිත් තබනවාය, එමනිසා කලබල වෙන්ට එපාය කියා. 13 වනදා ධාතු ගර්භය වැසුවා. එසේ වුණත් අරගෙන ගිය කිසිවක් ආපසු ගෙනැවිත් තැන්පත් කර නැහැ.

මේ කාරණය සම්බන්ධයෙන් ඉංජිනේරු සංස්ථාවේ නිලධාරීන් පැමිණිලි කර තිබෙනවා. පුරාවිද්‍යා කොමසාරිස් මහතාට පවා මේ කාරණය පිළිබඳව දන්වා තිබෙනවා. නමුත් අගමැතිතුමාට මේ කාරණය දන්වා යැවූ විදුලි පුවත්වලට අද වනතුරුත් පිළිතුරක් ලැබී නැහැ. අඩු වශයෙන් විදුලි පණිවුඩයක් ලැබුණාය කියාවත් දන්වා නැහැ. මෙහිදී අප විශේෂයෙන් කල්පනා කළ යුත්තක් තිබෙනවා. සකල ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය ස්ථානයක් වන ඓතිහාසික මිහින්තලාවේදී මෙබඳු සිද්ධීන් වනවා නම් මේවා ගැන කාටද කියන්නෙ කියා අප කල්පනා කරන්න ඕනෑ. ධාතු නිදන් කිරීමෙන් පසුව අගමැතිතුමා ප්‍රශ්න කළා, නිදන් වළ වසන්නෙ නැත්තෙ මන්ද කියා. එහෙම අහන්න එතුමාට හේතුවක් තිබුණා. ඊට පෙර දවසෙ පොලොන්නරුවෙ චෛත්‍යයකට මුල් ගල තැබූ වේලාවේදී එහි ධාතු නිදන්කොට අගමැතිතුමා අතින්ම කොන්ක්‍රීට් දමා ඒ වල වැසූ සිද්ධිය ගැන එතුමාගෙ මතකයට ආවා. එහෙත් එදා ඇසූ වෙලාවෙ කිව්වෙ පසුව වහන බවයි. ඒ ප්‍රදේශයේ මේ පිළිබඳව දැන් කිසිලු ඇන්‍ද-

දෝලනයක් ඇති වී තිබෙනවා. මේ අපරාධය ගැන වගකිය යුත්තේ කවුද කියා මහජනතාව අහනවා. මෙවැනි තත්ත්වයක් අද සිදු වී තිබීම ගැන අපි ඉතාමත් කනගාටු වෙනවා. ඒ වාගේම ඔය මහා සෑය මුලින් ගරා වැටී තිබුණ වෙලාවෙ හතරැස් කොටුවේ තැන්පත් කර තිබුණ පැරණි ධාතූන් වහන්සේලා ඇතුළු වස්තූන් පරාක්‍රම කොමිෂනිය මගින් ගළවා පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට භාර දී, පසුව එහි තැන්පත් කිරීම පිණිස එම විහාරස්ථානාධිපති භික්ෂූන් වහන්සේට භාර දුන්නා. මා ආණ්ඩුවෙන් අහන්න කැමතියි ඒ ඓතිහාසික මහා සෑයේ තිබුණ පැරණි නිදන් වස්තූන් සහ ධාතූන් වහන්සේලා ආපසු තැන්පත් කළාද නැද්ද කියා. එසේ තැන්පත් කළ බවට කවුද අපට සහතිකයක් දෙන්නෙ කියා මම බෞද්ධ ජනතාව වෙනුවෙන් විමසන්න කැමතියි.

මේ කාරණය පිළිබඳව පුවත්පත් මගින් ප්‍රචාරය වුණාට පසුව මට ලැබී තිබෙන ලියමනක් තමුන්නාන්සේලාගේ දැනගැනීම පිණිස මෙම සභාව ඉදිරියේ තැබීමට කැමතියි :

"බාලිකා පාර,
මතුගම,
19. 6. 68.

ගරු මහජන මන්ත්‍රීතුමා,
මිහින්තලේ.

මැතිතුමනි,

මිහින්තලේ වෙහෙරෙහි නිධාන වස්තූන් අතුරුදහන් වූ බව ඔබ විදුලි පුවතකින් ගරු අගමැතිතුමාට දැන්වූ බව පුවත්පත් මගින් දැනගතිමු. මේ කාරණය ඇත්තක් නම් පළාතේ මන්ත්‍රීවරයා හැටියට ඔබ මෙයට ඉදිරිපත් වී ක්‍රියා කරන මෙන් ඉල්ලමි. එපමණක්ද නොවෙයි. 17 වැනි දින සිළුමිණ පත්‍රයෙන් මිහින්තලේ නායක හාමුදුරුවෝ අභියෝගයක්ද කර තිබේ. එය බොරුවක් බවද දන්වා තිබේ. මේ කියමන් දෙකෙන් අපි කොයි එකද ඇත්ත බවට පිළිගන්නේ ?

ඔබ ඒ අභියෝගය පිළිගන්නේ නම් නිධාන් වස්තු තැන්පත් කළ අපටද ඉදිරිපත් විය හැකියි. අපිත් නිධාන කොටුවක් රු. 250 ක් ගෙවා වෙන් කරවා ගත්තෙමු. පළමුවෙන්ම අපට දැන්නුවේ නිධාන කොටුවක් වෙන් කරවා ගත්තොත් අප අතින්ම නිධාන් වස්තු තැන්පත් කිරීමට ඉඩ දෙන බවයි. අපි මුදල් ගෙව්වෙමු. නමුත් නිධන් වස්තු අපට තැන්පත් කිරීමට අවස්ථාවක් නොලැබුණි. එහි නායක ස්වාමීන් වහන්සේ 10 වැනි දින 2.30 ට පමණ අපට දැන්නුවා නිධන් වස්තු බන්දේසියක තබා පෙරහැරින් ගොස් තැන්පත් කරන බව. මුදල් ගෙවූ අපි ඒ කාරක සභාවේ මහතුන්ටත් ගරු ස්වාමීන් වහන්සේටත් කන්නලව් කර බැගෑපත්ව ඉල්ලා සිටියා අපටම අපි ගෙනා නිධන් වස්තු තැන්පත් කරන්නට ඉඩ දෙන්ටය කියා. ඔවුන්ට පිං කිය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව :

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

[පී. ඇම්. කේ. තෙන්නකෝන් මයා.]

ඉල්ලා සිටියා. ඊට පසුවයි නිධාන වස්තු අපටම සෑය මුදුනට ගෙන යෑමට ඉඩ දුන්නේ. නමුත් අපට අපේ අතින්ම නිධන් කරන්න අවස්ථාවක් ලැබුණේ නෑ. අපට සිදු වූයේ සෑය මුදුනේ නිධන් කාමරයක තබන්ටයි. ඒවාට කිසිම ආවරණයක් තිබුණේ නැත. අපට දන්නුවා පසුව ඒ නිධන් වස්තු එහි තැන්පත් කරන බව. නායක ස්වාමීන් වහන්සේ එදිනම අපට දන්නුවා එදිනම සවස ඒ නිධාන තැන්පත් කරන වල වසා කොන්ක්‍රීට් දමන බව. නමුත් පත්‍රයෙන් අපට දැනගන්නට ලැබුණේ 13 වැනිදා එය වැසූ බවයි. ඉතින් දවස් තුනක්ම නිධාන වල නොවසා තිබුණා නම් සැකයක් පහළ වීමට ඉඩ තිබෙන්නට පුළුවන්. ඔබ සිතනවා නම් මේ කාරණය ඇත්තක් බව කරුණාකර මේ ගැන ඉදිරිපත් වී ක්‍රියා කරන මෙන් යටහත් භාවයෙන් ඉල්ලා සිටිමු. ඒ ධාතු ගර්භය නැවත අරිනවා නම් අපටත් දන්නුවොත් අපි තැන්පත් කළ නිධාන් වස්තු තිබේද නැද්ද කියා කියන්නට පුළුවන්. අප තැන්පත් කළ නිධාන වස්තු සෑදීමට ගිය වියදම රු. 850 ක් පමණ වේ.

නිධන් වස්තු අතුරුදහන් වූවා නම් මුළු බෞද්ධ සින්ට සිදු වූයේ අවමානයක්. අනික් ආගම් කාරයින් අපට සිනාසෙත්. එනිසා නැවතත් ඔබගෙන් ඉල්ලා සිටින්නේ මේ කාරණය ඇත්තක් නම් ඊට විරුද්ධව ක්‍රියා කරන මෙන්.

මෙයට විශ්වාස,
(අත්සන———)

ඇඩ්රසය :
ඩී. ආර්. ජයසේකර,
බාලිකා පාර,
මතුගම.

නිධන් වස්තු තැන්පත් කළ අනික් තැනැත්තාගේ ඇඩ්රසය :

ඇල්. ඩී. විජේපාල වික්‍රමනායක,
පද්මසිරි නිවස,
මතුගම.”

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේ තත්ත්ව යයි අද ඇති වී තිබෙන්නේ. මේ අනුව තමුන්නාන්සේට පෙනී යනවා ඇති, මේ කාරණය ගැන විශේෂයෙන්ම මේ රටේ බෞද්ධ ජනතාව අතර විශාල කැළඹීමක් තිබෙන බව. ඒ වාගේම ඒ ඓතිහාසික මහා සෑයේ තිබුණ පැරණි නිදන් වස්තු සහ ධාතූන් වහන්සේලා නැවතත් එම චෛත්‍ය යේ තැන්පත් කර තිබෙනවාද කියාවත් අපට සහතික ලෙස කියන්න කෙනෙක් නැහැ. එම නිසා මා අගමැතිතුමාගෙන් ඉල්ලනවා, මේ ගැන විශේෂ පරීක්ෂණයක් පවත්වා මේ රටේ බෞද්ධ ජනතාවට—විශේෂයෙන්ම එදා තමන්ගේ අතේ, කණේ, කරේ තිබුණ වටිනා රන් ආභරණ ගලවා ශ්‍රද්ධා සම්පන්නව ඒ ස්ථානයේ තැන්පත් කළ ඒ බෞද්ධ ජනතාවට—සැනසීමේ නිදා ගැනීමට ඉඩ කඩ සලසන්නය කියා.

මීට වඩා දීර්ඝ ලෙස මා කථා කිරීමට බලා පොරොත්තු වන්නේ නැහැ. එහෙත් කවියෙක් වන මගෙන් කවුරුත් බලා පොරොත්තු වන පරිදි තමුන්නාන්සේගේ අවසරය ඇතුව රාජාසන කථාව පිළිබඳ අද හස් ස්වල්පයක් දක්වන මගේ කවි කථාව අවසාන වශයෙන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

| | | |
|---|---|---|
| 1. | කවියා අපේ නයි නටවන එකකු | කොට |
| | සැලකූ යුගය ඉවරයි රට ඉදිරි | පිට |
| | මම මැතිවරයෙක්මි හඳුනන සිහල | රට |
| | අවසර ගරු කථානායකතුමනි | මට |
| 2. | කලකදි සිහල කවියා කවිකම | කොන්වී |
| | සිටි අවදියක මට මතකයි මුළු | ගැන්වී |
| | කවි සම්මේලනය යුදවැද පණ | නැන්වී |
| | එහෙයින් සිටිති මන්ත්‍රීවරු කවි | යන්වී |
| 3. | දැ විපතෙහි දි මෙන් දෙස බස රකින | මහා |
| | සටනෙහි වන්හ කවියා පෙරමුණට | වහා |
| | ජාතිය අවදිකොට සිය පදවළිය | ලිහා |
| | මගෙ රට රැකරගත්හ කවියා කවිය | සහා |
| 4. | පොදු ජනතාවගෙ ඔප කරනුවට | දිවී |
| | කවියා රටේ පාලකයා පෙරට | යැවී |
| | කොපුවෙහි රුවා නුහුරුය හුරු පුරදු | අවී |
| | කුමටද මෙවැනි තැන්වලදී නොමැති | කවී |
| 5. | රාජාසන දෙසුම මේ වර කරන | ලද |
| | ඇසුවෝ රටේ ජනයා පීඩනය | මැද |
| | රැවටෙන දනට එය ඇස් බැන්දුමකි | හොඳ |
| | ඒකත් ගියා මහජනයගෙ ඇහැට | විද |
| 6. | පිරියස ඉසුරු අඩුවක් නැති ඉහල | පෙලේ |
| | පියකරු කුරුළුවනු පෙදෙසෙහි සඳළු | තලේ |
| | එක ගැහැනියක් අවලක්සන “ කබර | තොලේ ” |
| | සායම් තවරමින් රට රැවටුමකි | කලේ |
| 7. | ඒ විදියට රටේ රජ කරවා | බොරුව |
| | ගිණිගෙන දැවෙන පැණ විසඳන්නට | බැරුව |
| | අසරණ දුගී ජනයා බාගෙට | මැරුව |
| | සංවර්ධනයටයි කියමින් මුල | පිරුව |
| 8. | රාජාසන දෙසුම රට හමුවට | ආවේ |
| | වෙඩිමුර හඬිනි ඔකඳව යුද හමු | දවේ |
| | කුසගිණි නිවා ලන්නට පොදු ජන | තාවේ |
| | අබමල් රොණක් වත් සිදුවෙන වද | සේවේ |
| 9. | තොල් රතු කරන් සායම් තැවරූ | මූණු |
| | හේතුව කිමද ? වෙනද මෙනි අඩු | නුනු |
| | හැකිනම් ඔවුන් සංවර්ධනයට | ගේනූ |
| | කුමටද අහිංසක අසරණ ගැමි | ගැනු |
| 10. | ඇත රට සබා යන නාමය යට | හංගා |
| | මහජන විරෝධය හේතුව පැන | නැංගා |
| | පෙඩරල් නයා ආවිට පෙණ ගොබ | නංගා |
| | ලක් මව නහර තුළ දිවයයි විස | ගංහා |
| 11. | බලතල තබාගනු සඳහා කෙඳිරි | ගගා |
| | පුදුමයි හේතු උතුරට දුන් අයුරු | පගා |
| | [illegible] සපුන් රජයට වූවෙහිය | ළහා |
| | මෙහෙළ පරපුරේ ලේ බිඳුවට නොදෙනු | නිහා |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | | |
|---|---|---|
| 12. | සැපතක් නොවේ හෙළයට පෙඩරළුන් | තුලෙන් |
| | යටකොට තිබේ මුළු දිවයින ඔවුන් | දූලෙන් |
| | දුන්නොත් රට සබා ඔවුනට හොරෙන් | බලෙන් |
| | අරඹෙයි සටන සැකයක් නැහැ මිහින් | තලෙන් |
| 13. | අපගේ ඇමතිවරු ඉහලින් අණ | දෙව්වා |
| | නෙළුවා වල් පැලත් ගැමි දරුවන් | ලව්වා |
| | රාජාසන දෙසුම මහ ඉහලින් | තිව්වා |
| | සුළු නැහැ හපන්කම් අපි දන්නෙමු | මෙව්වා |
| 14. | වල්පැල නෙළුව ගම්බද දරුවනට | සතු |
| | දයාදයකි අකුරට පිළිපැදිය | යුතු |
| | සංවර්ධනය වෙනුවෙන් දිවයිනෙහි | මතු |
| | ආවද එකෙක්වත් දරුවෝ කුරුඳු | වතු |
| 15. | දුන් ණය පොලිය ගොවිනට සියයකට | හයේ |
| | පුදුමය දෙළහ දක්වා ඇයි ඉහල | ගියේ |
| | එහෙයින් නොසිතූ ලෙස ගින්නක් ඇවිල | ගියේ |
| | කාලය ගෙවයි ණය බරවූ පවට | බියේ |
| 16. | රැකගනු පිණිස ගොවි පරපුර අර | අඳින |
| | රජයේ කෙරුම් පිළිබඳ ඇත රට | හැඳින |
| | නොනටන හොරුන්ගේ බෙර තාලෙට | වඳින |
| | ගොවියන් කණු නොවේ මීහරකුන් | බඳින |
| 17. | දුකසේ ඔවුන් කුස ගින්නේ කුඹුරු | මැද |
| | දහදිය හෙළති කුමටද කිසිවකුගෙ | පුද |
| | නොමඳී සහය නිසි විදියට නියම | ලෙද |
| | රැවටිය නොහැක ගොවි සක්විති කිරුළු | බැද |
| 18. | බිජුවට පොහොර නිසිලෙස කුඹුරට | ජලය |
| | ගොවි උපකරණ ඉඩමුත් මුදලෙහි | බලය |
| | රුඳවුදට ජාතික කප්තුර | හෙළය |
| | බැබලේ රටක් පණ ගැන්වෙන ගොවි | කුලය |
| 19. | පියා ගොවිතැනට ගත් ණය බැරිම | තැන |
| | ගෙවා ගන්න බැරිවූ විට නියම | දින |
| | සොයා බලමු දඬුවම් දරුවනට | දෙන |
| | භයානකයි රජයෙන් පමුණුවන | වින |
| 20. | හාල් පොත් රැගෙන ගොවි දරුවනගෙ | හෙළ |
| | තබාගති රජය මිරිකූ වැනිය | ගෙල |
| | නොබා මෙය කියන්නෙමි වරදකට | මුල |
| | ලැබූ හැටි යුගය පුදුමයි ඇහැලෙ | පොල |
| 21. | ජීවන වියදමේ තතු මහ මෙරට | උසින් |
| | සැතපුම් ගණන් නොසිතූ ලෙස ඉහල | ගොසින් |
| | යෙදූවද ? නියම නිසි පිළියම් රජය | විසින් |
| | ඒවා දෙස බැලිය යුත්තේ දිළිඳු | ඇසින් |
| 22. | නැග එන මහාජන කෝපයෙ ගිණි | දැල්ල |
| | නිවනට හමුදව සහ පොලිසියෙ | අපොල්ල |
| | පෙන්වා කරවමින් පීඩිතයා | මෙල්ල |
| | කැපුවේ හාල් නොව මහජනයගෙ | ඉබ්ල්ල |
| 23. | බැලු බැලූ අතේ නැති පිරිසක් රැකි | රස්සා |
| | යති එති නිතර දෙවුපෙල සහතික | උස්සා |
| | ඒ ගැන කිසිත් නොකියා මල් වැසි | වැස්සා |
| | රාජාසන දෙසුම මේවර එළි | බැස්සා |
| 24. | රජයේ දිළිඳුකම අසරණ නිවට | කම |
| | බියසුළු කම අහිංසකකම කියනු | කිම |
| | පෙන්වන නොමැති කිසිවිට දියුණුවක | ඉම |
| | පිළිකුල් කරමි රාජාසන දෙසුම | ඔම |



අ. භා. 6.40

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන** (අම්බලන්ගොඩ)

*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன —அம்பலாங்கொடை)*

(Dr. M. H. Saddhasena—Ambalangoda)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේ රාජාසන කථාවෙන් ආණ්ඩුව නව වසරේ අනුගමනය කරන්නට බලාපොරොත්තු වන ක්‍රියා පටිපාටිය විදහා පා තිබෙනවා. පසුබිම ගැන කල්පනා කර බලන විට, 1965 දී එදා තිබුණු රජය පරාජයට පත් වන අවස්ථාවේදී මේ රට ඉතාම භයානක ආර්ථික පරිහාණියකට මුහුණ පා තිබුණු බව කාටත් පැහැදිලිව පෙනෙනවා ඇති. ඊට කලින් තිබූ රජය විසින් රැස් කර තිබුණු මුදල් නාස්ති කර හිස් භාණ්ඩාගාරයක් තබා තිබුණා පමණක් නොවෙයි, රටේ ජනතාව වැඩි වන බවක් සලකා කිසිම සංවර්ධනයක් කර තිබුණේ නැහැ. ඇතැම් විට මැති ඇමතිවරුන් පමණක් සංවර්ධනය වුණා වන්නට ඇති. එවැනි භයානක අවස්ථාවකදී රජය ගෙන යාමට නුපුළුවන් බවත්, ජනතාවට අවශ්‍ය ආහාර සැපයීමට බැරි බවත්, ඒ අය දැන ගත්තා. ඒ නිසා පත්‍ර මුකවාඩම් පනතක් ඇති කර කථා කිරීමේ නිදහසක් නැති කර, ඒකාධිපති ස්වරූපයක් පෙන්වමින් මාක්ස් වාදීන් සමග අත්වැල් බැඳගත්තා. එදා නොයෙකුත් මත දැරුවා වූ ඒ පිරිස එකතු වී ජාතික රජයක් පිහිටුවීම සඳහා මහජන සහයෝගය ඉල්ලූ අවස්ථාවේදී මහජනයා ඊට කන් දුන්නා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය නැසීමේ ඒ බිහිසුණු අපරාධය වැළැක්වීමට පුළුවන්කම ලැබුණා. මහජනයාට නිදහසේ පාරේ ගමන් බිමන් යෑම පවා වළක්වන ඒ බිහිසුණු අපරාධය වැළැක්වීමට පුළුවන් වුණා.

මේ ආණ්ඩුව බලයට පත් වුණායින් පසුව විරුද්ධ පාර්ශ්වයේ සිටින අය නොයෙකුත් විප්ලව කර මේ ආණ්ඩුව පෙරළා දමන්නට උත්සාහ කළා. එළු දෙනගේ කිරි බුරුල්ල දැක එය වැටෙතැයි බලාපොරොත්තුවෙන් එළු දෙන පස්සේ ගිය නරියා මෙන් විරුද්ධ පාර්ශ්වයේ උදවියත් මෙම ආණ්ඩුව මාස තුනකින් වැටෙතැයිද,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය සද්ධාසේන]

මාස හයකින් වැටෙතැයිද, මාස දොළහකින් වැටෙතැයිද බලාපොරොත්තු වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව විසින් පනවන ලද දෙමළ භාෂාවට සාධාරණ තැන දීමේ පනත යටතේ රෙගුලාසි පැනවීමට ක්‍රියා කළ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්විකයන් ස්වකීය පළමුවැනි විප්ලවය ආරම්භ කළා. චීවරධාරීන් පෙරමුණට දමාගෙන ගොස් ඔවුන් මහජනයා මුළා කිරීමට උත්සාහ කළා. එදා ඇති වුණු කලබලයේදී කලබලකාරයින් විසුරුවා හැරීමට පොලීසිය විසින් තබන ලද වෙඩිල්ලකින් මරණයක් සිදු වුණා. ඒ අවස්ථාවේදී භික්ෂූන් වහන්සේ නමකට වෙඩි තැබුවා යයි කියමින්ද, උන්වහන්සේ ඇඳ සිටි ලේ තැවරුණු සිවුරු පෙන්වමින්ද මහජනයා කුපිත කිරීමට උත්සාහ කළා. කහ පාට රෙදි කැබෙලි ගෙන රටපුරා යමින් මහජනයා කුපිත කිරීමට උත්සාහ කළා. එහෙත් මහජනයා ඊට රැවටුණේ නැහැ.

ඊළඟට සිදු වුණේ මොකක්ද? පසුගිය ආණ්ඩුවේ අදූරදර්ශී වැඩ පිළිවෙළ නිසා කෘෂිකර්මය දියුණු වුණේ නැහැ. පිටරටින් හාල් ගෙන්වීමටද ක්‍රමයක් නැතිව ගියා. ලෝකයේ හාල් හිඟයක් ඇති වුණා. ඒ අවස්ථාවේදී මේ රටේ මහජනයාට එක වේලකවක් බත් දෙන්නට ඕනෑ යයි කල්පනා කරගෙන හාල් සලාකය සම්බන්ධයෙන් එක්තරා පියවරක් ගත්තා. නොකරම බැරි වූ නිසයි, හාල් සලාකයෙන් කොටසකට තව්වු කරන්නට සිදු වුණේ. එහෙත් ලෝකයේ හාල් හිඟයක් නැතැයිද, ඕනෑ තරම් හාල් තිබෙනවා යයිද කියමින් ඒ අවස්ථාවේදී මහජනයා මුළා කිරීමට විරුද්ධ පාර්ශ්වයේ උදවිය උත්සාහ කළා. ඒ උත්සාහය සාර්ථක වුණේත් නැහැ. කීප වරක් රැවටී සිටින මහජනයා විරුද්ධ පාර්ශ්වයේ උදවියගේ බොරු ප්‍රචාරවලට රැවටුණේ නැහැ.

මෙම රජයේ කෘෂිකර්ම ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා ස්වකීය ශ්‍රම ශක්තිය යොදවමින් වෙහෙසෙන ගොවියාට අපගේ ස්තුතිය හිමි වෙනවා. මේ ආණ්ඩුවේ කෘෂිකර්ම ව්‍යාපාරය සඳහා ගොවියාගේ නොමසුරු සහයෝගය ලැබෙනවා. ඒ ගොවියන් තමන්ගේ රට වෙනුවෙන් ගෙන යන උදාර සේවය නිසා අද ශ්‍රී ලංකාවාසීන්ට සිංහල හාලේ බත් කන්න දෙන්නට පුළුවන් වී තිබෙනවා. මෙම වගා ව්‍යාපාරය ආදියෙහි නොයෙකුත් අඩුපාඩුකම් තිබෙන්නට පුළුවනි. ඒ වාගේම මහජනයාටද නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා වෙන්නට පුළුවනි. ඇත්තෙන්ම මහජනයාට දුෂ්කරතාවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා නම් එසේ වී තිබෙන්නේ පසුගිය රජයේ අදූරදර්ශී වැඩ පිළිවෙළ නිසයි. පසුගිය රජය කිසිම සංවර්ධන ව්‍යාපාරයක් කර ගෙන නොගිය නිසයි, අද රට වැසියන්ට දුෂ්කරතා පැමිණ තිබෙනවා නම්, එසේ වී තිබෙන්නේ. පසුගිය රජය ඉතුරු කර තබා ගිය ප්‍රශ්න විසඳීමට මේ රජයට සිදු වී තිබෙනවා. අපේ එඩිතර නායක ඩඩ්ලි සේනානායක මහතා මේ රට සංවර්ධනය කිරීමේ කටයුතු කරගෙන යන්නේ මහජනයාගේ ඡන්දය ලැබේද නැද්දැයි සලකා බලා නොවෙයි. රට වැටී ඇති ප්‍රපාතයෙන් ගොඩ ගැනීම සඳහා ජතික කැක්කුමක් ඇතිව එතුමා ක්‍රියා කරනවා. එතුමාගේ වැඩ පිළිවෙළේ හේතුවෙන් මේ රට ක්‍රම ක්‍රමයෙන් ස්වයංපෝෂිත තත්ත්වයට පත් වෙමින් පවතිනවා. 1970 දී එළු දෙනගේ කිරි බුරුල්ල කඩා වැටෙතැයි විරුද්ධ පාර්ශ්වයේ උදවිය බලාගෙන සිටිනවා. හොඳයි, එසේ වුණත් අප 1970 දී භාර දෙන්නට බලාපොරොත්තු වී සිටින්නේ සංවර්ධනය වූ ලංකාවක්.

මේ රට ස්වයංපෝෂිත කිරීමේ අභිලාෂයෙන් ආහාර වගා කිරීමට විශාල ප්‍රයත්නයක් දරාගෙන යන බව මේ වර රාජාසන කථාවෙන්ද කියා තිබෙනවා. අපේ රටේ මහජනතාවගේ නොමසුරු සහයෝගය ලැබීම කරණකොටගෙන වැඩි කල් යන්නට මත්තෙන් පිටරටින් ආහාර ද්‍රව්‍ය ගෙන්වා ගැනීම සඳහා යවන්නට සිදුවූ ඇති රුපියල් ලක්ෂ 8,000 මෙහිම නතර කර ගන්නට පුළුවන් වෙනවා ඇති. පිටරට සිටින මිනිසුන්ගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීමට අප මෙතෙක් කල් රුපියල් ලක්ෂ 8,000 ක් පිටරට යැව්වා. පිටරට මිනිසුන්ගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීමට ක්‍රියා කළ අප කම්මැලියන් වශයෙන් මෙහි ජීවත් වුණා. ආහාර ද්‍රව්‍ය සඳහා මුදල් පිටරට යැවීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නතර කර ගත්තායින් පසුව අපේ කර්මාන්ත දියුණුව සඳහා ඒ මුදල්වලින් කොටසක් යොදවන්නට පුළුවනි. ඒ විධියට ක්‍රියා කරගෙන යන කොට තව ටික කලකදී රැකීරක්ෂා ප්‍රශ්නයත් ක්‍රම ක්‍රමයෙන් ලිහිල් වී යන බව ඒකාන්තයි. මෙම අරමුණ ඇතිව ජාතික තරුණ ස්වේච්ඡා සේවාවක් ඇති කරන බව මේ වර රාජාසන කථාවෙන් කියා තිබෙනවා.

මෙතෙක් කල් මේ රටේ තිබුණේ නිකමුන් බෝ කරන අධ්‍යාපන ක්‍රමයක්. 1956 දී දෝ මේ රටේ තිබුණු උසස් පිරිවෙන් දෙකක් විශ්ව විද්‍යාල දෙකක් බවට පත් කිරීමෙන් පසුව රැකීරක්ෂා නොමැති උගතුන් විශාල පිරිසක් බිහි වන්නට පටන් ගත්තා. ඇත්තෙන්ම මේ රටේ රැකීරක්ෂා නැති උගතුන් බිහි වුණේ පසු ගිය රජයේ ක්‍රියා පටිපාටියේ ප්‍රතිඵලයක් වශයෙනුයි. ඒ ප්‍රතිඵල සියල්ලටම මුහුණ දෙන්නට සිදු වී තිබෙන්නෙ නව රජයටයි. මේ තරුණ ස්වේච්ඡා හමුදාව ඇති කිරීම කරණකොටගෙන අපේ තරුණයන්ට යම්කිසි රැකියාවක් පිළිබඳ පුහුණුවක් ලබාගෙන කාටවත් අත නොපා සිංහලයන් වශයෙන්, ලාංකිකයන් වශයෙන් ජීවත්වීමේ භාග්‍යය ලැබෙනවා. ඒ සමගම ගාල්ල, මාතර, යාපනය ආදී ස්ථානවල කාර්මික විද්‍යාල පිහිටුවා අපේ පාසල් යන කුඩා ළමුන්ට ඔවුන්ගේ සහජ දක්ෂතාවන්ට අනුව යම් යම් කර්මාන්ත පිළිබඳව පුහුණුවක් ලබා දී ලාංකික පුරවැසියන් වශයෙන් ඔවුන්ගේ ශ්‍රමය රටේ අභිවෘද්ධියට යෙදවීම සඳහා ක්‍රියා කරන බවට මේ රාජාසන කථාවෙන් ප්‍රතිඥා දී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ කිරිපිටි හිඟයක් ගැන බොහොම ලොකු ඝෝෂාවක් තිබුණු බව තමුන්නාන්සේ දන්නවා. මේ රජය දැනටමත් පොළොන්නරුවේ උකු කිරි කම්හලක් පිහිටුවා තිබෙන අතර වැලිසර තවත් කිරිපිටි කම්හලක් පිහිටුවීමට ක්‍රියා කරගෙන යන බව මතක් කරන්ට කැමතියි. සියලුම අඩුපාඩුකම් නැති කර මේ රටේ ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා මේ රජය විසින් මේ අන්දමේ පියවර රාශියක් ගෙන තිබෙනවා.

අද ග්‍රාමීය ප්‍රදේශවලට විදුලි බලය සැපයීම සඳහා අපේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමා විසින් විශාල ව්‍යාපාරයක් ගෙන යනවා. ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රමය යටතේ 1970 වන විට මගේ ආසනයට සම්පූර්ණයෙන්ම විදුලි බලය ලැබෙන බව ස්ථිර නිසා මම ඒ ගැන ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ කර්මාන්ත ඇමතිතුමා නව කර්මාන්ත 116 ක් ආරම්භ කරන බවට ප්‍රතිඥා දී තිබෙනවා. එයින් සමහරක් දැන් පටන් ගෙන තිබෙනවා. ආහාර අතින් පමණක් නොව ටයර් ටියුබ් හා රෙදිපිළි අතින්ද මේ රට ස්වයංපෝෂිත කිරීම සඳහා මේ ජාතික රජය මගින් විශාල ව්‍යාපාරයක් ගෙන යනවා. දැන් වේයන්ගොඩ විශාල රෙදි කම්හලක් තිබෙනවා. තුල්හිරියේ තවත් එකක් ඇති වෙනවා. තුන්වැනි කම්හලකුත් ළඟ එනවා. එය මගේ දුප්පත් කොට්ඨාශයට ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

ධීවර කර්මාන්තය දියුණු කිරීමට නොයෙකුත් පලාත්වල ධීවර වරායවල් පිහිටුවීමට රජය ක්‍රියා කරන අතර ධීවර කාර්මිකයන්ට අවශ්‍ය යාත්‍රා ලබා ගැනීමට ණය පහසුකම් සැලසීමට ක්‍රියා කරගෙන යනවා. එපමණක් නොව ධීවර ආම්පන්න පවා මෙහිම තැනීමට කටයුතු කරගෙන යන බව මතක් කරන්ට කැමතියි.

පසුගිය ආණ්ඩු කාලයේ අපේ ආචාර්ය දහනායක ඇමතිතුමාට අමුඩයක් ගහ ගෙන මේ සභා ගර්භයට එන්නට සිදු වුණු බව මතක ඇති. ඒ කාලයේ අමුඩ ලෙන්සුවක්, උඳැල්ලක් මිළදී ගන්ට පුළුවන් කමක් තිබුණේ නැහැ. අද උදලු, අමුඩ ලෙන්සු වැනි දේවල් මේ රටේ ගොවි ජනතාවට පහසුවෙන් ලබා ගැනීමට මේ රජය වැඩ පිළිවෙළ යොදා තිබෙනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

අමුඩය නැතිවයි එන්න තිබුණේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)

තව ටික දවසකින් අමුඩය නැතිව තමයි, තමුන්නාන්සේට යන්න සිද්ධ වෙන්නෙ. තේ කර්මාන්තය දියුණු කිරීමටත්, තේ අලෙවිය වැඩි කිරීමටත් දැන් මේ රජය ජාත්‍යන්තර සාකච්ඡා පවත්වාගෙන යනව. මෙතෙක් කල් කිසි කෙනෙක් සැලකිල්ල නොදැක්වූ පොල් කෙඳි කර්මාන්තය දියුණු කරන්නටත් මේ රජය ක්‍රියා කරගෙන යනව. මුහුදු බඩ ප්‍රදේශවල වාසය කරන ගැමි ජනතාව රක්ෂාවන කොහු කර්මාන්තය රසායනික ක්‍රම මගින් දියුණු කිරීමට මේ රජය ක්‍රම සොයාගෙන යනව.

ආගමික දියුණුවටත් මේ රජය ක්‍රියා කරනව. මම කලින් කිව්ව වගේ හොඳට තිබුණු පිරිවෙන් දෙකක් විශ්ව විද්‍යාල බවට පරිවර්තනය කිරීම කරණකොටගෙන අද අපේ සංඝයා වහන්සේලා බොහොම දෙනෙක් බී. ඒ. උපාධිය ගහගෙන රක්ෂාවල් සොයා යනවා. සමහරෙක් උපාධිය ගහගෙන විවාහයකුත් කරගෙන සිවුරු හැර යන තත්ත්වයක් තිබෙනව. ඒ තත්ත්වය නැති කිරීමට මේ රජය මගින් අනුරාධපුරයේ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයක් පිහිටුවා බෞද්ධ පරිසරයට අනුව බෞද්ධ ධර්මය පතුරුවා ලීමට හැකි වන අන්දමේ බෞද්ධ අධ්‍යාපනයක් භික්ෂූන් වහන්සේලාට ලබා දෙන්න ක්‍රියා කරගෙන යනව.

අද තිබෙන්නෙ විද්‍යා යුගයක් නිසා පාසල්වල විද්‍යාව ඉගැන්වීම අනිවාර්ය කළ යුතුයි. එම නිසා විද්‍යාව ඉගැන්වීම සඳහා පාසල්වලට අවශ්‍ය උපකරණ මේ රටේම නිෂ්පාදනය කිරීමට කර්මාන්තශාලාවක් ළඟදී පිහිටුවන බවට මේ රාජාසන කථාවෙන් ප්‍රතිඥා දී තිබෙනව.

ආයුර්වේද ක්‍රමය අපේ පැරණි වෛද්‍ය ක්‍රමයක්. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම සඳහා නොයෙක් පළාත්වල ආයුර්වේද වෛද්‍ය ශාලා ඇති කරනවා පමණක් නොව පැරණි වෙදකම් ආරක්ෂා කිරීම සඳහාත් නොයෙක් දේවල් කරගෙන යනවා. සමහර පැරණි වෛද්‍ය ක්‍රමයන් බොහෝවිට වෛද්‍යවරයාගේ ජීවිතය සමඟින් සමග අභාවයට යනවා. එය විශාල පාඩු සිදු කරන්නක් බව අපේ ආණ්ඩුව පිළිගන්නවා. පැරණි බෙහෙත් වට්ටෝරු ලබාගෙන ඒවා මුද්‍රණය කර ආරක්ෂා කර ගන්නා අතර ඒවායින් ජනතාවට ප්‍රයෝජන ගන්නට පුළුවන් වන විධියට දැනටමත් වැඩ කටයුතු කරගෙන යනවා. ඒ බව පුවත්පත් මගිනුත් තමුන්නාන්සේ දකින්නට ඇති.

ලංකා සම සමාජ පක්ෂයත්, කොමියුනිස්ට් පක්ෂයත් රට පුරා ගොස් කෑ ගසමින් කියන්නේ, මේ රටේ කම්කරුවන්ගේ විමුක්තිය සඳහා ක්‍රියා කරන්නන් ඒ අයය කියායි. කම්කරු විමුක්තියට වැඩ කරන්නේ අපි තමයි කියනවා. කම්කරුවන්ගේ ගැලවුම්කාරයෝ අපි තමයි කියනවා. එහෙත් කම්කරුවන්ගේ මුට්ටිකාසිවලටත් තට්ටු කරන ගමන් කම්කරුවන් මගින් රාජ්‍ය පාලන බලයත් ලබා ගන්නටයි ඒ අය උත්සාහ කරන්නේ. ඇත්ත වශයෙන්ම කම්කරුවන් කෙරෙහි දයානුකම්පාවකින් ක්‍රියා කරනවාය කියන්නට බැහැ. රුපියලේ අගය අඩු කළ අවස්ථාවේදී ධනපති හාම්පුතුන් ලවා කම්කරුවන්ට වැඩි පඩියක් ගෙවන්නට වැඩ කෙළේ මේ ආණ්ඩුව බව ආඩම්බරයෙන් කියන්න පුළුවනි.

රටසභා ගැන විශාල උද්ඝෝෂණයක් රටේ තිබෙනවා. රටසභාවල ඉතිහාසය තමුනානාන්සේට මතක ඇති. බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම තමුන්නාන්සේට මතක ඇති. එදා ඒ ගිවිසුමේ අඩංගු කරුණුවලට එක්සත් ජාතික පක්ෂය විරුද්ධ වුණා. ඒ ආකාරයේ ගිවිසුමකට අනුව එන රටසභා ක්‍රමයකට අපි එදත්, අදත්, හෙටත්, කවදත් විරුද්ධයි. ඒ විධියේ රටසභා ක්‍රමයක් අද ගෙනාවොත් ඒකටත් අපි විරුද්ධ වෙනවාමයි. දැන් තිබෙන දිස්ත්‍රික් සභා සහ එදා ඇති කරන්නට ගිය රටසභා අතර විශාල වෙනසක් තිබෙනවා. මම කියන්නම් වෙනස. එදා අදහස් කළ රටසභා ක්‍රමය ක්‍රියාත්මක කළොත් ඒ අනුව නම් රට දෙකට බෙදී යනවාමයි. මේ යෝජිත ක්‍රමය අනුව එසේ වන්නට ඉඩක් නැහැ. සිංහල [illegible] ඒ පළාත්වල ජනපදවලට යන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නට පවා බැරි වන විධියටයි එදා කෙරෙන්නට තිබුණේ. බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම අනුව වැඩ කළා නම් එක සිංහලයකුටවත් ඒ පළාත්වලට—ජනපදවලට—යෑමට බැරි වන්නට තිබුණා. අපේ ගරු අගමැතිතුමා කවදාවත් එවැන්නකට එකඟ වන්නේ නැහැ. එතුමා අගමැතිකමට කෑදර නැහැ.

1965 මාර්තු 24 වැනිදා ඇති වූ දේ තමුන්නාන්සේට මතක ඇති. එදා විරුද්ධ පාර්ශ්වයේ දැන් ඉන්න තමුන්නාන්සේලා පෙඩරල් පක්ෂයේ අය සමග සාකච්ඡා කළේ නැද්ද? මොනවද අයියා ඕනෑ, ඕනෑ දෙයක් දෙන්නම් කියලා කිව්වේ නැද්ද? දෙපාරක්, තුන්පාරක් දිගින් දිගටම ගිහිල්ලා මේ විධියට කී නිසා ඒ අය ඒවා පිළිගත්තේ නැහැ. බණ්ඩාරනායක-චෙල්වනායගම් ප්‍රතිපත්තිය අනුව ක්‍රියා කරනවා නම් තමන්ගේ සහාය දෙන්නට කැමති බව එදා අපේ ගරු අගමැතිතුමා, පෙඩරල් සහෝදරයන් 1960 මාර්තු මාසයේදී පැවති මැතිවරණයෙන් පසු කී නමුත් අපේ ගරු අගමැතිතුමා එයට එකඟ වුණේ නැහැ. එදා තාවකාලිකව එතුමා ආණ්ඩුවක් පිහිටුවා ගත්තා. එදත් එතුමාට ඒ අදහස ඉදිරිපත් කළා. එතුමා කවදාවත් එවැන්නකට එකඟ වන්නේ නැති බව කිව්වා. රට පාවා දෙන්නට බැහැ කියලා එතුමා පැහැදිලිවම කිව්වා. මාර්තු 22 වැනිදා පීරිස් මහත්මයාගේ බංගලාවේදී ඇති වූ සාකච්ඡාවේදීත් අපේ ගරු අගමැතිතුමා කිව්වේ 'මට නම් ඒවා දෙන්නට බැහැ කියායි. දැන් පවතින යල් පැනපු කච්චේරි ක්‍රමය වෙනස් කරන්නට ශක්තියක් ඇති දිස්ත්‍රික් සභා ක්‍රමයක් සඳහා පණතක් දීම ගැන නම් සලකා බලන්නට සූදානම් බව පමණක් ගරු අගමැතිතුමා කිව්වා. හැබැයි, එය මධ්‍යම ආණ්ඩුවෙන් පාලනය වන දිස්ත්‍රික් සභා ක්‍රමයක් විය යුතු බවත් ගරු අගමැතිතුමා කියා සිටියා. අපේ පාලනය යටතේ ඇති කරන්නට යන දිස්ත්‍රික් සභා ක්‍රමය අනුව යාපනය දිස්ත්‍රික්කයේ ඇති කරන දිස්ත්‍රික් සභාවට මඩකලපුව දිස්ත්‍රික් සභාව සමග එක්වන්නට—ඒකාබද්ධ වන්නට—පුළුවන්කමක් නැහැ. ඒවා වෙන වෙනම තිබෙන්නට ඕනෑ. දෙමළ සහෝදරයන් ඉන්න පළාත්වල පමණක් නොව සිංහල පළාත්වලත් දිස්ත්‍රික් සභා පිහිටුවන්නටයි අපේ ආණ්ඩුව අදහස් කළේ.

අපේ පෙඩරල් සහෝදරයින් දැන් මෙතැන නොසිටීම ගැන මා කනගාටු වෙනවා. ජාතික සමගිය ඇති කර රටේ අවශ්‍යතාවන් සපුරා ලන්නට විධිමත් ක්‍රියා මාර්ගයක් ක්‍රියාත්මක කරන්නට අපේ ආණ්ඩුවට පුළුවන් වුණේ අපේ ගරු අගමැතිතුමාගේ දක්ෂකම නිසයි. එතුමාට පුළුවන් වුණා සුළු කොටස් සමගි කරවා ගන්නට. මා මේ අවස්ථාවේ මෙහි පෙඩරල් සහෝදරයින් නොසිටීම ගැන කනගාටු වන අතර එතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මේ පෙඩරල් අදහස අත හැර දමන ලෙස. ලාංකික සහෝදරයින් ලෙස මේ රට දියුණු කරන්නට ක්‍රියා කිරීමට ඉදිරිපත් වන්නැයි එතුමන්ලාගෙන් මා ඉල්ලා සිටිනවා. පෙඩරල්වාදය නිසා දැන් මේ රටේ නව දේශපාලන පක්ෂයකුත් ඇතිවෙලා තිබෙනවා. අපේ දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) දැනටමත් අලුත් පක්ෂයක් ඇති කර තිබෙනවා. එතුමා මේ විවාදයට කෙලින්ම ඉදිරිපත් වුණා. මෙන්න මේ මේ දේ නිසා මා මෙයට විරුද්ධයි කියමින් එතුමා, තමන් නියෝජනය කරන ඡන්දදායකයින් වෙනුවෙන් තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. දැන් පෙඩරල් සහෝදරයින්ගේ පෙඩරල්වාදය නිසා සිංහල මහජන පක්ෂයකුත් ඇති වුණා. සමහර විට එය බොහොම සාර්ථක වෙන්නත් ඉඩ තිබෙනවා. එම නිසා මා පෙඩරල්වාදී සහෝදරයින්ගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේ පෙඩරල් කැල්ල අත් හැර දමන්නය කියා. මට පෙර කතා කළ දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් කියන්න යෙදුනා ගම්සභාපතිවරයෙකු සම්බන්ධයෙන් සිදු වුණ වෙඩි වැදීමක් ද මිනීමැරුමක් ද ගැන. මෙවැනි දේවල් සිදුවීම පුදුමයක් නොවෙයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

මම එහෙම කිව්වෙත් නැහැ. මම තවම කතා කළෙත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)

මට පොඩ්ඩක් වැරදුනා. මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා විසිනුයි ඒ විධියට කිව්වෙ. දෙන්නම එක විධිය නිසයි මට වැරදුනේ.

මේ මිනීමැරුම්, අපරාධ, සිදු වීමට රුකුල් දෙන්නේ කව්ද? මෙන්න මේ සමසමාජ කොමියුනිස්ට් කාරයින් විසින් තමයි දුප්පත් මහජනතාව, තරුණ පිරිස, නොමග යවා ඒ අයව උසිගන්වා මෙවැනි අපරාධ කරන්න රුකුල් දෙන්නෙත්, ආධාර දෙන්නෙත්. ඒ අය විසින් දුප්පත් ජනයාව උසිගන්වනවා. ඒ නිසා ඒ ගැන හෝ මිහින්තලේ නිදන් වස්තු නැති වීම ගැන හෝ අගමැතිතුමාට කරන්න පුළුවන් දෙයක් නැහැ. එම නිසා මං විරුද්ධ පක්ෂයට කියා සිටින්නේ බොරු ප්‍රචාරයන් මගින් රට මුළා කරන්න එපා කියයි. සියලු දෙනාම ජාති භේද ආගම භේද අත්හැර මේ අමාරු අවස්ථාවෙන් මේ රට මුදාගැනීම සඳහා එක්සිත්ව කටයුතු කළ යුතුයි. දැන් කළ යුත්තේ එයයි. තමුන්නාන්සේලා තැන් තැන්වල රැස්වීම් පවත්වමින් බොරු ප්‍රචාරයන් කරනවා. තමුන්නාන්සේලා කතා කරන්නේ මොන පනතක් ගැනද? මොකක්ද ගෙන ආ පනත? මොන දිස්ත්‍රික් සභා පනතද තමුන්නාන්සේලාට ඉදිරිපත් කළේ? වෙල්වනායගම් පනතද? බස්නායක පනතද? එහෙම නැතිනම් "දවස" පත්‍රයේ පනතද? මොකක් ගැනද මේ තමුන්නාන්සේලා කතා කරන්නෙ? තව මත් පනතක් ආවේ නැහැ. අපේ ගරු අගමැතිතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන නිසා තමයි, මහජනතාවගේ මතයට හිස නමන නිසා තමයි, රාජාසන කථාවේ ඒ සම්බන්ධයෙන් මේ විධියට කියා තිබෙන්නේ :

"... සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද අදහස් ගැන මාගේ ආණ්ඩුව සුපරීක්ෂාකාරීව සලකා බලනු ඇත." යම්කිසි විධියකින් තමුන්නාන්සේලාත් විරුද්ධ පැත්තේ ඉඳගෙන උත්තර දුන්නා නම්, මෙහි තිබෙන වැරදි පෙන්නා දුන්නා නම්, සමහර විට එදාම ගරු අගමැතිතුමා විසින් මේ අදහස් අස් කර ගන්න ඉඩ තිබුණා. ඒ නිසා මහජන මතය උසිගැන්වී තිබෙන මේ අවස්ථාවේදී මේ රටසභා පනත මෙයින් ම අහෝසි වී යන්නය කියා මා ප්‍රාර්ථනා කරනවා, බලාපොරොත්තු වෙනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

පනත එන්නෙ නැහැ නේද?

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)

තමුන්නාන්සේත් එයට කැමතියි නේ. සමහර විට තව ටිකක් කල් යන විට ලූනු ටිකක්, උඳුලු, ආදිය ලැබෙන විට දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාත් එක්සත් ජාතික පක්ෂයට බැඳේවිය කියා මා සිතනවා.

අවසාන වශයෙන් මේ රාජාසන කථාව මෙසේ සකස් කළ අගමැතිතුමාටත්, කැබිනට් මණ්ඩලයටත්, මෙය ඉදිරිපත් කළ අග්‍රාණ්ඩුකාරතුමාටත් මා නියෝජනය කරන අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් ප්‍රශංසා කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

අ. භා. 7

**පර්සි සමරවීර මයා.** (වැලිමඩ)
*(திரு. பேர்சி சமரவீர—வெலிமடை)*
(Mr. Percy Samaraweera—Welimada)

ගරු මූලාසනාරූඪ මැතිතුමනි, මේ රාජාසන කථා විවාදයේදී මා කථා කරන්න අදහස් කරගෙන සිටියේ මෙම රාජාසන කථාවට ගරු මන්ත්‍රීවරයෙකු විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන කිහිපයක් උඩ බව මා පළමුවෙන්ම කියන්න ඕනෑ. සමහර විට මේ ඊයේ පෙරේදා ලැබුණ යම් යම් ආරංචි එහෙම නැත්නම් රටේ පැතුරුනු රාවය හේතුකොටගෙන සම්ප්‍රදායට විරුද්ධව යමක් කියන්නට මා ඉදිරිපත් වුණාය කියා හුඟක් දෙනෙක් කල්පනා කරන්නට පුළුවනි. නමුත් ගරු මන්ත්‍රීවරයෙකු විසින් ඉදිරිපත් කර තිබෙන සංශෝධන ගැන සොයා බැලීමේදී උඩරට ආසනයක් නියෝජනය කරන කෙනෙකු වශයෙන් එම සංශෝධන ගැන වචනයක් දෙකක් කතා කළේ නැත්නම් එය මගේ යුතුකමක් පැහැර හැරීමක්ය කියා මට ප්‍රත්‍යක්ෂ වෙනවා, මට හැඟී යනවා. ඉදිරිපත් කර ඇති සංශොධන තුනම ගැන කතා කරන්නට මා බලාපොරොත්තු නූනත්, විශෙෂයෙන් උඩරට ප්‍රදේශයට බල පාන සංශෝධනවල ගැබ් වී ඇති කරුණු ගැන වචනයක් දෙකක් ම විසින් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කවුරුත් මෙම සභාවේදී කථා කළ රටසභා නැති නම් දිස්ත්‍රික් සභා පිළිබඳව මෙහි පළමුවන සංශෝධනයෙහි සඳහන් වෙනවා. ධවල පත්‍රිකාව මෙම සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේ දී හේතු සහිතව මා ඊට විරුද්ධව යම් කිසි ප්‍රකාශයක් කළ බව මතක ඇති. රටසභා පිළිබඳව අදත් මා යම් අදහසක් ප්‍රකාශ කරන්නට පෙර මෙම ගරු සභාවේ දැනගැනීම සඳහා එක්තරා කාරණයක් ඉදිරිපත් කරන්නට කැමතියි. 1956 ආණ්ඩු පෙරළියෙන් පසු, ඒ කියන්නේ දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා මේ රටේ පාලනය භාර ගත්තායින් පසු, අද දවසේ පෙඩරල් පක්ෂයේ ලේකම් ධුරය දරන වඩ්ඩුක්කොඩ්ඩෙයිහි ගරු මන්ත්‍රීතුමා (ඒ. අමිර්තලිංගම් මයා.) මෙම සභාව ඉදිරිපිටදී කරන ලද කථාවකින් වචන ස්වල්පයක් දැන් මතක් කර දෙන්නට මා කැමතියි. වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා එදා මෙම සභාව ඉදිරියෙහි තම කුළුදුල් කථාව කරමින් ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කර තිබෙන කරුණුවලින් ස්වල්පයක් මෙසේයි :

"Let it not be imagined that we are oblivious of the forces at work among the Sinhalese people. We are definitely happy, we feel happy, at the fall of the U.N.P. No one has reason to feel more happy than the Tamil-speaking people at the fall of a government which has, within the last eight years of its rule, perpetrated the gravest atrocities on the Tamil-speaking people of this Island. It was the UNP Government which deprived half the Tamil-speaking people of this country of their fundamental political rights, of citizenship and franchise rights, and made them a stateless people. It was that same government which pursued a policy of systematically colonizing the areas of Tamil-speaking people and making the Tamil-speaking people a landless people." —[OFFICIAL REPORT, 4th May 1956; Vol. 24, c. 327.]

තවත් තැනෙක මෙසේ සඳහන් වෙනවා :

"We demand—we do not request; we do not beg—I repeat, demand the right of self-determination, the right to rule ourselves in our own territory."—[OFFICIAL REPORT, 4th May 1956; Vol. 24, c. 329.]

අද ෆෙඩරල් පක්ෂයේ ලේකම්ධුරය දරන එතුමා එදා මෙම සභා ගර්භය තුළ තමන්ගේ කුළුදුල් කතාව කරමින් කීවේ ඒ අන්දමටයි. මේ සම්බන්ධ ඉතිහාසය ගැන වචනයක් කියන්නට මා කැමතියි. දිවංගත බණ්ඩාරනායක මැතිතුමාගේ ආණ්ඩුවත්, ඒ වාගේම සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවත්, අවුරුදු 9 ක් මේ රට පාලනය කළා. මේ ආණ්ඩු කාල දෙක තුළ ෆෙඩරල් පක්ෂය මොන ආකාරයේ වැඩ පිළිවෙළක් ගෙන ගියාද යන වග අපට හිතා ගන්නට පුළුවනි. අවුරුදු 9 ක කාල පරිච්ඡේදයක් මුලුල්ලේ මේ රටේ ජනතාවගේ හැඟීම් විශාල වශයෙන් වෙනස් වුණාට පසු, ජාතික රජය විසින් ඇති කරන්නට බලාපොරොත්තු වන බව කියැවෙන රට සභා පිළිබඳ ප්‍රශ්නයකට අපට නැවත වරක් මුහුණ පාන්නට සිදු වී තිබෙනවා.

රට සභා ධවල පත්‍රිකාව පිළිබඳ විවාදයේ දීත් ප්‍රකාශ කළාක් මෙන් නැවතත් මා මේ අදහස ප්‍රකාශ කරන්නේ, ඒ ධවල පත්‍රිකාවට විරුද්ධව අද ඉතා බැරෑරුම් අන්දමට කථා කරන පිරිස් අවුරුදු 9 ක කාලයක් තිස්සේ රට සභා නැත්නම් දිස්ත්‍රික් සභා ඇති කළ යුතු බව ඒ උදවියගේ රාජාසන කථාවලටත් ඇතුළත් කර තිබුණු නිසායි. මේ රාජාසන කථාවෙහි රට සභා සම්බන්ධයෙන් සඳහන් වී තිබෙන්නේ සුළු වගන්තියක් පමණයි. ගරු අගමැතිතුමා මේ සම්බන්ධව ප්‍රකාශයක් කරන්නට බලාපොරොත්තු වන බව ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් මට දැනගන්නට ලැබුණා. මා මීට කලිනුත් කීවාක් මෙන් මේ අවස්ථාවේදී නැවතත් මතක් කළ යුතු කරුණක් තිබෙනවා. අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමාත් (වෛද්‍යාචාර්ය සද්ධාසේන) දැන් මොහොතකට කලින් කළ ඉල්ලීම අප අමතක කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරවීර මයා.]

නරකයි. කවදාවත් මේ රටේ ෆේඩරල් ආණ්ඩුවක් ඇති කරන්නට සූදානම් නොවන බවත් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් තමන් පිළිගන්නට කැමති බවත් මේ ගරු සභාව ඇතුළතදී ප්‍රකාශ කරන්නට ෆේඩරල් පක්ෂය සූදානම් නම්, ඒ වාගේම, මෙතෙක් කල්—අවුරුදු 9 ක් තිස්සේ—මේ රටේ රට සභා ක්‍රමයක් ඇති කැරන බව තම රාජාසන කථාවල සඳහන් කළ විරුද්ධ පක්ෂ නායකයන්, රට සභා ඇති කිරීමේ පණතක් මොනම මුහුණුවරකින්වත් මේ ගරු සභාවට ඉදිරිපත් නොකරන බව ප්‍රකාශ කරන්නට සූදානම් නම් අපට මෙහි කිසිම ප්‍රශ්නයක් ඇත්තේ නැහැ. මේ පිරිස අවුරුදු ගණනක් තිස්සේ මේ සම්බන්ධව විවිධ මත දැරුවා. අද මේ පිරිස මේ සම්බන්ධව කුමක් ප්‍රකාශ කරන්නට සූදානම් වනවාද යන්න ගැන මහජනතාව විමසිල්ලෙන් සිටිනවා. මේ රජය විසින් ඉදිරිපත් කරන ලද රටසභා පිළිබඳ ධවල පත්‍රිකාවට මේ පිරිස විරුද්ධ වෙනවා නම් මහජන නියෝජිතයන් වශයෙන් ඔවුන් එසේ කළ යුතුව තිබුණේ මේ ගරු සභාව ඇතුළතදීයි. " හයිඩ් පාක් " පිට්ටනියෙහි රැස්වීමක් තබා මහජනතාවට කරුණු කියා මෙහි කිසියම් වෙනසක් කරන්නට විරුද්ධ පාර්ශ්වය අදහස් කරනවා නම් එය මහජන නියෝජිත පිරිසක් ඔවුන්ගේ යුතුකම් ඉෂ්ට කිරීමක්යයි මා අදහස් කරන්නේ නැහැ. ධවල පත්‍රිකාව පිළිබඳ විවාදයේදී ඉදිරිපත් වුණු කරුණු සුපරීක්ෂා කාරීව කල්පනා කර බලා ඒ අනුව සුදුසු අන්දමින් ක්‍රියා කරන බව මේ රාජාසන කථාවෙහි සඳහන් වෙනවා. එසේ නම්, ජාතික රජය ඒ පිළිබඳව ගන්නා තීරණය උඩ අද පැන නැගී ඇති ගැටළුව නිරාකරණය කර ගැනීමට පුළුවන් වේ යයි මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මට කථා කිරීමට තව වැඩි වේලාවක් නැති බව මා දන්නවා. එහෙත් තව එක් වැදගත් කරුණක් මතක් කළ යුතුව තිබෙනවා. රට සභා ප්‍රශ්නයට වඩා භයානක ප්‍රශ්නයක් තවමත් අප ඉදිරියෙහි තිබෙනවා. මේ රටේ ඉන්දියානුන්ගේ ප්‍රශ්නය විසඳා අවසාන බව, 1964 අවුරුද්ද අවසාන වේගෙන යද්දී මේ රටේ ප්‍රවෘත්තිපත්‍ර මාර්ගයෙනුත් මහා සභා රැස්වීම් මාර්ග යෙනුත් ප්‍රකාශයට පත් වුණු බව තමුන්නාන්සේට මතක ඇති. මා කථා කරන්නේ උඩරට මන්ත්‍රීවරයෙක් හැටියටයි. උඩරට මන්ත්‍රීවරයෙක් හැටියට මා මෙම ගරු සභාවේදී මේ ප්‍රකාශය කළේ නැත්නම් එය මට ඡන්දය දී මා මෙම ගරු සභාවට එවූ උඩරට ජනතාවට මා කරන අගෞරවයක් බව මා නැවතත් කියනවා. හේතුව කුමක්ද? අද විරුද්ධ පක්ෂයේ නායිකාව වශයෙන් සිටින සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉන්දියානු ප්‍රශ්නය විසඳා සිරිමා—ශාස්ත්‍රී ගිවිසුම අත්සන් කර තුන් ලක්ෂයක් ඉන්දියානුවන් මේ රටේ ලියාපදිංචි කරන්නටත් පන් ලක්ෂයක් නැවත ඉන්දියාවට යවන්නටත් තීරණය කරගෙන පැමිණි බව අපි දන්නවා. එතුමිය මේ රටේ එවකට සිටි අගමැතිනිය වශයෙන් තීරණයක් අරගෙන තිබෙනවා. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ හැන්සාඩ් වාර්තා වෙන් එතුමියගේ කථාවෙන් කොටසක් මම දැන් කියවන්නම්.

" During my discussions with the Hon. Leader of the Opposition it was agreed that all persons of Indian origin who have obtained Ceylon citizenship under the Indian and Pakistani Residents (Citizenship) Act as well as those others who will be acquiring citizenship under the present Agreement, should be placed on a separate electoral register. "—[OFFICIAL REPORT, SENATE, 10th November 1964 ; Vol. 20, c. 2085.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි අහන ප්‍රශ්නය මෙයයි. එම ගිවිසුමට අත්සන් කර පැමිණියාට පසුව තම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සමගත් එවකට විරුද්ධ පාර්ශ්වයේ නායකයාව සිටි වර්තමාන අගමැති ඩඩ්ලි සේනානායක මහතා සමගත් සාකච්ඡා කර මේ වැදගත් තීරණ අරගත්තා නම් එය ක්‍රියාත්මක නොවුණේ ඇයි කියන ප්‍රශ්නය මා අහනවා. කාගේත් දැනගැනීම පිණිස මා අහනවා මෙම ප්‍රශ්නය. අලුතින් ලියා පදිංචි වන මේ තුන් ලක්ෂයත් දනට මේ රටේ ලියාපදිංචි වී සිටින 1,50,000ක් පමණ වූ ඉන්දියානුවනුත් යනුවෙන් පන් ලක්ෂයක් පමණ වූ පිරිසක් එකම ඡන්ද ලැයිස්තුවකට වැටුණාට පසුව උඩරට ප්‍රදේශයේත් සබරගමුව ප්‍රදේශයේත් මධ්‍යම පළාතේත් ඇති වන තත්ත්වය කුමක්ද? අර විධියේ වැදගත් තීරණයක් අරගෙන එය ක්‍රියාත්මක නොකර කාගෙත් ඇස් වසා මේ පනත මේ විධියට ක්‍රියාත්මක කරන්නට තීරණය ගත්තේ ඇයි කියා මා අහනවා. සමහරවිට මේ අය කියාවි "මෙය අපේ අභ්‍යන්තර ප්‍රශ්නයක්, අපි එය ඉන්දියාව සමග සාකච්ඡා කළේ නැත, මෙය අපට ඕනෑ හැටියට විසඳන්නට ඕනෑ ප්‍රශ්නයක්, මේ ගැන අප සාකච්ඡා කර තිබෙන්නේ අපට ඕනෑ හැටියට විසඳා ගන්න" යනුවෙන්. මේ අණපනත් කොන්දේසි මේ රටේ දී මෙයට එක් කළා නම් මෙවැනි අසාධාරණයක් කරන්නට මේ අය තීරණය කර ගත්තේ ඇයි කියා මා අහනවා. මෙය ලොකු අපරාධයක්. එදා මේ පනත ඉදිරිපත් කළ අවසථාවේදී—මේ ආණ්ඩුව පිහිටෙව්වාට පසුව—මේ විධියේ අණපනත් ඇතුළත් කර තිබුණා නම්, සාකච්ඡා කළ පරිදි වෙනම ඡන්ද ලැයිස්තුවක් පිළිගන්නට සූදනමක් තිබුණා නම්, මේ අපරාධය සිදු වන්නේ නැහැ. මෙහි භයානකම පෙනෙන විට අපට මතක් වෙනවා එක් තරා කාලයක ඌව, සබරගමුව හා මධ්‍යම ප්‍රදේශ වාසීන්ට සිදු වී තිබුණේ කුමක්ද කියන එක. එක් දහස් නවසිය හතලිස් ගණන්වල ඒ ප්‍රදේශවලින් එක සිංහලයකුටවත් මේ ගරු සභාවට එන්නට අවසථාව සැලසී තිබුණේ නැහැ. ඌවේ ආසන 10 ක් තිබෙනවා. වැඩි ජනතාව වශයෙන් සිටින්නේ සිංහල ජනතාවයි. එහෙත් පාර්මේන්තු ආසනයක් දිනාගෙන එක සිංහලයකුටවත් මේ ගරු සභාවට එන්නට අවසථාව සැලසී තිබුණේ නැහැ. නැවතත් සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම උඩ ඒ තත්ත්වය උඩ රටට ගෙනෙන්නද හදන්නේ කියා අපි මේ අවසථාවේදී ප්‍රශ්න කරනවා. ආණ්ඩුවෙන් පමණක් නොවෙයි, මේ පනත සකස් කළ අයගෙනුත් උඩ රට ස්වාධීන මන්ත්‍රීවරයෙක් හැටියට මා අහනවා කවුද මෙයට වගකිව යුත්තේ කියා. මේවාට උත්තර දෙන්න ඕනෑ. [බාධාකිරීමක්] තමුන්නාන්සේ මොනවා කිවත්, උඩරට මන්ත්‍රීවරයෙකු වශයෙන් තමුන්නාන්සේට විශාල යුතුකමක් තිබෙනවා, මේ ගැන මීට වඩා උසස් අන්දමින් කල්පනා කරන්න. අප ඉන්නේ දේශපාලන පක්ෂ තර කරන්න නොවෙයි. දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමාගේ (ආර්. ජී. සේනානායක මයා.) පක්ෂයට මාත් ඇඳුණා යයි ලොකු රාවයක් තිබුණා. අපේ බලාපොරොත්තුව පක්ෂ තර කිරීම නොව සිංහලයාගේ අයිතිය ආරක්ෂා කිරීමයි. සිංහලයාට උඩ රට තිබූ අයිතිය නැති වී ගිය අවසථාවක, දිවංගත ඩී. එස්. සේනානායක අගමැතිතුමා එක පෑන් පහරින් ඒ අයිතිය නැවත ලබා දුන්නා. තව අවුරුදු 20ක් 25ක් ගිය විට උඩරට ප්‍රදේශවල මොන තත්ත්වයක් ඇති වේදැයි මේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මා අහනවා.

මගේ ඡන්දදායක කොට්ඨාශයේ දැනට ද්‍රවිඩ ඡන්ද හයසිය ගණනක් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරවීර මයා.]

නව අවුරුදු 15 ක් පමණ ගත වන විට, වැලිමඩ ඡන්දදායක කොට්ඨාශයේ ද්‍රවිඩ ඡන්ද නිසැක වශයෙන්ම 10,000 කටත් වැඩියෙන් තිබෙන්න බැරි නැහැ. තීරණය කර ගත් පරිදි අර වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවුණේ ඇයි? අර පනත ගෙන ආ අවස්ථාවේ, උඩරට මන්ත්‍රීවරයෙකු වශයෙන් අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න තිබුණා. "මේ විධියේ භයානක තත්ත්වයක් ඇති වී තිබෙනවා, එම නිසා ඊට පිළියම් යොදන්න" කියා. එහෙත් ඒ කාලයේ මා පාර්ලිමේන්තුවේ නොසිටි නිසා ඊට අවස්ථාවක් ලැබුණේ නැහැ.

මේ සංශෝධනයේ සඳහන් වී තිබෙනවා, දෙවැනි ඡන්ද ලැයිස්තුවක් ගැන. මා කථා කරන්නට සූදානම් වන්නේ, ඒ උඩයි. උඩරට හා මධ්‍යම ප්‍රදේශය පමණක් නොව, මේ පනත සකස් වී තිබෙන ආකාරය අනුව නම් සබරගමුවත් සම්පූර්ණයෙන්ම අර තත්ත්වයට ඇද වැටෙනවා. මේ වැඩ පිළිවෙළෙන් වී තිබෙන්නේ, ඡන්දදායක කොට්ඨාශ 40 ක පමණ සිංහලයන්ගේ අයිතිය නැති වන්නට අවස්ථාව සැලැසීමක්. ඊට වගකිව යුත්තේ කවුදැයි හෙට අනිද්දාම මහජනයා ඉදිරියට පැමිණ ප්‍රකාශ කරන්නට, මේ ගිවිසුම සකස් කළ උදවියටත්, අණපනත් සකස් කළ උදවියටත්, ඒවා ක්‍රියාවට පරිවර්තනය කළ උදවියටත් සිදු වේවි. "අපට මේ අපරාධය කළේ ඇයි" කියා උඩරට මහජනයා අහන විට, ඊට උත්තර දෙන්න ඒ අයට සිදු වෙයි.

මේ සංශෝධනවල ගැබ් වී තිබෙන අනෙක් කාරණය, උඩරට වතුකරය ගැන කල්පනා කරන විට කණගාටුවෙන් නමුත් ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා, ඒ ප්‍රශ්නය නිරාකරණය කිරීමට මේ රාජාසන කථාවෙන් යමක් සිදු වී නැති බව. මා සවිර කළ සංශෝධනයෙන් පළ වන්නෙ එයයි. ඒ සංශෝධනය ස්ථිර කරන අතරම එක් කාරණයක් ප්‍රකාශ කරන්න සිදු වී තිබෙනවා. මේ ප්‍රශ්නය නිරාකරණය කිරීම කල් ගත වී තිබෙන අවධියක, එහෙම නැත්නම් එය තරමක් දුරට ක්‍රියාත්මක වී තිබෙන අවධියක, උඩරට මන්ත්‍රීවරයෙක් වශයෙන් ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නට සිදු වී තිබෙනවා, "මේ සම්බන්ධයෙන් අගමැතිතුමාට යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නට පුළුවන් නම්, ඇත්වත් කරුණා කර උඩරට සිංහල ජනතාව වෙනුවෙන් ඒ ක්‍රියා මාර්ගය යන්න" කියා.

අගමැතිතුමා කාගේවත් බබෙක් නළවන්නට සූදානම් වුණත්, එහි තිබෙන බැරුම්කම කවුරුවත් තේරුම් ගන්නට ඇතැයි මා හිතන්නේ නැහැ. කොපමණවත් උඩරට මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේ හිටියත්, "උඩරටට මේ අපරාධය කරනේනේ ඇයි දැයි" කට ඇර අහන්නට, ඒ පනත ගෙන එන අවස්ථාවේදී ඒ කිසිම මන්ත්‍රීවරයකුට බැරි වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

විරුද්ධ පාර්ශ්වය ඊට විරුද්ධ වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

ගිවිසුම අත්සන් කළේ තමුන්නාන්සේලායි.

**සමරවීර මයා.**

*(திரு. சமரவீர)*

(Mr. Samaraweera)

මේක තමයි අපට සිදු වී තිබෙන්නේ. කොටසක් ගිවිසුම් අත්සන් කරනවා, කොටසක් ක්‍රියාත්මක කරනවා. ගිවිසුම් අත්සන් කළ උදවිය අත උස්සන්නේ නැහැ; ඒවා ක්‍රියාත්මක කරන්න. ඒකයි මෙහි තිබෙන වෙනස; ඒකයි මෙහි තිබෙන රහස. මෙයින් සිදු වී තිබෙන්නෙ මොකක්ද? මේ දෙගොල්ලන් ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන ගිවිසුම් අත්සන් කරන්න ගිය නිසා මෙහි උඩරටට මේ විනය වී තිබෙන්නෙ. මේ සම්බන්ධයෙන් කිව යුතුව තිබෙන්නෙ එපමණයි.

මෙහි සංශෝධනයක වතුකරයෙ ප්‍රශ්නය ගැනත් සඳහන් වෙනවා. උඩරට වතුකරයෙ ජීවත්වන පුද්ගලයකු නිසා මා එහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියම තත්ත්වය දන්නවා. ඉන්දියානු ප්‍රශ්නය හරියාකාර විසඳන්න ඉඩ ප්‍රස්ථා සලසා නැති බවක් ගැනයි සංශෝධනයෙහි තිබෙන්නෙ. නමුත් පනතක් ක්‍රියාත්මක කරන්න යනවා. පනත ඉදිරිපත් කළ අවස්ථාවේදී මොනරාගල මන්ත්‍රීතුමා ඒ පිළිබඳව වැදගත් කරුණක් මේ ගරු සභා වේදි හෙළි කළා. එනම්, උඩරට වතුකරයේ ඉතාමත් සීඝ්‍රයෙන් "අපි දෙමළු" කියන ව්‍යාපාරය පැතිර යන බවයි. උඩරට සෑම වත්තකම මේ ව්‍යාපාරය පැතිර ගොස් ඇතුවාක් පමණක් නොවෙයි, නොයෙකුත් අන්දමේ ප්‍රචාරක කටයුතු, වැඩ පිළිවෙළවල් සකස් කරගෙන යනවා. එසේ කරන්නෙ කුමන වැඩ පිළිවෙළක් ඉදිරියට ගන්නට දැයි අපට කියන්න බැහැ. දුරදිග බලන්නෙ නැතුව අත්සන් කළ ගිවිසුමක් නිසා, ඇති කරගත් කොන්ද්සි නිසා, ඒ අයට තව තවත් සහනයන් සැලසෙනවා මිස උඩරට ජීවත්වන සිංහල ජනතාවට නම් යහපතක් සැලසෙන්නෙ නැහැ. එමනිසා, උඩරට වතුකරයේ ජීවත්වන ජනතාවගේ සුභ සිඞිය පිණිස, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස යම්කිසි සටනක් ආරම්භ කිරීමට දැන් කාලය පැමිණ තිබෙන බව මේ ගරු සභාවට ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 7.22

**එස්. තොන්ඩමන් මයා.** (පත් කරන ලද මන්ත්‍රී)

*(திரு. எஸ். தொண்டமான்—நியமன அங்கத்தவர்)*

(Mr. S. Thondaman—Appointed Member)

Mr. Chairman, I listened with great interest to the vigorous speech of the hon. Member for Welimada (Mr. Samaraweera). I knew him as a schoolboy when he was boarded with my son in a Tamil home. He was quite the same then.

**සමරවීර මයා.**

*(திரு. சமரவீர)*

(Mr. Samaraweera)

No.

**තොන්ඩමන් මයා.**

*(திரு. தொண்டமான்)*

(Mr. Thondaman)

Why, at Kandy? You now talk of the Tamil people and Sinhalese citizens and say that they cannot be put into one electorate, but you were the very man who was boarded in a Tamil home with my son, and you were quite comfortable there.

**සමරවීර මයා.**

*(திரு. சமரவீர)*

(Mr. Samaraweera)

Do you say I come from a Tamil home?

**තොන්ඩමන් මයා.**

*(திரு. தொண்டமான்)*

(Mr. Thondaman)

You were boarded in a Tamil home. You were boarded in a Tamil home with my son, and you were together.

**සමරවීර මයා.**

*(திரு. சமரவீர)*

(Mr. Samaraweera)

We have Tamil people as schoolmasters.

**තොන්ඩමන් මයා.**

*(திரு. தொண்டமான்)*

(Mr. Thondaman)

My good Friend was a boarder along with my son in a Tamil home and they were quite happy. I knew him as a young boy. He was quite comfortable. Today he has risen enough to come to this House and represent the Welimada electorate.

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)*

(Mr. R. G. Senanayake—Dambadeniya)

Are you speaking for the D. M. K.?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තොන්ඩමන් මයා.
(திரு. தொண்டமான்)
(Mr. Thondaman)

You always dream of the D. M. K. That is the only way you can survive. You have been taught a lesson continuously. You have been kicked out from party to party, from one end to the other. Still you think that there are people to follow you. Do not think that there are people who are going to follow you. Whether it is Sinhalese or Tamil people, they want their standard of living to be improved.

My good Friend, the hon. Member for Welimada, says : " Oh, the Sinhalese people will be let down. " I would like to ask him, how many estate workers in his own electorate are in the Ceylon Workers Congress, of which I have been the President for so many years ? If the Sinhalese workers have no place in the Ceylon Workers Congress, which my Friend says is the D. M. K., he must ask the workers in the plantations how thousands and thousands of them are in the Ceylon Workers Congress. Let me tell him that, in a number of estates in his own electorate, as recently as two months back I was received with all the honours that are given to a leader. My good Friend now talks here as the saviour of the Sinhalese.

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)

You have not come to Welimada for ages, I will tell you that.

තොන්ඩමන් මයා.
(திரு. தொண்டமான்)
(Mr. Thondaman)

Last month I was there. Even you have come here with our support. This is all you can talk here.

සමරවීර මයා.
(திரு. சமரவீர)
(Mr. Samaraweera)

You may have given your support, but it has nothing to do with my speech.

තොන්ඩමන් මයා.
(திரு. தொண்டமான்)
(Mr. Thondaman)

In spite of the hon. Member for Dambadeniya (Mr. R. G. Senanayake), as long as we are all citizens of this country and we believe in democracy, the Tamils will have to depend on the Sinhalese and the Sinhalese will have to depend on the Tamils. You cannot hereafter simply go on pitting one race against the other. It is on that basis that you want to be a politician. Those days are past.

As far as the Ceylon Workers Congress is concerned, you say it is a " We Tamil " movement, but at the same time the Leftists and the Opposition say : " Oh, Thondaman is ruling the territory ; as Thondaman says, they vote. The U. N. P. came into power because of Thondaman's support. The " We Tamil " movement is there and the D. M. K. is there. We are all opposed to Thondaman. We have attacked Thondaman more vigorously than you do ; the Prime Minister is influenced by Thondaman " and so on.

If this country wants to prosper, if our development is to take place on the proper lines, you have to follow the Prime Minister who himself is a member of a party which unwisely adopted a racial policy in 1947 ; the U. N. P. itself was responsible for denying citizenship rights to certain sections of the people.

රාජා වෙලේගම මයා.
(திரு. ராஜா வெலேகம)
(Mr. Raja Welegama)

They are relaxing those conditions.

තොන්ඩමන් මයා.
(திரு. தொண்டமான்)
(Mr. Thondaman)

They have not relaxed. Today we have to co-exist. In those days we had foreign masters to divide and rule. Today all of us living in this country must work together, and that is how

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

this country can hope to prosper. It is on that that your prosperity and my prosperity depends. It is easy for a few of us like you and me to live in glory, exploiting the others, but the average man, whether he is a Sinhalese villager or a Tamil worker, has to work hard to get his daily bread.

For the last 20 years we have had independence in this country. But what has happened ? What have we improved ? Even today we have to depend on foreign countries for our rice, potatoes, and so on.

ආර්. ජී. සේනානායක මයා.
*(திரு ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

That is because there are too many Indian Tamils here.

තොන්ඩමන් මයා.
*(திரு. தொண்டமான்)*
(Mr. Thondaman)

If the Indian Tamils are not here you will not be able to import even what you are importing now. The imports from foreign countries to feed you and the mischief-makers who follow you, are obtained by the sweat of the Tamil workers on the tea estates. You cannot deny that.

ආර්. ජී. සේනානායක මයා.
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

What about the food drive ?

තොන්ඩමන් මයා.
*(திரு. தொண்டமான்)*
(Mr. Thondaman)

Yes, it is this Government that has undertaken it. The present Prime Minister has adopted a true nationalist policy and he is trying to get the co-operation of all the communities. As a result we are little by little reducing our dependence on foreign countries. Therefore, if my good Friend thinks that they can divide and rule, I can tell him that he is sadly mistaken. They started by discriminating against the Indian Tamils, and at that time the Jaffna Tamils were more or less with them ; and they thought that the Indian labourers are foreigners. But what happened to them finally ? Today, the Muslims are suffering, the Catholics are suffering.

My good Friend today says that there should be a separate electoral register for the Indian Tamils who will be granted citizenship. Next, he will want to discriminate against the Sinhalese Catholics, the Tamil Catholics, the depressed classes in Jaffna.—[*Interruption*]. You know what is happening in Jaffna. He will want to discriminate between the low-country Sinhalese and the upcountry Sinhalese.

ආර්. ජී. සේනානායක මයා.
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

A separate electoral register only for the new citizens.

තොන්ඩමන් මයා.
*(திரு. தொண்டமான்)*
(Mr. Thondaman)

Who are the new citizens ? You are the new citizens. Some of us came here long before you, and we have got better qualifications for citizenship. Let me remind the hon. Member of what Sir John Kotelawala, his own cousin, said. What did he say ? " Oh, the Indians are having one foot here and one foot in India. " Who is having one foot here and one foot somewhere else now ? He is a man who talked of the Indian labourer as a foreigner, as a person who has no permanent interest in this country. Today, by his own action, by his own living, he has shown that he has less interest in this country than the Indian labourers on the plantations.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන් කටයුතු අත් සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1968 ජූලි 20 වන සෙනසුරාදා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 7.30 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.*

*1968 ஜுலை 20, சனிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.*

*It being 7.30 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Saturday, 20th July 1968.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**එවේලාවේදී මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අද දින සභාසම්මතිය අනුව, 1968 ජූලි 20 වන සෙනසුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*அதன் பின்னர் தலைமை தாங்கும் அங்கத்தவர் அவர்கள் வினு விடுக்காமலேயே சபையை ஒத்தி வைத்தார்கள்.*

*அதன்படி, சபை அதனது இன்றைய தீர்மானத்துக் கிணங்க 1968 ஜுலை 20, சனிக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*Thereupon,* MR. PRESIDING MEMBER *adjourned the House without Question put.*

*Adjourned accordingly until 10 A.M., on Saturday, 20th July 1968, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் : தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org